# නර්තනය

# 12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය
(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

මුද්‍රණය හා බෙදා හැරීම : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# නර්තනය

## ගුරු මාර්ගෝපදේශය

## 12 වන ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ)**

**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

නර්තනය
12 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය
ප්‍රථම මුද්‍රණය - 2017
© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ  සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි, යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත.  පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත.  සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ.  එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ.  එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රිය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂය මාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | - | බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **ලේඛක මණ්ඩලය** | - | එස්. වර්ණසිංහ , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| **අභ්‍යන්තර** | - | බුද්ධි කල්‍යාණි මුතුකමාරණ , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| | - | බී. එම්. එස්. ද සොයිසා , කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>මහරගම. |
| **බාහිර** | - | ගුණසේන රාජපක්ෂ , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික) |
| | - | කේ. සිරිල් මීගම , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලය, ගිරාගම. |
| | - | ජගත් පද්මසිරි, උපදේශක,<br>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07. |
| | - | කේ. ඒ. මල්ලිකා , සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |
| | - | සුසන්ත ගුණවර්ධන , සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළිමතලාව. |
| | - | කේ. එල්. ඒ. ධර්මලතා , ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, දෙහිඕවිට. |
| | - | ඒ. ඩබ්. බියංකා එම්. අබේසිංහ , ගුරු සේවය<br>බප/ජය ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය. |
| **විෂය සංස්කාරක මණ්ඩලය** | - | ආචාර්ය ආරියරත්න කළුආරච්චි , |
| | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක |
| | - | මහාචාර්ය ලයනල් බෙන්තරගේ |
| | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාර |
| | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අසෝකා දිසානායක |
| | - | ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ<br>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07. |
| **භාෂා සංස්කරණය** | - | ශ්‍රීනාත් ගනේවත්ත |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

දෛනික ජීවිතය සාර්ථකව පවත්වා ගැනීම හා යහපත් සමාජයක් ගොඩනැංවීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොටගෙන සහශ්‍රයේ සිදු කළ නව ප්‍රතිසංස්කරණවලට අනුව සකස් කළ නර්තන විෂය 12 සහ 13 ශ්‍රේණි නව විෂය නිර්දේශ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. විෂය නිර්දේශයේ අන්තර්ගත නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීමට මෙම ග්‍රන්ථය සකස් කොට තිබේ. මෙය සම්පාදනයේ දී හා පරිහරණය කිරීමේ දී අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගත යුතු වේ.

නර්තන විෂය හා සබැඳි අරමුණු පදනම් කරගෙන නිපුණතා 08ක් ඔස්සේ නව විෂය නිර්දේශය සැලසුම් කොට තිබේ. 12 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 34ක් ද 13 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 25ක් යටතේ විෂය අන්තර්ගතය ගොනුකර ඇත. නිපුණතා, නිපුණතා මට්ටම් හා සබැඳි ක්‍රියාකාරකම්වල අන්තර්ගත විෂය සන්ධාරයෙන් ලබන දැනුමෙන් පමණක් පෝෂිත ව විභාගවලින් ඉහළ සමාර්ථ ලබාගත්ත ද යහපත් සමාජ ජීවිතයක් ගතකිරීමට එය ප්‍රමාණවත් නොවේ. දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනයෙන් හිස හදවත හා දෑත් ද පෝෂණය කළ යුතුවේ. එකී පෝෂණයෙන් තමා ද සමාජය යහපත් මාවතක් කරා යොමු කරවීමට ගැළපෙන ජීවිතය නංවාලීම අද්‍යතන යුගයේ ප්‍රබල සමාජ අවශ්‍යතාවකි.

මෙම ග්‍රන්ථය භාවිත කරණ සියලු ම ගුරුභවතුන් මෙහි මුල් පිටුවේ සිට අවසාන පිටුව දක්වා ඇති කරුණු අවධානයෙන් යුතු ව කියවා අවබෝධ කරගත යුතු වේ. අපේක්ෂිත අරමුණු කරා එළඹීමට නිපුණතා, නිපුණතා මට්ටම් කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර අදාළ ඉගෙනුම් පල කරා ළඟාවීමට ක්‍රියාකාරකම් ස්වාධීනව සැලසුම් කළ යුතුවේ.යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවලින් තමන් ට අභිමත පරිදි ඉගැන්වීම් ක්‍රමයක් තෝරා ගැනීමට නිදහසක් ඇත. එමෙන්ම තෝරා ගන්නා ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම විය යුතු ය. ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත පල කරා සිසුන්ට ළඟාවීමට අවශ්‍ය පසුබිම හා පහසුකම් සැපයීමට පියවර ගැනීම වැදගත් ය. එක් එක් ක්‍රියාකාරකම් සඳහා කාලච්ඡේද වෙන් කර ඇත. පන්ති කාමරයේ සිසු ශක්‍යතා සලකා බලමින් විවිධ පරිසර තත්ත්වයන් යටතේ කාලච්ඡේද සුදුසු පරිදි යොදා ගැනීමට අවකාශය ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර නූතන ගුරු භූමිකාව ඊට අනුගත විය යුතුව ඇත. ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම යන කාර්යයේ දී ගුරුවරයාගේ වගවීම හා වගකීම පුළුල් පරාසයක් කරා විහිදී ඇත. ක්‍රියාකාරකම් අවසානයේ ඇගයීමට අවශ්‍ය ප්‍රශ්න සකස් කිරීම, ඒ සඳහා ඇගයීම් නිර්ණායක ගොඩනැඟීම ක්‍රියාකාරකම් සැලසුමෙහි සුවිශේෂ අංගයකි. උක්ත ගුරු භූමිකාව පරිණාමන ගුරු භූමිකාව ලෙස නම් කර තිබේ.

නිර්මාණශීලී ගුරුවරයෙකු ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම සඳහා සරල මඟපෙන්වීමක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීමේ කාර්ය සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් වේවායි පතමු.

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii-xxiv |
| වාර බෙදා දැක්වීම | xxv-xxvii |
| ඉගෙනුම්-ඉගැන්වීම්  ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-134 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

නව සහශ්‍රයේ දී සිදු කළ නිපුණතා පාදක ක්‍රියාකාරකම් මූලික ප්‍රතිසංස්කරණ චක්‍රයේ දෙවැනි අදියර 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. නව ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ ඉදිරිපත් කරන ලද විෂය නිර්දේශවල මූලික අරමුණු වන්නේ දැනුම, කුශලතා, ආකල්ප හා යහපත් ජීවන පුරුදු මෙන් ම උසස් රසඥතාවෙන් යුතු මානව හිතවාදී චින්තනයෙන් යුත් පුද්ගලයකු වශයෙන් ක්‍රියාකාරී වැඩලොවට අවශ්‍ය නිපුණතාවෙන් යුක්ත මානව සම්පත් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය. එම අරමුණු සාක්ෂාත් කිරීමට දායක වීම අධ්‍යාපන ක්‍රියාවලියෙහි නියුක්ත සැමගේ වගකීමකි.

අ.පො.ස (උ.පෙළ) 12, 13 ශ්‍රේණි නව විෂය නිර්දේශ සැලසුම් කිරීමේ දී උක්ත කරුණු මෙන් ම නර්තන අධ්‍යාපන අරමුණු හා විෂය සුවිශේෂතා සැලකිල්ලට ගෙන තිබේ. දේශීය සංස්කෘතික හර පද්ධතීන් හඳුනාගැනීම, අගය කිරීම, ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම මෙන් ම අන්‍ය සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීම, අගය කිරීම හා ජාත්‍යන්තර තලයේ දී නොසැලී කටයුතු කිරීම සඳහා අවශ්‍ය විෂයානුබද්ධ හා පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

අ.පො.ස (උ.පෙළ) නර්තන විෂය හා සබැඳි අරමුණු 07 ක් පදනම් කොට ගෙන නිපුණතා 8ක් ඔස්සේ නව විෂය නිර්දේශ සැලසුම් කොට තිබේ. 12 ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 35ක් හා 13 ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 25ක් යටතේ විෂය අන්තර්ගතය ගොනු කර ඇත. අ.පො.ස (උ.පෙළ) විෂය ප්‍රතිසංස්කරණ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත අතර දීර්ඝ වශයෙන් කරුණු හා උපදෙස් ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථයෙන් ඉදිරිපත් කිරීමට සැලසුම් කොට තිබේ.

# ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

**ජාතික අරමුණු**

දෛනික ජීවිතය සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොටගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින්, ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩනැගීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා, පෝෂණය කිරීම.

# 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා :**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලාදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය සහ කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා :**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුශලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතා, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සැප පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළ බැහැර කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල ව හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහාගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා :**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන්වීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.)

# නර්තන විෂය අරමුණු

1. ශ්‍රී ලාංකේය බහුවිධ සංස්කෘතික විවිධත්වය නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් ඇසුරින් හඳුනාගනිමින් ජාතික සමගිය, එකමුතුකම හා සාමය ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක වීමට මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම.

2. අනාගත වැඩ ලෝකයේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැකි ක්‍රියාකාරිත්වය මෙන් ම නර්තන විෂය හා සබැඳි ජාතික සංස්කෘතික උරුම හඳුනාගැනීම හා සංරක්ෂණය සඳහා පුද්ගල හැකියා සංවර්ධනය කිරීම.

3. සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය කායික හා මානසික සුව සම්පත් වර්ධනය මෙන් ම තිරසාර ජීවන ක්‍රමයක් සඳහා නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් භාවිතයට ගැනීමේ හැකියාව වර්ධනය කිරීම.

4. ඵලදායි කාර්යයන් කිරීමට අවශ්‍ය ආරම්භන ශක්තිය, නිර්මාණාත්මක, තර්කානුකූල හා විචාරාත්මක චින්තනය මෙන් ම උසස් රසඥතා මට්ටමක් ඇති සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නර්තන අධ්‍යාපන ක්‍රියාකාරකම් ඇසුරෙන් දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.

5. පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් නිමාවකින් යුත් කලා කෘති බිහිකිරීම මෙන් ම, සීඝ්‍රයෙන් වෙනස්වන ලෝකයේ සිදුවන සංකීර්ණ අනපේක්ෂිත වෙනස්වීම්වලට සාර්ථක ව මුහුණදීමට හා විවිධ ගැටලු නිර්මාණශීලීව විසඳා ගැනීම සඳහා අවශ්‍ය චින්තන ශක්ති වර්ධනය හා ප්‍රායෝගික කුසලතා වර්ධනය.

6. නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් ඇසුරින් ශ්‍රී ලාංකේය සංස්කෘතික හා ආර්ථික සංවර්ධනය සඳහා නිරතවීමට අවශ්‍ය පුද්ගල හා සමාජයීය හැකියා වර්ධනය කිරීම.

7. ජාත්‍යන්තර ප්‍රජාව අතර ශ්‍රී ලාංකේය අනන්‍යතාව ප්‍රදර්ශනය කරමින් ගෞරවණීය ස්ථානයක් හිමිකර ගැනීමට නර්තන අධ්‍යාපනයෙන් කුසලතා, ආකල්ප ලබාදී සදාචාරාත්මක සහජීවන පුරුදු පවත්වාගෙන යාමට සහාය වීම හා ඒවා පෝෂණය කිරීමට අවශ්‍ය මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම.

## 5.0 ජාතික පොදු අරමුණු සහ නර්තන විෂය අරමුණු අතර සම්බන්ධතාව

| සෞන්දර්ය අධ්‍යාපනය - නර්තන විෂය අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 1. ශ්‍රී ලාංකේය බහුවිධ සංස්කෘතික විවිධත්වය නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් ඇසුරින් හඳුනාගනිමින් ජාතික සමගිය, එකමුතුකම හා සාමය ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක වීමට මානව සම්පත් සංවර්ධනය කිරීම. | √ | | | | | | | |
| 2. අනාගත වැඩ ලෝකයේ අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දියහැකි ක්‍රියාකාරිත්වය මෙන් ම නර්තන විෂය හා සබැඳි ජාතික සංස්කෘතික උරුම හඳුනාගැනීම හා සංරක්ෂණය සඳහා පුද්ගල හැකියා සංවර්ධනය කිරීම. | | √ | | | | | √ | |
| 3. ඵලදායී කාර්යයන් කිරීමට අවශ්‍ය ආරම්භක ශක්තිය, නිර්මාණාත්මක, තර්කානුකූල හා විචාරාත්මක චින්තනය මෙන්ම උසස් රසඥතා මට්ටමක් ඇති සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නර්තන අධ්‍යාපන ක්‍රියාකාරකම් ඇසුරෙන් දැනුම, කුශලතා හා ආකල්ප සංවර්ධන කිරීම. | | | | | √ | | | |
| 4. සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය කායික හා මානසික සුව සම්පත් වර්ධනය මෙන් ම තිරසාර ජීවන ක්‍රමයක් සඳහා නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් භාවිතයට ගැනීමේ හැකියාව වර්ධනය කිරීම. | | | | √ | | | | |
| 5. නර්තන විෂය හා සබැඳි ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් ශ්‍රී ලාංකේය සංස්කෘතික හා ආර්ථික සංවර්ධනය සඳහා නිරත වීමට අවශ්‍ය පුද්ගල හා සමාජයීය හැකියා වර්ධනය කිරීම. | | | | | | √ | | |
| 6. පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් නිමාවකින් යුත් කලාකෘති බිහිකිරීමට මෙන් ම සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ සිදු වන සංකීර්ණ අනපේක්ෂිත වෙනස්වීම්වලට සාර්ථක ව මුහුණ දීමට හා විවිධ ගැටලු නිර්මාණශීලී ව විසඳාගැනීම සඳහා අවශ්‍ය චින්තන ශක්තිය වර්ධනය හා නිර්මාණ කුශලතා වර්ධනය කිරීම. | | | | | | | √ | |
| 7. ජාත්‍යන්තර ප්‍රජාව අතර ශ්‍රී ලාංකේය අනන්‍යතාව ප්‍රදර්ශනය කරමින් ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට නර්තන අධ්‍යාපනයෙන් කුශලතා, ආකල්ප ලබා දී සදාචාරාත්මක සහජීවන පුරුදු පවත්වාගෙන යාමට සහාය වීම හා ඒවා පෝෂණය කිරීමට අවශ්‍ය මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම. | | | | | | √ | | √ |

## 6.0 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්ත්‍ර්ගතය, ඉගෙනුම් ඵල සහ කාලච්ඡේද

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුශලතා ප්‍රදර්ශනය කරයි. | 1.1 නිවැරදි අංගහාර අනුගමනය කරමින් මූලික සරඹ හා පද නර්තනය කරයි. | • පා සරඹ/මණ්ඩිපද හමාර පද සමග (1 -12 දක්වා) | • මූලික අංගහාර ප්‍රදර්ශනය කරමින් පා සරඹ /මණ්ඩිපද හමාරපදය සමග ඉදිරිපත් කරයි.<br>• සමගුණ, දෙගුණ, සිව්ගුණ තාලම්පට වාදනයට අනුව පා සරඹ/මණ්ඩිපද නර්තනය කරයි. | 06 |
| | | • ගොඩසරඹ /ඉලංගම් සරඹ/දොඹින පද (1-12 දක්වා) කස්තිරම්/ඉරට්ටි /හමාර පද සමග | • සමගුණ, දෙගුණ, සිව්ගුණ බෙර /දවුල් වාදනයට අනුව ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරමින් ගොඩ සරඹ /ඉලංගම් සරඹ/ දොඹින පද/කස්තිරම් /ඉරට්ටි/ හමාර පද සමග ඉදිරිපත් කරයි. | 08 |
| | 1.2 නර්තන ශක්‍යතා ප්‍රදර්ශනය කිරීමට විවිධ පැනීම් හා කැරකීම් භාවිත කරයි. | • නර්තනයේ ශක්‍යතා ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය පැනීම්, කැරකීම්. | • සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි පැනීම් හා කැරකීම් ඉදිරිපත් කරයි.<br>• නර්තන නිර්මාණවල දී පැනීම් කැරකීම් ඉදිරිපත් කරයි.<br>• නිවැරදි විධික්‍රම අනුගමනය කරමින් පැනීම් හා කැරකීම් ප්‍රදර්ශනය කරයි. | 04 |
| | 1.3 සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි. | **වන්නම් - උඩරට**<br>• මුසලඩි, ගණපති, මයුරා | • ඉගෙන ගන්නා ලද වන්නම් නර්තනය සාමූහික ව ප්‍රදර්ශනය කරයි.<br>• ඉගෙන ගන්නා ලද වන්නම් ගායනය කරමින් බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන පරිදි ඒකල ව නර්තනයේ යෙදෙයි. | 15 |
| | | **සින්දු වන්නම්-පහතරට**<br>• ශුද්ධ තාලය, ලලිතරාග තාලය, නළු ගීතිකා තාලය | • ඉගෙන ගන්නා ලද සින්දු වන්නම් නර්තනය සාමූහික ව ප්‍රදර්ශනය කරයි.<br>• ඉගෙන ගන්නා ලද සින්දු වන්නම් ගායනය කරමින් බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන පරිදි ඒකල ව නර්තනයේ යෙදෙයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 ගායනය රහිත ව උඩරට/පහතරට/සබරගමු සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි. | **වන්නම් - සබරගමු**<br>• කොවුලා, තිසරා, නාග ගජගා<br><br>**උඩරට**<br>• කුදංත ගතදොං වට්ටම සහ දොං ජිංත ගත දොංත වට්ටම (පිරීමේ පදය සමග පද 4, කස්තිරම් 4, අඩව් 4)<br><br>**පහතරට**<br>• ගුඳ ගති ගත වට්ටම (පද 7, ඉරට්ටි 7)<br><br>• එක් තාලය, දෙතාලය, තුන් තාලය<br><br>**සබරගමු** -<br>• යක්පද මාත්‍රය, ගමන් මාත්‍රය (කලාසම් වට්ටම්, කලාසම, අඩව්ව) | • ඉගෙන ගන්නා ලද වන්නම් නර්තනය සාමූහික ව ප්‍රදර්ශනය කරයි.<br>• ඉගෙන ගන්නා ලද වන්නම් ගායනය කරමින් දවුල් වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන පරිදි ඒකල ව නර්තනයේ යෙදෙයි.<br><br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් වට්ටම් පද, කස්තිරම් /අඩවු/ ඉරට්ටි නර්තනයේ යෙදෙයි.<br>• ශිල්පීය දක්ෂතා ප්‍රවර්ධනය සඳහා අදාළ වට්ටම් නර්තනය කරයි.<br>• ඉගෙන ගන්නා ලද වට්ටම් නර්තනය සාමූහික ව ප්‍රදර්ශනය කරයි.<br>• ඉගෙන ගන්නා ලද වට්ටම්වල පද, කස්තිරම් හා අඩව් / ඉරට්ටි බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන පරිදි ඒකල ව නර්තනයේ යෙදෙයි.<br><br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව එක් තාලය, දෙතාලය, තුන් තාලය නර්තනය කරයි.<br>• උගත් නර්තනාංග සාමූහික ව හා ඒකල ව ඉදිරිපත් කරයි.<br><br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් දවුල් වාදනයට අනුව යක් පද මාත්‍රය සහ ගමන් මාත්‍රයට අදාළ කලාසම් වට්ටම්, කලාසම, අඩව්ව නර්තනය කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.5 පූජා භාණ්ඩ නිවැරදි ව හසුරුවමින් නර්තන අංගය ඉදිරිපත් කරයි. | • උඩරට - කොතල පදය<br>• පහතරට - කොතල පදය<br><br>• සබරගමු - කෙණ්ඩි පාළිය | • පූජා භාණ්ඩ නිවැරදි ව හසුරුවමින් කොතල පදය/ කෙණ්ඩි පාළිය නර්තන අංගවල සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් නර්තන ඉදිරිපත් කරයි. | 12 |
| | 1.6 ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි. | උඩරට<br>• මංගලම් නර්තනය පද 03ක් කස්තිරම සමග (තිත් පහට)<br><br>• අස්නේ මුල් පද 03 සහ ඕඩියට අලංකාර පද 02ක් කස්තිරම් සමග<br><br>පහතරට<br>• විෂ්ණු මල් අස්න<br><br>• ශුද්ධ මාත්‍රය | • සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ ගායනය කරමින් බෙර වාදනයට අනුව මංගලම්, නර්තන අංගය ඉදිරිපත් කරයි.<br><br>• සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ ගායනය කරමින් බෙර වාදනයට අනුව අස්නේ නර්තන අංගය ඉදිරිපත් කරයි.<br><br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව විෂ්ණු මල් අස්න කවි ගායනය කරමින් නර්තනය කරයි.<br><br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ශුද්ධ මාත්‍රා කවි ගායනය කරමින් නර්තනය කරයි.<br>• සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ ගායනය කරමින් ඒකල ව නර්තන ඉදිරිපත් කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.7 වෙනත් සම්ප්‍රදායවලට අයත් නර්තන අංග දෙකක් ඉදිරිපත් කරයි. | **සබරගමු**<br>• සමන් දෙවි මල් අස්න,<br><br>• මුල් මාත්‍රය<br><br>• **උඩරට** - මංගලම්<br>• **පහතරට** - ශුද්ධ මාත්‍රය<br>• **සබරගමු** - මුල් මාත්‍රය | • සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ සමන් දෙවි මල් අස්න නර්තන අංගය ඉදිරිපත් කරයි.<br>• සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ ගායනය කරමින් දවුල් වාදනයට අනුව මුල් මාත්‍රය ඉදිරිපත් කරයි.<br>• ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයේ මූලික අංගහාර හා සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.<br>• ඉගෙන ගන්නා ප්‍රධාන නර්තන සම්ප්‍රදායය හැර වෙනත් නර්තන සම්ප්‍රදාය දෙකකට අයත් නර්තනාංග දෙකක් ඉදිරිපත් කරයි. | 15 |
| 2.0 නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි. | 2.1 රස භාව සංකල්පය පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි. | • රස නිෂ්පත්තිය<br>• නව නළු රසය (ගැමි නාටක, සන්නි, පාලි, සහ ශාන්තිකර්මවල අන්තර්ගත ප්‍රායෝගික චරිත නිරූපණ ඇසුරින්)<br>• භාව උද්දීපනය සඳහා භාවිත විධි ක්‍රම | • රස නිෂ්පත්තිය සිදු වන ආකාරය විමසුමට ලක් කරයි.<br>• භාව උද්දීපනය සඳහා දේශීය නර්තන සම්ප්‍රදාය භාවිත කර ඇති විධික්‍රම පිළිබඳ අදහස් දක්වයි. | 05 |
| | 2.2 භාව ප්‍රකාශනය කරමින් විවිධ චරිත නිරූපණ ඉදිරිපත් කරයි. | • ජස, මුදලි, නොංචි හා රීරි යකා | • භාව ප්‍රකාශනය වන පරිදි අදාළ චරිත නිරූපණ ඉදිරිපත් කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 දේශීය නර්තන සම්ප්‍රදායය හා සබැඳි තාල ලක්ෂණ පිළිබඳ විග්‍රහ කරයි. | **දේශීය තාල පද්ධතියේ විකාශය**<br>• තනි තිත<br>• දෙතිත<br>• තුන් තිත<br>• සිව් තිත<br>• පස් තිත තාල | • දේශීය නර්තන කලාව හා සබැඳි තාල හඳුනාගනිමින් විස්තර කරයි.<br>• දේශීය තාල පද්ධතියේ විකාශය විග්‍රහ කරයි. | 07 |
| | 2.4 දේශීය නර්තනය හා සබැඳි තාල රූපවලට සමාන හින්දුස්ථානි හා කර්ණාට තාල විමසුමට ලක් කරයි. | **දේශීය, හින්දුස්තානි, කර්ණාටක තාල**<br>• මාත්‍රා 2,3 සහ 4 තනි තිත, මාත්‍රා 2+3 සහ 3+4 දෙතිත තාල | • දේශීය නර්තන කලාව හා සබැඳි තාල රූපවලට සමාන හින්දුස්ථානි හා කර්ණාටක තාල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 10 |
| | 2.5 නිර්දේශිත ගායන, නර්තන හා සබැඳි කවි, පද කොටස් ප්‍රස්තාර කරයි. | **ප්‍රස්තාරකරණය**<br>• වන්නම්/ මංගලම්/ මුල් මාත්‍රය/පහතරට ශුද්ධ මාත්‍රය/ග්‍රහ පන්ති කවි ප්‍රස්තාර | • ප්‍රස්තාරකරණයේ මූලික සිද්ධාන්ත හා විධික්‍රම විස්තර කරයි.<br>• ප්‍රස්තාරකරණය හා සබැඳි නිවැරදි සංකේත හා විධික්‍රම භාවිත කරමින් අදාළ ගායන හා නර්තන පද කොටස් ප්‍රස්තාර කරයි. | 08 |
| 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල ස්වරූපය හඳුනාගනිමින් වාදන කුශලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 නිර්දේශිත වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය සකස් කිරීමේ ශිල්ප ක්‍රම හා චාරිත්‍ර | • සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල ස්වරූපය විස්තර කරයි.<br>• අදාළ වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ ශිල්ප ක්‍රම හා චාරිත්‍ර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 08 |
| | 3.2 නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරමින් බෙර/ දවුල් සරඹ පද වාදනය කරයි. | **වාදනය**<br>• බෙර/දවුල් සරඹ පද 1-5 (කඩිප්පුව භාවිත කරමින්) | • නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරමින් බෙර/දවුල් සරඹ ත්‍රිවිධ ලයට ඒකල ව වාදනය කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 වන්නම් ගායනය කරමින් බෙර/දවුල් වාදනය කරයි. | • ඉගෙන ගන්නා ලද වන්නම්වල මූලික බෙර පද (ගායනය සහිත) හා කස්තිරම්/ඉරට්ටි/කලාසම් | • නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කර බෙර, දවුල් වාදනය කරමින් ගායනය කරයි.<br>• නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරමින් කස්තිරම්/ඉරට්ටි/කලාසම් වාදනය කරයි. | 10 |
| 4.0 විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 4.1 පරිසර නිරීක්ෂණ - යෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් චරිත නිරූපණ ඉදිරිපත් කරයි. | • චරිත නිරූපණ සිද්ධියක් ඇසුරෙන් | • චරිත නිරූපණය කිරීමට සුදුසු සිද්ධියක් නිර්මාණය කරයි.<br>• නිර්මාණය කරන ලද සිද්ධියට අදාළ චරිත නිරූපණය කරයි. | 08 |
| | 4.2 චරිතාත්ම අංග රචනය සඳහා ක්‍රමවේදයන් සහ චරිත ගොඩනැඟීමේ ශිල්ප ක්‍රම අධ්‍යයනය කරමින් අංග රචනය කරයි. | • අංගරචන ආලේපන ද්‍රව්‍ය<br>• චරිත ගොඩනැඟීමේ අංග රචන ශිල්ප ක්‍රම<br>• ශාන්තිකර්මවල අන්තර්ගත චරිත, නාට්‍යමය අවස්ථා, වේදිකා නාට්‍ය චරිත සඳහා අංග රචනය | • සාම්ප්‍රදායික හා නූතන අංග රචන ආලේපන ද්‍රව්‍ය නම් කරයි.<br>• සාම්ප්‍රදායික හා නූතන අංග රචන ශිල්ප ක්‍රම පිළිබඳ විස්තර කරයි.<br>• ශිල්පක්‍රම අනුගමනය කරමින් චරිතාත්ම සඳහා අංග රචනය කරයි. | 10 |
| | 4.3 විවිධ ද්‍රව්‍ය හා ශිල්පක්‍රම භාවිත කරමින් සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංගාභරණ සකස් කරයි. | • සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංග ආභරණ නිර්මාණ (කණ කර, පපුව, උරහිස්, ඉණ, දෑත් හා දෙපා) | • තෝරාගත් අමුද්‍රව්‍ය භාවිත කරමින් ඒකල ව හා සාමූහික ව නිමාවක් සහිත සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංගාභරණයක් සකස් කරයි. | 10 |
| | 4.4 විවිධ ද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම භාවිත කරමින් නිර්මාණාත්මක රංග ආභරණ සකස් කරයි. | • නිර්මාණාත්මක රංග ආභරණ (කන, කර, පපුව, උරහිස්, ඉණ, දෑත්, හා දෙපා, කාන්තා සහ පිරිමි හිස් පලඳනා) | • තෝරාගත් අමුද්‍රව්‍ය භාවිත කරමින් ඒකල ව හා සාමූහික ව නිමාවක් සහිත නිර්මාණාත්මක රංගාභරණයක් සකස් කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුශලතා ප්‍රදර්ශනය කරයි. | 5.1 ශාන්තිකර්ම හා සබැඳි ගායන ඉදිරිපත් කරයි. | • නිර්දේශිත කවි ගායනවල පසුබිම<br>**ශාන්තිකර්ම කවි**<br>• මඩුපුරේ කවි, නානුමුර කවි, කොහොඹා හැල්ල, ග්‍රහ පන්ති කවි | • සාම්ප්‍රදායික ගායනවල පසුබිම විස්තර කරයි.<br>• ස්වකීය හඬතලයෙහි පිහිටා නිවැරදි තාල හා නාද රටාවන් අනුව ඒකල ව ගායනය කරයි.<br>• ඒකීය හඬතලයක පිහිටා සාමූහික ව ගායනය කරයි. | 06 |
| | 5.2 නර්තනාංග හා සබැඳි ගායන ඉදිරිපත් කරයි. | **නර්තනාංග හා සබැඳි ගායන**<br>• උඩරට වන්නම්, මංගලම්, අස්නේ/<br>• පහතරට සින්දු වන්නම්, කොතල පදය, ශුද්ධ මාත්‍රය, විෂ්ණු මල් අස්න/<br>• සබරගමු වන්නම්, මුල් මාත්‍රය, කෙණ්ඩි පාළිය, සමන් දෙවි මල් අස්න | • නිර්දේශිත කවි ගායනවල පසුබිම විස්තර කරයි.<br>• නිර්දේශිත කවි ගායනවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායයට අයත් නර්තනාංගවල කවි ගායනය කරයි. | 06 |
| | 5.3 උඩැක්කි, පන්තේරු, නර්තන හා සබැඳි කවි ගායනය කරයි. | • උඩැක්කි හා පන්තේරු කවි | • නිර්දේශිත කවි ගායනවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• නිවැරදි තාල හා නාද රටා අනුගමනය කරමින් උඩැක්කි, පන්තේරු, නර්තන හා සබැඳි කවි ගායනය කරයි. | 02 |
| | 5.4 ගැමි හා සේ ගී ගායන ඉදිරිපත් කරයි. | **ගැමි හා සේ ගී**<br>• පතල් කවි, ටීකා සීපද, නෙළුම් කවි, ප්‍රශස්ති හා හටන් කවි | • නිවැරදි නාද රටා අනුගමනය කරමින් ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගැමි ගී ගායනය කරයි.<br>• නිවැරදි තාල හා නාද රටා අනුගමනය කරමින් සේ ගී ගායනය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි. | 6.1 නර්තනයේ ඓතිහාසික හා සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • නර්තන කලාවේ ප්‍රභවය හා විකාශය<br><br>සමාජීය හා ආගමික අවශ්‍යතා (ඇදහිලි හා විශ්වාස ඇසුරින්) | • නර්තන කලාවේ ප්‍රභවය හා විකාශය විස්තර කරයි.<br><br>• සමාජීය හා ආගමික අවශ්‍යතා සඳහා නර්තනය භාවිත කළ ආකාරය විමසුමට ලක් කරයි. | 06 |
| | 6.2 දේශීය නර්තන කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ ඓතිහාසික තොරතුරු යුග ඇසුරින් විමසුමට ලක් කරයි. | යුග<br>• ප්‍රාග් බෞද්ධ යුගයේ සිට කුරුණෑගල යුගය දක්වා (ප්‍රාග් බෞද්ධ, අනුරාධපුර, පොළොන්නරු දඹදෙණි, කුරුණෑගල යුග) | • ප්‍රාග් බෞද්ධ, අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, කුරුණෑගල යුග ඇසුරින් නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසුමට ලක් කරයි.<br><br>• විවිධ මූලාශ්‍රයවල සාධක ඇසුරු කරගනිමින් නර්තන කලාවේ පැවති තත්ත්වය පිළිබඳ අනාවරණ ඉදිරිපත් කරයි. | 10 |
| | 6.3 දේශීය වන්නම්වල ප්‍රභවය හා විකාශය විචාරයට ලක් කරයි. | • දේශීය වන්නම් (උඩරට, පහතරට, සබරගමු) ප්‍රභවය හා විකාශය | • දේශීය වන්නම්වල ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br><br>• උඩරට, පහතරට සබරගමු වන්නම්වල සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරයි. | 08 |
| | 6.4 දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් නිර්දේශිත ශාන්ති කර්ම පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි. | • වලියක් මංගල්‍යය | • වලියක් මංගල්‍යය ශාන්තිකර්මයෙහි අන්තර්ගත නර්තන, වාදන, ගායන, රංග වස්ත්‍රාභරණ සැරසිලි හා චාරිත්‍ර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • කිරි මඩුව<br>• රට යකුම<br>• බලි ශාන්ති කර්මය | • කිරිමඩුව හා රට යකුම පැවැත්වීමේ අරමුණු, සැරසිලි, ගායන වාදන, රංග වස්ත්‍රාභරණ හා චාරිත්‍ර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• බලි ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු , ගායන වාදන හා සැරසිලිවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි. | 06<br>06<br>06 |
| 7.0 රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක් කරයි. | 7.1 නිර්දේශිත සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරයි. | • ලී, කළ ගෙඩි, ගොයම්, කුළු, මෝල්ගස්, පතුරු තාලම්, කෝලාට්ටම්, චෙම්බු, අරිවිවෙට්ටු, සුලකු, කරහම්, කාවඩි, කොළඳු පරිතාල් | • සිංහල හා දෙමළ ගැමි නැටුම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• අද්‍යතනයේ දක්නට ලැබෙන ගැමි නැටුම්වල ලක්ෂණ විචාරය කරයි. | 08 |
| | 7.2 කොහොඹා කංකාරිය, රට යකුම සහ පහන් මඩුව ශාන්තිකර්මවල නාට්‍යමය අවස්ථා විචාරයට ලක් කරයි. | • කොහොඹා කංකාරියේ උෟරා යක්කම, රට යකුමේ නානුමුරය, පහන් මඩුවේ පොත්කඩේ යක්කම. (පොක්කඩේ යක්කම) | • ශාන්තිකර්මවල නාට්‍යමය අවස්ථාවන්හි සමාන අසමානතා පිළිබඳ විචාරය කරයි. | 08 |
| | 7.3 භාරතීය නර්තන සම්ප්‍රදායවල ආරම්භය හා විකාශය විස්තර කරයි. | • භාරතීය සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන්ගේ තොරතුරු ආරම්භය හා විකාශය | • භාරතීය නර්තන සම්ප්‍රදායවල ආරම්භය හා විකාශය විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.4 රූපවාහිනිය මඟින් ප්‍රචාරය කරන නර්තන වැඩසටහන් පිළිබඳ විචාරය කරයි. | • රූපවාහිනිය මඟින් ප්‍රචාරය කරන නර්තන විෂය හා සබැඳි ශාස්ත්‍රීය වැඩසටහන්, තරග (ළමා වැඩිහිටි) අද්‍යතන නර්තන අංග | • රූපවාහිනිය මඟින් ප්‍රචාරය කරන අද්‍යතන වැඩසටහන් නරඹා විචාර ඉදිරිපත් කරයි. | 06 |
| | 7.5 බැරිසිල්/පටාචාරා කලාකෘති විචාරයට ලක් කරයි. | • බැරිසිල්/පටාචාරා කලාකෘති | • බැරිසිල්/පටාචාරා කලාකෘති නරඹා එහි අන්තර්ගතය පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි. | 10 |
| 8.0 නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 8.1 ශ්‍රී ලාංකේය නර්තනය හා සංගීතය අතර ඇති සහසම්බන්ධතාව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | • නර්තනය හා සංගීතය අතර ඇති සහ සම්බන්ධතාව (ශාන්තිකර්ම, ව්‍යවහාරික ගායන, වාදන, නර්තන, සංගීත අංග ඇසුරෙන්) | • නර්තනය හා සංගීතය අතර ඇති සහ සම්බන්ධතාවේ වැදගත්කම පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | 06 |
| | 8.2 නර්තනය හා නාට්‍ය ශෛලීන් අතර ඇති සහ සම්බන්ධතාවේ සුවිශේෂතා විමසුමට ලක් කරයි. | • නර්තනය හා නාට්‍ය ශෛලීන් | • නර්තනය හා නාට්‍ය ශෛලීන් අතර ඇති සහසම්බන්ධතාව විස්තර කරයි.<br>• නාට්‍ය ශෛලීන් තුළ දක්නට ලැබෙන නර්තනවල සුවිශේෂ ලක්ෂණ විමසුමට ලක් කරයි. | 06 |
| | 8.3 නර්තන කලාව හා චිත්‍ර කලාව අතර සහ සම්බන්ධතාව විමසුමට ලක් කරයි. | • නර්තන කලාව හා චිත්‍ර කලාව අතර සහ සම්බන්ධතාව චිත්‍ර කලාවේ මූලිකාංග, මූලධර්ම හා ශිල්ප ක්‍රම, චිත්‍ර සංරචනය හා නර්තන රංග රචනය | • චිත්‍ර කලාවේ මූලිකාංග, මූලධර්ම හා ශිල්ප ක්‍රම විස්තර කරයි.<br>• චිත්‍ර සංරචනය හා නර්තන රංග රචනය අතර සහ සම්බන්ධතාව පිළිබඳ කරුණු විග්‍රහ කරයි. | 06 |

## 12 ශ්‍රේණිය වාර බෙදා දැක්වීම

### පළමුවන වාරය

| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | කාලච්ඡේද සංඛ්‍යාව | පිටු අංකය |
|---|---|---|---|
| 1.1.1 | පා සරඹ/මණ්ඩි පද නර්තනය කරමු. | 06 | 02 |
| 1.1.2 | ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද/කස්තිරම්, ඉරට්ටි, හමාර පද සමඟ නර්තනය කරමු. | 08 | 05 |
| 1.2 | සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි පැනීම් හා කැරකීම් | 04 | 10 |
| 5.2 | නර්තනයට පෙර ගයමු. | 02 | 100 |
| 1.3 | මුසලඩි වන්නම/ශුද්ධ තාලය සින්දු වන්නම/කොවුලා වන්නම නර්තනය කරමු. | 05 | 12 |
| 8.1 | නර්තනය හා සංගීතය අතර සහසම්බන්ධතාව විමසමු. | 06 | 132 |
| 3.2 | බෙර/දවුල් සරඹ පද වාදනය කරමු. | 10 | 85 |
| 6.1 | නර්තන කලාවේ ප්‍රභවය හා විකාශය විමසමු. | 06 | 109 |
| 1.4 | කුඳංත ගත දොං වට්ටම සහ දොං ජිංත ගත දොංත වට්ටම නර්තනය කරමු. (උඩරට නර්තන සම්ප්‍රදායය) | 12 | 22 |
| | ගුඳ ගති ගත වට්ටම සහ එක්තාලය, දෙතාලය, තුන් තාලය නර්තනය කරමු. (පහතරට නර්තන සම්ප්‍රදායය) | | 25 |
| | යක්පද මාත්‍රයට සහ ගමන් මාත්‍රයට අදාළ කලාසම් වට්ටම, කලාසම, අඩව් නර්තනය කරමු. (සබරගමු නර්තන සම්ප්‍රදාය) | | 28 |
| 1.6.1 | මංගලම් නර්තනය ඉදිරිපත් කරමු. (උඩරට නර්තන සම්ප්‍රදාය) | 06 | 36 |
| | ශුද්ධ මාත්‍රය නර්තනය කරමු.(පහතරට නර්තන සම්ප්‍රදාය) | | 38 |
| | මුල් මාත්‍රය නර්තනය කරමු. (සබරගමු නර්තන සම්ප්‍රදාය) | | 40 |
| 1.6.2 | කුවේණි අස්න නර්තන අංගය ඉදිරිපත් කරමු. (උඩරට නර්තන සම්ප්‍රදාය) | 06 | 42 |
| | විෂ්ණු මල් අස්න නර්තන අංගය ඉදිරිපත් කරමු. (පහතරට නර්තන සම්ප්‍රදාය) | | 44 |
| | සමන් දෙවි මල් යහන් නර්තන අංගය ඉදිරිපත් කරමු. (සබරගමු නර්තන සම්ප්‍රදාය) | | 47 |
| 3.1 | වාද්‍ය භාණ්ඩ සකස් කිරීම පිළිබඳ තොරතුරු උගනිමු. | 08 | 82 |
| 4.2 | චරිතාත්ම සඳහා අංග රචනය කරයි. | 10 | 92 |
| 6.4.1 | වලියක් මංගල්‍යය ශාන්තිකර්මයේ තොරතුරු විමසමු. | 06 | 113 |
| 5.1 | ශාන්තිකර්ම කවි ගායනය කරමු. (මඩුපුරේ කවි, නානුමුර කවි, කොහොඹ හැල්ල කවි, ග්‍රහ පන්ති කවි) | 06 | 96 |

## දෙවන වාරය

| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | කාලච්ඡේද සංඛ්‍යාව | පිටු අංකය |
|---|---|---|---|
| 5.2 | නර්තනයට පෙර ගයමු. | 02 | 100 |
| 1.3 | ගණපති වන්නම/ලලිතරාග තාලය සින්දු වන්නම/ තිසරාවන්නම නර්තනය කරමු. | 05 | 14 |
| 6.2 | දේශීය නර්තනයේ ඓතිහාසික තොරතුරු විමසමු. | 10 | 110 |
| 5.3 | උඩැක්කි හා පන්තේරු කවි ගයමු. | 02 | 102 |
| 1.5 | කොතල පදය (උඩරට නර්තන සම්ප්‍රදාය)/<br>කොතල පදය (පහතරට නර්තන සම්ප්‍රදාය)/<br>කෙණ්ඩි පාලිය (සබරගමු නර්තන සම්ප්‍රදාය) | 12 | 30<br>32<br>34 |
| 1.7 | මංගලම්/ශුද්ධ මාත්‍රය/ මුල් මාත්‍රය නර්තනය කරමු. (වෙනත් නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තනය) | 15 | 50 |
| 2.1 | රස භාව පිළිබඳ උගනිමු. | 05 | 52 |
| 2.3 | දේශීය තාල විකාශය විග්‍රහ කරමු. | 07 | 58 |
| 4.1 | සිද්ධියක් ඇසුරින් චරිත නිරූපණය කරමු. | 08 | 91 |
| 6.4.2 | කිරිමඩුව පිළිබඳ තොරතුරු විමසමු. | 06 | 115 |
| 5.4 | පතල්, ටීකා, නෙළුම්, ප්‍රශස්ති හා හටන් කවි ගායනය කරමු. | 04 | 104 |
| 8.2 | විවිධ නාට්‍ය ශෛලීවල නර්තනය භාවිත කර ඇති ආකාරය විමසමු. | 06 | 133 |
| 7.1 | ගැමි නැටුම් පිළිබඳ විමසමු. | 08 | 120 |
| 4.3 | සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන රංග ආභරණයක් සකස් කරමු. | 10 | 93 |
| 2.5 | වන්නම් / මංගලම් / මුල් මාත්‍රය / ශුද්ධ තාලය /ග්‍රහ පන්ති කවි ප්‍රස්තාර කරමු. | 08 | 63 |

## තෙවන වාරය

| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | කාලච්ඡේද සංඛ්‍යාව | පිටු අංකය |
|---|---|---|---|
| 6.4.4 | බලි ශාන්තිකර්මය පිළිබඳ විමසමු. | 06 | 119 |
| 5.2 | නර්තනයට පෙර ගයමු. | 02 | 100 |
| 6.3 | දේශීය වන්නම්වල (උඩරට, පහතරට, සබරගමු) ප්‍රභවය හා විකාශය විමසමු. | 08 | 111 |
| 1.3 | මයුරා/නළු ගීතිකා තාලය සින්දු වන්නම /නාග ගජගා වන්නම නර්තනය කරමු. | 05 | 14 |
| 2.2 | රීරි යකා හා ජස, මුදලි, නොංචි යන චරිත නිරූපණය කරමු. | 10 | 54 |
| 7.2 | කොහොඹා කංකාරියේ උෟරා යක්කම, රට යකුමේ එන නානුමුරය, පහන් මඩුවේ පොත්කඩේ යක්කම විචාරය කර රස විඳිමු. | 08 | 121 |
| 3.3 | වන්නම් ගයමින් බෙර වාදනය කරමු. | 10 | 87 |
| 8.3 | නර්තන කලාව හා චිත්‍ර කලාව අතර සහසම්බන්ධතාව විමසමු. | 06 | 134 |
| 6.4.3 | රටයකුම ශාන්තිකර්මය පිළිබඳ තොරතුරු විමසමින් අගයමු. | 06 | 117 |
| 7.4 | රූපවාහිනී නර්තන වැඩසටහන් විචාරයට ලක් කරමු. | 06 | 130 |
| 7.3 | භරතීය සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන්ගේ තොරතුරු විමසමු. | 08 | 129 |
| 4.4 | නිර්මාණාත්මක රංග ආභරණයක් සකස් කරමු. | 10 | 95 |
| 7.5 | බැරිසිල්/පටාචාරා කලාකෘති විචාරයට ලක් කරමු. | 10 | 131 |
| 2.4 | ශ්‍රී ලාංකේය නර්තනය හා සබැඳි තාල හා හින්දුස්තානි, කර්ණාට තාල පිළිබඳ විමසමු. | 10 | 60 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : නිවැරදි අංගහාර අනුගමනය කරමින් මූලික සරඹ පද නර්තනය කරයි.

**ක්‍රියාකාරකම 1.1.1** : පා සරඹ/මණ්ඩි පද නර්තනය කරමු.

**කාලච්ඡේද** : 06

**ඉගෙනුම් පල** :

- සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව තාල තබමින් පා සරඹ/මණ්ඩි පද නිවැරදි ව කියයි.
- සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව පා සරඹ/මණ්ඩි පද නර්තනය කරයි.
- තාලම් පට වාදනය කරමින් සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව පා සරඹ/මණ්ඩි පද නර්තනය කරයි.
- මූලික අංගහාර ප්‍රදර්ශනය කරමින් පා සරඹ/මණ්ඩි පද හා හමාර පදය නර්තනය කරයි.
- ඒකල ව හා සාමූහික ව පා සරඹ/මණ්ඩි පද නර්තනය කර හමාර පදය ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි. (ජාතික අධ්‍යාපන ආයතනයේ නිෂ්පාදිත)

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

නර්තන විෂයයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දී සිසුන් උගත් පා සරඹ මණ්ඩි පද ඉදිරිපත් කිරීමට සලස්වා හොඳින් නිරීක්ෂණය කරන්න. සිසු සිසුවියන්ගේ හැකියා මට්ටම් හඳුනාගෙන, නර්තනයේ යෙදීමට, නිවැරදි ව පද උච්චාරණය කිරීමට හා නිවැරදි වූ සාම්ප්‍රදායික අංගහාර හා චලන අනුගමනය කරමින් සාමූහික ව හා ඒකල ව නර්තනයේ යෙදීමට ක්‍රියාකාරකම සැලසුම් කළ යුතු ය. වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව සලකා බලමින් සතතාභ්‍යාසයේ වැදගත්කම සාකච්ඡා කර අභ්‍යාසයේ යෙදීමට උපදෙස් ලබා දෙන්න. මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කරනුයේ නිවැරදි අංගහාර අනුගමනය කරමින් පා සරඹ හා මණ්ඩි පද නර්තනය කිරීම යි.

**විෂය අන්තර්ගතය**

## උඩරට නර්තන සම්ප්‍රදායය

### පා සරඹ

| **සරඹ නාමය** | | **සරඹ පදය** |
|---|---|---|
| 01. අඩිය | : | තෙයි. |
| 02. දෑඩිය | : | තෙයි කිත තෙයි තාම්. |
| 03. තුන් අඩිය | : | තෙයි කිත තෙයි කිත තෙයි කිත තෙයි තාම්. |
| 04. සිව් අඩිය | : | තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්. |
| 05. දෑල අඩිය | : | තේ යි ති තා තෙයි. |
| 06. පසු පෙර අඩිය | : | තා තෙයියත් තා තෙයියත් තා තෙයියත් තා තෙයි. |
| 07. නුහුරු අඩිය | : | තා තෙයි තා තෙයියත් තාම්. |

(තා) පූර්ණ පාදය තැබීමේ ක්‍රමයක් ද ඇත.

(තෙයි) ඇඟිලිවර තැබීම.

දෘශ්‍ය සංයුක්ත තැටියේ මුලින්ම ඇඟිලිවර තබයි. ක්‍රම දෙකට ම අභ්‍යාස කළ හැකි ය.

| | | |
|---|---|---|
| 08. කරණම් අඩිය | : | තෙයියත් තෙයියත් තෙයියත් තාම්<br>තේයි තත්තක තෙයියත් තාම්. |
| 09. දෙපැති අඩිය | : | තේයි තත්තක තෙයි තෙයි තත්තක<br>තේයි තත්තක තෙයියත් තාම්. |
| 10. තුන්පැති අඩිය | : | තෙයියත් තෙයිතා තිත් තෙයි තත් තා. |
| 11. චක්‍ර අඩිය | : | තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්. |
| 12. සුරල් අඩිය | : | තෙයි තක තෙයි තක තෙයි තක තෙයි |
| හමාර කිරීමේ පදය | : | තෙයියත් තෙයියත් තෙයියත් තාම්<br>තේයි තාම්<br>තෙයි තෙයි තත්තත් තා. |

## පහතරට නර්තන සම්ප්‍රදායය

### පා සරඹ

| | | | |
|---|---|---|---|
| 01. | පදය | : | තෙයියත් තෙයි |
| 02. | පදය | : | තෙයිකිට තෙයි තා |
| 03. | පදය | : | තෙයි කිට තෙයි දොම් |
| 04. | පදය | : | තෙයි කිට/// තෙයි දොම් |
| 05. | පදය | : | තෙයි කිට තෙයි තා//<br>තෙයි කිට///තෙයි දොම් |
| 06. | පදය | : | තෙයි තෙයි තා// තෙයි කිට තා// |
| 07. | පදය | : | තෙයියත් තා කිට තෙයියත් දොම් ගත |
| 08. | පදය | : | තෙයියත් තා කිට තෙයියත් ගහිති ගතම් |
| 09. | පදය | : | තෙයියත් තරිකිට තෙයියත් දිරිකිට |
| 10. | පදය | : | තෙයියත් තරිකිට තෙයියත් දිගතම් |
| 11. | පදය | : | තෙයියත් කිටිතක ගුහිති ගදිරිකිට |
| 12. | පදය | : | තෙයි ගදිතගත තත් දිත් තොං නං |

| | | |
|---|---|---|
| හමාර පදය | : | තෙයි තෙයි තා කිට තෙයියත් තා. |

# සබරගමු නර්තන සම්ප්‍රදායය

## මණ්ඩි පද

01. පදය : තෙයි

02. පදය : තෙයි තක

03. පදය : තෙයි තක///තෙයි

04. පදය : තෙයි තෙයියත් දොම්, තෙයිතක තෙයියත් දොම්

05. පදය : තෙයි තෙයි තත්තක තෙයිතක තෙයිතක

06. පදය : තෙයිත තෙහා තෙහා තෙහා//

07. පදය : තෙයි ගත කුඳ තේයි තකට // තෙයිගත කුඳ ///තේයි තකට

08. පදය : තෙයියත් තා දොම්

09. පදය : තා තරිකිට තා තෙයි // තා තෙයි තා තෙයි

10.පදය : තත් ජිජිගත, තක ජිජිගත,තත් ජිත්තත් කුන්දත් තක ජිත්තත් කුංදත්

11. පදය : කිටි තරිකිට ගතත් // කිටි තරිකිට /// ගතත්

12. පදය : දිරිකිට තරිකිට ගත කුකුඳත් //දිරිකිට තරිකිට ගත ///
කු - කු - ඳත්///

**හමාර පදය** : තෙයා තෙයා තෙයා තෙයා තෙයා තෙයියත් තාම් තේයි තාම්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- සිසු-සිසුවියන් උගත් පා සරඹ/ මණ්ඩිපද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව නර්තනය කර හමාර පද නිවැරදි ව අභ්‍යාස කිරීමට යොමු කරවන්න.
- තාල තබමින් පද නිවැරදි ව උච්චාරණය කිරීමට මඟ පෙන්වන්න.
- සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුගමනය කරමින් ඒකල ව නිවැරදි ව අංගහාර අනුගමනය කරමින් පා සරඹ/මණ්ඩි පද නර්තනය ඉදිරිපත් කිරිමට අවස්ථාව සලස්වන්න. අවශ්‍ය ප්‍රවීණතා මට්ටමට ළඟා වීමට මඟ පෙන්වන්න.
- තාලම්පට වාදනයට අනුව අභ්‍යාසයේ යොදවන්න. කණ්ඩායම් හා ඒකල ව සරඹ නර්තනය කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අභ්‍යාස ලබා දෙන්න.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසු ශක්‍යතා සැලකිල්ලට ගෙන නිවැරදි පද උච්චාරණය, ලය ගුණ කිරීම හා නිවැරදි අංගහාර අනුගමනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සැලකිලිමත් වන්න. සිසුන් අභ්‍යාසයේ යෙදෙන විට ඒ පිළිබඳ තක්සේරු කර ඇගයීමට පෙර අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

**ඇගයීම** :

- සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව ඔබ කැමති පා සරඹ /මණ්ඩි පද දෙකක් තාල තබා කියන්න.
- පා සරඹ/මණ්ඩි පද දෙකක් සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව නටා හමාර පදය ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : නිවැරදි අංගහාර අනුගමනය කරමින් මූලික සරඹ පද නර්තනය කරයි.

**ක්‍රියාකාරකම 1.1.2** : ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද / කස්තිරම්, ඉරට්ටි, හමාර පද සමඟ නර්තනය කරමු.

**කාලච්ඡේද** : 08

**ඉගෙනුම් පල** :

- ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව තාල තබමින් කියයි.
- බෙර / දවුල් වාදනයට අනුව සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව අදාළ පද නර්තනය කරයි.
- නියමිත අංගහාර ප්‍රදර්ශනය කරමින් ගොඩ සරඹ / ඉලංගම් සරඹ/ දොඹින පද කස්තිරම්/ඉරට්ටි/ හමාර පද සමඟ ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර/දවුල්/තාලම්පට හා සරඹ පද, කස්තිරම්/ඉරට්ටි, හමාර පදය ලියන ලද ප්‍රස්තාර සටහන.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය :** ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

නර්තන විෂය 6 - 11 ශ්‍රේණි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දී සිසුන් උගත් ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද කස්තිරම්, ඉරට්ටි, හමාර පද ඉදිරිපත් කිරීමට සලස්වා සිසු හැකියා /නොහැකියා හොඳින් නිරීක්ෂණය කරන්න. පන්ති කාමරයේ සියලු ම සිසුන්ට සාමූහික ව හා ඒකල ව නර්තනය කිරීමේ ශක්‍යතාව වර්ධනය කිරීමේ දී නිවැරදි අංගහාර, චලන හා තාලය ප්‍රගුණ කිරීම වැනි මූලික හැකියාවන් වඩාත් නිවැරදි ව ඉදිරිපත් කිරීමේ ශක්‍යතාව වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා වේ. වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව සලකා බලමින් සතතාභ්‍යාසයේ වැදගත්කම සාකච්ඡා කර සැලසුම ක්‍රියාත්මක කරන්න.

විෂය අන්තර්ගතය

## උඩරට නර්තන සම්ප්‍රදායය

සරඹ නාමය : **පදය හා කස්තිරම**

01. අඩිය : දොම් කිට කිට දොම්.
    කස්තිරම : තත් ජිත් තොං නං තා.

02. දෑඩිය : දොම් කිට කිට දොම්.
    කස්තිරම : තත් ජිත් තක ජිත් තත් ජිත් තොං නං තා.

03. තුන් අඩිය : දොම් කිට දොම් කිට දොම් කිට කිට දොම්.
    කස්තිරම : ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම්
    තරිකිට ජිත් තරිකිට දොම්කිට තා.

| | | |
|---|---|---|
| 04. සිවු අඩිය | : | දොම් කිට දොම් කිට දොම් කිට කිට දොම්. |
| කස්තිරම | : | ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් |
| | | ගජිං ජින්ත කුඳ ගජිතකු ජිත්තම් |
| | | තරිකිට ජිත් තරිකිට දොම්කිට තා. |
| 05. ඇල සරඹය | : | දොම් කිට කිට දොම් |
| කස්තිරම | : | රුංතක ජිංතක තරිකිට කුංදත් |
| | | තාග් ගජිංගත තරිකිට කුංදත් |
| | | රුංතක ජිංතක තරිකිට කුංදත් තා. |
| 06. දෑල සරඹය | : | දොම් කිට කිට දොම් |
| කස්තිරම | : | රුංතක ජිංතක තරිකිට කුංදත් /// |
| | | තාග් ගජිංතක තරිකිට කුංදත් // |
| | | රුංතක ජිංතක තරිකිට කුංදත් තා. |
| 07. අංගහාර සරඹය | : | දොම් කිට කිට දොම් |
| කස්තිරම | : | රුංතක ජිංතක තරිකිට කුංදත් /// |
| | | තාග් ගජිංතක තරිකිට කුංදත් // |
| | | රුංතක ජිං ජිං තකු තක ජිං ජිං |
| | | රුංතක ජිංතක තරිකිට කුංදත් තා. |
| 08. අර්ධ චක්‍ර සරඹය | : | දොම් කිට කිට දොම් |
| කස්තිරම | : | රුංතක ජිංතක තරිකිට කුංදත් /// |
| | | තාග් ගජිංගත තරිකිට කුංදත් // |
| | | රුංතක ජිං ජිං තකු තක ජිං ජිං |
| | | රුංතක ජිංතක තරිකිට කුඳ කුඳ |
| | | තාග් ගජිංතක තරිකිට කුංදත් |
| | | රුංතක ජිංතක තරිකිට කුංදත් තා. |
| 09. දෑත පෑගීමේ සරඹය | : | දොම්කිට දොම්කිට දොම්කිට කිට දොම් |
| කස්තිරම | : | තකට තකට තක තරිකිට කුංදත්// |
| | | තකට තකට තක තරිකිට කුංදත් ගජිං |
| කස්තිරම වාදන විධි ක්‍රමය | : | තකට කුඳට තකට කුඳට කුංදත්// |
| | | තකට කුඳට තකට කුඳට කුංදත් ගජිං |
| 10. බඹර සරඹය | : | දොම්කිට දොම්කිට දොම්කිට කිට දොම් |
| කස්තිරම | : | තකට තකට තක තරිකිට කුංදත් තා තක ජිජි කුඳ // |
| | | තකට තකට තක තරිකිට කුංදත් // |
| | | තකට තකට තක තරිකිට කුංදත් තා. |

කස්තිරම වාදන විධි ක්‍රමය : තකට කුඳට තකට කුඳට
කුංදත් තා තක ජිජිකුඳ//
තකට කුඳට තකට කුඳට කුංදත්//
තකට කුඳට තකට කුඳට කුංදත් තා

11. පැනීම් සරඹය : දොම් කිට කිට දොම්
කස්තිරම : තක්කඩ කඩතක ජිජි කුඳ
ජික්කඩ කඩතක ජිජි කුඳ
තොංගඩ කඩතක ජිජි කුඳ
නංගඩ කඩතක ජිජි කුඳ
තක්කඩ කඩතක - ජික්කඩ කඩතක
තොංගඩ කඩතක - නංගඩ කඩතක
තක්කඩ ජික්කඩ - තොංගඩ නංගඩ
තත් ජිත් තොං නං තා.

12. චන්ද්‍රිකා සරඹය : දොම්කිට දොම්කිට දොම්කිට කිට දොම්.
කස්තිරම : තත් තත් තක්කඩ කඩතක
ජිත් ජිත් ජික්කඩ කඩතක
තොං තොං තොංකඩ කඩතක
නං නං නංකඩ කඩතක
තත් තක්කඩ කඩතක - ජිත් ජික්කඩ කඩතක
තොං තොංකඩ කඩතක - නං නංකඩ කඩතක
තක්කඩ කඩතක - ජික්කඩ කඩතක
තොංකඩ කඩතක - නංකඩ කඩතක
තක්කඩ - ජික්කඩ - තොංකඩ - නංකඩ
තත් ජිත් තකජිත් තත් ජිත්
තොං නං තා.

## පහතරට නර්තන සම්ප්‍රදායය

### ඉලංගම් සරඹ

01. පදය : තෙයි....

ඉරට්ටිය : කිට තා

02. පදය : දිත් තා

ඉරට්ටිය : දිත ගුඳ තා

03. පදය : ගුංද ගුඳම් ගත් දිමිගත් දූහිං (දිතගත)

ඉරට්ටිය : දොංත ගතම් ගුම් දිමිගත ගත්තත් ගත්දිත ගත ගත් දිමිගත ගුංදත් තා.

04. පදය : රෙගුඳක තකුදොම්

ඉරට්ටිය : රෙගුඳග දිතගත ගුඳිතක රෙගුඳකු දොම්.

05. පදය : ගුඳිත ගුඳම් ගත  ගදිත ගතම් ගුඳ

ඉරට්ටිය : ගුඳිත ගුඳිත්තම් - ගදිත ගදිත්තම් - දොංත ගදිතගත ගදිගත ගුඳිගුඳ තා

06. පදය : ගදිගත ගුඳිගුඳ රෙගතත් දිගතම් (දිතගත)

ඉරට්ටිය : ගදිගත ගුඳගත් දිගතම් - දිගතම් - ගුඳිගත ගුඳගත් දිගතම් - දිගතම්

ගදිගත ගුඳගත් - ගුඳිගත ගුඳගත් ගදිගත ගුඳිගුඳ - රෙගතත් දිගතම්

07. පදය : දොංත ගදිතගත ගත් දූහිම්

ඉරට්ටිය : දොංතකු// දොංත ගදිත ගත ගතගුගුඳිතගත දොංතත් ගුහිති ගදිරිකිට තා.

08. පදය : ගුං දූහිම්// ගත් තත් දොං දිතගත

ඉරට්ටිය : දොංත ගදිතගත, ගත්ත ගදිත ගත ගත් දූහිම්, ගුම් දූහිම් - දූහිම් දූහිම් දිතගත

ගුඳිතක රෙගතකු දොම්

09. පදය : තර්... රි කඩ - දිර් රි කඩ

ඉරට්ටිය තත් තරි ගුඳගත, ගදිගත දිත්කුම්, තත්තරි දිත්තරි දොම්තරි කුරුඹිත් තරිදිරිකඩ ගුඳ තා.

10. පදය : ගුහිති ගදිරිකිට ගුඳ ගුඳ ගුම් දිත් තා (දිතගත)

ගහිති ගදිරිකිට ගත ගත ගත් දිත් තා

ඉරට්ටිය : ගුහිති ගදිරිකිට ගුඳ ගුඳ ගුඳිත ගුඳිත් තත්//

ගුහිති ගදිරිකිට ගුඳගත්// ගුහිති ගදිරිකිට ගු-ඳ-ගත් දොම් දිත් තා.

11. පදය : ර්... රිම් දූහිම් රෙගදිත ගත ගුඳ ගත් තම්.

ඉරට්ටිය : රිම් ගත ගුඳ ගත්තම්//

ගත් දූහිම් ගුම් දූහිම්

ගුඳිත ගුඳම් - ගදිත ගතම්

දොම්ත ගතම් ගත ගුඳි තක දෙගුඳක දූහිම්

12. පදය : ගුඳිත ගුම් දූහිං (දිතගත) ගදිතකු දොම්.

ර්....රිම්ගත ගදිගත ගත්ත ගදිතගත ගුඳිතකු දිගුඳකු දොම්.

ඉරට්ටිය : ගුඳිත ගදිත ගත ගත් දූහිම් ගුම් දූහිම් (දොංතකු)// දොං

තරිකිට තත් දිරිකිට දිත් ගුඳිත ගතත් දොම් ගදිත ගතත් දොම් දොංත ගදිත ගත

ගුඳිතක දිගුඳකු දොම්.

## සබරගමු නර්තන සම්ප්‍රදායය

### දොඹින පද

01. පදය : තෙයි
02. පදය : තෙයි තක.
03. පදය : තෙයි තෙයි තෙයිත, තෙයා තෙයා තෙයි - ත.
04. පදය : තෙයි ගත කුඳ තේයි තකට// තෙයි ගත කුඳ/// තේයි තකට.
05. පදය : තෙයියත් තත්තක තෙයි තෙයි තත්තක තෙයි තෙයි තත්තක තෙයියත් තාම්.
06. පදය : තහර්රුඳ රුඳ/// තහර් රුඳා.
07. පදය : තෙයියත් තා දොම්.
08. පදය : තෙයි දොම් - තෙයියත්දොම්.
09. පදය : කරතක් තක්කිට - කරතක තක්කිට - කරතක් තක්කිට - කරතත් තා.
10. පදය : කිත්තක් කිත්තක් ජෙජ් ජෙංතා - තක්කඩ තරිකිට//ජෙජ් ජෙං තා.
11. පදය : තරිකිට දිරිකිට, දිරිකිට තරිකිට.
12. පදය : තරිකිට දිරිකිට දිරිකිට තරිකිට, තරිකුන් දිරිකුන් දිරිකිට තරිකිට .

**හමාර පදය** : තෙයා /////

තෙයියත් තාම් - තේයි තාම්.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- බෙර වාදනයට අනුව ඒකල ව හා සාමූහික ව ගොඩ සරඹ/ඉලංගම් සරඹ / දොඹින පද/නිවැරදි අංගහාර සහිත ව සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව නර්තනය කර, කස්තිරම්/ඉරට්ටි හමාර පද නිවැරදි ව ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.
- බෙර වාදනයට අනුව අභ්‍යාස කරවන්න. සියලු ම සිසු සිසුවියන්ට කණ්ඩායමක් ලෙස හා තනි තනි ව සරඹ නර්තනය කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අභ්‍යාසය ලබා දෙන්න.

**ඇගයීම** :

- සමගුණ, දෙගුණ, සිව්ගුණ අනුව ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද 12 නර්තනය කර කස්තිරම්/ ඉරට්ටි/හමාර පද ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : නර්තන ශක්‍යතා ප්‍රදර්ශනය කිරීමට විවිධ පැනීම් හා කැරකීම් භාවිත කරයි.

**ක්‍රියාකාරකම 1.2** : ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි පැනීම් හා කැරකීම් ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද** : 04

**ඉගෙනුම් ඵල** :

- සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි පැනීම් හා කැරකීම් නම් කරයි.
- පැනීම්වල දී හා කැරකීම්වල දී අනුගමනය කළ යුතු විධි ක්‍රම පිළිබඳ විමසයි.
- සාම්ප්‍රදායික නර්තන හා සබැඳි පැනීම්වල හා කැරකීම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- නිවැරදි විධි ක්‍රම අනුගමනය කරමින් පැනීම් හා කැරකීම් ප්‍රදර්ශනය කරයි.
- නර්තන නිර්මාණකරණයේ දී පැනීම් හා කැරකීම් භාවිතයට ගත හැකි අවස්ථා පිළිබඳ අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර, බෙර.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, අත්හදා බැලීම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

අ.පො.ස. (උ.පෙළ) නර්තන ඉගෙන ගන්නා සිසුන්ගේ ප්‍රායෝගික ශක්‍යතාව ප්‍රවර්ධනයට සාම්ප්‍රදායික පැනීම් හා කැරකීම් අභ්‍යාස කිරීම හා භාවිතයට ගැනීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ.

උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායයවලට ආවේණික වූ (අනන්‍යතා ප්‍රදර්ශනය වන) පැනීම් හා කැරකීම් දැකිය හැකි ය. පහතරට සම්ප්‍රදායයේ දී මෙම පැනීම් නාමික ව හඳුන්වා ඇත.( පතහවිස්ස, මාලක්කම්, බඹර වළල්ල) සාම්ප්‍රදායික භේදයකින් තොර ව මේ පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාසයක් ලබා දීම ඉතා අවශ්‍ය වේ. මෙම ශක්‍යතා වර්ධනය වූ කල විවිධ අවස්ථාවල දී හා නිර්මාණකරණයේ දීත් පැනීම් හා කැරකීම් භාවිතයට ගැනීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන් දැනුම්වත් කිරීම ද අවශ්‍ය වේ.



**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- දේශීය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි පැනීම් හා කැරකීම් ක්‍රම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න. අදාළ ඡායාරූප, තැටි ප්‍රදර්ශනය කරන්න.
- සුවිශේෂ පැනීම්වලට හා කැරකීම්වලට අදාළ සරල අභ්‍යාස කිහිපයක නිරත කරවන්න.
- එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.
    - ශරීර නම්‍යතාව
    - පාද හැසිරවීමේ විධි ක්‍රම
    - කැරකීමේ හා පැනීම්වල නිවැරදි ශිල්ප ක්‍රම
    - සමබරතාව
    - අවකාශ භාවිතය
- පැනීම් හා කැරකීම් හඳුන්වා දෙමින් අභ්‍යාසවල නිරත කරවන්න.
- අභ්‍යාස කිරීමේ වැදගත්කම හා අනුගමනය කළ යුතු නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරවන්න.

**ඇගයීම** :

- පැනීම්වල දී හා කැරකීම්වල දී අනුගමනය කළ යුතු විධික්‍රම ඉදිරිපත් කරන්න.
- සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි පැනීම් හා කැරකීම් එක බැගින් ඉදිරිපත් කරන්න.
- නිවැරදි විධි ක්‍රම අනුගමනය කරමින් පැනීම් හා කැරකීම් එක බැගින් ප්‍රදර්ශනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි.

**ක්‍රියාකාරකම 1.3** : මුසලඩි, ගණපති, මයුරා වන්නම් නර්තනය කරමු.

**කාලච්ඡේද** : 05

**ඉගෙනුම් පල** :

- අදාළ වන්නම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- මුසලඩි, ගණපති, මයුරා යන වන්නම්වල තාල රූප නම් කරයි.
- අදාළ වන්නම්වලට අයත් පද තාල තබමින් කියයි.
- තානම හා කවි ගායනයට අදාළ ව හස්ත චලන නිවැරදි ව ප්‍රදර්ශනය කරයි.
- වන්නමට අදාළ පද, කස්තිරම්, සීරුමාරු, අඩව් නියමිත අංගහාර අනුව නර්තනය කරයි.
- බෙර වාදනයට අනුව උගත් පද කොටස් නර්තනය කරයි.
- ගායනය කරමින් බෙර වාදනය අනුව වන්නම් ඉදිරිපත් කරයි.
- උගත් වන්නම් සාමූහික ව හා ඒකල ව ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ගැටබෙරය, තාලම්පට, ශ්‍රව්‍ය පට, දෘශ්‍ය සංයුක්ත තැටි, වන්නම් ලියන ලද සටහන්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, අනුකරණ ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

උඩරට වන්නම් නර්තනයේ දී මුල් තානමට අනුව නිවැරදි ව හස්ත චලන දැක්වීම අනුගමනය කිරීම වැදගත් වේ. මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ගායනය කරමින් සම්පූර්ණයෙන් ම වන්නම ඉදිරිපත් කිරීමේ ශක්‍යතාව වර්ධනය විය යුතු ය. නියමිත නාද රටාවට ගයමින් තාල තැබීමේ හැකියාව, නර්තනයේ දී නියමිත අංගහාර අනුගමනය කිරීම පිළිබඳ ව අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

## මුසලඩි වන්නම

**මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) සහ මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**බෙර පදය** : **මාත්‍රා** 3 + 4 - දෝං ජිං ජිං තකට දොංතක

මාත්‍රා 3 - ජිං කඩතක ජිං කුකුතක

**තානම** : තා නත්ත තනෙ නත්ත තානම් තම්ද නා නත්ත තනෙ නත්ත තානම්

තනත් තනෙන තතන තනෙන තානෙන තම් දාන තනෙන//

තා නත්ත තනෙ නත්ත තානම් තම්ද නා නත්ත තනෙ නත්ත තානම්

**කවිය** : වන පැත්ත බිය පත්ව සයනම්//
දුවටත් යනෙන විටත් දුවන පිටත් පොටගසා පනිමින//
නැත නාඩි ඉඳ වාඩි වෙව්ලුම්//

නොනැවත යනු නැත එතැනින්//
හිරුත් අවර ගිරත් පැමිණි කලත් වසන තැනින් දුවන//
පැන ආඩි පත්රාසි බුදිමින්//
සිරි ගත්ත සඳු පත්ව මුදුනින්//
විටත් ඔවුන තුටත් සිතින මහත් සමගියෙන් දුව පැන//
වුණු දැඩි වන වාඩි ලන්නම්//

මේ ඇත්තමයි සත්ත කියනෙම්//
ගමනක් යන විලසක් ගෙන ඉසිඳුන් දෙව් කළ සතොසින//
කර දැඩි මුසලඩි වන්නම්//

**කස්තිරම** : රැඳඟ ජිත්තක තකට කුංදත් - තග්ගජිත්තක තකට කුංදත්
රැඳඟ ජිං ජිං, රැඳඟ ජිං ජිං - රැඳඟ ජිත්තක තකට කුඳ කුඳ
තග්ග ජිත්තක තකට කුංදත්
ජිං කඩතක ජිං කුකුතක - ජිං කඩතක ජිං කුකුතක//
ජිං කඩතක ජිං කුකුතක//
රැඳඟ ජිත්තක තකට කුඳ කුඳ තග් ගජිත්තක තකට කුංදත්
රැඳඟ ජිත්තක තකට කුංදත් දෝං තා.

සීරුමාරුව : තකුඳ තකුතක තකට කුංදත්
තග් ගජිත්තක තකට කුංදත්
තකුඳ තකුතක තකට කුංදත්
දෝං තා

අඩව්ව : තාකු තක්කුං තරිකිට තකුඳ තත් ජෙං -
තත් ජෙං තජෙං තත් ජෙං
ජිකු ජික් කුං තරිකිට ජිකුඳ තත් ජෙං -
තත් ජෙං තජෙං තත් ජෙං
තාකු තක්කුං තරිකිට තකුඳ තත් ජෙං -
ජිකු ජික්කුං තරිකිට ජිකුඳ තත් ජෙං -
තාකු තක්කුං තරිකිට ජිකු ජික් කුං තරිකිට
තකුඳ තත් ජෙං - තත් ජෙං
තජෙං තත් ජෙං - ජෙං තා
ජෙතා ජෙතකුඳ ජෙංත තා

## ගණපති වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**බෙර පදය** : ජිංග තගොගො

**තානම** : තම් ද නාම් දන තන - තන තනාම් දන තන
නා තනාම් දන තම් - දන තා - නා

**කවිය** : යුත් සිරින් බබළන ඇත් හිසින් සසොබන
වෙත් දළින් අඩ දූන ගනු සුදනා
රත් පියුම් වැනි මුක යුත් සවන් ලෙළ දෙන
නෙත් අඳුන් නිල්මිණි කුඹු රමනා
අත් උරින් පහතින වෙත් සුරන් සිරු රින
යුත් නිතින් දෙවගන දෙදෙනෙකිනා
ගත් නැණින් යුතු සුරිඳෙක් බැවින් ඉසි දූන
වෙත් මෙවන් ගණපති වන්නමිනා

**කස්තිරම** : කුඳගත ගත ගත කුකුඳත්/// තකුඳ ගජිං තකුඳ ගජිං
තකුතක තරිකිට කුඳ කුඳ ගජිංත ගජ්ජිත් කුංදත් තකුතක
තරිකිට කුංදත් තා.

**සීරුමාරුව** : තකට දො දොං තා - කඩතක තරිකිට තකට දො දොං තා.

**අඩව්ව** : තාත් තකට තරිකිට දොද් දොං තරිකිට දොද් දොං ගත්තත් තරිකිට දොද් දොං
ගත් තකුතක ජිත් තකුතක
තරිකිට දොද් දොං ගත්තත් තරිකිට දොද් දොං

## මයුරා වන්නම

**මාත්‍රා 2 + 2 + 3 (දෙසුළු මැදුම් තුන්තිත) තාලය**

**බෙර පදය** : තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ගත් තත් ජිං තරි කිට

**තානම** : තනෙන තන තන තනෙන තන තන තනෙන තන තනෙනා
තිනෙන තින තින තිනෙන තින තින තිනෙන තින තිනෙනා

**කවිය** : සතර සිව්වර බලැති දිඩතර සුරිඳු නේ කදි රා
කතර ගම පුර සුරිඳු වාහන කරති රණ මොන රා
පතර තෙද ගම්බිර සතට සෙත වේල අවිය ද රා
නොහැර ඉසිවර යෙදුව මෙ අයුර වර්ණ කර මයු රා

**කස්තිරම** : තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ජිං//
තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිංගත
කුංතක ජිං කුඳ ගජ් ජිංගත තරිකිට කුංදත් තහර් ජිත්
ගත් තත් තකට තරිකිට කුංදත් තා.

**සීරුමාරුව** : රොමිත රොමිතත් රොමිත රොමිතකු දා - තක්කඩ
තකට කුංදත් රොමිත රොමිතත් රොමිත රොමිතකු දා

අඩව්ව : තහර්ජිංගත කුංතක ජිංගත (ජිංකුද) ගජ්ජිංගත තරිකිට කුංදත් තහර් ජිත්///
තරිකිට කුංදත් තහර්ජිත්///
කිත් තත් කිතක තහර් ජිත් තහර් ජිත් තහර් ජිත්///
තහර්ජිත් තහර්ජිත් තහර්ජිත් //
තහර්ජිත් තහර්ජිත් තහර් ජිංගත
කුංතක ජිං කුද ගජ් ජිංගත තරිකිට කුංදත් තහර් ජිත්
ගත් තත් තකට තරිකිට කුංදත් තා.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- අදාළ වන්නම්වල පසුබිම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ගායනය ක්‍රියාකාරකමෙහි උගත් වන්නම් ගායනය කරමින් තාල තබා පද කීමට යොමු කරවන්න. අවශ්‍ය ප්‍රවීණතා මට්ටමට ළඟා වී නැතිනම් මඟ පෙන්වන්න.
- මුල් තානමට හස්ත චලන නියමිත අංගහාර හා චලන භාවිත කරන ආකාරය හඳුන්වා දී අභ්‍යාසයේ යොදවන්න.
- තානම අනුව අදාළ පද නර්තනයට යොමු කරවන්න.
- අදාළ කස්තිරම්, සීරුමාරු, අඩවු නර්තනය කරවන්න.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් නර්තනය කිරීමට යොමු කරවන්න.
- බෙර වාදනය අනුව ගායනය කරමින් වන්නම නර්තනය කරවන්න.
- බෙර වාදනය අනුව සාමූහික ව හා ඒකල ව වන්නම නර්තනයේ යෙදීමට අවස්ථාව සලසා සැලසුම ක්‍රියාත්මක කරන්න.

ඇගයීම :

- අදාළ වන්නමෙහි තාල රූපය නම් කරන්න.
- තාල තබමින් වන්නම ගායනය කරන්න.
- බෙර වාදනයට අනුව වන්නම නර්තනය ඉදිරිපත් කරන්න.

| | |
|---|---|
| **නිපුණතාව 01** | : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 1.3** | : සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි. |
| **ක්‍රියාකාරකම 1.3** | : ශුද්ධ තාලය, ලලිත රාග තාලය, නළු ගීතිකා තාලය, සින්දු වන්නම් නර්තනය කරමු. |
| **කාලච්ඡේද** | : 15 |
| **ඉගෙනුම් පල** | : |

- ශුද්ධ තාලය, ලලිත රාග තාලය, නළු ගීතිකා තාලය සින්දු වන්නම්වල තාල රූප නම් කරයි.
- අදාළ සින්දු වන්නම්වල බෙර පද හා ඉරට්ටි තාල තබමින් කියයි.
- අදාළ සින්දු වන්නම්වල තානම හා කවි ගායනය කරමින් උචිත පද නර්තනය කරයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් ඉරට්ටි නර්තනය කරයි.
- ඉගෙන ගන්නා ලද සින්දු වන්නම් ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය වන පරිදි සාමූහික ව ඉදිරිපත් කරයි.
- බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරමින් ඒකල ව නර්තනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : පහතරට බෙරය, තාලම් පට, වන්නම් ලියන ලද සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, අනුකරණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

පහතරට නර්තන සම්ප්‍රදායයට අදාළ සින්දු වන්නම්වල තානම හා කවියට පද නර්තනය කිරීම සාම්ප්‍රදායික අනන්‍යතාවකි. මෙහි දී අදාළ තාල රූපය හා නිවැරදි නාද රටා අනුව ගායනය කිරීම පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. නර්තන ඉදිරිපත් කරන අවස්ථාවල දී පද හා ඉරට්ටි නර්තනයේ දී ලය වේගයෙහි උචිත බව, සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි නිවැරදි අංගහාර භාවිත කරමින් නර්තනය කිරීම අපේක්ෂා කෙරේ.

### ශුද්ධ තාලය සින්දු වන්නම

**මාත්‍රා 2 + 2 + 3 (දෙසුළු මැදුම් තුන් තිත) තාලය**

**බෙර පදය** : දිත් තම් දිතකු දොම් දොම් තාම්

**තානම** : තෙන තෙන තෙන //තෙන තෙනිනා ආ . . .
නා තෙන තෙන - තෙන තෙන තෙන
තෙන තෙනිනා ආ . . .

කවිය : සිරි පිරි ගිරි මුදුනත සුර පුර ලෙසින
සිරිලක පවර දෙව් නුවරෙහි වෙසෙසවන
සිරි සඳ සමඟ සිරි සඳ සමගි ව වෙසෙන
සුරිඳුනි අසන් ම කියන බස් බැති පෙමින

ඉරට්ටිය : තත් ගුඳගත දිත් දිත් තෙයි
ගත ගුඳගත දිත් දිත් තෙයි
තත් ගුඳගත ගත ගුඳගත
ගුඳගත් ගුඳගත තත් ගුඳගත
දිත් දිත් තෙයි

## ලලිත රාග තාලය සින්දු වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**බෙර පදය** : ගදිත දොදොම් දොම් ගදිතම්

**තානම** : තෙනෙන තෙන තෙනම් තෙනෙනා
තෙන තෙනෙනම් තෙන තෙනෙනා

**කවිය** : වන්නි සයුරු සුපිපි තුරූ
සුවිරාජිත ගුණෙනි සුරූ
වන්නිල් පුල් තැනු අයුරූ
සුර රාජය ගුණ ගැඹුරූ

වන්නිති සිත සැඩ කුරිරූ
පිරු තේජස් දිගත පිරූ
වන්නිති සත වෙත අයුරූ
සුර රාජය කර ඉසුරූ

**ඉරට්ටිය** : ගත් තම් දොම් ත ගත් ගත
ගුගු දිත තරි තත් දිත් තොං නං දෙගතත්
ගති ගත ගත
ගත්ත දිත්ත ගත ගත් තත් දොම් තා

## නළු ගීතිකා තාලය සින්දු වන්නම

**මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය**

**බෙර පදය** : ගත්ත ගදිත ගුගුඳං ගදිත්තත්
රෙගතත් දිකුඳක දූහිං දිත ගත

**තානම** : තෙන තෙන තෙන තෙනෙනා
තෙනම් තෙන - තෙන තෙනා

**කවිය** : සේවිත පාද සරෝරුහ සන්ජිතයෙන් ඉතා
පූජිත තෝස දිගා සිරි දීමෙන් සන්තතා
චාරිත නාත ග්‍රහතෙයි පිරුසත විතතතා
පූජිත විෂ්ණු සුරාදිප රූප අලංකෘතා

ඉරට්ටිය : ගත්ත ගදිගත ගදිත ගුඳ ගුඳ
තත්ත දිත් - තත් - දිත් - තත් කිටි තක තරි කිට
තත් - ජෙං - තක - ජෙං -
ගුදිත්ත ගත ගති ගත ගුඳ ගුඳ
දොම් දිත ගත ගුදිතක දිකුදක දෑහිං

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- අදාළ වන්නමෙහි තාල රූපය පිළිබඳ හඳුන්වන්න.
- තාල තබමින් පද ඉරට්ටිය හා කවි කීමට යොමු කරවන්න.
- අදාළ සින්දු වන්නම් පද නර්තනයට යොමු කරවන්න.
- බෙර වාදනයට අනුව නර්තනයට මඟ පෙන්වන්න.
- ඉරට්ටිය කොටස් වශයෙන් අභ්‍යාස කරවන්න.
- බෙර වාදනයට අනුව ඉරට්ටිය ඉදිරිපත් කරවන්න.
- ගායනය, වාදනය අනුව වන්නම සම්පූර්ණයෙන්ම නර්තනයට යොමු කරවන්න.
- සාමූහික ව හා ඒකල ව සින්දු වන්නම ප්‍රදර්ශනය කිරීමට යොමු කරවන්න.

**ඇගයීම** :

- අදාළ සින්දු වන්නම්වල තාල රූප නම් කරන්න.
- අදාළ බෙර පද හා ඉරට්ටි තාල තබමින් කියන්න.
- තානම හා කවි ගායනය කරමින් උචිත පද නර්තනය කරන්න.
- නිවැරදි අංගහාර පවත්වා ගනිමින් අදාළ ඉරට්ටි නර්තනය කරන්න.
- බෙර වාදනයට අනුව අදාළ සින්දු වන්නම් ඒකල ව/සාමූහික ව සම්පූර්ණයෙන් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි.

**ක්‍රියාකාරකම 1.3** : කොවුලා, තිසරා, නාග ගජගා වන්නම් නර්තනය කරමු.

**කාලච්ඡේද** : 15

**ඉගෙනුම් පල** :

- අදාළ වන්නම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- කොවුලා, තිසරා, නාග ගජගා වන්නම්වල තාල රූප නම් කරයි.
- අදාළ වන්නම්වල දවුල් පද, කලාසම්, අඩවු තාල තබමින් කියයි.
- අදාළ වන්නම්වල කවි ගායනය කරමින් උචිත පද නර්තනයේ යෙදෙයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් කලාසම්, අඩවු නර්තනය කරයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රවර්ධනය සඳහා සබරගමු වන්නම් නර්තනයේ යෙදේ.
- ඉගෙන ගන්නා ලද වන්නම් නර්තනය සාමූහික ව ප්‍රදර්ශනය කරයි.
- ඉගෙන ගන්නා ලද වන්නම් ගායනය කරමින් දවුල් වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරමින් ඒකල ව නර්තනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : දවුල, තාලම්පට, වන්නම් ලියන ලද සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශනය ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, අනුකරණ ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

වන්නම් නර්තනයේ දී සෑම සිසුවකුට ම තනි ව ම ගායනය කරමින් වන්නම සම්පූර්ණයෙන් ම ඉදිරිපත් කිරීමේ ශක්‍යතාව වර්ධනය විය යුතු ය. මෙහි දී සාම්ප්‍රදායික නාද මාලා වන්නමට අදාළ කොටස් තාල තබමින් කීමේ හැකියාව, නිවැරදි අංගහාර අනුගමනය කරමින් ගායනයට හා දවුල් වාදනයට අනුව වන්නම සම්පූර්ණයෙන් නර්තනය කිරීමේ හැකියාව වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## කොවුලා වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය සහ මාත්‍රා 3+4 (මැදුම් මහ දෙතිත) තාලය**

**දවුල් පදය** - දොංත තකට - කුඳත් තක්කිට තකට ජිංතක

**තානම** - තාන තනා තන තම්දෙනා
තෙතන තනා තන තම්දෙනා //
තාන තනා තම්දෙ නා තෙතන තන
තෙතන තනා තම්දෙ නා

**කවිය** : කොහෝ යනා හඬ නගනා මියුරු මනා දන සවනා //
පරපුටු වෙසෙසින්නේ වසන්නේ මහ වන ගස් මුදුනේ

රිටු විමනා බිජු ලමිනා බහු නදනා රකෙන මෙනා //
ලොකු වී නද දෙන්නේ ඔවුන් ගෙන් එම විට බැට කන්නේ

රුව සමනා උනත් මනා ඉසිවඩනා රිටු නොමිනා //
රිටු පරපුටු හටනේ දෙවන්නේ නිදසුන් යස රුවිනේ

ලොව දුදනා ගතිය මනා මෙම හටනා ලොව තිබෙනා //
මදහුගේ මිතුරන්නේ ගයන්නේ මෙම මනහර වරුණේ

**කලාසම** : කුඳ කුඳ ගත////
කුඳිත ගත ගත ගතිත කුඳ කුඳ ///
ජිංත ගත්තත් - ගතිත ගත්තත්
තකුඳ ගත්තක් - ගතත් කුඳගත තා.

**අඩව්ව** : තදොං මිත්තේ දොං දොමිත්තේ දොංත දොංතක ගත කුඳා
තත්ත තහර්දත් දිත්ත තහර්දත් තහර්ද දිහිර්දක ගත කුඳා
කුඳිත ගත ගත ගතිත කුඳ කුඳ දොංත ගත්තත් ගතත් කුඳගත තා - ගත්තත්
ගතත් කුඳගත තා

## තිසරා වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**දවුල් පදය** : ජිං කිට තත් තත් කිට්තක / ජිංත ගත ගත ගත ගතිත ගත ගත ගත ජිංත ගත
ගතිත ගත ගතත් කුඳත් තා - තකට

**තානම** : තම්ද නා තාන තනෙන තෙයි තනා තාන තනෙන
තාන තනෙන තාන තනෙන තාන තම්දෙනා

**කවිය** : රන් රසා සේම වඩන - වන්යසා රූප දිලෙන
වීම සදිසි නාම විලස - ඒම රජ තුමාණන්
ඉන්නිසා සැම එදින - උන් අසා ගීත නදින
තාල වයන ගායන කර - සැම වැසි දනන් දුන්
මන්මෙසා භාවට බැස - දූන් ඉතා රාග වඩන
කීම සොඳට ආලය කර - නාම කර උතුම් යෙන්
අන්නිසා කීව පොරණ - දූන් අසා මේ සබ මැද
පේම වඩන මේ තිසරා - වන්නම පවසන් දූන්

**කලාසම** : ජිංත කුකුඳ තා තකට ///
ජිංත කුකුඳ තා කුංදත් තරිකිට - ගතිත කුකුඳ තා ගතත්

**අඩව්ව** : ජෙංත තකට දිරිකිට තරිකිට ගත
ගත කුඳගත ගතත් ජෙ ජෙං තත් කිත්තත්
කිතත් ජෙජෙං තා - කුන්දත් තරිකිට ගතත් කුකුඳ තා

## නාග ගජගා වන්නම

### නාග ගජගා වන්නම

**මාත්‍රා 3+2+2 (මැදුම් දෙසුළු තුන්තිත) තාලය**

**දවුල් පදය** : කුඳත් තක්කිට තකට ජිමිතක

**තානම** : තාන තන තන තාන තන තන තාන තනතම් දානෙනා
තනානත් තම් දන තනම්දන තානෙනත් තම් දානෙනා

**කවිය** : සීල නාගව කලෙක බෝසත්
හස්ති රාජව උපන්නේ
කෝල නොව බුදු බව පතාගෙන
එදළ කපමින් එදන් දුන්නේ

සීල ගුණ ඇති වීර විකුමැති
එමාතාණෝ බුදු වුණේ
ආල වඩවන නාග ගජගා
වන්නමේ සැටි මෙලෙසිනේ

**කලාසම** : කුඳිත ගත ගත ගතිත කුඳ කුඳ ///
කුඳිත තත් කුඳ ගතිත කුඳ දොං

**අඩව්ව** : තහර්ද තත් තත් තතත් තත් තත්
තහර්ද තත් කිට තකට කුඳ දොං
තහර් රුඳ දොං තහර් රුඳ දොං - තහර් රුඳ දොං
දොංත ගත්තත් ගතත් කුඳ ගත තා
ගත්තත් ගතත් කුඳගත තා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- අදාළ වන්නම්වල පසුබිම පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- වන්නම තාල තබමින් ගායනය කරවන්න.
- වන්නමේ දවුල් පදයට උචිත පද ගොඩ නගන්න.
- දවුල් වාදනයට අනුව පද නර්තනය කරවන්න.
- කලාසම්, අඩවු කොටස් වශයෙන් නර්තනය කිරීමට මඟ සලස්වන්න.
- බෙර වාදනයට අනුව සාමූහික ව නර්තනයේ යෙදීමට සුදුසු ලෙස සැලසුම ක්‍රියාත්මක කරවන්න.

**ඇගයීම** :

- ඉගෙන ගන්නා ලද වන්නමට අදාළ පද කොටස් තාල තබමින් කියන්න.
- වන්නමට අදාළ පද නියමිත අංගහාර අනුගමනය කරමින් නර්තනය කරන්න.
- ඉගෙන ගන්නා ලද වන්නම් ගායනය කරමින් බෙර වාදනයට අනුව කණ්ඩායම් වශයෙන් නර්තනය කරන්න.
- ඉගෙන ගන්නා ලද වන්නම බෙර වාදනයට අනුව ගායනය කරමින් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන සේ තනි ව නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4** : ගායනය රහිත ව උඩරට/පහතරට/සබරගමු නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.4** : කුඳංත ගත දොං වට්ටම සහ දොං ජිංත ගත දොංත වට්ටම නර්තනය කරමු.

**කාලච්ඡේද** : 12

**ඉගෙනුම් පල** :

- කුඳංත ගත දොං, දොං ජිංත ගත දොංත යන වට්ටම්වල තාල රූප නම් කරයි.
- වට්ටම්වලට අදාළ පිරිමේ පදය සමඟ පද, කස්තිරම් හා අඩවු තාල තබමින් කියයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් පද, කස්තිරම් හා අඩවු නර්තනයේ යෙදෙයි.
- ඉගෙන ගන්නා ලද වට්ටම් නර්තනය, සාමූහික ව ප්‍රදර්ශනය කරයි.
- ඉගෙන ගන්නා ලද වට්ටම්වල පද, කස්තිරම් හා අඩවු බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන පරිදි ඒකල ව නර්තනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : ගැට බෙරය, තාලම්පට, වට්ටම් ලියන ලද ප්‍රස්තාර සටහන

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : අභ්‍යාස ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

කුඳංත ගත දොං වට්ටමේ පදය තාල තබා කීමේ දී සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කරමින් තුන්වන ආඝාත ස්ථානයෙන් ආරම්භ කළ යුතු ය. රවුමට නැටීම උඩරට වට්ටම් නැටීමේ සාම්ප්‍රදායික ලක්ෂණය වන බැවින් ඒකල ව නර්තනය කිරීමේ දී නර්තනයේ හා වාදනයේ සහසම්බන්ධතාව පවත්වා ගැනීම සඳහා නර්තන ආරම්භයට පෙර අදාළ තාල ලක්ෂණ ප්‍රදර්ශනය කිරීම වැදගත් ය. වට්ටම් නැටීමේ දී අදාළ පද කොටස් උචිත හස්ත පාදාංග යොදා ගනිමින් පද පහත්තියට අනුව නැටීම පිළිබඳ අවධානය යොමු කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

## කුඳංත ගත දොං වට්ටම

**මාත්‍රා 2 + 2 + 4** (දෙසුළු මහ තුන් තිත) තාලය

වට්ටම පිරිම : කුඳංත ගත කුඳ දොම් කිට තරිකිට කුන්දත් තා

1. පදය : කුඳංත ගත දොං

කස්තිරම : තත් ජිත් තොන් නං තා

අඩව්ව : තාම් දොමිති ගත දොම්කිට කඩතක තරිකිට
කිතක දොමිති ගත කිත්තත් කුඳ කුඳ තා කුජිත්ත ගත
දොම් කිට තරිකිට කුන්දත් තා.

2. පදය : කුඳංත ගත දොං

කස්තිරම : තත් ජිත් තක ජිත් තත් ජිත් තොන් නං තා

**අඩව්ව** : තත් තොග තක තොග
තක්කඩ තරිකිට තක තොග
තකට ජිකට තොග ජික්කඩ තරිකිට ජික තොග
තා කුජිත්ත ගත දොමි කිට
තරිකිට කුංදත් තා

**3. පදය** : කුඳ ගත/// ගත දොං

**කස්තිරම** : ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොමිකිට තා

**අඩව්ව** : තක්කඩ තරිකිට ජිත්තත් - තෙහිං තෙහිං ජිත්තත්
තෙහිං දොමි තකු තෙහිං දොමිත කුඳා
තක්කඩ තරිකිට තා කුඳ - ජික්කඩ තරිකිට තා කුඳ
තක්කඩ තරිකිට - ජික්කඩ තරිකිට
කඩතක තරිකිට ජිජිකුඳ
තා කුජිත්ත ගත දොමි කිට
තරිකිට කුන්දත් තා

**4. පදය** : කුඳංත ගත දොං

**කස්තිරම** : ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම්
ගජිං ජිංත කුඳ ගජිතකු ජිත්තම්
තරිකිට ජිත් තරිකිට දොමිකිට තා

**අඩව්ව** : කඩතරිකිට කුංඳාං කඩතක
තකුතක කඩදොං තරිකිට
ගජ්ජිත් කුන්දත් කඩතරිකිට කුං
තරිකිට කුඳ තා කුජිත්ත ගත
දොමි කිට තරිකිට කුංදත් තා

## දොං ජිංත ගත දොංත වට්ටම

**මාත්‍රා 2 + 3 (සුළු මැදුම් දෙතිත) තාලය**

**වට්ටම් පිරීම** : දොං ජිංත ගත දොංත දොං තා

**1. පදය** : දොං ජිංත ගත දොංත

**කස්තිරම** : කුඳ ගජිත කුඳ තා
**අඩව්ව** : තත් තකට තක රොං
තක්කඩ තක්කඩ කුඳ තක රොං
තක රොං ගජිං ජිකුඳ කිටි තකට
කුංදත් ජික රොං

**2. පදය** : දොං ජිංත ගත දොංත

**කස්තිරම** : කුඳ ගජිත/// කුඳ තා

**අඩව්ව** : ජිං කුඳ ගජිත කුඳං
ගජිංත ගජිත කුඳං
ජිබ්බඩ කුඳ ගජිත කුඳං - දෝං තා
දොහොකඩ තහකඩ දොමි කිට කිට
දොමි කිට දොමි කිත්තක්
තහර්ජිත් තහර් ජිත් කුඳ
තහර් ජිත් තහර් දොං

3. පදය (වට්ටම): දොං ජිංත ගත දොංත

**කස්තිරම** : කුඳ ගජිත/// කුඳ තා
කුඳ ගජිත/// කුඳ තා

**අඩව්ව** : තත් තරිගු තත් තකට
ජෙං ජෙං ගජිං ජිකුඳ
කඩතක තකට///
කුංදත් තරිකිට දොං

**4. පදය** : දොං ජිංත ගත දොංත

**කස්තිරම** : (කුඳ ගජිත/// කුඳ තා)//
කුඳ ගජිත කුඳතා//
කුඳ ගජිත ගත දොංත දොංතා

**අඩව්ව** : තාක්කු තකජිජිකුඳ - දොහොකඩ තහකඩ තකජිජිකුඳ
කිනක්කු තක ජිජිකුඳ දොං තා
දොහොකඩ තහකඩ දොමිකිට කිට
දොමිකිට දොමි කිත්තත්, තහර්ජිත් තහර්ජිත් කුඳ
තහර්ජිත්, තහර් දොං

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- කුඳංත ගත දොං වට්ටමේ පද තාල තබා කියන්න.
- තාල රූපය පිළිබඳ අවබෝධය ඇති කිරීමට ඒ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.
- වට්ටමේ ගති ස්වභාවයන් පිළිබඳ සාකච්ඡා කරමින් නර්තනයට යොමු කරවන්න.
- පියවරෙන් පියවරට කොටස් වශයෙන් ක්‍රියාකාරකමෙහි යොදවා බෙර වාදනයට අනුව නර්තනය කරවන්න.
- නිවැරදි අංගහාර, චලන අනුගමනය කිරීමට සලස්වන්න.
- සාමූහික ව හා ඒකල ව නර්තනයේ යොදවන්න.
- සතතාභ්‍යාසයේ වැදගත්කම සාකච්ඡා කර ඒ සඳහා යොමු කරවන්න.
- පැනීම් හා කැරකීම් හඳුන්වා දෙමින් අභ්‍යාසවල නිරත කරවන්න.
- අභ්‍යාස කිරීමේ වැදගත්කම හා අනුගමනය කළ යුතු නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරවන්න.

ඇගයීම :

- වට්ටමේ අදාළ පද කොටස් තාල තබා කියන්න.
- තාල රූපයට අනුව අදාළ වට්ටම් පිරීමේ පදය නර්තනය කරන්න.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් වට්ටමේ පද නර්තනය කරන්න.
- නියමිත අඩව්ව තාල තබා කියන්න.
- බෙර වාදනයට අනුව අඩව්ව නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4.** : ගායනය රහිත ව උඩරට/පහතරට/සබරගමු සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.4.** : ගුඳගති ගත වට්ටම, එක් තාලය, දෙතාලය හා තුන්තාලය නර්තනය කරමු. (පහතරට නර්තන සම්ප්‍රදායය)

**කාලච්ඡේද** : 12

**ඉගෙනුම් පල** :

- ගුඳගතිගත වට්ටම, එක් තාලය, දෙතාලය හා තුන්තාලයට අදාළ තාල රූප නම් කරයි.
- අදාළ පද හා ඉරට්ටි තාල තබමින් කියයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් අදාළ පද හා ඉරට්ටි (සුරල්) නර්තනය කරයි.
- ඉගෙන ගන්නා ලද පද හා ඉරට්ටි (සුරල්) බෙර වාදනයට අනුව සාමූහික ව ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, වට්ටම ලියන ලද සටහන

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රායෝගික ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

පහතරට නර්තන සම්ප්‍රදායයට අයත් ගුඳ ගති ගත වට්ටම හා එක් තාලය, දෙතාලය, තුන්තාලය ක්‍රියාකාරකම් ඉගැන්වීමේ දී සිසුන්ගේ මූලික අංගහාර, ඉරියවු, චලන, හැඩතල හා තාල පිළිබඳ අවබෝධය ශක්‍යතා සංවර්ධනය කිරීම ඉතා වැදගත් වේ. පහතරට සාම්ප්‍රදායික අංගහාර හා චලන හුරු කිරීමට මෙම ක්‍රියාකාරකම බෙහෙවින් ඉවහල් වේ.

### ගුඳ ගතිගත වට්ටම

**1. පදය** : ගුඳ ගති ගත - ගුඳ ගුඳ ගති ගත

**අන්තාඩිය** : ගුඳ ගති ගත ගුඳ ගත්තම්

**ඉරට්ටිය** : ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත ගහිතිගතම්
තත් දිත් තත් දිගතම් - දොම් ගතිගත

**2. ඉරට්ටිය** : ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත
ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත
ගහිති ගතම්
තත් දිත් තත් දිගතම් - දොම් ගතිගත

**3. ඉරට්ටිය** : ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත/// ගහිතිගතම්
තත් දිත් තත් දිගතම් - දොම් ගතිගත

**4. ඉරට්ටිය** : ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත
ගුහිති ගදිරිකිට ගත ගත// ගහිතිගතම් } ද / ව
තත් දිත් තත් දිගතම් - දොං ගති ගත

**5. ඉරට්ටිය** : ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත
ගුහිති ගදිරිකිට ගත ගත// ගහිතිගතම් } ///
ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත ගහිති ගතම්//
තත් දිත් තත් දිගතම් - දොං ගතිගත

**6. ඉරට්ටිය** : ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත
ගුහිති ගදිරිකිට ගත ගත// ගහිතිගතම් } ///
ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත ගහිති ගතම්//
තත් ගහිතිගතම් දිත් ගහිති ගතම්
දොං ගහිතිගතම් නං ගහිතිගතම්
ගුංදත් ගුහිති ගදිරිකිට ගත ගත
ගුහිති ගදිරිකිට ගත ගත// ගහිතිගතම්
තත් දිත් තත් දිගතම් - දොං ගතිගත

**7 ඉරට්ටිය** : ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත
ගුහිති ගදිරිකිට ගත ගත// ගහිතිගතම් } //
ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත ගහිතිගතම්//
තත් ගහිති ගතම් - දිත් ගහිති ගතම්
දොං ගහිති ගතම් නං ගහිති ගතම්
ගදිත්ත ගුඳ ගදිගත ගුඳ ගදිත ගුදිත
තත් තත් තතත් තත් දොම්
ගුම්දත් ගුහිති ගදිරිකිට ගත ගත
ගුහිති ගදිරිකිට ගත ගත/// ගහිතිගතම්
තත් දිත් තත් දිගතම් - දොම්

## පහතරට නර්තන සම්ප්‍රදායය

### එක්තාලය

**පදය** : දොම් ගති කිට - දොම් දිම් ගති කිට

**සුරල** : දොංතග දිම්කිට ගත්තත් දොම්
ගතිතග දිම්කිට ගත්තත් දොම්
ගත්තත් දොම් - දෙගතත් දොං
දොංතග දිත්තත් තකුගත - ගුඳ ගත් දිගතම්.

### දෙතාලය

**පදය** : දොංත ගතම් දොම්ත ගදිගතම්
තත් රෙගතම් තත් රෙගතිගතම්

**සුරල** : දොං ගත් දිම් ගත - ගතිගත ගුඳ ගත්
ගත ගුගුදිත ගත ගතිත ගුඳා
තත් දිරිකිට ගුඳ තා.

**තුන්තාලය**

**පදය** : රෙගතත් දොම්ගත ග-දි-කි-ට

**සුරල** : රෙගතත්/// දොම් දොම්
රෙගතග දිරිකිට ගත
රෙගතත් දොම්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- ගුඳ ගතිගත වට්ටම, එක්තාලය, දෙතාලය, තුන්තාලය අන්තර්ගතය පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තාල රූප හඳුන්වා පද හා ඉරට්ටි තාල තබමින් කීමට යොමු කරවන්න.
- අදාළ පද කොටස් නර්තනයට යොමු කරවන්න.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් පද හා ඉරට්ටි නර්තනයට අවස්ථාව ගොඩ නඟන්න.
- බෙර වාදනයට අනුව උගත් පද කොටස් නර්තනයට අවස්ථාව ලබා දෙන්න.
- සාමූහික ව නර්තනයට යොමු කරවන්න. ඒකල ව නර්තනයට අවස්ථාව ලබා දෙන්න.
- සතතාභ්‍යාසයේ වැදගත්කම සාකච්ඡා කර අභ්‍යාසයේ නිරත කරවන්න.

**ඇගයීම** :

- ගුඳ ගතිගත වට්ටම, එක්තාලය, දෙතාලය, තුන්තාලයට අදාළ පද හා ඉරට්ටි තාල තබමින් කියන්න.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් ගුඳ ගතිගත වට්ටම, එක්තාලය, දෙතාලය, තුන්තාලයට අදාළ පද හා ඉරට්ටි නර්තනය කරන්න.
- ඉගෙන ගන්නා ලද ගුඳ ගතිගත වට්ටම, එක්තාලය, දෙතාලය, තුන්තාලයට අදාළ පද හා ඉරට්ටි බෙර වාදනයට අනුව සාමූහික ව ඉදිරිපත් කරන්න.

| | |
|---|---|
| **නිපුණතාව 01** | : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 1.4** | : ගායනය රහිත ව උඩරට / පහතරට / සබරගමු සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි. |
| **ක්‍රියාකාරකම 1.4** | : යක්පද මාත්‍රයට සහ ගමන් මාත්‍රයට අදාළ කලාසම් වට්ටම, කලාසම, අඩවු නර්තනය කරමු. |
| **කාලච්ඡේද** | : 12 |
| **ඉගෙනුම් පල** | : |

- යක් පද මාත්‍රය හා ගමන් මාත්‍රයෙහි තාල රූප නම් කරයි.
- යක් පද මාත්‍රයට හා ගමන් මාත්‍රයට අදාළ පද කලාසම් වට්ටම, කලාසම, අඩවු තාල තබමින් කියයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් පද, කලාසම් වට්ටම, කලාසම, අඩවු නර්තනය කරයි.
- යක් පද මාත්‍රයට සහ ගමන් මාත්‍රයට ආවේණික පද, කලාසම් වට්ටම සාමූහික ව නර්තනය කරයි.
- දවුල් වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කර ගායනය රහිත ව යක් පද මාත්‍රය සහ ගමන් මාත්‍රය ඒකල ව හා සාමූහික ව නර්තනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : තාලම්පට, යක් පද මාත්‍රය හා ගමන් මාත්‍රය ලියූ සටහන්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, අභ්‍යාස ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

උඩරට, පහතරට නර්තන සම්ප්‍රදායවලට අයත් වට්ටම් ගායනය රහිත නර්තන අංග වේ. සබරගමු සම්ප්‍රදායයෙහි වට්ටම්, එම ආකාරයට භාවිත නොවන බව පැහැදිලි කරුණකි. එම ක්‍රියාකාරකමට සාපේක්ෂ ව යක් පද හා ගමන් මාත්‍රා නර්තන අංග දෙකෙහි ගායනය කොටස් භාවිත නොකර කලාසම් වට්ටම, කලාසම හා අඩවු නර්තනය කිරීම මෙහිදී නිර්දේශ කර තිබේ. පහත දක්වා ඇති විෂය අන්තර්ගතය ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සබරගමු නර්තනයේ සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ ගොඩ නැඟෙන ආකාරයට අංගහාර, චලන, ඉරියවු පිළිබඳ සැලකිලිමත් ව ක්‍රියාකාරකම සැලසුම් කර ඉදිරිපත් කිරීම වැදගත් ය.

**යක්පද මාත්‍රය**

| | | |
|---|---|---|
| **තාලය** | : | **මාත්‍රා 4 (මහ තනි තිත) තාලය** |
| **දවුල් පදය** | : | ජිංත ග තා - දොං |
| **වට්ටම** | : | කුඳිතගතා කුඳ ගතිතග තා කුඳ |
| **කලාසම** | : | කුඳිත ගතා කුඳ ගතිත ගතා කුඳ ///<br>කුඳිත ගතා කුඳ ගතිත කු දිත් තත්. |
| **අඩව්ව** | : | තහර් රුඳංගත දිරිකිට තරිකිට ගතිගත<br>තහර් දත් තහර්දක දොංතග  තිතගත<br>ගතිගත දිරිකිට  තරිකිට තා ජිමිත්තත්<br>ගතිගත තරිකිට කුංදත් තා |

**ගමන් මාත්‍රය**

මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

| | | |
|---|---|---|
| **දවුල් පදය** | : | ජිං කිටිතත් - තත් කිටිතක |
| **වට්ටම** | : | ජිංත ගතිත ගත කුඳ ගත ගතිත කුඳිත ගතිගත කුඳ |
| **කලාසම** | : | කුඳිත ගතිත ගත කුඳගත<br>ගතිත ගතිත ගත කුඳගත<br>කුඳිත ගතිත ගත කුඳගත<br>ගතිත කුඳිත් තත් කිත්තත් |
| **අඩව්ව** | : | දොං ජිගතත් දොං ජිගතත් දොං ජිගතත් දොද් දොං<br>තත් තක්කිට ජිත් ජිත් කිට තොං තොංකිට නං නං<br>ජිංත ගතිත ගත කුඳගත දෝංත ගත් තත්  කිටිතක<br>තකුඳ ගතත් කුඳගත කුඳ තා ගතිත් ගත ගත්තත්<br>තකුඳ ගතත් කුඳ ගත කුඳ තා |

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- යක් පද මාත්‍රයේ සහ ගමන් මාත්‍රයේ පසුබිම හා සුවිශේෂ ලක්‍ෂණ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- යක් පද මාත්‍රයට හා ගමන් මාත්‍රයට අදාළ පද කොටස් නියමිත තිත් රූපයට අනුව තාල තැබීමට යොමු කරවන්න.
- යක් පද මාත්‍රය හා ගමන් මාත්‍රය පද කලාසම් වට්ටම් නර්තනය කිරීමට සලස්වන්න
- දවුල් වාදනයට අනුව නර්තනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කලාසම් වට්ටම්, කලාසම්, අඩවු නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාමූහික ව හා තනිව නර්තනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ අදාළ නර්තන අංග ඉදිරිපත් කිරීමට සලස්වන්න.

ඇගයීම :

- උගත් මාත්‍රාවලට අයත් පද කලාසම්, අඩවු තාල තබමින් කියන්න.
- යක් පද මාත්‍රයට, ගමන් මාත්‍රයට අදාළ පද කලාසම් වට්ටම් දවුල් වාදනයට අනුව නර්තනය කරන්න.
- යක් පද මාත්‍රයට ගමන් මාත්‍රයට අදාළ පද, වට්ටම්, කලාසම් වට්ටම්, අඩවු ඒකල හා සාමූහික වශයෙන් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.5** : පූජා භාණ්ඩ නිවැරදි ව හසුරුවමින් නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.5** : කොතල පදය නර්තනය කරමු (උඩරට නර්තන සම්ප්‍රදායය)

**කාලච්ඡේද** : 12

**ඉගෙනුම් පල** :

- උඩරට නර්තන සම්ප්‍රදායයෙහි කොතල පදයෙහි සුවිශේෂ ලක්ෂණ හා පසුබිම විස්තර කරයි.
- කොතල පදයට අයත් පද කොටස් තාල තබමින් කියයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රවර්ධනය සඳහා පූජා භාණ්ඩ නිවැරදි ව හසුරුවමින් නර්තන කරයි.
- බෙර වාදනයට අනුව කොතල පදය සාමූහික ව හා ඒකල ව නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, කොතල පදය ලියන ද සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, අභ්‍යාස ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් කොතල පදය නර්තන අංගයෙහි පූජා භාණ්ඩය නිවැරදි ව හසුරුවා ත්‍රිවිධ ලය අනුව අදාළ නර්තන කොටස් ප්‍රගුණ කිරීමට මෙහි දී සැලකිලිමත් විය යුතු යි. සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ නර්තනය කිරීමට සිසු ශක්‍යතා වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## කොතල පදය (උඩරට)

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

කහදියර වැඩීම : ජිංතත්// ජිංතක ජිංගත කුඳ ගජිං තරිකිට
කුඳ ගත ගත කුකුඳ කුඳ ගජිං තක ජිංගත
කුංජිංගත කුංත කුංතත් ජිං තකුං තකුං ජිං ජිං ගජ්ජිං

ගමන් මාත්‍රය : ජිංත කුකුඳ කුඳ කුඳ ගත (විලම්භ ලය)

**අලංකාර පද නර්තනය**

කහ දියර වැඩීම : ජිං කුඳගත් ජිං තත් (ද/ව)

ගමන් මාත්‍රය : ජිංත කුකුඳ කුඳ කුඳ ගත (මධ්‍ය ලය )

**අලංකාර පද නර්තනය**

කහ දියර වැඩීම : ජිං කුඳගත් ජිං තත්// (ද/ව)

ගමන් මාත්‍රය : ජිංත කුකුඳ කුඳ කුඳ ගත (ද්‍රැත ලය)

**අලංකාර පද නර්තනය**

කහ දියර වැඩීම : ජිංකුඳගත් ජිං තත්// (ද/ව)
ජිං කුඳ ගත/// ජිංත ජිංත ජිංත කුඳත්

ගමන් මාත්‍රය : ජිංත කුකුඳ කුඳ කුඳ ගත

අලංකාර පද කොටසක් (අඩවු කොටසකි)
තාත් ජිංත කුඳ ගජිං - කුං තරිකිට කුඳ ගජිං
ගජ්ජිත් තකජිත් කුං තරිකිට කුඳ ගජිං

ගමන් මාත්‍රය : ජිංත කුකුඳ කුඳ කුඳ ගත

කස්තිරම : කුඳ ගත ගත ගත කුකුඳත් තකුඳ ගජිං/// (ද.ව.ද)
තකුඳ ගජිං/// (ද.ව.ද)
තෙහිං තෙහිං තකුඳ ගජිං තා
කඩතක ජිකුතක තරිකිට කුංදත් තා
ජිංත තකට තකට කුඳත් - ගත් ජිත් කුංදත්
තකුඳ තකට තකට කුඳත් තක ජිත් කුංදත්
ජිංත තකට තකට කුඳත් - තකුඳ තකට තකට කුඳත්
ජිංත කුඳත් - ජිගත කුඳත්
ගජ්ජිජිගත කුඳ ගත දොං - කඩතරිකිට තකුඳත් ගජිං

යහනට : කුංජිංගත/// කුක්කුංදත්
තක ජිංගත/// කුක්කුංදත්
කුංජිංගත කුක්කුංදත් - තක ජිංගත කුක්කුංදත්
ජිංත කුඳත් - ජිගත කුඳත් ගජ්ජිජිගත කුඳ ගතත් දොං
කඩ තරිකිට ජික් කුංදත් ගජිත්ත දොං.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- කොතල පදය නර්තන අංගයෙහි පසුබිම හා සුවිශේෂ ලක්ෂණ පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- අදාළ පද කොටස් තාල තබා කීමට යොමු කරවන්න.
- එම පද කොටස් පියවරින් පියවරට නර්තනය කිරීමට සලස්වන්න.
- පූජා භාණ්ඩය නිවැරදි ව හසුරවමින් කොතල පදය නර්තනයට මඟ පෙන්වන්න.
- බෙර වාදනයට අනුව කොතල පදය අභ්‍යාස කරවන්න.
- සාමූහික හා ඒකල වශයෙන් නිවැරදි අංගහාර හා සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ කොතල පදය නර්තනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම** :

- කොතල පදය නර්තන අංගය දක්නට ලැබෙන අවස්ථා දෙකක් නම් කරන්න.
- එහි සුවිශේෂ ලක්ෂණ හඳුන්වන්න.
- පූජා භාණ්ඩය නිසි ලෙස හසුරුවමින් බෙර වාදනයට අනුව කොතල පදය නර්තන අංගය ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.5** : පූජා භාණ්ඩ නිවැරදි ව හසුරුවමින් නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.5** : කොතල පදය නර්තනය කරමු (පහතරට නර්තන සම්ප්‍රදායය)

**කාලච්ඡේද** : 12

**ඉගෙනුම් පල** :

- පහතරට නර්තන සම්ප්‍රදායයෙහි කොතල පදයේ සුවිශේෂ ලක්ෂණ හා පසුබිම විස්තර කරයි.
- කොතල පදයට අයත් පද හා කවි තාල තබමින් කියයි.
- පූජා භාණ්ඩය නිවැරදි ව හසුරුවමින් කොතල පදය නර්තනය කරයි.
- කවි ගායනය කරමින් කොතල පදය නර්තනය කරයි.
- වාදනයට අනුව කොතල පදය නර්තනය කරයි.
- වාදනයට අනුව සාමූහික ව හා ඒකල ව කොතල පදය සම්පූර්ණයෙන් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, කොතල පදය ලියන ද සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, අභ්‍යාස ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

කොතල පදය නර්තනයේ දී ගායනයෙන් අනතුරු ව පූජා භාණ්ඩය ගැනීමත් එය නිවැරදි ව හැසිරවීමත්, පළමු වන ගායනයේ දී (දාර සතයි) කවිය ආරම්භ කර පාදය තැබීමේ ශිල්පීය ක්‍රමවේදය අනුගමනය කරමින් සාම්ප්‍රදායික අනන්‍යතාව ප්‍රදර්ශනය කිරීමට සිසුන් යොමු කරවීම අපේක්ෂා කෙරේ.

**කොතල පදය (පහතරට)**

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**ආරම්භක පදය** : දොං ගත ගුඳ ගත් දිත් තත් ගුහිති ගදිරිකිට ගුඳ ගත් දෑහිං

**පදය** : රිං ගති ගත ගුඳ ගුඳ ගත් තං ගදිතකු දොං ගත ගුඳ
ගුඳ ගති ගත ගත ගුඳ ගත ගදිත ගතකු දොං

**කවිය** :
දාර සතයි කෙම් දොළසයි රන් කොතලේ
බාර කළයි සැම දෙවිඳුන් හට කොතලේ
පුරවාලයි පැන් මුනිඳුන්ට පුද කළේ
නෑර අසන් කවි කහදිය රන් කොතලේ

**පදය** : ගුංද දෙගත ගති ගත ගුඳ

**කවිය** :
එදා අනෝතත්තෙන් පැන් ගෙනත් සිට
එදා එතන මාරුක් මල් වඩා සිට
එදා එතන පැන් ඉස්සේ උවදුරට
අදත් සෙත් කරන් මේ ආතුරන් හට

**පද අවසානය** : රෙගත ගුඳ ගුඳ ගත්//
රුඳ ගුඳ ගත්// රුඳ ගුඳ ගත්ත ගුන්ද ගත් දිත් තත් ගුහිති ගදිරිකිට ගුඳගත් දූහිං

**පැන් වැඩීමේ පදය** : ගුම් රුඳගත් දෙගත ගත්ත////
ගුම් රුඳගත//// රෙගත දිකුඳ තා ගත්ත

**අවසානය** : දූහිං///////

**ආවඩන පදය** : දොංත දොංත දොංත ගතං ගත්ත ගදිත ගත ගුඳගත්///
දොංත ගතං ගදිත ගතං ගදිගත ගුඳ
ගත් දිත් තත් ගුහිති ගදිරිකිට ගුඳ ගත් දූහිං
ගතිත ගති ගුඳගත් දොම්
ගුදිත ගති ගුඳගත් දොම්
දොම්ත ගද් දිරිකිට ගද් දිරිකිට ගද් දිරිකිට
දොම්ත ගතං ගදිත ගතං ගදිගත ගුඳ
ගත් දිත් තත් ගුහිති ගදිරිකිට ගුඳ ගත් දූහිං
දූහිං දූහිංත ගුම්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- පහතරට නර්තන සම්ප්‍රදායයෙහි කොතල පදය නර්තන අංගයෙහි පසුබිම පිළිබඳ සාකච්ඡාවන් මෙහෙයවන්න.
- අදාළ කවි තාල තබමින් ගැයීමට සලස්වන්න.
- නර්තන පද කොටස් පියවරින් පියවර ඉදිරිපත් කර සිසුන්ට නර්තනය සඳහා මඟ පෙන්වන්න.
- පූජා භාණ්ඩය නිවැරදි ව හසුරුවන ආකාරය හඳුන්වා දෙන්න.
- බෙර වාදනයට අනුව නර්තනය ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.
- සාමූහික ව හා ඒකල ව නියමිත අංගහාර අනුගමනය කරමින් කොතල පදය කවි ගායනය කරමින් නර්තනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම** :

- කොතල පදයට අදාළ පද කොටස් තාල තබමින් කියන්න.
- වාදනයට අනුව කවි ගායනය කරමින් කොතල පදය නර්තනය කරන්න.
- සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන සේ කණ්ඩායම් වශයෙන් කොතල පදය නර්තනය කරන්න.
- බෙර වාදනයට අනුව කොතල පදය (සම්පූර්ණයෙන්) ඒකල ව නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.5** : පූජා භාණ්ඩ නිවැරදි ව හසුරවමින් නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.5** : කෙණ්ඩි පාලිය නර්තනය කිරීම. (සබරගමු නර්තන සම්ප්‍රදාය)

**කාලච්ඡේද** : 12

**ඉගෙනුම් පල** :

- කෙණ්ඩි පාලිය නර්තන අංගයෙහි පසුබිම විස්තර කරයි.
- කෙණ්ඩි පාලියට අයත් පද කොටස් තාල තබමින් කියයි.
- නිවැරදි අංගහාර පවත්වා ගනිමින් කෙණ්ඩි පාලියට අයත් පද කොටස් සම්පූර්ණයෙන් නර්තනය කරයි.
- දවුල් වාදනයට අනුව කවි ගායනය කරමින් කණ්ඩායම් වශයෙන් කෙණ්ඩි පාලිය නර්තනය කරයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රවර්ධනය සඳහා පූජා භාණ්ඩය නිවැරදි ව හසුරුවමින් නර්තනය කරයි.
- දවුල් වාදනයට අනුව කවි ගායනය කරමින් නිවැරදි ව අංගහාර අනුගමනය කරමින් සාමූහිකව හා ඒකලව කෙණ්ඩි පාලිය නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දවුල, තාලම් පට, කෙණ්ඩිය, පද කොටස් ලියන ලද සටහන, දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය , අභ්‍යාස ක්‍රමය , අනුකරණ ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

කෙණ්ඩි පාලියෙහි කවි, අඩු කෝල් පදය, පාලි පදය, ආවඩන පදය, සෙත් කිරීමේ පදය (ආවැඩීම) යන කොටස් අන්තර්ගත වේ. පූජා භාණ්ඩය නිසි ලෙස හසුරුවා ගනිමින් සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි නියමිත පූජා භාණ්ඩ නිසි ලෙස හසුරුවා ගනිමින් නර්තනය කිරීමේ වැදගත්කම මෙහි දී අවධාරණය කෙරේ.

## කෙණ්ඩි පාලිය (සබරගමු)

**මාත්‍රා 4 (මහ තනි තිත) තාලය**

**පදය** - ජිංත ජිං ජිං තත්ජිං ජිමිතකු දා - තත් ජිමිකිට කිටිතක

**කවිය**

නීල මැටියෙන් නාග රුසිවරු එරන් කොතලය තනමිනා
මාල බරණක් පැලැන්දා සිට දාර සත කෙමි දොළසිනා
යාගයට පෙර ගත්තු විලසින් එ මාරුක් මල් සරසනා
රෝග පිරිපත සේම දුරලත් කෙණ්ඩි පාලියෙ බලයෙනා

**කලාසම** - ජිංත ජිං ජිං තත් ජිං ජිමිතකු ඳා තත් ජිමිකිට කිටිතක
ජිංත ජිං ජිං තක ජිං ජිමිතකු ඳා

**අඩව්ව** - ජිංගත කුඳගත තා කිත්තත් ගතිගත කුඳගත තා කිත්තත්
ජිංගත කුඳගත ගතිගත කුඳ ගත ගජිංත ගතජිත්
තා කිත් තත් (දිරිකිට තරිකිට දිරිකිට තත්)/// ජිංගත
කුඳගත ගතිගත කුඳගත ගජිංත ගත ජිත්තා

**දෙවන තාල රූපය මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**බෙර පදය** : දොංත තකට

**කවිය**

කෙණ්ඩිය සුරතට ගෙන පැන් වඩලා
යන්න රෝග පිරිපත දුරු කරලා
ගන්න එමාරුක් මල් වඩවාලා
කෙණ්ඩි පාලි බලයෙන් දොස දුරලා

**කලාසම** : කුඳ කුඳගත/// ගත කුඳ දොං
කුඳත් තකට තා - කුංදත් තරිකිට - කුඳගත කුඳතා - ගතත්

**අඩව්ව** : තහර්ජෙං දං ගජිං ජිකුඳ (කුඳක ජෙංත ජෙංත ගතත්)//
ජෙංත ගතත් ජෙංත ගතත් (කුඳ කුඳගත)/// ගතත් තා
දිරිකිට තරිකිට තකට/// තහර් ද තත්ත ගත කුඳගත තහර් ද තා

**අඩු කෝල් පදය** : දොං ගතත් හර්ද ගතිගතත් හර්ද ගතිගතත්
හර්ද ගතිගතත් ගතිගතත් ගතත් දොං ගතත්
හර්ද ගත ගත ගත ගත ගතත් දොං ගතත්

**පාලි පදය** : තහර්දග තත්ගත කුඳගත කුඳගත
තත් කර කර තක් ජෙංකිට ගත්තත් ජෙං ජෙං

**ආවඩන පදය** : ජිගත ගතත් ගතිගත කුඳ ගතත් කුඳත් ගතිගතා
(පදය මුදුන් කොට අවසන් කෙරේ.)

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- කෙණ්ඩි පාලිය නර්තන අංගයෙහි පසුබිම හා එහි තාල රූප පිළිබඳ සාකච්ඡා කරන්න.
- අදාළ පද කොටස් තාල තබමින් කීමට යොමු කරවන්න.
- පියවරින් පියවර අදාළ පද කොටස් නර්තනයට මඟ පෙන්වන්න.
- කවි ගායනය කරමින් නර්තනයට යොමු කරවන්න.
- පූජා භාණ්ඩය නිවැරදි ව භාවිත කරමින් නර්තන අංගය අභ්‍යාස කරවන්න.
- නියමිත අංගහාර අනුව නර්තනයට මඟ පෙන්වන්න.
- දවුල් වාදනයට අනුව කවි ගායනය කරමින් නර්තනයේ යෙදීමට යොමු කරවන්න.
- සාමූහික ව හා ඒකල ව කෙණ්ඩි පාලිය නර්තන අංගය සම්පූර්ණයෙන් ම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම** :

- කෙණ්ඩි පාලියේ පාලි පදය තාල තබමින් කියන්න.
- කෙටි කවි හා දිග කවි තාලයට ගායනය කරමින් මාත්‍රා පද නර්තනය කරන්න.
- කෙණ්ඩි පාලියේ කලාසම්, අඩවු, අඩු කෝල් පදය සහ පාලි පදය, ආවඩන පදය නර්තනය කරන්න.
- ගායනයට හා වාදනයට අනුව කණ්ඩායම් වශයෙන් හා ඒකල ව නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.6** : ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.6.1** : උඩරට මංගලම් නර්තනය ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද** : 06

**ඉගෙනුම් පල** :

- මංගලම් නර්තනයෙහි සුවිශේෂ ලක්ෂණ පිළිබඳ අදහස් දක්වයි.
- මංගලම් නර්තනයේ තාල රූපය නම් කරයි.
- මංගලම් නර්තනයෙහි බෙර පදය තාල තබමින් කියයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් පළමු තානමට හා කවිවලට හස්ත චලන දක්වයි.
- මංගලම් නර්තනයෙහි තානම ගයමින් උචිත පද නර්තනය කරයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් මංගලම් නර්තනය කරයි.
- බෙර වාදනයට අනුව ගායනය කරමින් මංගලම් ඉදිරිපත් කරයි.
- සාමූහික ව හා ඒකල ව මංගලම් ගයමින් නර්තන ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ගැට බෙරය, තාලම් පට, මංගලම් නර්තනයේ පද ප්‍රස්තාර කරන ලද සටහන

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

උඩරට මංගලම් නර්තනය සඳහා තිත් පහේ තාල ලක්ෂණ යොදා ගැනීමට නිර්දේශිත ය. නර්තනයට අදාළ බෙර පදය සමඟ ගායනයේ දී එහි ආරම්භක ස්ථානය පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කිරීම මෙන් ම මංගලම් නර්තනයේ කස්තිරම සමඟ පද කොටස් නැටීමේ දී හා ලය පවත්වා ගැනීමේ දී එහි ගති ලක්ෂණ ආරක්ෂා වීම පිළිබඳ සැලකිලිමත් වෙමින් මෙම ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවීම අපේක්ෂා කෙරේ.

**මංගලම් නර්තනය**

**මාත්‍රා 2 + 2 + 2 + 4 + 4 (තුන්සුළු දෙමහ පස් තිත) තාලය**

බෙර පදය : දොං තකු දොං ජිං තක තරිකිට

තානම : තම්ද නාම් දන - තන තානාම් දන
තානෙනාම් දන - තා නෙ නා ආ....
තතන තාන තාම් - දන තානාම් දන
තානෙ නාම් දන - තා නෙ නා ආ....

කවිය : බුද්ධ රාජය වැන්දෙ පළමු ව දෙවෙනි සද්ධර්මය වදිම්
සුද්ධ සංසං රත්නෙ වැඳලා ගත්තු තිසරණ අත් මුදුම්
සිද්ධ වෙයි ජය ගුරුන් පා වැඳ ගත්තු සක්වළ දෙවි වරම්
සුද්ධ දෙරණත පා තබන්නට පොළොව මිහිකත් දෙවි වරම්

මංගලම් ජය මංගලම් ජය මංගලම් ජය මංගලම්
මංගලම් සිරි මංගලම් සිරි මංගලම් සිරි මංගලම්
මංගලම් සුභ මංගලම් සුභ මංගලම් සුභ මංගලම්
මංගලම් මේ සබේ සැමටම වේවා ජයසිරි මංගලම්

කස්තිරම : ගත් ජිත්තත් ජිංතක තරිකිට - ගජිත් කුඳත් ජිකුතක තරිකිට
ගත කුකුඳත් ජිකුතක තරිකිට - ගත කුඳ කුඳ තා - (තක තරිකිට)
තක ජිත්තත් ජිංතක තරිකිට - ගජිත් කුඳත් ජිකුතක තරිකිට
ගත කුකුඳත් ජිකුතක තරිකිට - ගත කුඳ කුඳ තා
ගත් ජිත් තත් ජිංතක තරිකිට - ගජිත් කුඳත් ජිකුතක තරිකිට
තක ජිත් තත් ජිංතක තරිකිට - ගජිත් කුඳත් ජිකුතක තරිකිට
ගත් ජිත් තත් ජිංතක තරිකිට - තක ජිත් තත් ජිංතක තරිකිට
ගත කුකුඳත් ජිකුතක තරිකිට
ගත කුඳ කුඳ, තත් ජිත් තොං නං තා.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- මංගලම් නර්තනයෙහි පසුබිම පිළිබඳ සාකච්ඡා කරන්න. තාල තබමින් පදය කීමට යොමු කරවන්න.
- තානමට හස්ත චලනය කිරීමට මඟ පෙන්වන්න.
- අදාළ පද කොටස් පියවරින් පියවර නර්තනයට යොමු කරවන්න.
- නිවැරදි අංගහාර අනුගමනය කිරීමට මඟ පෙන්වන්න.
- ගායනය සමඟින් නර්තනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- බෙර වාදනයට අනුව ගායනය කරමින් නර්තනයට යොමු කරවන්න.
- සාමූහික ව හා ඒකල ව නර්තන අභ්‍යාස කර මංගලම් නර්තනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම** :

- මංගලම් බෙර පදය නිවැරදි ව තාල තබා කියන්න.
- මංගලම් කවිය ගායනය කරමින් හස්ත චලන ඉදිරිපත් කරන්න.
- බෙර පද වාදනයට අනුව මංගලම් නර්තනය ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.6** : ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.6.1** : ශුද්ධ මාත්‍රය නර්තනය කරමු. (පහතරට නර්තන සම්ප්‍රදායය)

**කාලච්ඡේද** : 06

**ඉගෙනුම් පල** :

- ශුද්ධ මාත්‍රය නර්තන අංගයෙහි පසුබිම පිළිබඳ අදහස් දක්වයි.
- ශුද්ධ මාත්‍රයට අදාළ බෙර පද, කවි හා ඉරට්ටි තාල තබමින් කියයි.
- නියමිත අංගහාර අනුගමනය කරමින් අදාළ පද කොටස් හා ඉරට්ටි නර්තනය කරයි.
- සාම්ප්‍රදායික ලක්ෂණ ඉස්මතු වන පරිදි ගායනය සහිත හා රහිත පද කොටස් බෙර වාදනයට අනුව නර්තනය කරයි.
- බෙර වාදනයට අනුව ශුද්ධ මාත්‍රය සාමූහිකව, ඒකල ව නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, ශුද්ධ මාත්‍රය ලියන ලද සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය:** අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, පැවරුම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

ශුද්ධ මාත්‍රයේ අදාළ සාම්ප්‍රදායික ගති ලක්ෂණ ඉස්මතු වන පරිදි නර්තනය කරන්න. ශාන්තිකර්මවල දී සහ පද්ධතියේ ඇතැම් අවස්ථාවල දී බර පදය මාත්‍රා 4 තනි තිතටත්, ඉරට්ටිය මාත්‍රා 3 තනි තිතටත් නර්තනය කිරීම භාවිතයේ පවතී. එය සාම්ප්‍රදායික අනන්‍යතාවයක් ලෙස සලකනු ලැබේ. එහෙත් පාසල් පද්ධතියේ දී බර පදය, අලංකාර පදය, ඉරට්ටිය මාත්‍රා 3 තනි තිතට නර්තනය කිරීම නිර්දේශ කර තිබේ. එහෙත් මාත්‍රා 4 තනි තිතට බර පදය නටා ඉරට්ටිය මාත්‍රා 3 තාලයට යම්කිසි සිසුවකු නර්තනය කළහොත් එය සාම්ප්‍රදායික අනන්‍යතාවයක් ලෙස පිළිගනිමින් ඇගයීමට ලක් කිරීම වඩාත් සුදුසු ය.

## ශුද්ධ මාත්‍රය

**බර පදය : මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

ගත් දිත් තත් දොම් තකු දොම්
රුඳ ගුඳ ග-ත-ක-දිමි දිමි දූහිමි

**අලංකාර පදය** :
ගත් තම් ගත් දිත ගදිතකු දොං දොං
තකු දොම් රුඳ ගුඳ ගතිගත
ගත් දූහිමි ගුම් දූහිමි
ගුදිතක දිකු ඳක දූහිමි

**ඉරට්ටිය** :
රිමි ගත ගත ගදිතග තම් - ගත් දිත් තත් දොම් තකු දොම්
රුඳ ගත ගත ගදිත ගතම් - දෙග දිත් තත් දොම් තකු දොම්
රිමි ගත ගත ගදිත ගතම් - රුඳ ගතගත ගදිත ගතම්
ගදිත ගතම් - ගුදිත ගුඳම්
ගත් දිත් තත් - දෙග දිත් තත්
දෙග දිත් දෙග දිත් දෙග දිතගත
ගුදිතක දෙගුඳක දොම්

**2 පදය** : **මාත්‍රා 3 + 4(මැදුම් මහ දෙතිත) තාලය**

රිමි ගත දූහිමිත දෙගත ගත ගුඳ ගුඳ

ගුඳ ගත දූහිමිත දෙගත ගත ගුම්

**කවිය** :
මෙලෙසින් මල් මද දේවියේ
යුදයට කොඩි බැඳ ඒවියේ
මගෙ සකියනි නුඹ පාවියේ
සබ නැටුවා මා දේවියේ

**ඉරට්ටිය** : ගුහිදි ගද්දිරිකිට ගුඳ ගත් දූහිම් ///
දූහිම් දූහිම් දූහිම් ගුහිදි ගද්දිරිකිට ගුඳ ගත් දූහිම්
ගදිත ගත් දූහිම් - ගුදිත ගුම් දූහිම්
ගද්දිරිකිට ගතකු දොම්

**3 පදය** : **මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය**
දොංතගු දංගත ගදිතග තං ගුඳ

**කවිය** : නිල්ලා රැළිලා අඳිනා සේලය තුනු ඉග බබළව තෙයි
සංගා පුස්කොළ තෝඩු තබාලා සවන් පටින් බඳි තෙයි
ළමැද පුරා එන පීන පයෝදර රන් පටියෙන් බඳිතෙයි
මේ සබයෙන් අප දිනවා දෙන්නට සැම දෙවි පිහිට වෙතෙයි

**ඉරට්ටිය** : දොංත ගත්තම් ගදිත ගත්තම්
ගත ගුඳන් ගත ගදිත ගුම් දිත් තා

**4 පදය** : **මාත්‍රා 4 (මහ තනිතිත) තාලය**
දෙගත්ග තකුදොම් (දොංත ගුදංගත ගදිත ගතං ගුඳ)

**කවිය** : අත්තන මල සේ ඇඳ සුදු සේලය ඉණ වට රැලි අල්ලා
නෙළුම් මලක් සේ බඳිනා කොණ්ඩය මල් පෙති ගවසාලා
ගත ගනරන් නුඹෙ මුකුළු සිනාවට බැම දෙක ඉඟි කරලා
බලා සිටින් සකි ළඳ යන අන්දම තාලෙට පා තබලා

**ඉරට්ටිය** : දොම්තග තම් ගුම් දිම් ගත ගත් තත්
ගත්දිත ගත ගත් දිම් ගත ගුම් දත්
තා

**අවසාන ඉරට්ටිය** : ගුංඳ ගුදංගත ගත්ත ගතං ගුඳ/// } ද. ව.
ගුංද ගදිත ගත ගත් තත් දොම් }
ගුංඳ ගුඳංගත ගත්ත ගතං ගත } ද. ව.
ගුංද ගුදංගත ගදිත ගතත් දොම්
ගුංද ගදිත ගත ගත් තත් දොම් - ගත්ත ගදිත ගත ගත්තත් දොම්
ගත්තත් දොම් - දෙගතත් දොම්
දොම්ත ගදිත ගත ගදිගත ගුඳ ගුඳ තා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- ශුද්ධ මාත්‍රය නර්තන අංගය පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අදාළ කවි, බෙර පද තාල තබමින් කීමට යොමු කරවන්න.
- අදාළ පද කොටස් පියවරින් පියවරට ඉගෙනීමට යොමු කරන්න.
- අදාළ අංගහාර, චලන, සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ ප්‍රදර්ශනය වන ආකාරයට නර්තන ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න.
- වාදනයට අනුව අදාළ පද කොටස් නර්තනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගායනය සමඟින් සාමූහික හා ඒකල වශයෙන් වාදනයට අනුව නර්තනය කිරීමට සලස්වන්න.

ඇගයීම :

- ශුද්ධ මාත්‍රයට අදාළ බෙර පද, කවි හා ඉරට්ටි තාල තබමින් කියන්න.
- සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි ගායනය සහිත හා රහිත පද කොටස් බෙර වාදනයට අනුව නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.6** : ගායනය සහිත නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.6.1** : මුල් මාත්‍රය නර්තනය ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද** : 06

**ඉගෙනුම් පල** :

- මුල් මාත්‍රය නර්තන අංගය පිළිබඳ තොරතුරු දක්වයි.
- මුල් මාත්‍රයේ තාල රූපය නම් කරයි.
- මුල් මාත්‍රයේ දවුල් පදය තාල තබමින් කියයි.
- මුල් මාත්‍රයේ තානම හා කවිය ගායනය කරමින් පද නර්තනය කරයි.
- මුල් මාත්‍රයේ කලාසම, අඩව්ව තාල තබමින් කියයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් කලාසම් වට්ටම්, කලාසම හා අඩව්ව නර්තනය කරයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් මුල් මාත්‍රය ඉදිරිපත් කරයි.
- ඉගෙන ගන්නා ලද මුල් මාත්‍රය සාමූහිකත්වයෙන් යුතු ව ප්‍රදර්ශනය කරයි.
- මුල් මාත්‍රය ගායනය කරමින් දවුල් වාදනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන පරිදි සාමූහික ව හා ඒකල ව නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දවුල, තාලම්පට, මුල් මාත්‍රය ඇතුළත් සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, අභ්‍යාස ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, අනුකරණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

සබරගමු සම්ප්‍රදායයට අදාළ මුල් මාත්‍රය නර්තන අංගයෙහි සුවිශේෂ ලක්ෂණ විස්තර කර සාම්ප්‍රදායික නාද රටා, අංගහාර, චලන හා අනන්‍යතා ලක්ෂණ ප්‍රදර්ශනය වන පරිදි මුල් මාත්‍රය නර්තන අංගය ඉදිරිපත් කිරීමට අවශ්‍ය පසුබිම ගොඩ නැඟීම මෙහි දී අපේක්ෂා කෙරේ.

## මුල් මාත්‍රය

**මාත්‍රා 2 + 2 + 2 + 4 + 4 (තුන්සුළු දෙමහ පස් තිත) තාලය**

**දවුල් පදය** : කුං දිත් තත් දොංතක තරිකිට (ජිං ජිං ජිං දොංතග තිතගත)

**තානම** : තාන තන තන තාන තන තන
තාන තන තම් දානෙනා

**කවිය** :
සසිරි සිරිලක කොදෙව් දෙදහස් පෑව අණසක මංගලම්
මෙසිරි ලක තුන් පියවරට මැන මුනි රජුට පිදූ මංගලම්
එ සිරිමා බෝ පිළිම දා ගැබ් සාසනේ පිදූ මංගලම්
අසුර පුල්වන් දෙවිඳු බලයෙන් වේ වා ජයසිරි මංගලම්

**කලාසම් වට්ටම** : (කුන්දිත් තත් දොංතගතිත ගත //// කුන්දිත් තත් දොම්)///ද/ව/ද (තක්කිට)

**කලාසම** : කුඳ කුඳ කුඳ කුදිත ගදිතගත
කුඳ කුඳ කුඳ කුදිත ගදිතගත
කුඳ කුඳ කුඳ කුදිත ගදිතගත
කුඳ ගත කුඳ තා

**අඩව්ව** : කුඳ කුඳ කුඳ තත් තත් තත් තත්
කුඳ කුඳ කුඳ ගත්ත කුදිත ගත
කුඳ කුඳ කුඳ ගත්ත කුදිත් තත්
කුඳ ගත කුඳ තා (තරිකිට) } // ද. ව.
කුඳ කුඳ කුඳ තත් තත් තත් තත්
කුඳ කුඳ කුඳ ගත්ත කුදිතගත } // ද. ව.
l ╞ l ╞ l ╞ ; ; ą ; ą ; ą ; a$$ o' j '
l ╞ l ╞ l ╞ . ; ą l ¢; . ; $$$
l ╞ l ╞ l ╞ ; d ^; l a g &$$$
l ╞ l ╞ l ╞ ; ; ą ; ą ; ą ; a
l ╞ l ╞ l ╞ . ; ş l ¢; . ;
l ╞ l ╞ l ╞ . ; ą l ¢; ą ; a
l ╞ . ; l ╞ f c x ; d

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- මුල් මාත්‍රය නර්තන අංගයෙහි පසුබිම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මුල් මාත්‍රයට අදාළ පද කොටස් තාල තබමින් කීමට සලස්වා තාල රූපය පිළිබඳ විමසුමට ලක් කරන්න.
- අදාළ පද කොටස් පියවරින් පියවරට ඉගෙනීමට යොමු කරවන්න.
- නිවැරදි අංගහාර, චලන ගායනයේ නාද රටා සහ සාම්ප්‍රදායික අනන්‍යතා ආරක්ෂා වන පරිදි නර්තනය කිරීමට මඟ පෙන්වන්න.
- දවුල් වාදනය අනුව මුල් මාත්‍රය අභ්‍යාසයේ යොදවන්න.
- සාමූහික හා ඒකල වශයෙන් ගායනය කරමින් දවුල් වාදනයට අනුව මුල් මාත්‍රය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම** :

- මුල් මාත්‍රයට අයත් මූලික දවුල් පදය, කලාසම්, අඩවු නිවැරදි තාල රූපයට අනුව තාල තබමින් කියන්න.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් ගායනයට අනුව පද නර්තනය කරන්න.
- නියමිත පද කලාසම්, අඩවු කණ්ඩායම් වශයෙන් නර්තනය කරන්න.
- මුල් මාත්‍රය සම්පූර්ණයෙන් ගායනය සහිත ව ඒකල ව නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.6** : ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.6.2** : කුවේණි අස්න නර්තන අංගය ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද** : 06

**ඉගෙනුම් පල** :

- කුවේණි අස්න නර්තන අංගයෙහි පසුබිම හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- අදාළ පද කොටස් තාල තබමින් කියයි.
- සාම්ප්‍රදායික ගති ලක්ෂණ ප්‍රදර්ශනය වන පරිදි පූජා භාණ්ඩය හසුරුවමින් නර්තනය ඉදිරිපත් කරයි.
- අදාළ කවි ගායනය කරමින් කුවේණි අස්න නර්තනාංගය ඉදිරිපත් කරයි.
- බෙර වාදනයට අනුව නියමිත අංගහාර අනුගමනය කරමින්, ගායනය කරමින් කුවේණි අස්න නර්තන අංගය ඉදිරිපත් කරයි.
- සාමූහික ව හා ඒකලව කුවේණි අස්න නර්තනය ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ගැට බෙරය, තාලම් පට, කුවේණි අස්න ලියන ලද සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, අභ්‍යාස ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

පූජා භාණ්ඩයන් අතැති ව ඉදිරිපත් කරන කුවේණි අස්න නර්තන අංගය ගායනය සමඟින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය සිසු ශක්‍යතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම සැලසුම් කළ යුතු ය. මෙම ක්‍රියාකාරකමේ දී පළමු පද තුනට අමතර ව ශිෂ්‍ය කුසලතාව වර්ධනය සඳහා ඕඩියට හෙවත් මාත්‍රා 2 කඩිනම් ලයට නර්තනය කර කස්තිරමක් ඉදිරිපත් කිරීමට යොමු කිරීම අපේක්ෂා කෙරේ.

## කුවේණි අස්න

**මාත්‍රා 2 + 2 + 4 (දෙසුළු මහ තුන් තිත) තාලය**

**ආලත්ති පදය** :
තග් ගජිං/// තකුඳ කුඳ කුඳ කුඳ
කුංත ගත ගත /// කුංත ගත දොං
කුකුඳ ගත/// තකුඳ ගත දොං
කුංත ගජිගත ගජිත ගත දොං (ගත ජිං)
කුකුඳ ගජිගත ගජිත ගත දොං (ගත ජිං)
කුංත ගත දොං (ජිං) කුකුඳ ගත දොං (ජිං)
ගත කුංත ගතට ගත
කුංත කුංතත් ජිං, තකුං තකුං ජිං ජිං ගජ්ජිං

**1 මාත්‍රය** :
තකුංත කුං කුං කුඳගත කුකුතක ජිං
තත් ජිං තක ජිජිකුඳ ගජිං ගත් තරිකිට කුංදත්

**කවිය** :
අපගේ මුනි රජාණන් . . . . .

**කස්තිරම** :
ගජ්ජිං කඩතක ජිකුතක ජිජිගත කුඳ කුඳ///
ගජ්ජිං කඩතක ජිජිකුඳ//
ගජ්ජිං කඩතක ජිකුතක ජිජිගත කුඳ කුඳ
තාග් ගජිංතක ජිංගත කුංදත් - ගජ්ජිං කඩතක ජිකුතක
ජිජිගත කුංදත් තා

**මාත්‍රා - 4 (මහ තනිතිත) තාලය**

**2 මාත්‍රය** : කුංජිං ගත්තත් - තකුජිං ගත්තත් - කුංජිං ගත්තකු දා
තක තරිකිට, තක්කඩ තරිකිට ජිජිකුඳ
ජික්කඩ තරිකිට ජිජිකුඳ - කඩතක තරිකිට ජිජිකුඳ
ගජ්ජිත් තකජිත් ගජ්ජිත් කුංදත් තා

**කවිය** : කොයි ගොසින් කොයි අනේ....

**කස්තිරම** : තක්කඩ තරිකිට ජිත්තත් තෙහිං තෙහිං ජිත්තත්
තෙහිං ජිං ගත්තකු ජිංගත කුඳගත ජිංගත කුඳගත
තෙහිංත කඩතක// තෙහිං ජිත් ගත්තත් තෙහිං
ගත්තකු ජිත්තම් - ගජිතකු ජිත්තම්
තරිකිට ජිත් - තරිකිට දොම්කිට තා.

**මාත්‍රා - 3 (මැදුම් තනිතිත) තාලය**

**3 මාත්‍රය** : දොංත තදොම් තදොම් රුඳගජිං තකට ගත කුඳ ගත
දොංත තදොම් තදොම් රුඳ ගජිං

**කවිය** : සොපින සොමි වන කැළුම් ......

**කස්තිරම** : ගත් තරිකිට කුංදත් තරිකිට කුංදත් ජෙංගඩ තා....
තතත්, ජිජිත් තොතොං, නනං
තකු තරිකිට කුදං තරිකිට කුංදත් ජෙංගඩ තා.

ශිෂ්‍ය කුසලතාව තව දුරටත් ඔප් නැංවීම සඳහා ඕඩියට (මාත්‍රා 02 කඩිනම් ලයට) නර්තන දක්වීම නිර්දේශිත ය. කස්තිරමක් යොදා ගනිමින් එම කොටස නිම කළ හැකි ය. මේ සඳහා,
''**දැන් සොඳුර - තනි ව මම - යුරු කොමළ....**'' යන කවිය භාවිත කළ හැක.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- කුවේණි අස්න නර්තන අංගයෙහි පසුබිම හා සුවිශේෂ ලක්ෂණ විස්තර කර සිසුන් දැනුම්වත් කරන්න.
- එහි පද හා කවි තාල තබමින් ගයන්නට යොමු කර අවශ්‍ය මඟ පෙන්වීම් කරන්න.
- අදාළ පද කොටස් පියවරින් පියවර නර්තනය කිරීමට යොමු කරවන්න.
- නිවැරදි අංගහාර, පූජා භාණ්ඩ හැසිරවීම හා සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ ආරක්ෂා කරමින් නර්තනයේ යෙදීමට මඟ පෙන්වන්න.
- බෙර වාදනය අනුව නර්තන අභ්‍යාසයේ යොදවන්න. එහි අවශ්‍යතාව විස්තර කරන්න.
- සාමූහික ව හා ඒකල ව ගායනය කරමින් බෙර වාදනය අනුව කුවේණි අස්න ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ඇගයීම :

- කුවේණි අස්න නර්තන අංගයෙහි පසුබිම හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- කුවේණි අස්න කවි දෙකක් තාල තබමින් ගායනය කරන්න.
- කුවේණි අස්න පද දෙකක් හා අදාළ කස්තිරම් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.6** : ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.6.2** : විෂ්ණු මල් අස්න නර්තන අංගය ඉදිරිපත් කරමු.
(පහතරට නර්තන සම්ප්‍රදාය)

**කාලච්ඡේද** : 06

**ඉගෙනුම් පල** :

- විෂ්ණු මල් අස්න නර්තන අංගයෙහි පසුබිම විස්තර කරයි.
- විෂ්ණු මල් අස්නට අදාළ බෙර පද, කවි හා ඉරට්ටි තාල තබමින් කියයි.
- කවිවලට අදාළ පද කොටස් හා ඉරට්ටි නර්තනය කරයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් කවි ගායනයට අනුව නර්තනය කරයි.
- බෙර වාදනයට අනුව කවි ගායනය කරමින් සාමූහික ව / ඒකල ව විෂ්ණු මල් අස්න නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, විෂ්ණු මල් අස්න ලියන ලද සටහන්.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** :අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, කැඩපත් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

විෂ්ණු මල් අස්න නර්තන අංගයෙහි පසුබිම හඳුන්වා දීම ද වැදගත් ය. පළමු තාලයේ දී පාද තැබීමට පෙර කවි ගායනය ආරම්භ කිරීමෙන් පසු ව නර්තනය ආරම්භ කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමවේදය භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. දෙවන තාලයේ කවි දෙක එක ම තාල රූපයකට අයත් වන බැවින් නාද මාලා දෙකක් වශයෙන් ගායනා කරමින් නර්තනය කිරීම අපේක්ෂා කෙරේ. ශාන්තිකර්මවල භාවිත කරන විෂ්ණු මල් අස්න පාසල් පද්ධතියට ගැළපෙන ආකාරයට සකස් කර ඉදිරිපත් කර ඇති බව සලකන්න.

## විෂ්ණු මල් අස්න

**ආශීර්වාද කවි** :
**(අනාසාතාත්මක කවි)**

| | | | |
|---|---|---|---|
| වියන් වට පළ කළ | - | රුවන් පායකි මන | කල |
| කියන් තම තෙද බල | - | බැතින් නමඳිම් විෂ්ණු තෙද | බල |
| ශ්‍රී විෂ්ණු දෙවිඳුට | - | ආරාධනා කළ | විට |
| දෝස දුරලන්නට | - | වඩින් දෙවියනි මෙ මල් | යහනට |

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**බෙර පදය** :

රිම් ගත්තම් - ගත් දිත ගත
ගදිත ගතකු - දොං ගත ගුඳ
ගුඳ ගත්තම් - ගත් දිතගත
ගදිත ගතකු දොං

**කවිය** :

| | |
|---|---|
| කිරුළු රුවන් දේවහරණ නීල සළුව | ඇඳ |
| සුරුළු එරන් දුනු දඬු සිරි හස්තෙට තද | තෙද |
| කිරුළු ඉන්ද්‍ර මිණි ජාලා මල් පටි සුර | නද |
| ගුරුළු අස්න පැන නැගිලා වඩින් විෂ්ණු | තෙද |

ආල වඩන රුවන් දුන්න පණිවිඩ කරලා
දැල වරෙන් රන් දුන්නෙන් එළිය හෙළාලා
නීල වර්ණ දේව රැසින් ගිනිජල් ඇරලා
කෝල නැති ව විෂ්ණු මෙමල් අස්න බලාලා

**ඉරට්ටිය** : දොංත ගතකු /// දොං ///
දොංත ගතම් - ගදිත ගතම්
ගදිත්ත ගුංදත් දෙගුඳත් තා
(ර්....... රිම් ගත ගත....)
ඉරට්ටිය දීර්ඝ කර නර්තනය කළ හැකි ය.

**බෙර පදය** : දෙගත් ගතකු දොං - මාත්‍රා 4 (මහ තනිතිත) තාලය

**කවිය** : වලා යටින් පායන පුන් සඳ සෙ දිලෙනවා
බලා එරන් සඳුන් රුකක් සේ ම පෙනෙනවා
හෙළා දිෂ්ටි බලා සැණින් දුකින් මුදනවා
බලා මෙමල් අස්නට ශ්‍රී විෂ්ණු වඩිනවා

**ඉරට්ටිය** : තත් තත් රුඳ ගත - ගදිත ගුඳිතගත
තත් තත් රුඳ ගුඳ තාකු දොං ගත
ගදිත්ත ගුහිති ගදිරිකිට තා.

ඉඳු දිග මණ්ඩලයට අධිපති විෂ්ණු නම් ලත් සුරිඳුනේ
මෙමල් යහනට වැඩම කරවා දුටත් වරදක් හරිමිනේ
සැණෙන් වින යකු මෙතන ගෙන්වා කරපු අණවින හරිමිනේ
මෙ ආතුර පිරිපත දමා දුර රකින් සියවස් සුරිඳුනේ

**ඉරට්ටිය** : දොංත ගතම් ගුම් - දිම්ගත ගත්තත්
ගත්දිත ගතගත් - දිම්ගත ගුංදත් තා

**බෙර පදය** : ගුංද දෙගත ගති ගත ගුඳ - මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

**කවිය** : ගොතා එරන් දඹ කරවට නිල් මල් සැදි සොඳ සඟළ අඳිනවා
පතා එ බුදු වන්ඩ සිතා මරු බිඳ ජයගෙන පෙරුම් පුරනවා
සිතා අතින් ගත්ත දුන්න මිණි නද අහසේ මෙර කැරකෙනවා
එතා මෙමල් අස්න බලා නාරායණ සිරි විෂ්ණු වඩිනවා

**ඉරට්ටිය** : දොංත ගතම් ගත් දිත ගත } (ද. ව.)
ගදිත ගතකු තත් දොම් දොම් }
දොංත ගතම් තත් දොම් දොම්
ගදිත ගතම් තත් දොම් දොම්
දොංත ගතම් ගදිත ගතම්
ගදිත්ත ගුම්දත් දෙගුඳත් තා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- විෂ්ණු මල් අස්න නර්තන අංගයෙහි පසුබිම පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- අදාළ කවි පද තාල තබමින් කීමට යොමු කරවන්න.
- පියවරින් පියවරට අදාළ පද කොටස් නර්තනයට මඟ පෙන්වන්න.
- බෙර වාදනයට අනුව ගායනය කරමින් නර්තනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අවකාශය භාවිත කිරීමේ දී ශාන්තිකර්මවල භාවිත ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කර ක්‍රියාකාරකම ගොඩනගන්න.
- සාමූහික ව හා ඒකල ව බෙර වාදනයට අනුව ගායනය කරමින් නර්තනය ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම :**

- විෂ්ණු මල් අස්නට අදාළ බෙර පද, කවි, ඉරට්ටි තාල තබමින් කියන්න.
- බෙර වාදනයට අනුව කවි ගායනය කරමින් සාමූහික ව/ඒකල ව විෂ්ණු මල් අස්න නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.6** : ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** 1.6.2 : සමන් දෙවි මල් යහන් නර්තන අංගය ඉදිරිපත් කරමු.

(සබරගමු නර්තන සම්ප්‍රදායය)

**කාලච්ඡේද** : 06

**ඉගෙනුම් පල** :

- සමන් දෙවි මල් යහන් නර්තන අංගය පිළිබඳ විස්තර කරයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් සමන් දෙවි මල් යහන් කවි විවිධ තාල රූපවලට ගායනය කරයි.
- ඉගෙන ගන්නා ලද සමන් දෙවි මල් යහන හා සබැඳි කවි ගායනය කරමින් දවුල් වාදනයට අනුව සාමූහිකත්වයෙන් යුතු ව නර්තනය කරයි.
- සමන් දෙවි මල් යහන නර්තනය ගායනයට අනුව නිවැරදි අංගහාර ප්‍රදර්ශනය වන පරිදි සාමූහික ව හා ඒකල ව නර්තනය කරයි.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් කලාසම, අඩව්ව නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දවුල, තාලම්පට, ගායනය ලියන ලද සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, අභ්‍යාස ක්‍රමය, අනුකරණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

සබරගමු පහන් මඩුව ශාන්තිකර්මයෙහි අන්තර්ගත සමන් දෙවි මල් යහන නර්තන අංගය අ.පො.ස. උසස් පෙළ සිසුන්ට ප්‍රමාණවත් වන ආකාරයට සැලසුම් කර ඉදිරිපත් කර ඇත. සාම්ප්‍රදායික නාද රටා, චලන අංගහාර අනුගමනය කරමින් ගායනය සමඟ නර්තනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

## සමන් දෙවි මල්යහන් කවි

**ආශීර්වාද කවි** **(අනාසාතාත්මක කවි)** :

මුනිතුමන් අණ දූරූ
දෙවි බඹුන් සැම ගුරුවරූ
ලැබ වරම් ඉසරූ
මල් යහන් කවි කියම් විසිතුරූ

**දවුල් පදය** : දෝං දොමිත්තත් තක්කිට කිටිතක

**කවිය** :

ලස්සන කුසුමාසන බැඳ ගිනිකොන
එක් කරවා පස දළුමුර දීපදුන
දක්වමි මේ පුද ගෙන මල් බුලතින
ලක් එ සුමන දෙවි වඩිනේ ගිනිකොන

**හමාරය** : ජිමිකිට කිටිතක, ගත්තත් කුන්දත් තා

**කලාසම** : තිත් තිත් තෙයි/// (තරිකිට)

තිත් තිත් තෙයි

| | | |
|---|---|---|
| **අඩව්ව** | : | ගත්තකු දිත්තා - තොංකඩ තරිකිට කිත්තා |
| | | ගත කුඳ ගත කුඳ තක්කඩ දික්කඩ තොංකඩ තරිකිට |
| | | දොංත ගතිත ගත ගතිගත දිරිකිට තරිකිට තා |
| | | ජිමිත්තත් ගති ගත තරිකිට කුන්දත් තා |
| **දවුල් පදය** | : | දොංත තකට මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය |
| **කවිය** | : | ගලා මුහුද රැලි සමුදුර පර්වත පිට සිට වඩින්න<br>හෙළා දිවැස් සක්වළ ගල හිමගිරි ලෙන තුළින් එන්න<br>වලා මේඝ අතර ගුවන් සක්මන් කරමින් වඩින්න<br>මෙ යාගයෙන් සුමන සුරිඳු මල් යහනට වැඩම වන්න |
| **කලාසම** | : | කුඳ කුඳ ගත කුඳ කුඳ ගත // |
| | | කුඳ ගත කුඳ ගත කුඳ දොං |
| | | කුඳත් තකට තා කුන්දත් තරිකිට |
| | | කුඳගත කුඳ තා ගතක් |
| **අඩව්ව** | : | තත් කුඳ ගත තකට ජෙ ජෙං තතත් තා |
| | | තතත් තා - තතත් තා |
| | | කුඳ කුඳගත කුඳ කුඳගත කුඳ කුඳගත තතත් තා |
| | | දිරිකිට තරිකිට තකට /// |
| | | තහර්ද තත්ත ගත කුඳගත තහර්ද තා |
| **දවුල් පදය** | : | ජිං - ගතා කුඳ |
| **කවිය** | : | ගිමන් නිවා වැඩ හිඳ එසමන් ගිර<br>අතින් දරා දුනු විදිමින් හී සර<br>නිවන් දකින දෙවිඳෙක් නැත ඔබ හැර<br>සමන් දෙවිඳු මේ පුද ලැබ දොස හැර |
| **කලාසම** | : | කුඳක් ගත්තත් ගතත් කුන්දත් /// |
| | | කුඳ ගත ගත කුඳ ගතිත කුදිත් තත් |
| **අඩව්ව** | : | තාත් තහර්ද කුඳ තාග්ග ජිත්තත් |
| | | ජිංගත කුඳගත් - ගතිගත කුඳගත් |
| | | ගත්තත් තහර්ද කුඳ තා ගතිත් තත් |
| | | ගති ගත කුඳගත තා |

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- සමන් දෙවි මල් අස්න පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සමන් දෙවි මල් යහන් කවි තාල තබමින් ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පියවරින් පියවරට අදාළ කවි ගායනය හා නර්තන කොටස් ඉගෙනීමට සලස්වන්න.
- නිවැරදි තාල, චලන, අංගහාර මෙන් ම සාම්ප්‍රදායික අනන්‍යතා ආරක්ෂා කරමින් දවුල් වාදනයට අනුව නර්තනය ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න.
- සාමූහික ව හා ඒකල ව සමන් දෙවි මල් යහන් නර්තන අංගය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම** :

- සමන් දෙවි මල් යහන් කවි විවිධ තාල රූපයන්ට අනුව ගායනය කරමින් නර්තනය ඉදිරිපත් කරන්න.
- සමන් දෙවි මල් අස්න කවි ගායනය කරමින් වාදනයට අනුව සාමූහික ව නර්තනය කරන්න.
- සමන් දෙවි මල් අස්න කවි ගායනය කරමින් වාදනයට අනුව ඒකල ව නර්තනය කරන්න.

**නිපුණතාව 01** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.7** : වෙනත් සම්ප්‍රදායවලට අයත් නර්තන අංග දෙකක් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 1.7** : මංගලම්, ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රය නර්තනය කරමු.

**කාලච්ඡේද** : 15

**ඉගෙනුම් පල** :

- අදාළ නර්තන අංගවල පසුබිම විස්තර කරයි.
- මංගලම්, ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රය, නර්තන අංගවල තාල රූප නම් කරයි.
- මංගලම්, ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රයට අදාළ බෙර පද, දවුල් පද තාල තබමින් කියයි.
- මංගලම්, ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රයට අදාළ කවි ගායනය කරයි.
- අදාළ පද, කස්තිරම්, කලාසම්, ඉරට්ටි, අඩවු නර්තනය කරයි.
- ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයෙහි මූලික අංගහාරවල හා චලනවල විවිධතා නිරීක්ෂණය කර අදහස් දක්වයි.
- සාම්ප්‍රදායික අංගහාර, ඉරියවු හා චලන ප්‍රදර්ශනය වන පරිදි අදාළ නර්තන අංග සාමූහික ව හා ඒකල ව ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, ලිඛිත සටහන්, ඡායාරූප.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, අනුකරණ ක්‍රමය, ගවේෂණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

අ.පො.ස. (උ.පෙළ) නර්තන විෂයය හදාරන සිසුන්ට දේශීය නර්තන සම්ප්‍රදාය ත්‍රිත්ත්වයෙහි තමා හදාරන සම්ප්‍රදායය හැර අනෙක් සම්ප්‍රදාය දෙකෙන් නර්තන අංගයක් බැගින් හැදෑරීමට මෙම ක්‍රියාකාරකමෙන් නිර්දේශ කොට තිබේ. ශ්‍රී ලාංකේය නර්තනයෙහි සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ නිවැරදි ව හඳුන්වා දෙමින් අදාළ නර්තනාංග ඉගැන්වීමට සුදුසු ලෙස ක්‍රියාකාරකම සැලසුම් කළ යුතු ය. මෙම ගුරු මාර්ගෝපදේශයෙහි පිටු අංක 36,41 හි අන්තර්ගත ක්‍රියාකාරකම්වල විෂයය අන්තර්ගතය අදාළ කර ගනිමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීම වැදගත් වේ. අදාළ සම්ප්‍රදායය ඉගැන්වීමට පෙර මූලික හස්ත පාද හුරු කිරීමට සරඹ කිහිපයක් අභ්‍යාස කරවන්න.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායය හැර අනෙක් සම්ප්‍රදාය දෙකට අයත් නර්තන අංගයක් (එක් වාරයකට 01ක්) තෝරා ගන්න.
- අදාළ නර්තන අංගයෙහි පසුබිම සාකච්ඡා කරමින් විමසීමට ලක් කරන්න.
- තෝරා ගත් නර්තන අංගයෙහි ගායනය හා පද කොටස් තාල තබමින් කියන්නට සලස්වන්න.

- නිවැරදි සාම්ප්‍රදායික අංගහාර අනුගමනය කරමින් නමස්කාරය හුරු කරවන්න.
- හස්ත පාද චලන භාවිත කරන ආකාරය පැහැදිලි ව ප්‍රදර්ශනය කරන්න.
- දෘශ්‍ය සංයුක්ත තැටි මඟින් හෝ ගුරුවරයා විසින් නියමිත අංගහාර ප්‍රදර්ශනය කරනු ලැබීම මඟින් හෝ මූලික අභ්‍යාස කිහිපයක් සිසුන්ට ඉගෙනීමට සලස්වන්න.
- සාම්ප්‍රදායික අංගහාර, චලන, බෙරපද, සමාන අසමානතා හා සුවිශේෂතා පිළිබඳ ව උදාහරණ දක්වමින් තුලනාත්මක සාකච්ඡාවක් මෙහෙයවන්න. විවිධ සම්පත් හා ඉගෙනුම්/ඉගැන්වීම් උපකරණ භාවිත කරන්න.
- සාමූහික ව හා ඒකල ව නර්තනය අභ්‍යාස කිරීමට මඟ පෙන්වන්න.
- බෙර වාදනයට අනුව උගත් නර්තන අංග අභ්‍යාස කරවන්න.
- සිසු ශක්‍යතා සලකා බලමින් අවශ්‍ය මඟ පෙන්වීම් කරන්න.

**ඇගයීම** :

- උගත් නර්තනයට අදාළ පද හා කවි තාල තබමින් කියන්න.
- උගත් නර්තනාංගය ඒකල ව ඉදිරිපත් කරන්න.
- නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයෙහි මූලික අංගහාර ප්‍රදර්ශනය කරන්න.

සැ.යු. : සිසුන් උගත් වෙනත් සම්ප්‍රදායවලට අයත් නර්තන අංග දෙක ජාතික මට්ටමේ ඇගයීම්වල දී කැමති නර්තන අංගය ලෙස ඉදිරිපත් කිරීමට අවකාශය ඇති බව සලකන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව** 02 | : | නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි. |
| **නිපුණතා මට්ටම** 2.1 | : | රස භාව සංකල්ප පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි. |
| **ක්‍රියාකාරකම** 2.1 | : | රස - භාව පිළිබඳ ව උගනිමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 05 |
| **ඉගෙනුම් පල** | : | |

- රස භාව පිළිබඳ දැක්වෙන විවිධ මත විමසුමට ලක් කරයි.
- රස භාව නම් කරයි.
- රස නිෂ්පත්තිය සිදු වන ආකාරය විමසුමට ලක් කරයි.
- ශ්‍රී ලාංකේය ශාන්තිකර්මවල රස භාව දැකිය හැකි අවස්ථා උදාහරණ දක්වමින් සාකච්ඡා කරයි.
- භාව උද්දීපනය සඳහා දේශීය නර්තන සම්ප්‍රදායවල භාවිත කර ඇති විධික්‍රම පිළිබඳ ව තොරතුරු දක්වයි.
- භාව ප්‍රකාශනය සඳහා අවශ්‍ය අංග, ප්‍රත්‍යංග, උපාංග හැසිරවීමේ මූලික ශිල්ප ක්‍රම අනුගමනය කරයි.
- නව නළු රස නිරූපණය කරයි.

| | | |
|---|---|---|
| **ගුණාත්මක යෙදවුම්** | : | දෘශ්‍ය සංයුක්ත තැටි, ඡායාරූප, අවශ්‍ය විෂය කරුණු සටහන් පත්‍රිකා. |
| **ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** | : | ග්‍රන්ථ පරිශීලන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, භූමිකා රංගන ක්‍රමය. |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

රස භාව සංකල්ප හඳුන්වා දීමේ දී විවිධ අවස්ථා අනුව මිනිසා තුළ ඇති වන හැඟීම් විමසීමට ලක් කළ යුතු වේ. එමගින් නව නළු රසය මෙන් ම ඒ හා බැඳි භාව හඳුනා ගැනීමට යොමු කළ යුතු ය. මෙම රසභාව පිළිබඳ අදහස් දැක්වූ මතවාදීන් පිළිබඳ තොරතුරු කෙටියෙන් දැක්වීම අවශ්‍ය වේ.

අනතුරුව දේශීය ශාන්තිකර්මවල රස නිෂ්පත්තිය දැකිය හැකි අවස්ථා හඳුන්වා දිය යුතු වේ. ඒ අනුව සන්නි යකුමේ යක් නැටුම්, පාලි නැටුම්, මරු සන්නිය, සන්නි 18 හා දෙවොල් මඩු, පහන් මඩු යාගවල දෙවොල් ගොඩ බැසීම අඹ විදමන, රට යකුමේ දොළහ පෙළපාලියත්, සූනියමේ වඩිගපටුනත් මේ සඳහා අදාළ කර ගත හැකි ය.

රස සිද්ධාන්තය භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වේ. එහි 6 වන පරිච්ඡේදයේ දැක්වෙන රස සූත්‍රය වනුයේ ''විභාවානුභාව ව්‍යභිචාරී - සංයෝගාද් රස නිෂ්පත්තිඃ''

ඒ අනුව රස නිෂ්පත්තිය සඳහා විභාව, අනුභාව හා ව්‍යභිචාරී භාව, සංයෝග වන බව කියවේ. භරත මුනි දක්වන අයුරින් භාව අටක් වන අතර එයින් ඇති වන රස ගණන ද අටකි.

| **භාව** | **රස** |
|---|---|
| රති | ශෘංගාර |
| හාස | හාස්‍ය |
| ශෝක | කරුණ |
| ක්‍රෝධ | රෞද්‍ර |
| උත්සාහය | වීර |
| භය | භයානක |
| ජුගුප්සා | බීභත්ස්‍ය |
| විස්මය | අද්භූත |

**විභාව යනු** ස්ථායී භාව අවධි කිරීමට මුල් වන හේතුව යි. මෙය ආලම්භන විභාව සහ උද්දීපන විභාව ලෙස කොටස් දෙකකට බෙදේ. ස්ථායී භාවයක් ඇති කිරීමට බලපාන හේතුව ආලම්භන විභාව යි. ආලම්භන යනු අරමුණ යි.

**අනුභාව යනු** විභාවයන් මුල් කරගෙන අවධි වූ ස්ථායී භාව ප්‍රදර්ශනය කරලීම යි. එනම් පාත්‍රයාගේ සිත් තුළ ඇති භාවයන් බාහිර ව ප්‍රකාශ කිරීම යි.

සිනහව, මුහුණ රතු වීම, නෙතග බැලුම්, කඳුළු සැලීම වැනි දේ මඟින් චරිතයේ මනෝභාව ප්‍රකට කිරීම සිදුවේ.

**ව්‍යභිචාරී භාව යනු** ආලය, ක්‍රෝධය වැනි මනෝභාවයන් පවතිද්දී ඒ මනෝභාවයන් සමඟ ම කලකිරීම, එපා වීම, නින්ද නොයෑම, උකටලිය වැනි උපභාව ඇති වීම යි.

පසුකාලීන ව ශම භාවය එකතු වීම නිසා ශාන්ත රසය ද එක්ව රස 09ක් ලෙස භාවිතයේ පවතී.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- ක්‍රියාකාරකම සාර්ථක වීමට සුදුසු පිවිසීම් ක්‍රමයක් හෝ භාව නිරූපණය කරන විවිධ අවස්ථාවලට අදාළ දෘශ්‍ය සංයුක්ත තැටි හෝ ඡායාරූප ප්‍රදර්ශනය කරමින් ක්‍රියාකාරකම ආරම්භ කරන්න.
- රස භාව සංකල්ප පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- රස සිද්ධාන්ත විස්තර කරමින් තොරතුරු සාකච්ඡා කරන්න.
- දේශීය ශාන්තිකර්මවල රස භාව දැකිය හැකි අවස්ථා උදාහරණ ලෙස දක්වමින් ඒ පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න.
- දේශීය ශාන්තිකර්ම ශිල්පීන් භාව නිරූපණය කිරීමට භාවිත කර ඇති උපක්‍රම විමසුමට ලක් කරමින් රස නිෂ්පන්න කර ඇති ආකාරය විස්තර කරන්න.
- ශාන්තිකර්ම ආශ්‍රිත ඍජු අත්දැකීම් ලබා දීමට සැලසුම් කර එම අවස්ථා නරඹමින් ක්‍රියාකාරකමට අදාළ ව කරුණු ගොනු කිරීමට සලස්වන්න.

**ඇගයීම :**

- නව නළු රසය හා ඒ හා සම්බන්ධ භාවයන් නම් කරන්න.
- රස නිෂ්පත්තිය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.
- භාව උද්දීපනය සඳහා යොදා ගෙන ඇති උපක්‍රම විස්තර කරන්න.
- දේශීය නර්තන සම්ප්‍රදායවල රස භාව දැකිය හැකි අවස්ථා ශාන්තිකර්මයක් ඇසුරින් විස්තර කරන්න.

**නිපුණතාව 02** : නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 2.2** : භාව ප්‍රකාශනය කරමින් විවිධ චරිත නිරූපණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.2** : රීරි යකා හා ජස, මුදලි, නොංචි යන චරිත නිරූපණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- අදාළ චරිතවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- චරිතවලට අදාළ බෙර පද හා කවි තාල තබමින් කියයි.
- චරිතවල සුවිශේෂ ලක්ෂණ අනුකරණය කරයි.
- චරිත නිරූපණය කිරීමෙන් ලබන අත්දැකීම්, නිර්මාණකරණය සඳහා ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
- භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපණය කරයි.
- ඉදිරිපත් කරන චරිත නිරූපණ ඇගයීමට ලක් කරමින් අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : උඩරට බෙරය, පහතරට බෙරය, තාලම්පට, දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ගවේෂණ ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, කේවල ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්** :

උක්ත ක්‍රියාකාරකම් සඳහා සිසු ශක්‍යතා වර්ධනයට ශාන්තිකර්ම හා ගැමි නාටක නරඹා ඍජු අත්දැකීම් ලබා ගැනීමට මඟ පෙන්වන්න.

**රීරි යකා**

**කෙටි කවි** :

දුන් සුමන විවරණ
කන්ද සුරිඳුගෙ බලයෙන
දූන් මෙතන පුදගෙන
එන්ඩ රීරා සැණෙන් නික්මුණ

**නර්තන ආරම්භය** :

දූහිම් දොම් දොම් දොම් ගතම්
ගත්ත ගත ගදිගතම් දෙගත ගත ගදිගතම්
ගදිගතම් ගුඳි ගුඳම්
ගතම් ගුඳතම් ගත්තම් ගතං දොම් තත්
රෙගත ගත ගදිගතම්
දොං ගත් දූහිම්

**බෙර පදය** :

රෙ ග ත දෙ ග ත ගතිගත ගුම් දම් දෙගතම්
රෙ ග ත දිකුඳ දූහිං (ගත්තම් දිතගත)

**තානම** :

ඩෙනඟ// ඩෙන ඩෙන ඩෙන

ඩෙනඟ ඩෙන ඩෙනා//

**කවිය** :

රීරි මරුව හට සැරසෙයි යකා මේ ලෙසා
කුරිරු ලේ බිබී ඩැහැගෙන කටින් මිනි හිසා
කුරිරු අවතාර දහ අට පාලියෙන් බැසා
රීරි යකු වරෙන් මෙපුදට ඉන්ද්‍ර දිග බැසා

**බෙර පදය** : ගත් තම් ගදිතකු දොම්

**කවිය** : උපන් පළමු එක් වර ඇති කරපු මවුමරා
අතින් කඩාගෙන පියයුරු බොමින් ලේ උරා
ගොසින් පෙනෙයි යම රජුහට භූත බය කරා
ඉතිං වරෙන් අග්නි දිගින් යකුන් පිරිවරා

**බෙර පදය** : ගුංද දෙගත ගතිගත ගුඳ

කවිය : සිරස බඳින ජටා සතර පළමු ලේ විලේ
සරොස වෙමින් බලා සිටිති සොහොන් දඬු පලේ
නිදොස් කළේ ආතුරහට දෙවිඳු තෙද බලේ
විගස වරෙන් යාම දිගින් යකා තනි පලේ

රෙගත ගුඳ ගුඳ ගත්// රුඳ ගුඳ ගත්//
රුඳ ගුඳ ගත්ත ගුංද ගත් දිත් තත්
ගුහිති ගදිරිකිට ගුඳ ගත් දූහිම්

**සංවාද අවසානයේ පිදේනිය ගැනීමෙන් පසු -**

**තානම** : ඬෙනාන ඬෙන් ඬෙන ඬෙන ඬෙන ඬෙනන් ඬෙනෝ
නා ඬෙනාන ඬෙන ඬෙන ඬෙන ඬෙනන් ඬෙනෝ

**කවිය** : කාරියක් අසවු ලෙඩ කළ යකු සිහළ
වීරියෙන් දුනිමි පෙර නිම කරපු දොළ
සූරියා ලෙසින් තොප ගිනි ලවමි බල
රීරි යාළුවේ ලේ මල් විලට පල

නැරියොත් කරපු ලෙඩ යකිනිය නුඹලා
වීරියෙන් දුනිමි අංජන ලමි පුදලා
නැසියොත් ලොවිඳු ගෞතම අණය බලා
රීරි යක්ෂණිය පල ලේ පොකුණ බලා

රෙගත ගුඳ ගුඳ ගත්// රුඳ ගුඳ ගත්//
රුඳ ගුඳ ගත්ත ගුංද ගත් දිත් තත්
ගුහිති ගදිරිකිට ගුඳ ගත් දූහිම්
දූහිම්.....

**ආවැඩීම** : (දොංත///ගතම් දූහිම් ගත්ත ගදි ගුඳගත)//
දොංත/// ගතම් - දෙගත ගත්ත ගත්ත ගතම්
දොංත ගතම් දෙගත ගතම්
ගදිගත ගුඳ ගත් දිත් තත්
ගුහිති ගදිරිකිට ගුඳ ගත් දූහිම්
දූහිම්......

## ජස කෝලම

**කෙටි කවි** : පෙර සිට පැවත එන -සිරිතට පොදිය බැඳගෙන
(අනාඝාතාත්මක) උරපිට තබාගෙන - යෝධ ජසයා ඒ ය දුවගෙන

**පදය** : ගුම් දූහිං ගුඳ ගුඳ දූහිං - රිංගත ගදිගත ගුදිතක දිකු දකු දොං

තත් ගුඳ ගුඳ.....

ගම්බිර කාලිංග නුවර - තිරිඳුගෙ රජ වාසලයට
මන් නදනා සේම රුවට - සෝදා සළු පිළී සොඳට//
ඉන් නරනා තැබූ නම මට - ජේඩි විදානේ සත්තට
මම මෙතැනට ආවෙ වියන් - බඳිනට නරනිඳු එනවට//

**ඉරට්ටිය** : ගුඳං දෙගත ගති ගුඳ ගත් දූහිං.

**කවිය** : මේ ගම් පියසේ හේනේ මාමලා
කොච්චර සිටියත් මං වගෙ වෙන නැත //

රජ වාසලයෙන් සළු පිළි අරගෙන
යන්නෙමි රජු වඩිනා පෙරමුණයට //

දෙවනුත් මම යමි මේ පුරයේ වට
පිරුවට දී කිලුටුත් අරගන්නට //

අප්පුහාමිලා මට සල්ලි නොදුන්නොත්
තැබෑරුමේ තියා බොන්නෙමි රෙදි ටික//

මේ පුරයේ හොර චණ්ඩි බොහොම ඇත
හැන්දෑයාමෙ දි පාරේ තැනින් තැන //

නොණ්ඩි වුණත් මම අම්මප බය නැත
මෙන්න බලනවකො ඒවට දෙන බැට //

තැබෑරුමට ගොස් අඩියක් ගහගෙන
යඤ්ඤං පුතා වගෙ වැනි වැනි ගෙදරට //

අපේ ගෙදර උන්දෑ දූන ගත්තොත්
මගෙ මේ කෙස් ටික හිඳිනව සත්තට //

## මුදලි කෝලම

**කෙටි කවි** : මුදලි කම් ලැබගෙන
කස්තාන ගෙල පලඳින
බස්තම අතට ගෙන
රාලහාමි සබේ වඩිමින

**පදය** : ග-ත ගුම් ර්...රිම් ගත ගදිගත ගදිත ග තම්
(දිතගත) ගත්තම් ගදිත ගතම් දිකු දොම් ගුඳ
ගුදිතකු දොම්

## නොංචි කෝලම

**කෙටි කවි** :

නොංචි කර වරුණේ
පුංචි වයසත් පසුවෙමින්නේ
කොන්චි මා (පැංචිමා) ලෙසිනේ
නොන්චි අක්කා එන්ඩ එන්නේ

**පදය** :

දොංත ගතම් දොංත ගතිග තම්
තත් රෙගතම් තත් රෙගතිග තම්

තත් ගුඳ ගුඳ...... (දොංත ගතකු දොම් ගදිතකු)

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- අදාළ චරිත ප්‍රදර්ශනය කර ඒවායේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අදාළ පද කොටස් තාල තබමින් කීමට හා කවි ගායනයට යොමු කරවන්න.
- අදාළ චරිත නිරූපණය කිරීමට මඟ පෙන්වන්න. සිසු ශක්‍යතා තක්සේරු කරමින් අවශ්‍ය පහසුකම් හා සම්පත් දායකත්වය සපයන්න.
- බෙර වාදනයට අනුව භාව නිරූපණය වන පරිදි චරිත නිරූපණය කිරීමට මඟ පෙන්වන්න.
- ඒකල ව චරිත නිරූපණ කළ පසු ඇගැයීමට ලක් කර අඩුපාඩු සකස් කරන්න.
- මෙම අත්දැකීම් නිර්මාණකරණයේ දී භාවිත කළ හැකි ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- අ. පො. ස. උසස් පෙළ නර්තන විෂය හදාරන සියලු ම සිසු/සිසුවියන් මෙම ක්‍රියාකාරකමෙහි නිරත කළ යුතු ය. සම්ප්‍රදායයෙහි පවතින ආකාරයට මෙම චරිත නිරූපණය කිරීමෙන් ලබන අත්දැකීම් විවිධ චරිත නිරූපණ කාර්යයන් සඳහා භාවිත කිරීමට යොමු කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය ශක්‍යතා සිසුන් තුළ වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ.

**ඇගයීම** :

- අදාළ චරිතවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- චරිතවලට අදාළ බෙර පද හා කවි තාල තබමින් කියන්න.
- අදාළ චරිත නිරූපණ ඉදිරිපත් කරන්න.

මෙම චරිත පිළිබඳ වාචික ව තොරතුරු විමසීම වැදගත් වේ. සිසුසිසුවියන්ට තනි ව ම පද කියමින් අදාළ කවි කියමින්, ගායනය වාදනයට අනුව චරිත නිරූපණය කිරීමේ ශක්‍යතාව ඇගයීමට ලක් කළ යුතු ය. ඇගයීම් නිර්ණායක සකස් කිරීමේ දී ඉහත උපදෙස් පිළිබඳ අවධානය යොමු කරන්න.

**නිපුණතාව 02** : නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 2.3** : දේශීය නර්තන සම්ප්‍රදාය හා සබැඳි තාල ලක්ෂණ පිළිබඳ ව විග්‍රහ කරයි.

**ක්‍රියාකාරකම** 2.3 : දේශීය තාල විකාශය විග්‍රහ කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 07

**ඉගෙනුම් පල** :

- තාලය පිළිබඳ විවිධ අර්ථකථන ඉදිරිපත් කරයි.
- දේශීය තාල පද්ධතියේ විකාශය විග්‍රහ කරයි.
- දේශීය නර්තනය හා සබැඳි තාල හඳුනා ගනිමින් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දේශීය තාල පද්ධතිය පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, ලිපි ලේඛන

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : කණ්ඩායම් ක්‍රමය, පියවර ක්‍රමය, පැවරුම් ක්‍රමය, සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

තාලය පිළිබඳ විවිධ අර්ථකථන

පැරණි සාම්ප්‍රදායික තාල නාම

තාල නාම හා ඉන් පසු සංස්කරණ

මකුලොලුව සංස්කරණ තාල නාම හා විවිධ සංස්කරණ

ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙන ලද තාල නාම

- මාත්‍රා, ලඝු මාත්‍රා, ගුරු මාත්‍රා, ප්ලුත මාත්‍රා, සඳැස්මත්, ගීමත්, ග්‍රහ, විභාග, ආඝාත හා ලය පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් නර්තනය හා බැඳි තාල පද්ධතිය විග්‍රහ කළ හැකි බව.

**මාත්‍රා**

තාලය මැන දැක්වීම සඳහා යොදා ගන්නා කුඩා ම ඒකකය.

**ලඝු මාත්‍රා**

නොඇදෙන අක්ෂරයන් උච්චාරණය කිරීමට ගත වන කාලය ලඝු මාත්‍රාවක් වීම.

උදා :- ස, ග, ර, ට, ව, ප

**ගුරු මාත්‍රා**

ලඝු මාත්‍රා දෙකක් පමණට ඇදෙන, නැතහොත් ලඝු මාත්‍රාවක් සමඟ හල් අකුරක් එකතු වීමෙන් සෑදෙන මාත්‍රා වීම.

උදා :- ආ - ඌ - ඊ - මා - පා

ගස්, පන්, කොස්, මල් - (හලන්ත ගුරු)

**ප්ලුත මාත්‍රා**

ලඝු අක්ෂර තුනක පමණට ඇදෙන මාත්‍රා ප්ලුත මාත්‍රා වේ.

උදා :- ඇදෙන අක්ෂරයක් සමඟ හල් අකුරක් එකතු වීමෙන්

(හාල් ,මාල්, පාන් ) ප්ලුත මාත්‍රා වේ.

**සඳැස්මත් (චන්දස් මාත්‍රා)**

කවි පදයක හෝ බෙර පදයක හෝ ඇති ලඝු ගුරු මාත්‍රාවල එකතුව

**ගීමත්**

ගායනයේ දී යෙදෙන මාත්‍රා සංඛ්‍යාව

**ලය**

නිශ්චිත තාල රූපයක් පවත්වා ගනිමින් තාල තැබීමේ වේගයෙහි විෂමතාවය ලය ලෙස හැඳින්විය හැකි ය. මෙහිදී එක් මූලික ලය මානයක් පදනම් කරගනිමින් එහි ගුණාකාර ලෙස පිළිවෙළින් අනෙකුත් තාල තැබීම වේගවත් වීම කරණ කොට ගෙන ලයෙහි ගුණ කිරීම ගොඩනැගෙනු ඇත. එයට සමානව එහි පද කොටස් ද ගුණ කිරීමේ වේගයට සරිලන ලෙස පවත්වාගෙන යා යුතු ය. ඒ අනුව සමගුණ දෙගුණ සිව්ගුණ ගොඩනැගේ.

Wbd (

| | 1́ | 2 | 1́ | 2 | 1́ | 2 | 1́ | 2 |
|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | කු | ඳ | ග | ත | ග | ත | දොම් | - |
| දෙගුණ | කුඳ | ගත | ගත | දොම් | කුඳ | ගත | ගත | දොම් |
| සිව්ගුණ | කුඳගත | ගතදොම් | කුඳගත | ගතදොම් | කුඳගත | ගතදොම් | කුඳගත | ගතදොම් |

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- දේශීය තාල සංකල්පය පිළිබඳ විවිධ විග්‍රහ පිළිබඳ ලියැවුණු විවිධ ශාස්ත්‍රීය ග්‍රන්ථ ඇසුරු කරගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. තාල සංකල්පය විකාශය වූ ආකාරය විස්තර කරන්න.
- තාලය පිළිබඳ අර්ථකථන ඇති බව පහදන්න. අනතුරු ව තාල පිළිබඳ විස්තර කරන්න.
- තාලය හෙවත් තිත හඳුන්වා දී එම කරුණු ප්‍රායෝගික ව සිදුවන ආකාරය උදාහරණ දක්වමින් විග්‍රහ කරන්න.
- අවබෝධයෙන් යුතු ව තාල පිළිබඳ විග්‍රහ කිරීමට මඟ පෙන්වන්න.

**ඇගයීම** :

- තාලය යන්නට දී ඇති විවිධ අර්ථ නිරූපණ දෙකක් ඉදිරිපත් කරන්න.
- තාලය කොටස් වන ආකාරය විස්තර කරන්න.
- මාත්‍රා, ලඝු මාත්‍රා, ගුරු මාත්‍රා, ප්ලුත මාත්‍රා, සඳැස්මත්, ගීමත්, විභාග, ආඝාත හා ලය යන වචනවල අර්ථ පැහැදිලි කරන්න.
- දේශීය තාල පද්ධතියේ විකාශය විස්තර කරන්න.

මූලාශ්‍රය :

- හෙළ ගී මඟ - ඩබ්. ඩී. මකුලොලුව
- උඩරට තාල ශාස්ත්‍රය - ජේ. ඊ. සේදරමන්
- තාල ඥානය - වින්සන්ට් සෝමපාල
- සිංහල තිත් තාල ක්‍රමය - සරත් විජේවර්ධන

**නිපුණතාව 02** : නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 2.4** : දේශීය නර්තනය හා සබැඳි තාල රූපවලට සමාන හින්දුස්තානි හා කර්ණාට තාල විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 2.4** : ශ්‍රී ලාංකේය නර්තනය හා සබැඳි තාල හා හින්දුස්තානි, කර්ණාට තාල පිළිබඳ විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- දේශීය නර්තනය හා සබැඳි තාලවලට සමාන හින්දුස්තානි තාල විමසුමට ලක් කරයි.
- දේශීය නර්තනය හා සබැඳි තාලවලට සමාන කර්ණාට තාල විමසුමකට ලක් කරයි.
- දේශීය නර්තනය හා සබැඳි තාල රූපවලට සමාන හින්දුස්තානි හා කර්ණාට තාල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, තාලම්පට, තාල පිළිබඳ ලිඛිත සටහන්.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : කණ්ඩායම් ක්‍රමය, පියවර ක්‍රමය, පැවරුම් ක්‍රමය, සාකච්ඡා ක්‍රමය,

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- දේශීය තාල පද්ධතිය කෙටියෙන් හඳුන්වා දෙමින් භාරතීය නර්තනය හා සබැඳි කර්ණාටක තාල හා හින්දුස්තානි තාල හඳුන්වා දිය යුතු ය. ඒ අනුව දේශීය නර්තනයේ තාල රූපවලට සමාන හා අසමාන හින්දුස්තානි හා කර්ණාටක තාල ඇති බවට අදාළ කරුණු ඉදිරිපත් කරන්න.

**හින්දුස්තානි සංගීත සම්ප්‍රදාය**

**තාලය - ත්‍රිතාල්**

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| ඨේකාව | ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| තාල සංඥා | x | | | | 2 | | | | 0 | | | | 3 | | | |

**තාලය - දාදරා**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| ඨේකාව | ධා | ධී | නා | ධා | තු | නා |
| තාල සංඥා | x | | | 0 | | |

**තාලය - කෙහෙර්වා**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ඨේකාව | ධා | ගෙ | න | ති | න | ක | ධි | න |
| තාල සංඥා | x | | | | 0 | | | |

**තාලය - ඣප්තාල්**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| ඨේකාව | ධී | න | ධි | ධි | න | ති | න | ධි | ධි | න |
| තාල සංඥා | x | | 2 | | | 0 | | 3 | | |

**තාලය - දීප්චන්දි**

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ඨේකාව | ධා | ධිං | s | ධා | ධා | ධිං | s | තා | තිං | s | ධා | ධා | ධිං | s |
| තාල සංඥා | x | | | 2 | | | | 0 | | | 3 | | | |

**තාලය - ධමාර්**

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ඨේකාව | ක | ධි | ම | ධි | ට | ධා | s | ගෙ | ති | ට | ති | ට | තා | s |
| තාල සංඥා | x | | | | | 2 | | 0 | | | 3 | | | |

**කර්ණාටක සංගීත සම්ප්‍රදාය**

**චිහ්න (සංකේත)**

| | | | | |
|---|---|---|---|---|
| ◡ | - | අනුධ්‍රැත හෙවත් විරාම | - | මාත්‍රා 01යි. |
| 0 | - | ධ්‍රැත | - | මාත්‍රා 02යි. |
| I | - | ලඝු | - | මාත්‍රා 04යි. |
| S | - | ගුරු | - | මාත්‍රා 08යි. |
| 3 | - | ප්ලුත | - | මාත්‍රා 12යි. |
| X | - | කාකපද | - | මාත්‍රා 16යි. |

I - ලඝු - සංකේතයට මාත්‍රා 04ක් දී ඇතත්, ඒ වෙනුවට මාත්‍රා 03, 05,07,09 වශයෙන් පංච ජාති භේදය අනුව යෙදිය හැකි ය.

| පංච ජාති | ගතිය |
|---|---|
| චතුස්‍ර | 04 |
| තිශ්‍ර | 03 (1 + 2) |
| ඛණ්ඩ | 05 (2 + 3) |
| මිශ්‍ර | 07 (3 + 4) |
| සංකීර්ණ | 09 (4 + 5) |

| තාල | සංකේත | මාත්‍රා |
|---|---|---|
| 1. ධ්‍රැවතාල | 1011 | 4, 2, 4, 4, 4 |
| 2. මඨ | 101 | 4, 2, 4 |
| 3. රූපක | 01 | 2, 4 |
| 4. ජම්පතාල | 1◡0 | 4, 1, 2 |
| 5. ත්‍රිපුට | 100 | 4, 2, 2, |
| 6. අඨ | 1100 | 4, 4, 2, 2 |
| 7. ඒක | 1 | 4 |

එක් තාලයකින් ජාති 05ක් සාදාගත හැකි ය. එවිට තාල 7 x 5 = 35 උත්පාදනය වේ.

- කර්ණාටක තාල හා බැඳුණු නර්තනාංග ඉදිරිපත් කිරීමේ දී දේශීය තාල ක්‍රමය හා සමාන ගති ලක්ෂණ දක්නට ලැබේ.

  තිශ්‍ර චාපු - මාත්‍රා 3

  ඛණ්ඩ චාපු - මාත්‍රා 2 + 3

  මිශ්‍ර චාපු - මාත්‍රා 3 + 4

  ආදි තාල මාත්‍රා 4 + 2 + 2

  රූපක තාල මාත්‍රා 2 + 4

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- දේශීය තාල පද්ධතිය ක්‍රියාකාරකම පිළිබඳ ආවර්ජනය කරමින් අදහස් විමසන්න.
- භාරතීය නර්තනය හා සබැඳි තාල පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- භාරතීය කර්ණාටක හා හින්දුස්තානි තාල පිළිබඳ උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.
- දේශීය හා භාරතීය තාලවල ලක්ෂණ සුවිශේෂ වශයෙන් විමසුමට ලක් කරන්න.
- එම තාල ප්‍රායෝගිකව භාවිත කරන ආකාරය පිළිබඳ අවබෝධය ලබා දෙන්න.

**ඇගයීම :**

- කර්ණාට තාල හා දේශීය තාල ක්‍රමය අතර ඇති සමාන - අසමානතා පැහැදිලි කරන්න.
- හින්දුස්තානි තාල තුනක් නම් කොට උදාහරණ දක්වන්න.
- දේශීය තාල හා හින්දුස්තානි තාල ක්‍රමය අතර ඇති සමාන අසමානතා විස්තර කරන්න.

**නිපුණතාව 02** : නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 2.5** : නිර්දේශිත ගායනය, නර්තනය හා සබැඳි කවි පද කොටස් ප්‍රස්තාර කරයි.

**ක්‍රියාකාරකම 2.5** : වන්නම් / මංගලම් / මුල් මාත්‍රය / ශුද්ධ මාත්‍රා කවි / ග්‍රහ පන්ති කවි ප්‍රස්තාර කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- නර්තනය හා සබැඳි ප්‍රස්තාරකරණය පිළිබඳ ව තොරතුරු දක්වයි.
- ප්‍රස්තාරකරණය හා සබැඳි සංකේත හා විධි ක්‍රම නිවැරදි ව භාවිත කරමින් අදාළ ගායනය හා නර්තනය පද කොටස් ප්‍රස්තාර කරයි.
- ගායනය, නර්තන කොටස් හා සබැඳි සාම්ප්‍රදායික ගති ලක්ෂණ හඳුනා ගනිමින් ප්‍රස්තාර කරයි.
- ප්‍රස්තාරකරණය පිළිබඳ තිබිය යුතු විචාරාත්මක අවබෝධයේ වැදගත්කම අගයමින් අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : ප්‍රස්තාරකරණය සඳහා අවශ්‍ය ආධාරක

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, පැවරුම් ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායයෙහි උගත් වන්නම් සහ මෙහි දක්වා ඇති නර්තන අංග හා ග්‍රහ පන්ති කවි ප්‍රස්තාර කිරීමට නිර්දේශිත ය. මෙහි දී ප්‍රස්තාරකරණය පිළිබඳ ලිඛිත සහ ප්‍රායෝගික අවබෝධය ලබා දීම අපේක්ෂා කෙරේ.

උඩරට : ගණපති වන්නම, මයුරා වන්නම, මුසලඩි වන්නම සහ ග්‍රහ පන්ති කවි

පහතරට : ශුද්ධ තාලය, ලලිතරාග තාලය, නළු ගීතිකා තාලය සින්දු වන්නම් සහ ග්‍රහ පන්ති කවි

සබරගමු : තිසරා, කොවුලා, නාග ගජගා වන්නම් සහ ග්‍රහ පන්ති කවි

# උඩරට නර්තන සම්ප්‍රදායය

## ගණපති වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය**

| | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | ජිං | - | ග | ත | ගො | ගො | ජිං | - | ග | ත | ගො | ගො |
| තානම | + | ත්‍රම් | ද | නා | - | ම් | ද | න | - | ත | න | - |
| | + | ත්‍රන | ත | නා | - | ම් | ද | න | - | ත | න | - |
| | + | තා | නෙ | නා | - | ම් | ද | න | - | ත | - | ම් |
| | + | + | ද | න | තා | - | නා | - | - | - | - | - |
| කවිය | + | යුත් | සි | රි | - | න් | බ | බ | - | ළ | න | - |
| | + | ඇත් | හි | සි | - | න් | ස | සො | - | බ | න | - |
| | + | වෙත් | ද | ළි | - | න් | අ | ඩ | - | දු | න | - |
| | + | + | ග | නු | සු | ද | නා | - | - | - | - | - |
| කස්තිරම | කුඳ | ගත | ගත | ගත | කුකු | දත් | කුඳ | ගත | ගත | ගත | කුකු | දත් |
| | කුඳ | ගත | ගත | ගත | කුකු | දත් | ගජිං | ත | ගත් | ජිත් | කුං | දත් |
| | තකු | දඟ | ජිං | තකු | දඟ | ජිං | තකු | තක | තරි | කිට | කුඳ | කුඳ |
| | ගජිං | ත | ගත් | ජිත් | කුං | දත් | තකු | තක | තරි | කිට | කුං | දත් |
| | තා | | | | | | | | | | | |
| සීරුමාරුව | ත | ක | ට | දො | දොං | - | තා | - | කුඩ | තක | තරි | කිට |
| | ත | ක | ට | දො | දොං | - | තා | | | | | |
| අඩව්ව | තාත් | - | - | ත | ක | ට | තරි | කිට | දොද් | දොම් | - | - |
| | තරි | කිට | දොද් | දොම් | ගත් | තත් | තරි | කිට | දොද් | දොම් | - | - |
| | ගත් | - | ත | කු | ත | ක | ජිත් | - | ත | කු | ත | ක |
| | තරි | කිට | දොද් | දොම් | ගත් | තත් | තරි | කිට | දොද් | දොම් | - | - |

මීට අමතර ව පහත දක්වා ඇති අඩවු ද භාවිත කළ හැකි බව සලකන්න.

1. ගත්ත තෙහිඟු තකට තකුඳ....
2. තාත් ජිංත ජිංත ජිතරි....
3. තාත් ජිංත ජිංත ජිං

## මයුරා වන්නම

**මාත්‍රා 2 + 2 + 3 (දෙසුළු මැදුම් තුන්තිත) තාලය**

| | ^1 | 2 | ^1 | 2 | /1 | 2 | 3 | ^1 | 2 | ^1 | 2 | /1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | තෙහිං | තකු | තෙහිං | තකු | තෙහිං | ජිං | - | ගත් | - | තත් | - | ජිං | තරි | කිට |
| තානම | - | - | - | - | + | තනෙ | න | ත | න | ත | න | - | තනෙ | න |
| | ත | න | ත | න | + | තනෙ | න | ත | න | ත | නෙ | නා | - | - |
| | - | - | - | - | + | තිනෙ | න | ති | න | ති | න | - | තිනෙ | න |
| | ති | න | ති | න | + | තිනෙ | න | ති | න | ති | නෙ | නා | - | - |
| කවිය | - | - | - | - | + | සත | ර | සිව් | - | ව | ර | - | බලැ | ති |
| | දි | ඩ | ත | ර | + | සුරි | ඳු | ඉන් | - | ක | දි | රා | - | - |
| | - | - | - | - | + | කත | ර | ග | ම | පු | ර | - | සුරි | ඳු |
| | වා | - | හ | න | + | කර | ති | ර | ණ | මො | න | රා | - | - |
| | - | - | - | - | | | | | | | | | | |
| කස්තිරම | තෙහිං | තකු | තෙහිං | තකු | තෙහිං | ජිං | ජිං | තෙහිං | තකු | තෙහිං | තකු | තෙහිං | ජිං | ජිං |
| | තෙහිං | තකු | තෙහිං | තකු | තෙහිං | ජිං | ගත | කුං | තක | ජිං | කුඳ | ගජ් | ජිං | ගත |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | කිත් | - | කිත් | - | කි | ත | ක |
| | තරි | කිට | කුං | දත් | තා | | | | | | | | | |
| සීරුමාරුව | + | + | + | + | රො | මි | ත | රො | මි | තත් | - | රො | මි | ත |
| | රො | මි | ත | කු | ඳා | - | - | තක් | - | ක | ඩ | ත | ක | ට |
| | කුං | - | දත් | - | රො | මි | ත | රො | මි | තත් | - | රො | මි | ත |
| | රො | මි | ත | කු | ඳා | | | | | | | | | |
| අඩව්ව | + | + | + | + | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | + | + | + | + | තහර් | ජිං | ගත |
| | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| | + | + | + | + | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| | කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | කුඳ | ගජ් | ජිං | ගත |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | ගත් | - | තත් | - | ත | ක | ට |
| | තරි | කිට | කුං | දත් | තා | | | | | | | | | |

## මුසලඩි වන්නම

මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත )හා මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

| | ∧1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 | ∧1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | ද්‍රෝං | - | - | ජිං | - | ජිං | - | ත | ක | ට | ද්‍රොං | - | ත | ක |
| තානම | තා | - | - | තත් | - | ත | - | ත | නෙ | - | තත් | - | ත | - |
| | තා | - | - | තම් | - | - | - | - | - | - | තම් | - | ද | - |
| | නා | - | - | තත් | - | ත | - | ත | නෙ | - | තත් | - | ත | - |
| | තා | - | - | තම් | - | - | - | - | - | - | - | - | - | - |

| | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | ජිං | - | ග | ත | ගො | ගො | ජිං | - | ග | ත | ගො | ගො |
| | (ජිං | කඩ | තක | ජිං | තකු | තක | ජිං | කඩ | තක | ජිං | තකු | තක) |
| | ත | තත් | - | ත | නෙ | න | ත | ත | න | ත | තෙ | න |
| | තා | - | නෙ | න | තම් | - | දා | - | න | ත | නෙ | න |
| | ත | තත් | - | ත | නෙ | න | ත | ත | න | ත | නෙ | න |
| | තා | - | නෙ | න | තම් | - | දා | - | න | ත | නෙ | න |

| | ∧1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 | ∧1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තා | - | - | තත් | - | ත | - | ත | නෙ | - | තත් | - | ත | - |
| | තා | - | - | තම් | - | - | - | - | - | - | තම් | - | ද | - |
| | නා | - | - | තත් | - | ත | - | ත | නෙ | - | තත් | - | ත | - |
| | තා | - | - | තම් | - | - | - | - | - | - | - | - | - | - |
| කවිය | ව | න | - | පැත් | - | ත | - | බි | ය | - | පත් | - | ව | - |
| | ස | ය | - | තම් | - | - | - | - | - | - | - | - | - | -// |

| | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දු | ටත් | - | ය | නෙ | න | වි | ටත් | - | දු | ව | න |
| | පි | ටත් | - | පො | ට | ග | සා | - | ප | නි | මි | න// |

| | ∧1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 | ∧1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නැ | ත | - | නා | - | ඩි | - | ඉ | ඳ | - | වා | - | ඩි | - |
| | වෙච් | - | - | ලුම් | - | - | - | - | - | - | - | - | - | - // |

| | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කස්තිරම | රැ | ඳ | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| | තග් | - | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| | රැ | ඳ | ග | ජිං | - | ජිං | - | රැ | ද | ග | ජිං | - | ජිං | - |
| | රැ | ඳ | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුඳ | - | කුඳ | - |
| | තග් | - | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |

| | /1 | 2 | 3 | /1 | 2 | 3 | /1 | 2 | 3 | /1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජිං | කඩ | තක | ජිං | කුකු | තක | ජිං | කඩ | තක | ජිං | කුකු | තක |
| | ජිං | කඩ | තක | ජිං | කුකු | තක | ජිං | කඩ | තක | ජිං | කුකු | තක |
| | ජිං | කඩ | තක | ජිං | කුකු | තක | ජිං | කඩ | තක | ජිං | කුකු | තක |

| | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රැ | ඳ | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| | තග් | - | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කු | ඳ | කු | ඳ |
| | රැ | ඳ | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| | දෝං | - | - | තා | | | | | | | | | | |
| සීරු මාරුව | ත | කු | ඳ | ත | කු | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| | තග් | - | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| | ත | කු | ඳ | ත | කු | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| | දෝං | - | - | තා | | | | | | | | | | |
| අඩව්ව | තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ඳ | තත් | - | ජෙං | - |
| | + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| | ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජී | කු | ඳ | තත් | - | ජෙං | - |
| | + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| | තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ඳ | තත් | - | ජෙං | - |
| | ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජී | කු | ඳ | තත් | - | ජෙං | - |
| | තා | - | කු | තක් | කුං | තරි | කිට | ජී | - | කු | ජික් | කුං | තරි | කිට |
| | ත | කු | ඳ | තත් | - | ජෙං | - | + | + | + | තත් | - | ජෙං | - |
| | ත | ජෙං | - | තත් | - | ජෙං | - | + | + | + | ජෙං | - | තා | - |
| | ජෙ | තා | - | ජෙ | ත | කු | ඳ | ජෙං | - | ත | තා | | | |

**මංගලම් මාත්‍රා 2 + 2 + 2 + 4 + 4 (තුන් සුළු දෙමහ පස් තිත) තාලය**

| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **බෙර පදය** | දොං | - | ත | කු | දොං | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| **තානම** | + | + | තුම් | - | ද | - | නා | - | - | ම් | ද | - | න | - |
| | + | + | ත | න | තා | - | නා | - | - | ම් | ද | - | න | - |
| | + | + | තා | - | නෙ | - | නා | - | - | ම් | ද | - | න | - |
| | + | + | තා | - | නෙ | - | නා | - | - | - | - | - | - | - |
| | ආ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | ත | ත | න | - | ත | - | න | - | තා | - | - | ම් |
| | + | + | ද | න | තා | - | නා | - | - | ම් | ද | - | න | - |
| | + | + | තා | - | නෙ | - | නා | - | - | ම් | ද | - | න | - |
| | + | + | තා | - | නෙ | - | නා | - | - | - | - | - | - | - |
| | ආ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **කවිය** | + | + | බුද් | - | ධ | - | රා | - | - | - | ජ | - | ය | - |
| | + | + | වැන් | - | දෙ | - | ප | - | ළ | - | මු | - | ව | - |
| | + | + | දෙ | වෙ | නු | - | ස | - | - | ද් | ධ | - | - | ර් |
| | + | + | ම | ය | ව | - | දී | - | - | - | - | - | - | ම් |
| | ආ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | සුද් | - | ධ | - | ස | - | - | න් | ස | - | - | න් |
| | + | + | රත් | - | නෙ | - | වැ | - | ඳ | - | ලා | - | - | - |
| | + | + | ගත් | - | කු | - | ති | - | ස | - | ර | - | ණ | - |
| | + | + | අත් | - | මූ | - | දු | - | - | - | - | - | - | න් |
| | ආ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **කස්තිරම** | ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| | ග | ජිත් | - | කු | දත් | - | ජිකු | - | ත | ක | ත | රි | කි | ට |
| | ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| | ග | ත | කු | ඳ | කු | ඳ | තා | - | ත | ක | ත | රි | කි | ට |
| | ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| | ග | ජිත් | - | කු | දත් | - | ජිකු | - | ත | ක | ත | රි | කි | ට |
| | ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| | ග | ත | කු | ඳ | කු | ඳ | තා | - | ත | ක | ත | රි | කි | ට |
| | ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| | ග | ජිත් | - | කු | දත් | - | ජිකු | - | ත | ක | ත | රි | කි | ට |
| | ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| | ග | ජිත් | - | කු | දත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| | ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| | ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| | ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| | ග | ත | කු | ඳ | කු | ඳ | තත් | ජිත් | තොං | නං | තා | | | |

## ග්‍රහ පන්ති ගායනා

### උඩරට නර්තන සම්ප්‍රදායය - මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

| | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **බෙර පදය** | දොං | - | ජී | ජී | ග | ත | ජිං | - | කු | ඳ | ග | ත |
| **කවිය** | සි | රි | ව | ස | ගෙ | න | අ | සු | - | - | - | - |
| | නැ | ගෙ | මින් | - | නො | ලෙ | සා | - | - | - | - | - |
| | සි | රි | බ | ර | ඉ | ඹු | ලේ | - | - | - | - | - |
| | තු | රු | ඊ | ස | නි | වෙ | සා | - | - | - | - | - |
| | පි | රි | බ | ලි | කො | කු | මෙන් | - | - | - | - | - |
| | ඉ | ඳු | රේ | - | නි | වෙ | සා | - | - | - | - | - |
| | ඉ | රු | දෙ | වි | මෙ | ඔ | බ | ට | - | - | - | - |
| | දෙන් | - | සෙ | ත | ස | ල | සා | - | - | - | - | - |

## පහතරට නර්තන සම්ප්‍රදායය - ශුද්ධ තාලය සින්දු වන්නම
## මාත්‍රා 2 + 2 + 3 (දෙසුළු මැදුම් තුන්තිත) තාලය

| | ^1 | 2 | ^1 | 2 | 1/ | 2 | 3 | ^1 | 2 | ^1 | 2 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | දිත් | - | තුම් | - | දි | ත | කු | දොම් | - | දොම් | - | තාම් | | |
| තානම | තෙ | න | තෙ | න | තෙ | න | - | - | - | - | - | - | - | - |
| | තෙ | න | තෙ | න | තෙ | න | - | - | - | - | - | - | - | - |
| | තෙ | න | තෙ | නි | නා | - | - | - | - | - | - | - | - | - |
| | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කවිය | සි | රි | පි | රි | ගි | රි | - | - | - | - | - | - | - | - |
| | මු | දූ | න | ත | සු | ර | - | - | - | - | - | - | - | - |
| | පු | ර | ලෙ | සි | නා | - | - | - | - | - | - | - | - | - |
| | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඉරට්ටිය | තත් | - | ගු | ඳ | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| | ග | ත | ගු | ඳ | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| | තත් | - | ගු | ඳ | ග | ත | - | ග | ත | ගු | ඳ | ග | ත | - |
| | ගු | ඳ | ගත් | - | ගුඳ | ග | ත | තත් | - | ගු | ඳ | ග | ත | - |
| | දිත් | - | දිත් | - | තෙයි | | | | | | | | | |

තානමේ දෙවන කොටස ප්‍රස්තාර සටහනේ දක්වා නොමැති බව සලකන්න.

## ලලිත රාග තාලය සින්දු වන්නම

මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

| | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | ග | දි | ත | දො | දොම් | - | දොම් | - | ග | දි | තුම් | - |
| තානම | තෙ | නෙ | න | තෙ | න | තෙ | නුම් | - | තෙ | නෙ | නා | - |
| | තෙ | න | තෙ | නෙ | නුම් | - | තෙ | න | තෙ | නෙ | නා | - |
| කවිය | වන් | - | නි | ස | යු | රු | සු | පි | පි | තු | රූ | - |
| | සු | වි | රා | - | ජී | ත | ගු | නෙ | නි | සු | රූ | - |
| ඉරට්ටිය | ගත් | තත් | දොම් | ත | ගත් | ගත | ගුගු | දිත | තරි | තත් | දිත් | තොං |
| | නං | දෙග | තත් | ගති | ගත | ගත | ගත්ත | දිත්ත | ගත | ගත් | තත් | දොම් |
| | තා | | | | | | | | | | | |

## නළු ගීතිකා තාලය සින්දු වන්නම
### මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය

| | ∧ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ∧ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | ගත් | - | - | ත | - | ග | - | දි | ත | - | ගු | - | ගු | - |
| | ඳං | - | - | - | - | ග | - | දිත් | - | - | තත් | - | - | - |
| | රෙ | ග | - | තත් | - | - | - | දි | කු | - | ඳ | - | ක | - |
| | දැහිං | - | - | - | - | - | - | දි | ත | - | ග | - | ත | - |
| තානම | + | + | + | තෙ | න | තෙ | න | තෙ | න | - | තෙ | - | නෙ | - |
| | නා | - | - | - | - | තෙ | - | තම් | - | - | තෙ | - | න | - |
| | - | - | - | තෙ | න | තෙ | - | නා | - | - | - | - | - | - |
| | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කවිය | + | + | + | සේ | - | වි | ත | පා | - | - | ද | - | ස | - |
| | රෝ | - | - | රු | - | හ | - | සත් | - | - | ජී | - | ත | - |
| | + | + | + | යෙන් | - | - | ඉ | තා | - | - | - | - | - | - |
| | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඉරට්ටිය | ගත් | - | ත | ග | දි | ග | ත | ග | දි | ත | ගු | ඳ | ගු | ඳ |
| | තත් | - | ත | දිත් | - | - | - | තත් | දිත් | තත් | කිටි | තක | තරි | කිට |
| | තත් | - | - | ජෙං | - | - | - | ත | ක | - | ජෙං | - | - | - |
| | ගුදි | ත්ත | ගත | ගති | ගත | ගුදි | ගුඳ | දොම් | දිත | ගත | ගුදි | තක | දිකු | දක |
| | දෑ | හිං | | | | | | | | | | | | |

## පහතරට නර්තන සම්ප්‍රදායය - ශුද්ධ මාත්‍රය
### මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය

| | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බර පදය | තත් | - | - | දිත් | - | - | තත් | - | - | දොං | - | - |
| | ත | කු | - | දොං | - | - | රුඳ | ගු | ඳ | ග | - | - |
| | ත | - | - | ක | - | - | දිම් | දිම් | - | දෑහිං | - | - |
| ඉරට්ටිය | රුඳ | ගත | ගත | ගදි | තග | තම් | ගත් | දිත් | තත් | දොං | තකු | දොං |
| | රුඳ | ගත | ගත | ගදි | තග | තම් | දෙග | දිත් | තත් | දොං | තකු | දොං |
| | රුඳ | ගත | ගත | ගදි | තග | තම් | රුඳ | ගත | ගත | ගදි | තග | තම් |
| | ගදි | තග | තම් | ගුදි | තග | තම් | ගත් | දිත් | තත් | දෙග | දිත් | තත් |
| | දෙග | දිත් | දෙග | දිත් | දෙග | දිත් | දෙග | දිත | ගත | ගුදි | තග | තකු |
| | දොං | | | | | | | | | | | |

බර පදය ප්‍රස්තාරය ඇගයීම සඳහා භාවිත කිරීම අපේක්ෂා නොකෙරේ.

## පහතරට නර්තන සම්ප්‍රදායය - ශුද්ධ මාත්‍රයේ කවි

### මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය

| | 1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 | ^1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | රිම් | - | - | ග | - | ත | - | දූහිම් | - | - | ත | - | දෙ | - |
| | ග | ත | - | ග | - | ත | - | ගු | ද | - | ගු | - | ද | - |
| | ගු | ද | - | ග | - | ත | - | දූහිම් | - | - | ත | - | දෙ | - |
| | ග | ත | - | ග | - | ත | - | ගුම් | | | | | | |
| කවිය<br>**මෙලෙ** | සි | - | - | න් | - | - | - | ම | - | - | ල් | - | - | - |
| | ම | - | - | ද | - | - | - | - | - | - | දේ | - | - | - |
| | වී | - | - | - | - | - | - | යේ | - | - | - | - | - | - |
| | - | - | - | - | - | - | - | - | - | - | යු | ද | - | - |
| | ය | - | - | ට | - | - | - | කො | - | - | ඩි | - | - | - |
| | බැ | - | - | ඳ | - | - | - | - | - | - | ඒ | - | - | - |
| | වි | - | - | - | - | - | - | යේ | - | - | - | - | - | - |
| | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඉරට්ටිය | ගුහි | ති | ග | දි | රි | කි | ට | ගු | ඳ | - | ගත් | - | - | - |
| | දූ | හිම් | - | - | - | - | - | ගුහි | ති | ග | දි | රි | කි | ට |
| | ගු | ඳ | - | ගත් | - | - | - | දැ | හිම් | - | - | - | - | - |
| | ගුහි | ති | ග | දි | රි | කි | ට | ගු | ඳ | - | ගත් | - | - | - |
| | දැ | හිම් | - | - | - | - | - | දැ | හිම් | - | දැ | හිම් | - | - |
| | දැ | හිම් | - | - | - | - | - | ගුහි | ත | ග | දි | රි | කි | ට |
| | ගු | ඳ | - | ගත් | - | - | - | දැ | හිම් | - | ග | - | - | - |
| | දි | ත | - | ග | - | ත | - | දැ | හිම් | - | ගු | - | - | - |
| | දි | ත | - | ග | - | ත | - | දැ | හිම් | - | - | - | ග | - |
| | දිරි | කි | ට | ග | ත | කු | - | දොම් | | | | | | |

| | ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| කවිය | දොං | - | - | ත | - | ගු | - | දං | - | - | ග | - | ත | - |
| | ග | දි | - | ත | - | ග | - | තං | - | - | ගු | - | ද | - |
| බෙර පදය | + | + | + | නිල් | - | ලා | - | රැ | ලි | - | ලා | - | - | - |
| | අ | දි | - | නා | - | - | - | සේ | - | - | ල | - | ය | - |
| | - | - | - | තු | නු | ඉ | ග | බ | බ | - | ල | - | ව | - |
| | තෙයි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | - | - | - | සං | - | ගා | - | පුස් | - | - | කො | - | ළ | - |
| | තෝ | - | - | ඩු | - | ත | - | බා | - | - | ලා | - | - | - |
| | - | - | - | ස | වන් | - | ප | ටින් | - | - | බ | - | ඳි | - |
| | තෙයි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඉරට්ටිය | දොම් | - | ත | ගත් | - | තම් | - | ග | දි | ත | ගත් | - | තම් | - |
| | ග | ත | ගු | දං | - | ග | ත | ග | දි | ත | ගුම් | - | දිත් | - |
| | තා | | | | | | | | | | | | | |

| | / | | | | / | | | | / | | | | / | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | |
| බෙර පදය | දෙ | ගත් | - | ග | ත | කු | දොම් | - | දෙ | ගත් | - | ග | ත | කු | දොම් | - | |
| කවිය | + | අත් | ත | න | ම | ල | සේ | - | ඇ | ඳි | සු | දු | සේ | - | ල | ය | |
| | + | ඉණ | ව | ට | රැ | ලි | අල් | - | ලා | - | - | - | - | - | - | - | |
| | + | නෙ | ළුම් | ම | ලක් | - | සේ | - | බ | ඳි | නා | - | කොණ් | - | ඩ | ය | |
| | + | මල් | පෙ | ති | ග | ව | සා | - | ලා | - | - | - | - | - | - | - | |
| ඉරට්ටිය | දොම් | තග | තම් | ගුම් | දිම් | ගත | ගත් | තත් | ගත් | දිත | ගත | ගත් | දිම් | ගත | ගුම් | දත් | |
| | තා | | | | | | | | | | | | | | | | |
| අවසාන ඉරට්ටිය | ගුං | දගු | දං | ගත | ගත් | තග | තං | ගුඳ | ගුං | දගු | දං | ගත | ගත් | තග | තං | ගුඳ | } //දව. |
| | ගුං | දගු | දං | ගත | ගත් | තග | තං | ගුඳ | ගුං | දග | දිත | ගත | ගත් | තත් | දොම් | - | } |
| | ගුං | දගු | දං | ගත | ගත් | තග | තං | ගුඳ | ගුං | දගු | දං | ගත | ගත් | තත් | දොම් | - | // |
| | ගුං | දග | දිත | ගත | ගත් | තත් | දොම් | - | ගත් | තග | දිත | ගත | ගත් | තත් | දොම් | - | |
| | ගත් | තත් | දොම් | - | දෙග | තත් | දොම් | - | දොම් | තග | දිත | ගත | ගදි | ගත | ගුඳ | ගුඳ | |
| | තා | | | | | | | | | | | | | | | | |

**ගුඳ ගති ගත වට්ටම - මාත්‍රා 2 ( සුළු තනිතිත ) තාලය**

| | 1́ | 2 | 1́ | 2 | 1́ | 2 | 1́ | 2 |
|---|---|---|---|---|---|---|---|---|
| | ගු | ඳ | ග | ති | ග | ත | ගු | ඳ |
| | ගු | ඳ | ග | ති | ග | ත | - | - |
| අන්තාඩිය | ගු | - | ඳ | - | ග | - | ති | - |
| | ග | - | ත | - | ගු | - | ඳ | - |
| | ගත් | - | - | - | තම් | - | | |
| ඉරට්ටිය | ගුන් | - | දත් | - | ගුහි | තිග | දිරි | කිට |
| | ග | ත | ග | ත | ගුහි | තිග | තම් | - |
| | තත් | - | දිත් | - | තත් | - | - | - |
| | දිගතම් | - | - | - | දොං | - | | |

(ග ති ග ත)

පහතරට - ග්‍රහ පන්ති කවි

**මාත්‍රා 4 (මහ තනිතිත) තාලය**

| | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙරපදය | දෙ | ගත් | - | ග | ත | කු | දොං | - | දෙ | ගත් | - | ග | ත | කු | දොං | - |
| කවිය | + | ඉන් | දු | දි | සා | - | ව | ට | - | ඉඹු | ල් | වි | මා | - | නෙ | ට |
| | + | ඉරු | දෙ | වි | අ | ධි | ප | ති | - | වන් | නේ | - | - | - | - | - |
| | + | රන් | සි | රි | ව |ස | ගෙ | න | - | සුර | ත | ද | රා | - | ගෙ | න |
| | + | තුර | ග | කු | පි | ට | වැ | ඩ | - | ඉන් | නේ | - | - | - | - | - |
| | + | ඇති | ය | ම් | රෝ | - | දුක් | - | - | දුරු | ර | ද | මා | - | නි | ති |
| | + | චි | රා | ක | ලක් | - | සෙ | ත | - | දෙන් | නේ | - | - | - | - | - |
| | + | ඉන් | දු | දි | සා | - | වෙන් | - | - | ඉරු | දෙ | වි | වැ | ඩ | ලා | - |
| | + | ග්‍රහ | මේ | - | දො | ස | දු | ර | - | ලන් | නේ | - | - | - | - | - |

මෙම ගායනය පහත සඳහන් ආකාරයට ද ඉදිරිපත් කළ හැකි ය.

## ග්‍රහ පන්ති කවි

| | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | රෙ | ග්‍රුම් | - | ගු | ද්‍රුම් | - | ග්‍රත් | - | දෙ | ග්‍රත් | - | ග | ත | කු | ද්‍රොං | - |
| කවිය | + | + | ඉන්‍ | - | ද්‍ර | - | දි | - | සා | - | - | - | ව | - | ට | - |
| | + | + | ඉ | ඹූ | ල් | - | වි | - | මා | - | - | - | නෙ | - | ට | - |
| | + | + | ඉ | රු | දෙ | - | වි | - | අ | - | ධි | - | ප | - | ති | - |
| | + | + | වන්‍ | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | රන්‍ | - | සි | - | රි | - | ව | - | ස | - | ගෙ | - | න | - |
| | + | + | සු | ර | ත | - | ද | - | රා | - | - | - | ගෙ | - | න | - |
| | + | + | තු | ර | ගෙ | - | කු | - | පි | - | ට | - | වැ | - | ඩ | - |
| | + | + | ඉන්‍ | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | ඇ | ති | ය | - | ම් | - | රෝ | - | - | - | දු | - | ක් | - |
| | + | + | දු | රු | ර | - | ද | - | මා | - | - | - | නි | - | ති | - |
| | + | + | චි | ර | - | ත් | ක | - | ල | - | ක් | - | සෙ | - | ත | - |
| | + | + | දෙන්‍ | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | ඉන් | - | ද්‍ර | - | දි | - | සා | - | - | - | වෙ | - | න් | - |
| | + | + | ඉ | රු | දෙ | - | වි | - | වැ | - | ඩ | - | ලා | - | - | - |
| | + | + | ග්‍ර | - | හ | - | මේ | - | දො | - | ස | - | දු | - | ර | - |
| | + | + | ලන්‍ | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - |

## සබරගමු නර්තන සම්ප්‍රදායය

### තිසරා වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

| | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | ජිං | - | ත | ග | ත | - | ග | ත | - | ග | ත | - |
| | ග | ති | ත | ග | ත | - | ග | ත | - | ග | ත | - |
| | ජිං | - | ත | ග | ත | - | ග | ති | ත | ග | ත | - |
| | ග | තත් | - | කු | දත් | - | තා | - | - | ත | ක | ට |
| තානම | + | තම්ද | - | නා | - | - | තා | - | න | ත | නෙ | න |
| | + | තෙයි | ත | නා | - | - | තා | - | න | ත | නෙ | න |
| | + | තා | න | ත | නෙ | න | තා | - | න | ත | නෙ | න |
| | + | තා | න | ත | ම් | දෙ | නා | - | - | ත | නෙ | න |
| කවිය | + | රන් | ර | සා | - | - | සේ | - | ම | ව | ඩ | න |
| | + | වන් | ය | සා | - | - | රූ | - | ප | දි | ලෙ | න |
| | + | වී | ම | ස | දි | සි | නා | - | ම | වි | ල | ස |
| | + | ඒ | ම | රා | - | ජ | තු | මා | - | ණන් | - | - |
| කලාසම | ජිං | - | ත | කු | කු | ඳ | තා | - | - | ත | ක | ට |
| | ජිං | - | ත | කු | කු | ඳ | තා | - | කුං | දත් | තරි | කිට |
| | ග | ති | ත | කු | ඳි | ත | තා | - | - | ග | තත් | - |
| අඩව්ව | ජෙං | - | ත | ත | ක | ට | දිරි | කිට | තරි | කිට | ග | ත |
| | ග | ත | කු | ඳ | ග | ත | ග | තත් | - | ජෙ | ජෙං | - |
| | තත් | - | කිත් | - | තත් | - | කි | තත් | - | ජෙ | ජෙං | - |
| | තා | - | කුං | දත් | තරි | කිට | ග | තත් | - | කු | කු | ඳ |
| | තා | - | - | | | | | | | | | |

2. ඉන් නිසා සැම - එදින උන් අසා ගීත නදින
   තාල වයන ගායන කර සැම වැසි දනන් දුන්

3. මන් මෙ සභාවට බැස දූන් ඉතා රාග වඩන
   කීම සොඳට ආලය කර නාම කර උතුම් යෙන්

4. අන් නිසා කීව පොරණ දූන් අසා මේ සබ මැද
   පේම වඩන මේ තිසරා වන්නම පවසන් දූන්

# කොවුලා වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) හා මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය**

| | /1 | 2 | 3 | /1 | 2 | 3 | | /1 | 2 | 3 | /1 | 2 | 3 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | දොං | - | ත | ත | ක | ට | | දොං | - | ත | ත | ක | ට | |
| තානම | + | තා | න | තා | නා | - | | ත | න | තුම් | දෙ | නා | - | |
| | + | තෙත | න | ත | නා | - | | ත | න | තුම් | දෙ | නා | - // | |
| දවුල් පදය | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 |
| | කු | දත් | - | තක් | - | කි | ට | ත | ක | ට | ජී | මි | ත | ක |
| | + | + | + | තා | - | න | ත | නා | - | - | තුම් | - | දෙ | - |
| | නා | - | - | - | - | - | තෙ | ත | න | - | ත | - | න | - |
| | + | + | + | තෙ | ත | න | ත | නා | - | - | තුම් | දෙ | - | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කවිය | /1 | 2 | 3 | /1 | 2 | 3 | | /1 | 2 | 3 | /1 | 2 | 3 | |
| | + | කො | හෝ | ය | නා | - | | හ | ඬ | න | ගු | නා | - | |
| | + | මියු | රු | ම | නා | - | | ද | න | ස | ව | නා | - // | |
| | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 |
| | + | + | + | ප | ර | පු | ටු | වෙ | සෙ | - | සින් | - | - | - |
| | නේ | - | - | - | - | - | ව | සන් | - | - | නේ | - | - | - |
| | + | + | + | ම | හ | ව | න | ගස් | - | - | මු | - | දු | - |
| | නේ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කලාසම | /1 | 2 | 3 | /1 | 2 | 3 | | /1 | 2 | 3 | /1 | 2 | 3 | |
| | කු | ද | කු | ද | ග | ත | | කු | ද | කු | ද | ග | ත// | |
| | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 | ^1 | 2 | 3 | /1 | 2 | 3 | 4 |
| | කු | දි | ත | ග | ත | ග | ත | ග | ති | ත | කු | ද | කු | ද/// |
| | ජිං | - | ත | ගත් | - | තත් | - | ග | ති | ත | ගත් | - | තත් | - |
| | ත | කු | ද | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ද | ග | ත |
| | තා. | | | | | | | | | | | | | |
| අඩව්ව | ත | දොං | - | මිත් | - | තේ | - | දොං | - | දො | මිත් | - | තේ | - |
| | දොං | - | ත | දොං | - | ත | ක | ග | ත | කු | දා | - | - | - |
| | තත් | - | ත | ත | හර් | දත් | - | දිත් | - | ත | ත | හර් | දත් | - |
| | ත | හර් | ද | දි | හිර් | ද | ක | ග | ත | කු | දා | - | - | - |
| | කු | දි | ත | ග | ත | ග | ත | ග | ති | ත | කු | ද | කු | ද |
| | දොං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ද | ග | ත |
| | තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ද | ග | ත |
| | තා | | | | | | | | | | | | | |

2. රිටු විමනා බිජු ලමිනා බහු නදනා රැකෙන මෙනා//
 ලොකු වී නද දෙන්නේ ඔවුන් ගෙන් එම විට බැට කන්නේ

3. රුව සවනා වුණත් මනා ඉසිවඩනා රිටු නොමිනා//
 රිටු පරපුටු හටනේ දෙවන්නේ නිදසුන් යස රුවනේ

4. ලොව දුජනා ගතිය මෙනා මෙම හට නර ලොව තිබෙනා//
 මදහුගේ මිතුරන්නේ ගයන්නේ මෙම මනහර වරුණේ

**නාග ගජගා වන්නම**

**මාත්‍රා 3 + 2 + 2 (මැදුම් දෙසුළු තුන්තිත) තාලය**

| | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | කු | ඳත් | - | තත් | - | කි | ට | ත | ක | ට | ජි | මි | ත | ක |
| තානම | + | තා | න | ත | න | ත | න | + | තා | න | ත | න | ත | න |
| | + | තා | න | ත | න | තුම් | - | + | දා | නෙ | නා | - | - | - |
| | + | ත | නා | නත් | - | තුම් | - | + | දන | ත | තුම් | - | ද | න |
| | + | තා | නෙ | නත් | - | තුම් | - | + | දා | නෙ | නා | - | - | - |
| කවිය | + | සී | ල | නා | - | ග | ව | + | කලෙ | ක | බෝ | - | සත් | - |
| | + | හස් | ති | රා | - | ජ | ව | + | උ | පන් | නේ | - | - | - |
| | + | කෝ | ල | නො | ව | බු | දු | + | බව | ප | තා | - | - | - |
| | + | එද | ළ | ක | ප | මින් | - | + | එ | දන් | දුන් | - | නේ | - |
| කලාසම | කු | ඳි | ත | ග | ත | ග | ත | ග | ති | ත | කු | ඳ | කු | ඳ // |
| | කු | ඳි | ත | තත් | - | කු | ඳ | ග | ති | ත | කු | ඳ | දොං | - |
| අඩව්ව | ත | හර් | ද | තත් | - | තත් | - | ත | තත් | - | තත් | - | තත් | - |
| | ත | හර් | ද | තත් | - | කි | ට | ත | ක | ට | කු | ඳ | දොං | - |
| | ත | හර් | - | රු | ඳ | දොං | - | ත | හර් | - | රු | ඳ | දොං | - |
| | ත | හර් | - | රු | ඳ | දොං | - | දොං | - | ත | ගත් | - | තත් | - |
| | ග | තත් | - | කු | ඳ | ග | ත | තා | - | - | ගත් | - | තත් | - |
| | ග | තත් | - | කු | ඳ | ග | ත | තා | - | - | | | | |

## මුල් මාත්‍රය/මාත්‍රා පිරීම

මාත්‍රා 2 + 2 + 2 + 4 + 4 (තුන් සුළු දෙමහ පස් තිත) තාලය

| | ^ 1 | 2 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | කුං | - | දිත් | - | තත් | - | දොං | - | ත | ක | ත | රි | කි | ට | |
| තානම | තා | - | - | - | න | - | ත | - | ත | - | ත | - | න | - | |
| | තා | - | - | - | න | - | ත | - | න | - | ත | - | න | - | |
| | තා | - | - | - | න | - | න | - | න | - | ත | - | ම් | - | |
| | දා | - | - | - | නෙ | - | නා | - | - | - | - | - | - | | |
| කවිය | ස | - | සි | - | රි | - | සි | - | රි | - | ල | - | ක | - | |
| | කො | - | දෙ | - | ව් | - | දෙ | - | ද | - | හ | - | ස් | - | |
| | පෑ | - | - | - | ව | - | අ | - | ණ | - | ස | - | ක | - | |
| | මුං | - | - | - | ග | - | ලම් | - | - | - | - | - | - | - | |
| කලාසම් වට්ටම | කුං | - | දිත් | - | තත් | - | දොං | - | ත | ග | දි | ත | ග | ත//// | |
| | කුං | - | දිත් | - | තත් | - | දොං | | | | | | | | |
| අඩව්ව | කු | ද | කු | ද | කු | ද | කු | දි | ත | ග | දි | ත | ග | ත//// | |
| | කු | ද | ග | ත | කු | ද | තා | - | - | - | - | | | | |
| | කු | ද | කු | ද | කු | ද | තත් | - | තත් | - | තත් | - | තත් | - | } |
| | කු | ද | කු | ද | කු | ද | ගත් | - | ත | කු | දි | ත | ග | ත | } // |
| | කු | ද | කු | ද | කු | ද | ගත් | ත | - | කු | දිත් | - | තත් | - | } |
| | කු | ද | ග | ත | කු | ද | තා | - | - | - | ත | රි | කි | ට | } |
| | කු | ද | කු | ද | කු | ද | තත් | - | තත් | - | තත් | - | තත් | - | } // |
| | කු | ද | කු | ද | කු | ද | ගත් | - | ත | කු | දි | ත | ග | ත | } |
| | කු | ද | කු | ද | කු | ද | තත් | - | තත් | - | තත් | - | තත් | - // | |
| | කු | ද | කු | ද | කු | ද | ගත් | - | ත | කු | දි | ත | ග | ත /// | |
| | කු | ද | කු | ද | කු | ද | තා | - | - | - | තත් | - | කි | ට/// | |
| | කු | ද | කු | ද | කු | ද | තත් | - | තත් | - | තත් | - | තත් | - | |
| | කු | ද | කු | ද | කු | ද | ගත් | - | ත | කු | දි | ත | ග | ත | |
| | කු | ද | කු | ද | කු | ද | ගත් | - | ත | කු | දිත් | - | තත් | - | |
| | කු | ද | ග | ත | කු | ද | ජෙං | - | - | - | තා | | | | |

## සබරගමු - ග්‍රහ පන්ති කවි ගායනය

**මාත්‍රා 3+4 (මැදුම් මහ දෙතිත) තාලය**

| | ∧ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ∧ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දවුල් පදය | ජිං | - | ත | තක් | - | කි | ට | ත | ක | ට | ජි | මි | කි | ට |
| | + | + | + | වල් | - | වි | දු | නා | - | - | රැ | - | ගෙ | - |
| | නා | - | - | - | - | ගෙ | - | නා | - | - | හි | - | මි | - |
| | + | + | + | ගි | නි | කො | න | වැ | ඩ | - | සි | - | ටි | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | + | ලොල් | - | ව | ඩ | ව | න | - | බො | ජු | - | - |
| | නා | - | - | - | - | මෙ | - | නා | - | - | වැ | - | ස | - |
| | + | + | + | ක | ර | ඳ | වි | ම | න | - | වැ | - | සෙ | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | + | ගල් | - | මි | ණි | වජ් | - | - | ර | - | මෙ | - |
| | නා | - | - | - | - | මෙ | - | නා | - | - | හි | - | මි | - |
| | + | + | + | ග | ත | සු | දු | පැ | හැ | - | ය | - | මෙ | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | + | කල් | - | ස | ත | හ | ට | - | පැ | - | මි | - |
| | නා | - | - | - | - | මෙ | - | නා | - | - | කි | වි | දෙ | ව් |
| | + | + | + | මෙ | ඹ | බ | ට | සෙ | - | ත | දෙ | ව | - | - |
| | නා | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- තාල පිළිබඳ ක්‍රියාකාරකම නැවත විමසා ප්‍රස්තාරකරණය පිළිබඳ මූලික අවබෝධය හා මතකය ලබාදීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ප්‍රස්තාරකරණය හා සබැඳි මූලධර්ම, සිද්ධාන්ත, සංකේත හා විධික්‍රම පිළිබඳ සාකච්ඡා කරන්න.
- ගායනය හා වාදනයට අදාළ කොටස් ප්‍රස්තාර කිරීමේ දී එහි ගති ලක්ෂණ ආරක්ෂා විය යුතු බව සාකච්ඡා කරන්න. (තිත් සංකේත, මාත්‍රා කැටි වීම්, යතිය, සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ, විභාග)

- ප්‍රස්තාරකරණය පිළිබඳ විචාරාත්මක අවබෝධයේ ඇති වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරන්න.
- අදාළ ගායනය හා නර්තන පද කොටස් ප්‍රස්තාර කිරීමට යොමු කරවන්න.

ඇගයීම :

- නියමිත තාල රූප අනුව පද, කවි, කස්තිරම්, සීරුමාරු, අඩවු, ඉරට්ටි, කලාසම් ප්‍රස්තාර කරන්න.
- තාලාවබෝධය ලැබීමට ප්‍රස්තාරකරණය මඟින් ලැබෙන පිටිවහල අගය කරන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල ස්වරූපය හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.1** : නිර්දේශිත වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 3.1** : වාද්‍ය භාණ්ඩ සකස් කිරීම පිළිබඳ තොරතුරු උගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :

- නිර්දේශිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නිර්දේශිත වාද්‍ය භාණ්ඩ සැකසීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කරයි.
- වාද්‍ය භාණ්ඩ සැකසීමේ සම්මත ශිල්ප ක්‍රම හා චාරිත්‍ර පිළිබඳ සාකච්ඡා කරයි.
- වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ දී ධ්වනි ගුණය උත්පාදනයට අවශ්‍ය ශිල්ප ක්‍රම භාවිතයේ වැදගත්කම විචාරයට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය**

: ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, පැවරුම් ක්‍රමය, ක්ෂේත්‍ර චාරිකා ක්‍රමය, ගවේෂණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

ඒ ඒ වාද්‍ය භාණ්ඩ නිර්මාණය හා බැඳි චාරිත්‍ර පිළිබඳ සාකච්ඡා කර, බෙර සැකසීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය, මිනුම් ක්‍රම, උපකරණ හා සකස් කිරීමේ පියවර ක්‍රමික ව විස්තර කර දීම අපේක්ෂා කෙරේ.

| දවුල | පහතරට බෙරය | ගැටබෙරය |
|---|---|---|
| <u>බෙර සැකසීමට ගන්නා ලී වර්ග</u><br>ඇහැළ, ගංසූරිය, කොහොඹ, දේවදාර, මිල්ල | ඇහැළ, කොහොඹ, කොස් (වරකා) කිතුල්, පොල්, මේරූ තල් කඳන් | ඇහැළ, කොහොඹ, කොස් (වරකා) ගංසූරිය, හල්මිල්ල |
| <u>හම් වර්ග</u><br>දවුල් තට්ටුව- එළහරක් හම්<br>මීවසු පැටවුන්ගේ හම්,මුව හම්,<br>එළු හම් | <u>බෙර ඇස් සඳහා</u> -<br>හරක් බොකු හම්, සිවි හම්<br><u>වරපට සඳහා</u> -<br>හරක් හම් | <u>දකුණු ඇස</u>- පදම් කළ වඳුරු හම්, තලගොයි හම්, එළු හම්<br><u>වම් ඇස</u> - පදම් කළ මුව හම්, හරක් හම් |
| <u>දවුල් වරපට හා දවුල් ලණුවසඳහා</u><br>හන නූල්<br><u>දවුල් ගැටි සඳහා-</u><br>මල් කැප්පෙට්ටියා, රතඹලා, ලේන්තිරිය වැනි ලී වර්ග<br><u>ගැටිය තුළට</u>- බාඳුරා වැල්<br><u>කඩිප්පු</u>- ඇට්ටේරියා, රතඹලා | <u>කැපුම් හම හා වෙනිවර සඳහා</u> -<br>හරක් හම්, මුව හම්<br><u>ගැටිවැල් සඳහා</u> -<br>රදලිය, කිරිඳි වැල්, රත්මල්, මල්කැර, කැප්පෙට්ටියා කෝටු | හරක් හම්<br><br>කිරිඳි වැල්, කුකුල වැල් |

| දවුල | පහතරට බෙරය | ගැටබෙරය |
|---|---|---|
| කයිපුඩි වළල්ල- පිත්තල ගිගිරි සිහින් මුදු | | කයිපුඩි වළල්ල- පිත්තලවලින් නිමවූ ගිගිරි සහිත වළල්ල |
| **මිනුම් ක්‍රම** - <br> දවුල් කඳ දිග අඟල් 18 -22 පමණ | බෙර කඳේ දිග <br> තුන් වියත් තුනඟුල යි. | තුන් වියත් තුනඟුල යි. |
| **බෙර කටේ විෂ්කම්භය** <br> අඟල් 15 -16 පමණ | එක් වියත් තුනඟුල යි. | විග්ගුස්සයි. (මහපට ඇඟිල්ල හා දඹර ඇඟිල්ල දික් කළ විට ඒ අතර දුර) |
| වට ප්‍රමාණය අඟල් 45 -46 පමණ | | හඬ ඉර-දකුණු ඇසෙහි බෙර කට වටේ සකස් කර ගන්නා කුඩා රේඛාව |
| බෙර කට සනකම අඟල් කාලකට වඩා අඩු විය යුතු ය. | | |
| | වරපට පළල අඟල් කාලකට වඩා අඩු විය යුතු ය. <br> දිග සත්බඹ සත් වියතකි. | වරපට පළල අඟල් භාගයකි. <br> දිග සත්බඹ සත් වියතකි. |

(අතෙහි ඇඟිලි විහිදවූ විට මහපට ඇඟිල්ලේ සිට සුළැඟිල්ල දක්වා දුර එක් වියතකි. අතෙහි මැද ඇඟිලි තුන එකට එක්කොට ලැබෙන

| තම්මැට්ටම (පොකුරු බෙරය) | උඩැක්කිය |
|---|---|
| තිරස් පළල තුනඟුලකි. මේවා සාම්ප්‍රදායික යෙදුම් කොටස් දෙකකි. හඬ බෑය, මණ්ඩම | වේ. <br> කඳ කුඩා මුහුණත් දෙපස මදක් විශාල වූ භාණ්ඩයකි. |
| **කඳ සකස් කිරීමට යොදා ගන්නා ලී වර්ග** - <br> ඇසළ, කොහොඹ, කොස් (වරකා), ගන්සූරිය, | ඇසළ, කොහොඹ, කොස් (වරකා), ගන්සූරිය, දේවදාර |
| **හම් වර්ග** - <br> සනකම සහිත හරක් හම්, සනකමින් අඩු හරක් හම් | සාවුන්ගේ හම්, වඳුරු හම්, තලගොයි හම් |
| **වරපට** - <br> වරපට සඳහා හරක් හම් (අඟල් භාගයක් පළල) වෙනිවර (හරක් හම් සිහින් ව කපා තලා අඹරා සකස් කෙරේ. | නියඳ කෙඳි |
| ගැටි වැල - <br> රතඹලා, රදලිය, කිරිඳිවැල්, මල්කැර, කැප්පෙට්ටියා කෝටු | හම් ඇලවීමට- දිවුල් ලාටු, කැන්ද ලාටු <br> හඬ සුසර කිරීමට - කිතුල් /නියඳ තතක් |
| **කුන්දිරම් පල්ල** - <br> පුවක්, කිතුල් හෝ ලෝහ පතුරු | සවරම - හණ නූල්වලින් සකස් කර ගනී. <br> අග පොහොට්ටුවකින් අලංකාර කෙරේ. |
| **කඩිප්පු** - <br> මේරූ කිරිඳි වැල් | |

**බෙර සකස්කර ගැනීම සඳහා යොදා ගන්නා උපකරණ :**

ලියවන පට්ටලයකින් බෙර කඳ ලියවා ගැනීම කෙරේ පොරව, අත් පොරව, හරස් කියත, අත් කියත, වෑය, අවගාරය, බොකු නියන්, උල් නියන්, සාන්කුව හෙවත් පුල්ලෝරම, ඇලිස් කටුව, පෙති කටුව, ඉල්ලම් කුරු, බොකු අඬුව, පත්උල.

**ආධාරක උපකරණ** :

අතකොළුව, දියගල, ගිනිගල, ඇමරිගල, තෙල්ගල

**බෙර සකස්කිරීමේ පියවර :**

බෙර කඳ/දවුල් කඳ/තම්මැට්ටමේ හඬබෑය,මණ්ඩම/උඩැක්කි කඳ කැපීම, හැරීම, ලියවීම, කට සැකසීම, හම් සැකසීම, වරපට සැකසීම, කැපුම් හම් සැකසීම,ගැට්වැල සැකසීම(ගෙතීම), හම් යෙදීම, තට්ටු දැමීම, වරපට දැමීම, කන්වර සකසා යෙදීම, කයිපුඩි වළල්ල යෙදීම, මුදු යෙදීම, බෙර ලණුව යෙදීම, කඩිප්පු සකස්කිරීම. (දවුල්, තම්මැට්ටම්)

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- වාද්‍ය භාණ්ඩ සකස් කරන ස්ථානයක් නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන්න. නැතිනම් දෘශ්‍ය සංයුක්ත තැටි භාවිත කරන්න.
- අදාළ භාණ්ඩ ප්‍රදර්ශනය කරමින් එම වාද්‍ය භාණ්ඩ සකස් කිරිමට භාවිත අමුද්‍රව්‍ය පිළිබඳ කරුණු දක්වන්න.
- වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න.
- ධ්වනි ගුණය නිෂ්පන්න කිරීමට බලපාන සාධක පිළිබඳ විස්තර කරන්න.
- මෙම ශිල්ප ක්‍රම ඉගෙනීමේ ඇති වටිනාකම් හා අවශ්‍යතා පිළිබඳ විමසන්න.

**ඇගයීම** :

- අදාළ වාද්‍ය භාණ්ඩ සැකසීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කරන්න.
- වාද්‍ය භාණ්ඩ සැකසීමේ සම්මත ශිල්පක්‍රම හා චාරිත්‍ර පිළිබඳ විස්තර කරන්න.
- වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ දී ධ්වනි ගුණය උත්පාදනයට අවශ්‍ය ශිල්ප ක්‍රම භාවිතයේ වැදගත්කම විචාරයට ලක් කරන්න.

**නිපුණතාව 03** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල ස්වරූපය හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** : නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරමින් බෙර/දවුල් සරඹ පද වාදනය කරයි.

**ක්‍රියාකාරකම 3.2** : බෙර/දවුල් සරඹ පද වාදනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- සතර බීජාක්ෂර නිවැරදි ව වාදනය කරයි.
- බෙර/දවුල් සරඹ පද තාල තබමින් කියයි.
- වාදනයේ දී නියමිත අක්ෂර උත්පාදනය වන අයුරින් බෙර/දවුල් සරඹ පද වාදනය කරයි.
- බෙර/දවුල් සරඹ පද ත්‍රිවිධ ලය පවත්වා ගනිමින් සාමූහිකත්වයෙන් යුතු ව වාදනය කරයි.
- වාදන විධි ක්‍රම අනුගමනය කරමින් බෙර/දවුල් සරඹ ඒකල ව වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, සරඹ පද ලියන ලද සටහන

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, අභ්‍යාස ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

මෙම ක්‍රියාකාරකම අවසානයේ නිරන්තර අභ්‍යාසයේ යෙදීම සඳහා සිසුන්ට උපදෙස් ලබා දීම හා ගුරුවරයා නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.

## <u>උඩරට - බෙර සරඹ පද</u>

1. තකට
2. තකට තකට කුඳ
3. තකට තකට කුඳ තකට කුජිං ජිං
4. තකට තකට කුඳ තක්කඩ කඩ කුඳ
5. තත් තත් කඩ<br>ජිත් ජිත් කඩ<br>තොං තොං කඩ<br>නං නං කඩ

## <u>පහතරට - බෙර සරඹ පද</u>

1. ගුහිති ගහිදි (ති)
2. ගුහිති ගහිති ගත
3. ගුහිති ගදිරිකිට - ගහිති ගදිරිගුඳ
4. කිටි තක කිටි ගුඳ
5. කිටි කිටිතක කිටිතක කිටි කිටිගුඳ කිටිගුඳ

## <u>සබරගමු - දවුල් සරඹ පද</u>

1. තකට - ජිකට
2. තක්කඩ ජික්කඩ තොංකඩ නංකඩ
3. කිටිතක - දොම්කිට
4. තරිකිට - දිරිකිට
5. තරි තරිකිට - දිරි දිරිකිට - තරිකිට දිරිකිට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- 8 - 11 ශ්‍රේණිවල දී උගත් බෙර/දවුල් පද වාදනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වාදනයට සුදුසු පරිදි බෙරය හසුරුවාගෙන ආචාරධර්ම පවත්වා සරඹ පද වාදන අභ්‍යාසයට සූදානම් කරවන්න.
- සතර බීජාක්ෂර නිපදවන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දෙන්න. සරඹ පද ත්‍රිවිධ ලය අනුගමනය කරමින් වාදනයට යොමු කරවන්න. එහි දී වාදන ශිල්ප ක්‍රම යොදා ගනිමින් සරඹ පද නිවැරදි ව වාදනයට යොමු කරවන්න.
- සාමූහික ව හා ඒකල ව පද වාදනය කිරීම හා ලය පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- උගත් බෙර පද කොටස් අභ්‍යාස කර ඒකල ව ඉදිරිපත් කරවන්න.

ඇගයීම :

- සතර බීජාක්ෂර නිවැරදි ව වාදනය කරන්න.
- සරඹ පද ලය තුනට වාදනය කරන්න.
- නිවැරදි අක්ෂර උත්පාදනය වන සේ පද වාදනය කරන්න.
- සාමූහික ව බෙර සරඹ පද වාදනය කරන්න.
- නිවැරදි අක්ෂර උත්පාදනය වන සේ ඒකල ව සරඹ පද වාදනය කරන්න.

**නිපුණතාව 03** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල ස්වරූපය හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.3** : වන්නම් ගායනය කරමින් බෙර/දවුල් වාදනය කරයි.

**ක්‍රියාකාරකම 3.3** : වන්නම් ගයමින් බෙර/දවුල් වාදනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- නියමිත වන්නම්වල මූලික බෙර/දවුල් පද තාල තබමින් කියයි.
- මූලික බෙර පද ආශ්‍රිත අලංකාර බෙර/දවුල් පද හා කස්තිරම්/ඉරට්ටි/කලාසම් පද තාල තබමින් කියයි.
- අලංකාර බෙර/දවුල් පද වාදනය කරයි.
- ගායනය කරමින් අදාළ බෙර/දවුල් පද වාදනය කරයි.
- නිවැරදි අක්ෂර උත්පාදනය වන පරිදි කස්තිරම්/ඉරට්ටි/කලාසම් වාදනය කරයි.
- ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් කණ්ඩායම් වශයෙන් වාදනය ඉදිරිපත් කරයි.
- ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය වන අයුරින් ඒකල ව වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : අදාළ බෙර, තාලම්පට, පද ලියන ලද පුවරු

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

වන්නම්වලට අදාළ මූලික බෙර පද හා අලංකාර පද කස්තිරම්/ඉරට්ටි/ කලාසම් තාල තබා පියවරෙන් පියවර වාදනය කිරීමට යොමු කරවන්න.

## උඩරට නර්තන සම්ප්‍රදායය

### <u>මුසලඩි වන්නම</u>

මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය

**මූලික පදය** : මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය
දෝං ජිං ජිං තකට දොංතක
මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය
ජිංගත ගො ගො

**අලංකාර 01** : මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය
තක් කුන්තක/ජිං-ජිං-/තකට/කුං ජිං කඩතකු/
මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය
ජිංතට ගත්/ජිං කඩතකු/ජිංතට කුං /ජිං කඩතකු/

**අලංකාර 02** : මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය
තක් කුන්තක/ජිං-ජිං-/ගත් තරිකිට/කුංජිං කඩතකු
මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය
කුන්දඩ කුං/ජිං කඩතකු/ජිංතට ගජ්/ජිං කඩතකු

**අලංකාර 03** : මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය
කුන්දඩ කුං/ජිංතට කඩතකු/ජිංතට කුඳ/ගජ්ජිං කඩතකු/

## ගණපති වන්නම

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

**මූලික පදය** : ජිං ගත ගො ගො

**අලංකාර** :

01. ජිං තට කුඳ/ගත කුකුතක/ජිං තට ගජ්/ජිං ගො ගො
02. කුඳගත කුඳ/ගත කුකුතක/ජිංතට ගජ්/ජිං- කුං- දත්
03. කුන්තක තරිකිට කුඳ/ගත කුකු තක/ජිංතක තරිකිට කුඳ/ගත කුකු ජිං-
04. කුන්තක තරිකිට කුඳ/ගජ්ජිං තකටකු තකු දඩ/ගජ්ජිං තරිකිට කුඳ/ගත කුකු ජිං

සැ. යු.: අලංකාර පදයක් වාදනය කළ යුතුයි.

## මයුරා වන්නම

**මාත්‍රා 2 + 2 + 3 (දෙසුළු මැදුම් තුන්තිත) තාලය**

**මූලික පදය** : තෙහිංතකු/තෙහිංතකු/තෙහිං ජිං-/ගත් - / තත් -/ජිං- තරිකිට

**අලංකාර 01** : තෙහිං තකු/තෙහිං තකු/තෙහිං ජිං ජිං
තක් කට/කුකු තක/ජිං- තරි කිට

**අලංකාර 02** : තෙහිං තකු/තෙහිං තකු/තෙහිං ජිං ජිං
කුජිං තක්/ජිං තක්/ජිං- තරි කිට

**අලංකාර 03** : තෙහිං තකු/තෙහිං තකු/තෙහිං ජිං ජිං
තක්කඩ කඩතකු/ජිංකඩ කඩතකු/ජිං තරිකිට

**අලංකාර 04** : කුංජිං කඩතකු/තකුජිං කඩතකු/තකු ජිං ජිං
තක්කඩ දොංකඩ/කඩතකු තකුකඩ/ගජ්ජිං තරිකිට කුන්දත්

පහතරට නර්තන සම්ප්‍රදායයේ ශුද්ධ තාලය, ලලිත රාග තාලය, නළු ගීතිකා තාලය සින්දු වන්නම්වලට අදාළ ව වාදන ශිල්පීය කුසලතා මත අලංකාර බෙරපද වාදනය කෙරේ.

## ශුද්ධ තාලය

**මාත්‍රා 2+2+3 (දෙසුළු මැදුම් තුන්තිත) තාලය**

බෙර පදය : දිත් -/ තම් -/ දිතකු / දොම් -/ දොම්- /තා - - /

## ලලිත රාග තාලය

**මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය**

බෙර පදය : ගදිත / දො දොම් -/ දොම් - ග/ දිතම් -

**නළු ගීතිකා තාලය**

මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය

බෙර පදය : ගත්--/ ත-ග- /දි ත - / ගු - ගු -/ ඳං - - / - - ග - /දිත් - -/ තත් - - - /
රෙග - -/ තත් - - -/ දිකු -/ ඳ - ක - /දැහිමි - - /- - - -/දිත -/ග - ත -/

**සබරගමු නර්තන සම්ප්‍රදායය**

**කොවුලා වන්නම**

මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය සහ මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය

මූලික දවුල් පදය : දොංත - තකට
කුඳත් තක්කිට - තකට ජිමිතක

අලංකාර පද : දොංත / තකට /දොං - කුං /දත් තරි කිට

අලංකාර පද ජිං කුඳ කුඳ /තත්කිට කිටිතක/තත් කිටිතක/ තත්කිට කිටිතක

**තිසරා වන්නම**

: මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

මූලික දවුල් පදය : ජිං-ත / ගත - / ගත - / ගත - /
ගතිත / ගත - / ගත -/ ගත - /
ජිං-ත / ගත - / ගතිත / ගත - /
ගතත් - / කුඳත් - / තා - - / තකට /

අලංකාර පද : ජිමිකිට ගත් / තත් කුන්දත් / තත් කුන්දත්/ තත් තරිකිට/
ජිමිකිට ගත් / තත් කුන් දත්/ජිමිකිට ගත් / තත් කුන්දත්/ //
දිරි කිට තරි / කිට දිරි කිට / තාත්- - / ග තත් -/

**නාග ගජගා වන්නම**

: මාත්‍රා 3 + 2 + 2 (මැදුම් දෙසුළු තුන්තිත) තාලය

මූලික දවුල් පදය : ජිමිත්- / තක් - /කිට / තකට / ජිමි / තක/

අලංකාර පද : ජිං කුඳ කුඳ / තක්කිට / කිටිතක
තත් කිටිතක / තත්කිට / කිටිතක

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- බෙර සරඹ වාදනයේ දී සිසුන් ලබා ගත් ප්‍රායෝගික කුසලතා නිරීක්ෂණය කරන්න. අපේක්ෂිත කුසලතා මට්ටමට ළඟා වී නොමැති නම් ඒ සඳහා අවශ්‍ය අභ්‍යාසවල නිරත කරවන්න.
- වන්නම් සඳහා බෙර වාදනය කිරීමට අවශ්‍ය මූලික බෙර පද පිළිබඳ සාකච්ඡා කර වාදනයට යොමු කරවන්න. අභ්‍යාස කරවන්න.
- අලංකාර පද වාදනයට ප්‍රායෝගික අභ්‍යාස කරවන්න.
- වන්නමේ අදාළ කොටස් සියල්ල වාදනය කිරීමට මග පෙන්වන්න.
- ගායනය සමඟ සාමූහික ව වාදනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒකල ව ගායනය කරමින් වාදනයට යොමු කරවන්න. සතතාභ්‍යාසයේ වැදගත්කම සාකච්ඡා කර අභ්‍යාසයේ නිරත වීමට උපදෙස් දෙන්න.

**ඇගයීම** :

- වන්නම්වලට අදාළ මූලික බෙර / දවුල් පද තාල තබා කියන්න.
- මූලික බෙර / දවුල් පදවලට අදාළ අලංකාර පද හා කස්තිරම් / ඉරට්ටි / කලාසම් තාල තබා කියන්න.
- මූලික බෙර පද / දවුල් පද, අලංකාර පද කස්තිරම් / ඉරට්ටි / කලාසම් වාදනය කරන්න.
- ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් සාමූහික ව හා ඒකල ව බෙර / දවුල් පද වාදන ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 04** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම 4.1** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් චරිත නිරූපණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.1** : සිද්ධියක් ඇසුරින් චරිත නිරූපණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :

- චරිත නිරූපණය කිරීමට සුදුසු සිද්ධියක් ගොඩ නඟයි.
- ගොඩනඟා ගන්නා ලද සිද්ධියෙහි අන්තර්ගත චරිතවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විමසයි.
- චරිත නිරූපණය සඳහා උචිත චලන නිර්මාණය කරයි.
- චරිත නිරූපණය සඳහා ඒකල ව චලන නිර්මාණය කරයි.
- නර්තන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය කරයි.
- භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපණය කරයි.
- සාමූහිකත්වයෙන් යුතු ව සිද්ධිය ගොඩ නංවයි.
- නිර්මාණය සාර්ථක ව ඉදිරිපත් කිරීමට සාමූහිකත්වයෙන් යුතු ව කටයුතු කරයි.
- තම නිර්මාණ ප්‍රදර්ශනය කරයි.
- සෙසු නිර්මාණ විචාරයට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර, උචිත වාද්‍ය භාණ්ඩ,

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, පැවරුම් ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

මෙම මාතෘකාවට අදාළ ව ක්‍රියාකාරකම ගොඩ නගන විට ජනශ්‍රැතිය ආශ්‍රිත කතා, ජාතක කථා, සමාජයේ දක්නට ලැබෙන සිද්ධි ඇසුරෙන් සිද්ධියක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ. සිසු සිසුවියන්ගේ ශක්‍යතා සලකා බලා සිද්ධියක් ගොඩ නංවා ගැනීම මෙන් ම චලන නිර්මාණය, භාව ප්‍රකාශනය, චරිත ස්වභාව හා චලන පිළිබඳ විචාරශීලී ව අදහස් දැක්වීම වැදගත් ය. සිසු සිසුවියන්ගේ නිර්මාණාත්මක චින්තනය භාවිත කරමින් ක්‍රියාකාරකම සාර්ථක කර ගැනීමට අත්වැලක් සැපයීම වැදගත් බව සලකන්න.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- චරිත නිරූපණයට උචිත සිද්ධියක් ගොඩ නඟන්න.
- සිද්ධියෙහි අන්තර්ගත චරිතවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරමින් ඒ පිළිබඳ විමසන්න.
- චරිත නිරූපණය සඳහා චලන නිර්මාණය කිරීමට මඟ පෙන්වන්න.
- කණ්ඩායමක් ලෙස සිද්ධියක් (නිර්මාණය) ඉදිරිපත් කිරීමට අභ්‍යාස කරවන්න.
- කණ්ඩායමක් ලෙස සිද්ධිය ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.

**ඇගයීම** :

- කණ්ඩායමක් ලෙස සිද්ධියක් ඇසුරින් චරිත නිරූපණ ඉදිරිපත් කරන්න.
- සිද්ධිය ඇසුරින් චරිත නිරූපණ ඒකල ව ඉදිරිපත් කරන්න.
- කණ්ඩායමක් වශයෙන් හෝ ඒකල ව මෙම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා සමස්තය අගයන්න. චරිත නිරූපණ කාර්යයේ දී සිසුන් දැක්වූ කුසලතා ද ඇගයීමට ලක් කරන්න.

**නිපුණතාව 04** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදේ.

**නිපුණතා මට්ටම 4.2** : චරිතාත්ම අංග රචනය සඳහා ක්‍රමවේදයන් සහ චරිත ගොඩනැගීමේ ශිල්ප ක්‍රම අධ්‍යයනය කරමින් අංග රචනය කරයි.

**ක්‍රියාකාරකම 4.2** : චරිතාත්ම සඳහා අංග රචනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- අංග රචන ආලේපන ද්‍රව්‍ය නම් කරයි.
- අංග රචනයේ විවිධ ශිල්ප ක්‍රම හඳුන්වයි.
- චරිතාත්ම අංග රචනය යනු කුමක්දැයි විස්තර කරයි.
- ශාන්තිකර්මවල අන්තර්ගත ඇතැම් චරිත සඳහා නූතන අංග රචනය යොදා ගත හැකි බව ප්‍රදර්ශනය කරයි.
- වේදිකා නාට්‍යවලට උචිත චරිතයක් අංග රචනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරයි.
- නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරමින් අංග රචනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : අංග රචන ආලේපන ද්‍රව්‍ය, දෘශ්‍ය සංයුක්ත තැටි, (ජාතික අධ්‍යාපන ආයතනයේ නිෂ්පාදිත)

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, කැඩපත් ක්‍රමය, ගවේෂණ ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

අංග රචනයේ විවිධ ආලේපන ද්‍රව්‍ය හා නිවැරදි ක්‍රම ශිල්ප, චරිතාංග අංග රචනය ශාන්තිකර්මවල අන්තර්ගත චරිත සඳහා නූතන අංග රචනා ක්‍රම යොදා ගැනීම, වේදිකා නාට්‍යවලට උචිත චරිත අංග රචනය පිළිබඳ සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- නූතන අංග රචනා ක්‍රම ශිල්ප හා ශාන්ති කර්මවල අංග රචනා ක්‍රම පිළිබඳ විචාරයට ලක් කරන්න.
- එවැනි අවස්ථා උදාහරණ ගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නූතන අංග රචනා ශිල්ප ක්‍රම හඳුන්වන්න.
- චරිතාංග අංග රචනය යනු කුමක් දැයි විස්තර කරන්න.
- ශාන්තිකර්මවල අන්තර්ගත ඇතැම් චරිත සඳහා අංග රචනය කළ හැකි ආකාරය විස්තර කරන්න.
- වේදිකා නාට්‍යයට උචිත චරිත අංග රචනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරන්න.
- අංග රචනා ආලේපන ද්‍රව්‍ය හඳුන්වා දී අංග රචනය ප්‍රායෝගික ව කරන ආකාරය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඇගයීම** :

- ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දී නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරන ආකාරය ඇගයීමට ලක් කිරීම අවශ්‍ය වේ. දැනුම හා අවබෝධය පිළිබඳ විමසීමට සුදුසු ප්‍රශ්න කිහිපයක් ලිඛිත ව හෝ වාචික ව හෝ භාවිත කරන්න.
- අංග රචනා ආලේපන ද්‍රව්‍ය නම් කරන්න.
- අංග රචනා ශිල්ප ක්‍රම දෙකක් විස්තර කරන්න.

**නිපුණතාව 04** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදේ.

**නිපුණතා මට්ටම 4.3** : විවිධ ද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම භාවිත කරමින් සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංග ආභරණ සකස් කරයි.

**ක්‍රියාකාරකම 4.3** : සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන රංග ආභරණයක් සකස් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- දේශීය සාම්ප්‍රදායික රංග ආභරණවල සුවිශේෂ ලක්ෂණ විමර්ශනය කර තොරතුරු ඉදිරිපත් කරයි.
- ඒකල ව හෝ සාමූහික ව හෝ නිර්මාණය කරන රංග ආභරණ නම් කරයි.
- රංග ආභරණ නිර්මාණය කිරීමේ ක්‍රම ශිල්ප හඳුනා ගනිමින් ඒවා භාවිතයට ගනියි.
- තෝරාගත් රංග ආභරණයක දළ රූප සටහනක් අඳියි.
- එම රංග ආභරණය සකස් කිරීමට සුදුසු අමු ද්‍රව්‍ය තෝරයි.
- විවිධ ක්‍රම ශිල්ප භාවිත කරමින් රංග ආභරණයක් නිර්මාණය කරයි.
- රංග ආභරණ සකස් කිරීමේ දී සාමූහික ව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** : රංග ආභරණ සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ, රූප සටහන්,

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, පැවරුම් ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංග ආභරණ සකස් කිරීම සඳහා සාම්ප්‍රදායික රංග ආභරණවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම අවශ්‍ය වේ.

  දේශීය නර්තන සම්ප්‍රදායවලට ආවේණික පාරම්පරික ඇඳුම් කට්ටලවලට අයත් ආභරණ මැනවින් අධ්‍යයනය කිරීම පළමු කොට වැදගත් ය. ඒ හැරුණු කොට විහාර - දේවාලය ආශ්‍රිත ව පවත්නා චිත්‍ර මෝස්තර කැටයම් හා පුරාවිද්‍යාත්මක සාධකවල දක්නට ලැබෙන රංග ආභරණ නිරීක්ෂණය කිරීම.

  රංග ආභරණ නිර්මාණය කිරීම සඳහා භාවිත කළ හැකි අමුද්‍රව්‍ය එක්රැස් කිරීම. (ඇට වර්ග, කාඩ්බෝඩ්, ලී කුඩු පල්ප්, විවිධ මහතින් යුතු අඹරන ලද කපු පුළුන් මෙන් ම ඉවත ලන පල්ප් කොටස්, නිෂ්පාදිත කෘත්‍රිම රබර් විශේෂ, කම්බි, තීන්ත වර්ග, රන්, රිදී, තඹ ආදි වර්ණවලින් යුතු කුඩු හා ගම් විශේෂ)

- අවශ්‍ය උපකරණ

  කතුරක්, නූල් කැපීමට සුදුසු මුවහත් පිහියක්, ස්ටේප්ලර් යන්ත්‍රයක් හා ඊට අවශ්‍ය ඇමුණුම් කටු, කුඩා මිටියක් ආදි වශයෙන් අවශ්‍යතා අනුව යොදාගත හැකි උපකරණ එක් රැස් කර ගත යුතු ය.

- නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රම

  රංග ආභරණ පලඳින ශරීර ස්ථානය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. එහි දී ශරීරයේ පිහිටීම හොඳින් අධ්‍යයනය කොට උචිත හැඩය හඳුනා ගැනීම සඳහා කඩදාසි කැබැල්ලක් භාවිත කර ආභරණයේ මූලික හැඩය (අදාළ මිනුම් අනුව) පැන්සලකින් /පෑනකින් සටහන් කොට කපා ගත යුතු ය. එම හැඩය ම කාඩ්බෝඩ්වලින් කපා මූලික හැඩය මත ඇලවිය යුතු ය. ශක්තිමත් කර ගැනීම සඳහා ගැල්වනයිස් කම්බි (කොන්ක්‍රීට් සැකිලි බැඳ ගැනීමට භාවිත කරන බයින්ඩින් කම්බි) මූලික හැඩයට මඳක් ඇතුළතින් තබා ස්ටේපලර කටු මඟින් රඳවා ගැනීමෙන් අනතුරු ව ඒවායේ කෙළවර කුඩා මිටියකින් තළා ඉවතලන සිමෙන්ති උර වැනි කොළවලින් මූලික හැඩය සුරැකෙන සේ අලවා ගත යුතු ය. නූල් ආශ්‍රිත ව මෝස්තර යෙදීම ඇරඹිය යුත්තේ ඉන් පසු ව ය. තෝරාගත්

මහත කපු නූල දෙපසට ඊට තරමක් කුඩා නූල්පටවල් දෙකක් බැඳ ගැනීම ශක්තිමත් බව සුරැකීමට උපකාරී වෙයි. ඊළඟට වැදගත් වන්නේ මෝස්තර යෙදීම යි. මෙම ක්‍රියාවලියේ දී නර්තන සම්ප්‍රදායවලට උචිත මෝස්තර හැඩතල තෝරා ගැනීම ඔබ සතු වගකීමකි.

ලී කුඩු, පල්ප් ආශ්‍රිත ව නිර්මාණය කරන්නේ නම් කාඩ් බෝඩ් කොටස ආවරණය වන සේ කපු රෙදි කැබැල්ලක් අලවා රෙදි ඇලවූ පැත්ත ශරීරය පැත්තට යෙදෙන සේ අනෙක් පැත්තට ලී කුඩු පල්ප් අතුරා ඒ මත කුඩා පිහි තුඩකින් හෝ සකස් කර ගත් කියත් පටි කැබැල්ලකින් හෝ මෝස්තර යෙදිය යුතු ය. අවශ්‍ය නම් ආභරණයේ මූලික රේඛා ආශ්‍රිත ව කපු නූල් යොදා සෙසු කොටස් කැටයම් කරගත හැකි ය.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- දේශීය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි රංග ආභරණ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එක් එක් සම්ප්‍රදායයට අදාළ රංග ආභරණ නම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම රංග ආභරණවලින් එක් ආභරණයක් සකස් කිරීමට තෝරා ගත යුතු ය. සිසු ශක්‍යතා හා අමුද්‍රව්‍ය සපයා ගැනීම පිළිබඳ ව ද සලකා බලන්න.
- කන, කර, පපුව, උරහිස්, ඉණ, දෑත්, දෙපාවලට පලඳින ආභරණ සකස් කරවන්න. තෝරා ගන්නා ලද ආභරණයක මූලික දළ සටහනක් සකස් කරවන්න. (චිත්‍රයට නැඟීම) එය සකස් කිරීමට භාවිත කළ හැකි අමුද්‍රව්‍ය හා ක්‍රම ශිල්ප පිළිබඳ ව ද සාකච්ඡා කරන්න.
- ශිල්ප ක්‍රම අනුගමනය කරමින් සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි රංග ආභරණ සකස් කිරීමට අවශ්‍ය පහසුකම් සලස්වන්න.
- තනි තනි ව හෝ කණ්ඩායමක් ලෙස හෝ යොදවා ක්‍රියාකාරකම සැලසුම් කරන්න. සකස් කරන ලද රංග ආභරණ නිර්මාණ ප්‍රදර්ශනය කර ඇගයීමට ලක් කරන්න.
- පන්ති කාමරයේ දී මෙම ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත වන විට ඔවුන්ගේ ප්‍රවීණතා මට්ටම් හඳුනා ගනිමින් දළ තක්සේරුවක් කරන්න. අවශ්‍ය සහාය, සම්පත් දායකත්වය ලබා දෙන්න. රංග ආභරණ සකස් කළ පසු ඒ පිළිබඳ ව නිරීක්ෂණය කරමින් නිර්ණායක පදනම් කොටගෙන ඇගයීමට ලක් කරන්න.

ඇගයීම :

- සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංග ආභරණයක් සකස් කරන්න.
- අන් අය ඉදිරිපත් කරන ලද රංග ආභරණ ඇගයීමට ලක් කරන්න.

මූලාශ්‍රය : සිංහල සැරසිලි කලාව - ලයනල් බෙන්තරගේ

වේදිකා නාට්‍යයේ ආනුෂංගික අංග - ජගත් පද්මසිරි

**නිපුණතාව 04** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදේ.

**නිපුණතා මට්ටම 4.4** : විවිධ ද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම භාවිත කරමින් නිර්මාණාත්මක රංග ආභරණ සකස් කරයි.

**ක්‍රියාකාරකම 4.4** : නිර්මාණාත්මක රංග ආභරණයක් සකස් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- නිර්මාණාත්මක නර්තන අංගයක් සඳහා සුදුසු රංග ආභරණ නිර්මාණය කිරීම පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- ඒ සඳහා භාවිත කළ හැකි අමුද්‍රව්‍ය හඳුනා ගනිමින් එක් රැස් කරයි.
- නිර්මාණාත්මක රංග ආභරණ සකස් කිරීමේ ශිල්ප ක්‍රම හඳුනා ඒවා භාවිත කරයි.
- නිර්මාණාත්මක රංග ආභරණ සකස් කිරීමේ දී සාමූහිකත්වයෙන් යුතු ව කටයුතු කරයි.
- නිර්මාණය කරන ලද රංග ආභරණවල ගුණාත්මක භාවය විචාරයට ලක් කරයි.
- විචාරවලට සවන් දී තම නිර්මාණ තව දුරටත් සංවර්ධනය කර ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ඡායාරූප, දෘශ්‍ය සංයුක්ත තැටි, විවිධ රංගාභරණ කොටස්, අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ

**ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රමවේදය** : ප්‍රායෝගික ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය, ගවේෂණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන පරිදි රංග ආභරණ සකස් කිරීමේ ක්‍රියාකාරකම නිම කළ පසු, මෙම ක්‍රියාකාරකම සැලසුම් කිරීම වඩා සුදුසු ය. එවිට උක්ත ක්‍රියාකාරකමේ දී උගත් ශිල්ප ක්‍රම හා ප්‍රායෝගික අත්දැකීම් මෙහි දී භාවිතයට ගත හැකි ය. නිර්මාණාත්මක නර්තන අංග සඳහා උචිත කර, පපුව, උරහිස්, ඉණ, දැත්, දෙපා ආභරණ හා කාන්තා පිරිමි හිස් පලඳනා මෙහි දී නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ. ඒ පිළිබඳව ද තොරතුරු හා අදහස් විමර්ශනාත්මක ව සාකච්ඡා කර විවිධ ද්‍රව්‍ය, පින්තූර හා ශිල්ප ක්‍රම උදාහරණ ලෙස ගනිමින් සිසුන් දැනුම්වත් කළ යුතු ය. නිර්මාණය කරන ලද රංග ආභරණ පැලඳීමට හැකි ලෙස සකස් කිරීමට උපදෙස් දීම වැදගත් වේ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- සාම්ප්‍රදායික රංග ආභරණ සකස් කළ පසු මෙම ක්‍රියාකාරකම සැලසුම් කරන්න.
- නිර්මාණාත්මක නර්තන අංගයක් සඳහා උචිත රංග ආභරණ සකස් කිරීම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ඒ සඳහා සුදුසු ද්‍රව්‍ය හැඩතල හා වර්ණ පිළිබඳ අදහස් විමසන්න.
- සාකච්ඡාවකින් අනතුරු ව ක්‍රියාකාරකමෙහි යොමු කරවන්න.
- නිර්මාණය කරන ලද රංග ආභරණ ඇගයීමට ලක් කරන්න.

ඇගයීම :

- නිර්මාණාත්මක නර්තන අංගයක් සඳහා නිර්මාණය කරන රංගාභරණවල සුවිශේෂ ලක්ෂණ මොනවා ද? විස්තර කරන්න.
- නිර්මාණාත්මක නර්තන අංගයක් සඳහා උචිත රංග ආභරණයක් සකස් කරන්න.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනය කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** : ශාන්තිකර්ම හා සබැඳි ගායනය ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.1** : ශාන්තිකර්ම කවි කියමු.

(මඩුපුරේ කවි, නානුමුර කවි, කොහොඹා හැල්ල කවි, ග්‍රහ පන්ති කවි)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- සාම්ප්‍රදායික ගායනවල පසුබිම හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ස්වකීය හඬ තලයෙහි පිහිටා නිවැරදි තාල හා නාද රටාවන් අනුව ඒකල ව ගායනය කරයි.
- ඒකීය හඬ තලයක පිහිටා සාමූහික ව ගායනය කරයි.
- මෙම ජාතික උරුමයන් රැක ගැනීම සඳහා විවිධ යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : කවි ලියන ලද පත්‍රිකා, බෙර, තාලම්පට, ශ්‍රව්‍ය පට

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, දෘශ්‍ය සංයුක්ත තැටි

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

**මඩුපුරයේ කවි** : එක් එක් සම්ප්‍රදායයට අදාළ කවි ගායනය නිවැරදි නාද රටා අනුගමනය කරමින් ගායනය කිරීම අපේක්ෂා කෙරේ.

උඩරට සහ සබරගමු ප්‍රධාන ශාන්තිකර්මවල එන මල්පද නැටීමේ පෙළපාළියට පෙර මඩු පුරයේ කවි ගායනය කරමින් විවිධ තාල රටා අනුව නර්තනයේ යෙදෙයි. පොල් මල පිවිතුරු වූ පූජා භාණ්ඩයකි. මල කපාගෙන මඩු භූමියට ගෙන ඒම චාරිත්‍ර අනුව කළ යුතු බව සහ එකල පැවති කුල වර්ග අනුව පොල්මල භාවිත කරන ආකාරය පිළිබඳ තොරතුරු මෙම කවිවලින් කියැවේ.

**උඩරට නර්තන සම්ප්‍රදායය - මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය**

**බෙර පදය** : දොංජි ජිගත

වීරමුණ්ඩ දෙවි වඩින්ඩ - සියලු දෝස දුර හරින්ඩ
සියොලඟ මගෙ සලිත වන්ඩ - මල් කෙළියට වරන් දෙන්ඩ

**මාත්‍රා 4 (මහ තනිතිත) තාලය**

**බෙර පදය** : තකුක්කු ජිං ජිං කඩතක

සියොපත් පතිනේ දිගුනුව නෙතිනේ
රණලියො පතිනේ රතල ව රතිනේ
සිරිමා පතිනේ නිති අප රකිනේ
වීරමුණ්ඩ රජුනේ කළ ලෙඩ හරිනේ

: **මාත්‍රා 4 (මහ තනිතිත) තාලය**

රජ කුලයට මොන මල දෑ - බමුණු කුලට මොන මල දෑ
වෙළඳ කුලට මොන මල දෑ - ගොවි කුලයට මොන මල දෑ

: **මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය**

රජ කුලයට රනින් මලයි - බමුණු කුලට රිදී මලයි
වෙළඳ කුලට තඹෙන් මලයි - ගොවි කුලයට මෙපොල් මලයි

## සබරගමු නර්තන සම්ප්‍රදාය

**මාත්‍රා 4 (මහ තනිතිත) තාලය**

| | | |
|---|---|---|
| **බෙර පදය** | : | **ජිංත ගතා දොං** |
| **කවිය** | : | මෙනර ලොවේ මල් නැති විය - බඹරුන්ගෙන් ඉඳුල් විය<br>සුළඟින් මල කිලිටි විය - මලට ආමි ඔබගෙ රථය |

**මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය**

| | | |
|---|---|---|
| **බෙර පදය** | : | **දොංත තකට** |
| **කවිය** | : | සුරදෙවියෝ එමල වටා - පංච ගීත කරයි නටා<br>දිවිය රතෙන් නර ලොවටා - ගෙනා මලකි මෙමඬුවටා |

## පහතරට නර්තන සම්ප්‍රදායය

### රට යකුමේ - නානුමුරයේ කවි

නානුමුරය යන වචනය විවිධ වූ අර්ථයන්ගෙන් සිංහල ජන සමාජයේ භාවිත වේ. ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම අතර එන පහතරට රිද්දි යාගයේ නානුමුරයේ දී රිද්දි බිසවගේ චරිත නිරූපණ අවස්ථාව තීව්‍ර කිරීමට සුවිශේෂ වූ නර්තන වාදන හා ගායන යොදා ගැනේ. විශේෂයෙන් නානුමුරයේ ඒ ඒ අවස්ථා සඳහා ගයන කවි සාම්ප්‍රදායික නාදමාලා අනුව පහතරට අනන්‍යතා ලක්ෂණ තහවුරු කරමින් ගායනය කරනු ලැබේ. මෙම කවිවලින් කියවෙන්නේ රිද්දි බිසව දිය නා සළුපිළි හැඳ පැලඳ සූදානම් වන ආකාරය යි. මාත්‍රා 3 තනිතිතට ශෘංගාරය මතු වන සේ ගායනය කිරීම සුවිශේෂ වේ.

**මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය**

රන්විල රිද්දි විල කෙළිනා බිසවුන්ට
මැණික් විලේ දිය නාලා ගොඩ එන්ට
අයවන පුද පඬුරු හෙප්පුව පුරවන්ට
රන්රුව සේ ම බිසවුන් යහනට එන්ට

රේණු දොඩං දෙහි ඇඹුලුයි ගාන්නේ
දෝණු හරින ලෙස වරලස මුදන්නේ
නානු හිසේ ගල්වා දොස හරින්නේ
රිද්දි බිසවු ස්නානෙට සැරසෙන්නේ

## උඩරට නර්තන සම්ප්‍රදායය

**කොහොඹා හැල්ල කවි :**

කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ කොහොඹා හැල්ල ගායනය සහිත ප්‍රධාන නර්තන අංගයකි. මෙහි කවි ගායනයවලින් විස්තර කෙරෙන්නේ කොහොඹා දෙවි උපත් කතාව යි. දරු ගැබ ඇති වීමට පෙර නිමිති පහළ වීමේ සිට දරුගැබේ මේරීම තෙක් විවිධ අවස්ථා හා දේවත්වයට පත්වීම පිළිබඳ මෙම කවිවලින් විස්තර කෙරේ. කොහොඹා හැල්ල විවිධ තාල රූප හා තිත් මාත්‍රා අනුව නැටීමේ දී මෙම කවි ඉතා අලංකාර නාද මාලාවලින් යුතු ව ගායනය කෙරේ.

මෙහි සඳහන් කව්වලින් 'යස ඉසුරු' කවිය කෙටි කවියක් වන අතර, 'අක්ක ඉතින් නාඩන්නේ' කවිය මාත්‍රා තුනේ තනි තිතටත් 'ඉණේ හවඩි රන් කෙදිවන්' කවිය මාත්‍රා දෙක හතර දෙතිතටත් 'කොසඹෝ දිය නාපූ' කවිය මාත්‍රා දෙකේ තනි තිතටත් (ඕඩියට) යොදා ගැනීම වඩාත් සුදුසු ය.

අනාඝාතාත්මක කෙටි කවිය :

යස ඉසුරු සුලබා - සිරිලකෙහි යුත් ගජබා
මල රජුගෙන් සුබා - වරම් ලැබගත් කෙනෙකි කොසඹා

**මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය**

අක්ක ඉතින් නාඩන්නේ - එක්ක ගොසින් අපි එන්නේ
දුක්ව සිතක් නොසිතන්නේ - දැක්මක් නැත කොසඹන්නේ

**මාත්‍රා 2 + 4 (සුළු මහ දෙතිත) තාලය**

ඉණේ හවඩි රන් කෙදිවන් - පයේ ගිගිරි වළලු ලවන්
මෙසේ කොමළ බොළඳ ලියන් - අනේ මලනි දුටොත් කියන්

**මාත්‍රා 2 තනිතිත (සුළු තනිතිත) තාලය**

කොසඹෝ දිය නාපූ - වයිවයි ගොඩ පැනපූ
සිටි මලරජ දැකපූ - පා වැඳලා සිටපූ

ග්‍රහ පන්ති කවි : බලි ශාන්තිකර්මයේ එන ගායනය අතර ග්‍රහපන්ති කවි සුවිශේෂ ය. රවි,චන්ද්‍ර, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනි, රාහු, කේතු යන ග්‍රහයන් නව දෙනාගෙන් පැමිණෙන්නේ යැයි සැලකෙන අපල, උපද්‍රව දුරු කර ගැනීම සඳහා ග්‍රහ දෙවියන්ගේ උපත් කතා ඇතුළු විස්තර කවි ගයමින් පුද පූජා පැවැත්වීමෙන් සෙත් ශාන්තිය අපේක්ෂා කරයි. ඒ ඒ ග්‍රහයන්ට වෙන් වූ කවි පන්ති ඇත. ඒවා ග්‍රහ පන්ති කවි ලෙස හැඳින්වේ. මෙහි සඳහන් කෙරෙන කවි 03 උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායයන්ට ආවේණික නාද මාලාවන් යොදා ගනිමින් ගායනය කළ හැකි ය. ඒ අනුව '**සිරිවස ගෙන**' කවිය මාත්‍රා 03 තනි තිතට උඩරට නාද මාලාවටත්, '**ඉන්ද්‍ර දිසාවට**' කවිය මාත්‍රා 04 තනි තිතට පහතරට නාද මාලාවටත්, '**වල් විදුනා රුගෙනා ගෙනා හිමි**' කවිය මාත්‍රා 3+4 දෙතිතට සබරගමු නාද මාලාවටත් ගැයීම සුදුසු ය.

**උඩරට නර්තන සම්ප්‍රදාය**

**මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය (දොංජි ජිගත)**

ඉන්ද්‍ර දිගේ රවි දෙවිඳුට - වැන්දෙමි අවසර ගන්නට
මන් දෙන මේ පුද ගන්නට - වඩිනේ රවි දෙවි මෙරඟට

සිරිවසගෙන අසු නැගෙමින් නොලසා
සිරිබර ඉඹුලේ තුරු රුස නිවෙසා
පිරිබලි කොකුමෙන් ඉඳුරේ නිවෙසා
ඉරු දෙවි මෙ ඔබට දෙන් සෙත සලසා

**පහතරට නර්තන සම්ප්‍රදාය**

**මාත්‍රා 4 (මහ තනිතිත) තාලය**

ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති වන්නේ
රන් සිරිවස ගෙන සුරත දරාගෙන තුරඟකු පිට වැඩ ඉන්නේ
ඇතියම් රෝ දුක් දුරැර දමා නිති චිරත් කලක් සෙත දෙන්නේ
ඉන්ද්‍ර දිසාවෙන් ඉරු දෙවි වැඩලා ග්‍රහ මේ දොස දුරලන්නේ

**සබරගමු නර්තන සම්ප්‍රදාය**

**මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය**

වල් විදුනා රැගෙනා ගෙනා හිමි ගිනිකොන වැඩ සිටිනා
ලොල් වඩවන බොජුනා මෙනා වැස කරඳ විමන වැසෙනා
ගල්මිණි වජ්‍ර මෙනා හිමි ගත සුදු පැහැය මෙනා
කල් සතහට පැමිණා මෙනා කිවිදෙවි මෙ ඔබට සෙත දෙවනා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- සාම්ප්‍රදායික කවිවල සුවිශේෂ ලක්ෂණ හඳුන්වා දීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අදාළ ගායනාවල (ඒ ඒ මාතෘකා අනුව) පසුබිම හඳුන්වා දෙන්න.
- නිවැරදි නාද මාලාව අනුගමනය කරමින් ගායනය කිරීමට මඟ සලස්වන්න.
- පද උච්චාරණය පිළිබඳ ව අවධානය යොමු කරමින් ගායනය කිරීමට මඟ පෙන්වන්න.
- ස්වකීය හඬ තලය භාවිත කරමින් අදාළ කවි ඒකල ව ගායනය කරන්න.
- සාමූහික ව ඒකීය හඬ තලයක පිහිටා ගැයීමට යොමු කරමින් අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- බෙර වාදනයට අනුව ගැයීමේ හැකියාව වර්ධනය කර ගැනීමට අභ්‍යාසයේ යොදවන්න.
- සාම්ප්‍රදායික ගායනය සංරක්ෂණය කිරීමේ වැදගත්කම විමසා ඒ පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.

**ඇගයීම** :

- නියමිත කවිවල පසුබිම විස්තර කරන්න.
- එක් මාතෘකාවකට එක කවියක් බැගින් ගායනය කරන්න.
- නියමිත නාදමාලාවට අනුව ඒකීය හඬ තලයක පිහිටා කණ්ඩායම් වශයෙන් ගායනා කරන්න.
- බෙර පදයට අනුව තාල තබමින් ඒකල වශයෙන් ගායනය කරන්න.
- මෙම කවි ගායන සංරක්ෂණය සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** : නර්තනය හා සබැඳි ගායන ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.2** : නර්තනයට පෙර ගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- නිර්දේශිත කවි ගායනවල පසුබිම විස්තර කරයි.
- නිර්දේශිත කවි ගායනවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායයට අයත් නර්තනාංගවල කවි ගායනය කරයි.
- සාමූහික හා ඒකල වශයෙන් ගායනය කරයි.
- කවි ගායන සංරක්ෂණයට පියවර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** : නියමිත කවි ලියන ලද පත්‍රිකා, බෙර, තාලම්පට, ශ්‍රව්‍ය පට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

ඉගෙන ගන්නා ප්‍රධාන නර්තන සම්ප්‍රදායයට අදාළ කවි ගායනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. වාරයට අදාළ ගායන කොටස් පහත බෙදා දක්වා ඇත. ඒ අනුව ක්‍රියාකාරකම් අංක 5.2 යටතේ වාර තුනේ දී ගායන වෙන් කර ඉගැන්වීමට සැලසුම් කළ යුතුය.

උඩරට නර්තන සම්ප්‍රදායයට අදාළ වන්නම්, මංගලම් සහ කුවේණි අස්නට අදාළ කවි, පහතරට නර්තන සම්ප්‍රදායයට අදාළ සින්දු වන්නම්, කොතල පදය, ශුද්ධ මාත්‍රය, විෂ්ණු මල් අස්න, නර්තන අංග හා සබැඳි කවි, සබරගමු නර්තන සම්ප්‍රදායට අදාළ වන්නම්, මුල් මාත්‍රය, කෙණ්ඩි පාලිය සහ සමන් දෙවි මල් අස්න නර්තන අංග හා සබැඳි කවි විෂය අන්තර්ගතය ලෙස සලකන්න.

**පළමු වාරය**

- මුසලඩි වන්නම/ශුද්ධ තාලය සින්දු වන්නම/කොවුලා වන්නමට අදාළ කවි.
- මංගලම්/ශුද්ධ මාත්‍රය/මුල් මාත්‍රයට අදාළ කවි.
- කුවේණි අස්න/විෂ්ණු මල් අස්න/සමන් දෙවි මල් අස්නට අදාළ කවි.

**දෙවන වාරය**

- ගණපති වන්නම/ලලිතරාග තාලය සින්දු වන්නම/ තිසරා වන්නමට අදාළ කවි.
- පහතරට - කොතල පද කවි/සබරගමු - කෙණ්ඩි පාලියට අදාළ කවි.
- වෙනත් නර්තන සම්ප්‍රදායයන්ට අයත් නර්තන අංග හා සබැඳි ගායනා

**තුන්වන වාරය**

- මයුරා වන්නම/නළු ගීතිකා තාලය සින්දු වන්නම/නාග ගජගා වන්නමට අදාළ කවි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- නියමිත කවි ගායනවල පසුබිම හඳුනා ගැනීමට හා තොරතුරු රැස් කර ගැනීමට උපදෙස් දෙන්න.
- නියමිත කවිවල පසුබිම සම්බන්ධ කරුණු ඉදිරිපත් කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- කවි ගායනය එකින් එක ශ්‍රවණයට සලස්වා නිවැරදි නාදමාලා අනුගමනය කරමින් ගායනයට යොමු කරවන්න.
- බෙර වාදනයට අනුව ගැයීමේ හැකියාව වර්ධනය කරන්න.
- ඒකීය හඬ තලයක පිහිටා කණ්ඩායම් වශයෙන් ඒකල ව ගායනය කරන්න.
- ස්වකීය හඬ තලය භාවිත කරමින් ඒකල ව ගායනය කිරීමට මඟ පෙන්වන්න.
- මෙම කවි සංරක්ෂණය කිරීමට සුදුසු යෝජනා හා සැලසුම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

ඇගයීම :

- ඔබ උගත් වන්නම් ගායනය කරන්න.
- උගත් ගායනවලට අදාළ පසුබිම විස්තර කරන්න.
- මෙම කවි ගායන සංරක්ෂණය සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනය කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.3** : උඩැක්කි , පන්තේරු නැටුම් හා සබැඳි කවි ගායනය කරයි.

**ක්‍රියාකාරකම 5.3** : උඩැක්කි හා පන්තේරු කවි ගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- උඩැක්කි හා පන්තේරු කවි ගායනයේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- නිවැරදි තාල නාද රටා අනුගමනය කරමින් උඩැක්කි , පන්තේරු නැටුම් හා සබැඳි කවි ගායනය කරයි.
- සාමූහික හා ඒකල වශයෙන් අදාළ කවි ගායන ඉදිරිපත් කරයි.
- මෙම කවි ගායන සංරක්ෂණය කිරීමට යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : උඩැක්කි හා පන්තේරු කවි ලියූ සටහන් පත්‍රිකා , බෙර , තාලම්පට , ශ්‍රව්‍ය පට

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

උඩැක්කි හා පන්තේරු ගායනවල පසුබිම හා නිවැරදි නාද රටා අනුගමනය කරමින් ගායනය කිරීම අපේක්ෂා කෙරේ.

### උඩැක්කි කවි

උඩැක්කිය''ආතත''භාණ්ඩයකි. එක් අතකින් උඩැක්කිය අල්ලාගෙන අනික් අතින් වාදනය කරයි. උඩැක්කි සවරම / පටිය උඩැක්කි නැටුම අලංකාර කර ගැනීමට යොදා ගනී. උඩැක්කිය මුලින් ම බුදුන් වෙනුවෙන් වාදනය කළ බව කවිවලින් කියැවේ. මෙම කවි දෙක ම 'දොං ජිජිගත' තාලයට ගායනය කිරීම සුදුසු ය.

පෙර බුදු මඟුලට ගෙනා උඩැක්කිය
ඒ බුදු මඟුලට ගැසූ උඩැක්කිය
සතරවරම් දෙවි සැවොම සාක්කිය
ගුරුනි දෙවන් මට බුද්ධ උඩැක්කිය

ඒ බුදු රැස් කඳ තුන් ලොව විහිදූ
ඒ බුදු මඟුලට ආ සැඩ දෙවිඳූ
ලාවට සිරියැල් රත්නිල් මෙබඳූ
මෙලෙස උඩැක්කිය ගෙන දුන් දෙවිඳූ

### පන්තේරු කවි

පන්තේරු ඝන තාල වාද්‍ය භාණ්ඩයකි. පත්තිනි දේවියගේ සලඹ වළල්ල අනුසාරයෙන් පන්තේරුව නිර්මාණය කරගෙන ඇති බව කවිවලින් තහවුරු වෙයි. පත්තිනි දේවියගෙන් ආශීර්වාද ලබා ගැනීම උදෙසා රචනා වී ඇති කවි බොහෝ ගණනක් ඇත. සූවිසි විවරණ, සත් සතිය, පන්සාලිස් වස වැනි අවස්ථාවල දී පන්තේරු නර්තනයට මෙම කවි භාවිත කෙරේ. මෙහි සටහන් කර ඇති කවි තුන මාත්‍රා 4 තනි තිතට හෝ මාත්‍රා 2 තනි තිතට ගායනය කළ හැකි ය.

**මාත්‍රා 4 (මහ තනිතිත) තාලය**

**බෙර පදය - දොං ජිං ගත්තත් ජිංගත දොංතක**

සැපත පැමිණි මුළු ලොවට සියල්ලේ - ලොවටසියල්ලේ
විපත නොවන කවි පද මෙසියල්ලේ - පද මෙසියල්ලේ
අපත නොවන දොස දුරුව සියල්ලේ - දුරුව සියල්ලේ
උපත කියමි පන්තේරු වළල්ලේ - තේරු වළල්ලේ

සුගත් දහම් සඟ රත්නෙ වැඳිල්ලා
රැගත් සුරන් සැම දෙවි ඇදහිල්ලා
අපිත් සබේ බැස අවසර ඉල්ලා
දෙඅත් දරමි පන්තේරු වළල්ලා

පත්තිනි දෙවිඳුගෙ සලඹ වළල්ලා
රැතිනි එවැඳ බැස අවසර ඉල්ලා
නෙතිනි බලා අප රැක මෙ සියල්ලා
අතිනි දරමි පන්තේරු වළල්ලා

**මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය**

අනේ මී මැස්සේ මල්රොන් ගෙන යන රිස්සේ //
රුං රුං ගාමින් ඉගිළෙන - ගුම් ගුම් නදයෙන් පැණිබොන //
පුතු ඇඟ අස්සේ දළ තුඩු නොයන්න රිස්සේ //
ලස්සන තුරු ගොමු අතරේ - මින් පුරවා තටු සඟළේ //
පුතුට සියල්ලා මල් රොන් - ගෙන දීපල්ලා //

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- කවි ගායනය ශ්‍රවණය කිරීමට සලස්වා අදාළ ගායනවල පසුබිම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පද උච්චාරණය හා නාදමාලා පිළිබඳ අවධානය යොමු කරමින් ගායනය කරවන්න.
- උඩැක්කිය වාදනය කරමින් නර්තනයේ යෙදෙන බව අවධාරණය කරන්න.
- නර්තනයේ දී පන්තේරුව අතින් අත මාරු කරමින්, උඩ දමා ඇල්ලීම වැනි සුවිශේෂ ක්‍රියාකාරකම් සහිත බව ප්‍රදර්ශනාත්මක ව ඉදිරිපත් කරන්න.
- මෙම භාණ්ඩ දෙක ම ගායනයේ දී තාල තබා ගැනීමට උපකාරී වන බව විස්තර කරන්න.
- සාමූහික ව ඒකීය හඬ තලයක පිහිටුවා ගායනය කිරීමට සලස්වන්න.
- ඒකල ව ස්වකීය හඬ තලයෙහි පිහිටා ගායනය කිරීමට සලස්වන්න.
- මෙම කවි ගායනවල වටිනාකම විමසමින්, මෙවැනි දේශීය සංස්කෘතිකාංග සංරක්ෂණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම :**

- නියමිත කවිවල පසුබිම සම්බන්ධ කරුණු ඉදිරිපත් කරන්න.
- නියමිත මාතෘකාවට අදාළ ව කවි එක බැගින් ගායනය කරන්න.
- ඒකීය හඬ තලයක පිහිටා කණ්ඩායම් වශයෙන් ගායනය ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.4** : ගැමි හා සේ ගී ගායනය ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.4** : පතල්, ටීකා සීපද, නෙළුම්, ප්‍රශස්ති හා හටන් කවි ගායනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- ආසාතාත්මක හා අනාසාතාත්මක කවිවල පසුබිම හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- නිවැරදි නාද රටා අනුගමනය කරමින් අදාළ කවි ගායනය කරයි.
- මෙම කවි සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : නියමිත කවි ලියූ පත්‍රිකා, ශ්‍රව්‍ය තැටි, බෙර

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

**පතල් කවි** :

පතල් කර්මාන්තය ග්‍රාමීය ජීවන වෘත්තියකි. නිවසේ සාමාජික , සාමාජිකාවන් ගෙන් වෙන් ව දින, සති, මාස ගණන් එම වෘත්තියේ නියැළිය යුතු වේ. මෙය ජීවිතය පරදුවට තබා කරන දුෂ්කර කාර්යයකි. බොහෝ පතල් කවිවලින් කියැවෙන්නේ වෘත්තියේ දුෂ්කර බව හා ශාරීරික, මානසික දුඃඛ දෝමනස්සය.

දඩි බිඩි ගගා කරනා වැඩ රට වටියේ
රට වෙඩි දමා කඩනා කළු ගල් කැටියේ
මඩ යට තිබෙන මිනිරන් ගන්නා සැටියේ
උඩ වැඩ කරනා අයට දෙන්නේ අඩු පඩියේ

කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනින් යනවා
මිනිරන් තේරුවොත් ළඳේ නුඹ කළු වෙනවා
ළඟ නම් ගෙදර මුර ඇරුණ ම මම එනවා

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවළයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදාද මව්පියො දකින්නට

දබරේ කරකවන අත් දෙක වෙවුලනවා
නිතර ඇවිත් ලෝඩර දත්මිටි කනවා
වතුර ඇදල අත්වල කරගැට එනවා
මිතුරේ පතල් වැඩ ගැන මට බඩ දනවා

**ටීකා සීපද**

ගද්‍ය පද්‍ය දෙක ම මිශ්‍ර වූ කාව්‍යමය ප්‍රබන්ධයකි. කවියක් අතරතුර ගද්‍යමය ප්‍රබන්ධ යෙදී ඇත. බොහෝ ටීකාවල කිසියම් කතා ප්‍රවෘත්තියක් ඉදිරිපත් කෙරේ. සමහර ටීකා සීපද කවිපද නොපිට පෙරළමින් තේරවිලි ස්වරූපයෙන් ගායනය කර ඇත.

- අන්දර කැලේ
  කැන්දර අලේ - අන්දර කැලේ
  ලිර දායේ - දර ලීයේ
  මිරිකුණියා - කුරුමිණියා
  තාදිම්බර තකදිම්බර තාදිඹරේ තකදිඹරේ
  ඩිංඩිනිකෝ// මැංගිරිඩිණිකෝ - ඩිංගිරිමැණිකෝ
  මේ ඩිංගත් තෝ කාකෝ - ඔය ඩිංගත් තෝ කාකෝ
  තම්දෙන තම් දාන තානෙනා....
  අන්දර කැලේ දර ලීයේ කුරුමිණියා....
  බිනර මලේ....
  මනර බිලේ - බිනර මලේ
  නැඩ තුරම - තුඩ නැරම
  ගන් රොනියා - රොන් ගනියා
  තාදිම්බර තකදිම්බර තාදිඹරේ තකදිඹරේ
  ඩිංඩිනිකෝ// මැංගිරිඩිණිකෝ - ඩිංගිරිමැණිකෝ
  මේ ඩිංගත් තෝ කාකෝ - ඔය ඩිංගත් තෝ කාකෝ
  තම්දෙන තම් දාන තානෙනා....
  බිනර මලේ තුඩ නැරම රොං ගනියා....

- බැද්දෙ ගියා වැලක් සොයාගන්ට කියා
  ඉද්ද වැල් තිබෙන්නා පොහොට වැල් තිබෙන්නා
  නොයෙක් වැල් තිබෙන්නා
  එයින් එකක් ගෙනල්ලා වෙළුවා සේ ම

  වෙළි වෙළි වෙළී - ඉස සිට දෙපතුලට වෙළී

  කන්දේ ගියා මලක් සොයා ගන්ට කියා
  නා මල් තිබෙන්නා සපු මල් තිබෙන්නා
  පිච්ච මල් තිබෙන්නා
  එයින් එකක් ගෙනල්ලා පැලැන්දා සේ ම

  මලි මලි මලී නුඹෙ කොණ්ඩේ තිබෙන මලී

**නෙළුම් කවි**

ගොයම් පැළ සිටවන විට, වල් පැළ නෙළන විට හා පන් නෙළන විට කාන්සිය, මහන්සිය, විඩාව දුරු කර ගැනීම සඳහා නෙළුම් කවි ගායනය කරයි. මෙහි දී ප්‍රධානයා පදයක් ගැයූ පසු අනෙක් කණ්ඩායම අත්වැල් ගායනයේ යෙදුණු බව පෙනේ. බෞද්ධ ජාතක කථා වස්තු ද නෙළුම් කවි සඳහා යොදාගෙන ඇත. එසේ ම කාන්තාවන් සැරසුණු ආකාරය ද, ඔවුන්ගේ ආගමික භක්තිය සම්බන්ධ තොරතුරු ද, නෙළුම් කවිවල අන්තර්ගත ය. මෙම ගායනවල විශේෂත්වය වන්නේ අදාළ කාර්යයේ ස්වරූපයට උචිත වන පරිදි නාදමාලාව සකස් වී තිබීම යි.

- තෙල් ගාලා හිස පීරන් නැනෝ
  ඇටවැල අරගෙන බැඳගන් නැනෝ
  සේලය ඉණ වට ඇඳගන් නැනෝ
  ගොයම් නෙළන්නට යමු අපි නැනෝ

- බෝගම්බර අපි නෙළුමට යන කොට
  තිස් දෙන්නෙක් නෙළතෙයි තා නා
  තිස් දෙන්නෙක් නෙළුවාට කුමක් වෙ ද
  සුහුරු ලියක් නෙළතෙයි තානා
  සුහුරු ලියේ නුඹෙ ගන රන් දෑතට
  වළලු දමා රඟතෙයි තානා
  බෝගම්බර සිටි සුහුරු කිඩා කෙළි
  සැම දෙවියෝ රඟතෙයි තානා

- නාන විලේ නා ගස් නවයක් සැදුණා (තිබුණා)
  නාන විලේ නා ගස්වල අතු බෙදුණා
  නාන විලේ නා අතුවල මල් පිපුණා
  නාන විලේ නා මල් මුනිඳුට පිදුණා

### ප්‍රශස්ති

යමකු පිළිබඳ ව කරන අතිශයෝක්ති වර්ණනාවක් 'ප්‍රශස්ති' යනුවෙන් නම් කළ හැකි ය. ප්‍රශස්ත කටයුතු පුද්ගලයකු සම්බන්ධ ව ප්‍රශස්ති ගායනය කළ හැකි ය. අතීතයේ රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ ගුණ තේමා කර ගනිමින් ප්‍රශස්ති නිර්මාණය වී ඇත. මහනුවර යුගයේ කවිකාර මඩුවේ දී ප්‍රශස්ති ගායනය ඉදිරිපත් කළ බව සාහිත්‍ය කෘතිවල සඳහන් වේ. මේවා බුද්ධ ප්‍රශස්ති, දේව ප්‍රශස්ති හා රාජ ප්‍රශස්ති වශයෙන් වර්ග කර ඇත.

- ලක්ෂ්මී.... භුජවා සා... සතතජය
  ලක්ෂ්මී.... භුජවාසා...
  වීර විජය ලක්ෂ්මී ශිවකාමී
  නෑරබාහු සිඛරය විසු පේමී
  සාරාමෘත ගරු වචනැති සේමී
  වීර නරේන්ද්‍ර සිංහස්වාමී...

  ලක්ෂ්මී....

  මන්දෑඩි ප්‍රතිකාල් දෙමළෝ ලන්දේසි
  බන් එජටා ලාඩය සන්නාසී
  නන්දෙසවල මේ භාෂ විශේෂී
  පින්වත් අප හිමි දෑක නෙක විලසී

  ලක්ෂ්මී....
  සත්‍ය වචන හරිශ්චන්ද්‍රවතාරා
  නිත්‍ය ලෝල සංගීත සුබෝධා
  මක්තධීර හරිද්‍රව තේජා
  පෘථිවිපාල කුල බන්දු සරෝජා

  ලක්ෂ්මී.....

ගංගාධර සුර නිඹසේ මුහුදා
තුංගා යස දස දිග සුවිබෝධා
ශෘංගාරික නව නාට්‍ය විනෝදා
ලංකාපති සුර රාජ වරෝජා

ලක්ෂ්මී.....

- තුරූ රත්න සිරි ලෙසිනා - තිළිණ නෙක
  දෙන නිත්‍ය සන්තොසිනා

  උදුල කළ දිගු නයන දිගු ගෙල
  පබල හසහර කමල කළ රැළි
  විපුල උරතල කමල කළ නිති
  කමල නැබදුල පබල දලයස

  තුරූ රත්න....

  ලකළ මාතා අඟන ලකසිරි
  වඩන සුර විපුල යසසිරි. . . . .

**හටන් කවි**

ශ්‍රී ලංකාවේ ඉතිහාසය දෙස ආපසු හැරී බලන විට විවිධ අවස්ථාවල දී පැන නැගුණු සතුරු උපද්‍රව මැඩලීම සඳහා හටන්' කර ඇත. මෙම හටන් සඳහා යාමට පෙර සටනට යන අවස්ථාවේ දී හා සටනට ගොස් පැමිණි පසු ද හටන් කවි ගායනය කර ඇත. බොහෝ හටන් කවි වීරත්වය විදහා දක්වන අතර ඇහැළේපොළ හටන වැනි හටන් කවි කරුණ රසය (ශෝක භාවය) ගෙන දෙන බව සඳහන් කළ හැකි ය.

- යුද්දෙටත් ඇවිත් සිඳුපිට නැව් නැගිලා- පරංගි
  උන්න මුත් ඇවිත් කොළඹට ගොඩ බැසලා
  අන්දමත් සොඳයි කිසි බී සී ගාලා - එතනදි
  කම්පලත් නැතත් සෙනඟක් මරා දාලා

  ලත් සැණින් කියත් මහසෙන් රට ගන්ටා - දෙමළු
  මත්වෙලත් දොඩත් වෙරි මත පෙන්වන්ටා
  කත් ගෙරිත් මසුත් උන්ගේ කුණු පණ යන්ටා - මෙදින
  රත්වෙලත් මලෝ යුද ජය නැත උන්ටා

- නොමදින් විකුම් පාලා....//
  සැදෙමින් යුදට ජය ලන්දෙසින්
  සමඟින් එජනරාලා...//
  සමිඳුන්ගෙ භූමි පාලා//
  සිය සෙන් අතින් මියෙමින් ගියෝ //
  යුදයෙන් ඇනුම් කාලා//

- යනෙන කළුගඟ එතෙර වැඩසිට රුපුන් යන මං බලව     බලවා
  දිලෙන රන්කග අතට අරගෙන විදුලියක් මෙන් ලෙළව     ලෙළවා
  කෙළින කෙළියක් ලෙසට සතුරන් කපා දමමින් එළව     එළවා
  වඩිනවා දැක රාජසිංහ රජු දුවති රුපුවල් ඉරව     ඉරවා

- ලේසි නොව බැඳ අල්ලා //
  ඉංග්‍රීසිනට කළ දෙය දැනගල්ලා
  සීසි මෝඩ නොවෙල්ලා //
  පරදේසි මේ රට යුද නොපතල්ලා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- අදාළ කවි, ගායනයවල පසුබිම හඳුන්වා දීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නිවැරදි වචන උච්චාරණය, නාදමාලාව නිවැරදි ව ග්‍රහණය කර ගැනීම, තාල සහිත හා තාල රහිත (ආඝාතාත්මක, අනාඝාතාත්මක) ගායනා වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට සලස්වන්න.
- ඒ ඒ කවිවල ආවේණික ගති ලක්ෂණ හා නාදමාලා තහවුරු වන සේ ගායනය කළ යුතු බව දැනුම්වත් කරන්න.
- ඒ ඒ මාතෘකාවට අදාළ ව කවි එක බැගින් ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- එම කවි ගායනය කිරීමට පියවරින් පියවර මඟ පෙන්වන්න.
- ඒකීය හඬ තලයක පිහිටා කණ්ඩායම් ගායනයේ යොදවන්න.
- ස්වකීය හඬ තලයෙහි පිහිටා ඒකල ව ගායනය කිරීමට යොමු කරවන්න.
- ජනශ්‍රැතිය හා සබැඳි ගායනය සංරක්ෂණය සඳහා අදහස් විමසමින් යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම** :

- නියමිත කවිවල පසුබිම විස්තර කරන්න.
- එක් මාතෘකාවකට එක කවියක් බැගින් ගායනය කරන්න.
- නියමිත නාදමාලාවට අනුව ඒකීය හඬ තලයක පිහිටා කණ්ඩායම් වශයෙන් ගායනය කරන්න.
- බෙර පදයට අනුව තාල තබමින් ඒකල වශයෙන් ගායනය කරන්න.
- මෙම කවි ගායනය සංරක්ෂණය සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 06** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.1** : නර්තනයේ ඓතිහාසික හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.

**ක්‍රියාකාරකම 6.1** : නර්තන කලාවේ ප්‍රභවය හා විකාශය විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- නර්තන කලාවේ ප්‍රභවය හා විකාශය පිළිබඳ ව අදහස් දක්වයි.
- නර්තනයේ ආරම්භයට බලපෑ සාධක විස්තර කරයි.
- සමාජීය හා ආගමික අවශ්‍යතා සඳහා නර්තනය භාවිත කළ ආකාරය විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ආශ්‍රිත ග්‍රන්ථ, තොරතුරු පත්‍රිකා, රූප සටහන්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය, දේශන ක්‍රමය, ක්ෂේත්‍ර චාරිකා ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

විශ්වයේ ජීව අජීව සියලු දේ කිසියම් රිද්මයකට අනුව සිදුවන බව ප්‍රකාශ කිරීම අවශ්‍ය ය. මෙහිදී මානව වර්ගයාට රිද්මය සහජයෙන් උරුම වන හෙයින් ඒ අනුව නාඩි වැටීම, හෘදය ස්පන්දනය හා ආභ්‍යන්තරික ක්‍රියාදාමයන් සමඟ මිනිසාගේ බාහිර කටයුතු සිදු වන බව තහවුරු කළ යුතු ය. එසේ ම 'චලනය' චිත්ත වේගයට අනුව දක්වන ප්‍රතික්‍රියාවකි. චලනය හා මානව චිත්තවේගය අතර ඇති අන්තර් සම්බන්ධය භාවමය හැඟීම් ප්‍රකාශනයෙහිලා වැදගත් ය. නර්තනයෙහි මූල බීජය චලනයයි.

ප්‍රාථමික මානවයා ස්වභාව ධර්මයේ සංසිද්ධීන් කෙරේ විශ්වාසයෙන් ගෞරව පූර්වක ව වැඳුම් පිදුම් සිදු කළ බව ද සුවිශේෂ කරුණකි. ඒ අනුව දේව සංකල්ප බිහි වීම හා ආගමික සම්බන්ධතා නර්තනයේ මූලාරම්භයට හේතු වීම පිළිබඳ ව මෙන් ම ප්‍රාථමික සමාජයේ සමාරෝපි නර්තනය අත්‍යවශ්‍ය අංගයක් වීම පිළිබඳ ව සාකච්ඡා කළ යුතු ය.

එසේ ම නර්තනය හා සමාජ සංස්ථාව අතර මනා සම්බන්ධතාවක් පවතී. ඒ අනුව මූලික සමාජ අවශ්‍යතා ද නර්තනය බිහි වීමට බලපා ඇත. මිනිසාගේ උපතේ සිට මරණය දක්වා වූ සංසිද්ධිවල දී නර්තනය පවත්වා ඇත. ඒ අනුව විවාහ මංගල්‍යය, දෙවියන් පිදීම, ආගමික උත්සව ආදි අවස්ථා මුල් කොටගෙන පෙර අපර දෙදිග ශිෂ්ටාචාර තුළ නර්තනය බිහි විය. පසුකාලීන ව ඒ ඒ රටවල සුවිශේෂ වූ නර්තන සම්ප්‍රදායයන් වර්ධනය වීම පිළිබඳ ව සාකච්ඡා කළ යුතු ය.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- තොරතුරු එක්රැස් කිරීම සඳහා පැවරුමක් ලබා දෙන්න.
- දෙන ලද පැවරුමට අදාළ ව තොරතුරු ඇසුරින් නර්තන කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ ව සිසුන්ගෙන් විමසීමක් කරන්න.
- නර්තන කලාවේ ආරම්භයට තුඩු දුන් කරුණු විස්තර කරමින් විකාශය පිළිබඳ කරුණු දක්වන්න.

ඇගයීම :

- නර්තන ආරම්භයට බලපෑ සාධක විස්තර කරන්න.
- සමාජීය හා ආගමික වශයෙන් මානව අවශ්‍යතා සඳහා නර්තනය යොදාගෙන ඇති අයුරු විමසන්න.
- නර්තන කලාවේ විකාශයට විවිධ සංස්කෘතීන්ගෙන් ලැබුණු පිටුබලය විමසුමට ලක් කරන්න.

මූලාශ්‍රය

- සිංහල නර්තන කලාව - මුදියන්සේ දිසානායක
- සෞන්දර්ය අධ්‍යාපනයට අත්වැලක් - ජාතික අධ්‍යාපන ආයතනය

**නිපුණතාව 06** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.2** : දේශීය නර්තන කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ ඓතිහාසික තොරතුරු යුග ඇසුරෙන් විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.2** : දේශීය නර්තනයේ ඓතිහාසික තොරතුරු විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල**
- දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු අන්තර්ගත මූලාශ්‍රය නම් කරයි.
- එම මූලාශ්‍රය වර්ග කර දක්වයි.
- හඳුනාගත් මූලාශ්‍රයවල අන්තර්ගත සාධක ඉදිරිපත් කරයි.
- එම සාධක උදාහරණයට ගනිමින් නර්තන කලාවේ පැවති තත්ත්වය පිළිබඳ අනාවරණ ඉදිරිපත් කරයි.
- දේශීය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම හා සබැඳි සාධක ජාතික උරුමයන් සේ රැක ගැනීමේ අවශ්‍යතා පිළිබඳ අදහස් දක්වයි.
- ඒවා රැක ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරමින් ක්‍රියාකාරී ව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ආශ්‍රිත ග්‍රන්ථ, තොරතුරු පත්‍රිකා, රූප සටහන්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය , දේශන ක්‍රමය, ගවේෂණ ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :
- ප්‍රාග් බෞද්ධ යුගයේ සිට අද්‍යතන යුගය තෙක් වූ - ප්‍රාග් බෞද්ධ යුගය - අනුරාධපුර - පොළොන්නරු - දඹදෙණි - කුරුණෑගල නර්තන ඉතිහාසය විවරණය කිරීමේ දී ලිඛිත මූලාශ්‍රය යොදා ගැනෙන බව ඉදිරිපත් කරමින් ඒ සඳහා වංශ කථා, සාහිත්‍ය කෘති හා දේශාටන වාර්තා සහ විදේශිකයන්ගේ වාර්තා දක්විය යුතු ය. එසේ ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් තොරතුරු අධ්‍යයනය කරමින් රූකම්, කැටයම්, මූර්ති, සෙල්ලිපි ආදිය මගින් සාධක විස්තර කළ යුතු ය.
- දේශීය නර්තන කලාවට භාරතීය ආභාසය ලැබී ඇති ආකාරය ද පුරාවිද්‍යාත්මක හා ලිඛිත මූලාශ්‍රය ඇසුරෙන් අධ්‍යයනය කළ හැකි බව දක්විය යුතු ය. අද්‍යතනයේ දී ද නර්තන කලාවේ විකාශය සඳහා ප්‍රබල ලෙස රාජ්‍ය අනුග්‍රහය ලැබීම පිළිබඳ ව සාකච්ඡා කළ යුතු යි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :
- දේශීය නර්තන කලාවේ ඓතිහාසික කරුණු ඇතුළත් මූලාශ්‍රය වර්ග කරන්න.
- එම මූලාශ්‍රයවල අන්තර්ගත සාධක දක්වන්න.
- එම සාධක විග්‍රහ කරමින් නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ සාකච්ඡා කරන්න.
- මෙම සාධක ජාතික උරුමයක් සේ රැක ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- එම ජාතික උරුම ආරක්ෂා කිරීම ගැන අදහස් යෝජනා විමසා ඒ සඳහා පියවර ගැනීමට ක්‍රියාත්මක කරවන්න.

ඇගයීම :
- දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කළ හැකි මූලාශ්‍රය වර්ග කර දක්වන්න.
- අනුරාධපුර යුගයෙහි නර්තන කලාව පැවති තත්ත්වය අනාවරණය කෙරෙන සාධක 02ක් ඉදිරිපත් කරන්න.
- පොළොන්නරු යුගයෙහි නර්තනය පැවති තත්ත්වය පිළිබඳ ව පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් විමසීමක් කරන්න.

**නිපුණතාව 06** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.3** : දේශීය වන්නම්වල ප්‍රභවය හා විකාශය විචාරයට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.3** : දේශීය වන්නම්වල (උඩරට, පහතරට, සබරගමු) ප්‍රභවය හා විකාශය විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :

- දේශීය වන්නම්වල ප්‍රභවය හා විකාශය පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි.
- වන්නම් කෙරෙහි බලපෑ භාරතීය ආභාසය පිළිබඳ ව අදහස් දක්වයි.
- උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායවලට අයත් වන්නම්වල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මක ව විමසුමට ලක් කරයි.
- වන්නම්වල සාහිත්‍යමය වටිනාකම් පිළිබඳ අදහස් දක්වයි.
- සාම්ප්‍රදායික වන්නම්වල අනන්‍යතා ලක්ෂණ සුරක්ෂිත කර ගැනීමට ක්‍රියාත්මක වෙයි.
- අද්‍යතන වන්නම් නිර්මාණ හා එහි සුවිශේෂතා විචාරයට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : වන්නම් පිළිබඳ තොරතුරු දැක්වෙන සටහන්, ආශ්‍රිත ග්‍රන්ථ, කැසට් පට,දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ප්‍රශ්නාවලි ක්‍රමය, පැවරුම් ක්‍රමය, දේශන ක්‍රමය, ගවේෂණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- දේශීය වන්නම්වල ප්‍රභවය හා විකාශය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී, රචනා වූ කාලය හා රචකයන්, වන්නම් රචනා වීම සඳහා බලපෑ හේතු සාධක, භාරතීය ආභාසය, එක් එක් සම්ප්‍රදායය අනුව වන්නම්වල සුවිශේෂ ලක්ෂණ, සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ, ව්‍යුහය, නාදමාලාව, ප්‍රස්තුතය, ඒ ඒ සම්ප්‍රදායයේ වන්නම්වල එකිනෙක සමාන අසමාන ලක්ෂණ, දේශීය වන්නම්වල සාහිත්‍යමය වටිනාකම, බස් වහර, ප්‍රදේශීය ලක්ෂණ, ප්‍රබන්ධයන්ගේ සුවිශේෂතා, කාව්‍යාලංකාර හා විවිධ විරිත් හා රචනා ක්‍රම පිළිබඳ ව විස්තර කළ යුතු ය.
- අද්‍යතන වන්නම් නිර්මාණ හා සාම්ප්‍රදායික උඩරට, පහතරට, සබරගමු හා විවිධ ප්‍රාදේශීය වන්නම් නිර්මාණය වූවාට පසු විශේෂයෙන් කොළඹ යුගයේ හා ඊට පසු කාලයේ වන්නම් කීපයක් ම නිර්මාණය වී ඇත. එම වන්නම් අතර හංස වන්නම, මරඟන වන්නම, සමනළ වන්නම, මහබෝ වන්නම, සුවිශේෂ ව සඳහන් කළ හැකි ය. මෙම වන්නම්වල නාද මාධූර්ය ගුණය ඉතා ඉහළ මට්ටමක පැවති බව ද, නර්තනයේ ප්‍රාසංගික බව වැඩි කර ගැනීමට එම සංගීතමය ඇසුර වඩාත් බලපා ඇති බව සඳහන් කළ හැකි ය.
- 1990 දශකයෙන් පසු පාසල් නර්තන තරගාවලීන්හි දී වන්නම් නිර්මාණයට අවස්ථාවක් ලැබිණි. එම වන්නම් නිර්මාණයේ දී ඒ ඒ සම්ප්‍රදායයන් අනුව ව්‍යුහයේ සමානතාවක් දක්නට ඇත. මේ අනුව පාසල් තරගාවලීන්හි දී ප්‍රථම ස්ථාන ගත් වන්නම් කීපයක් ලෙස මෙත්සිරි වන්නම, ගුරු වන්නම, මවු ගුණ වන්නම, සිරිරඟ වන්නම, ශ්‍රී ලංකා වන්නම සඳහන් කළ හැකි ය. අද්‍යතන වන්නම් අතර ඇගලුම් වන්නම හා මන්තිරි වන්නම ජනප්‍රියත්වයට පත්ව ඇත.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- වන්නම් ආරම්භය හා විකාශය පිළිබඳ මූලික සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එක් එක් සම්ප්‍රදායයට අනුව වන්නම්වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ විමසමින් සාධක ඉදිරිපත් කර තුලනාත්මක ව සාකච්ඡා කරන්න.
- වන්නම්වල සාහිත්‍ය වටිනාකම් ඇගයීමට ලක් කරමින් සාකච්ඡාවක් කරන්න.
- අද්‍යතන වන්නම් නිර්මාණවල පසුබිම හා සුවිශේෂතා සාකච්ඡා කරන්න.
- අවශ්‍ය කරුණු පිළිබඳ ව සිසු අවධානය යොමු කරමින් කරුණු එක්රැස් කිරීමට පොලඹවන්න.
- සාම්ප්‍රදායික වන්නම්වල අනන්‍යතා ලක්ෂණ සුරක්ෂිත කර ගැනීමට අදාළ අදහස් හා යෝජනා විමසා සාකච්ඡාවක් මෙහෙයවන්න.

ඇගයීම :

- වන්නම්හි ප්‍රභවය හා විකාශය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න.
- භාරතීය ආභාසය වන්නම් කෙරෙහි බලපා ඇති ආකාරය විමසන්න.
- දේශීය නර්තන සම්ප්‍රදාය තුනට අයත් වන්නම් තුලනාත්මක ව විස්තර කරන්න.
- අද්‍යතනයේ නිර්මාණය වූ වන්නම් පිළිබඳ තොරතුරු එක්රැස් කරමින් විචාරයක් කරන්න.

මූලාශ්‍රය :


- සිංහල නර්තන කලාව - මුදියන්සේ දිසානායක - 2015
- දහඅට වන්නම් - සී. ද එස්. කුලතිලක
- ස්වර ලිපි ප්‍රස්තාර සහිත දහඅට වන්නම - සරත් විජේවර්ධන
- දුරස්ථ අධ්‍යාපනය වන්නම් මොඩියුලය - ජා. අ. ආයතනය

**නිපුණතාව 06** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.4** : දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් නිර්දේශිත ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.4.1** : වලියක් මංගල්‍යය ශාන්තිකර්මයේ තොරතුරු විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- වලියක් මංගල්‍යය ශාන්තිකර්ම ආරම්භය හා සබැඳි පසුබිම විස්තර කරයි.
- එම ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු විචාරයට ලක් කරයි.
- එම ශාන්තිකර්ම හා සබැඳි විශ්වාස සාරධර්ම හා පූජා චාරිත්‍ර විධි පිළිවෙළ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- වලියක් මංගල්‍යයේ අන්තර්ගත නර්තනය, ගායනය, වාදනය, රංග වස්ත්‍රාභරණ හා සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- වලියක් මංගල්‍යය ශාන්තිකර්ම සංරක්ෂණය සඳහා විවිධ යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර, ශාන්තිකර්ම පිළිබඳ විස්තර දැක්වෙන ලිපි ලේඛන.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, ව්‍යාපෘති ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, ක්ෂේත්‍ර චාරිකා ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

මහනුවර ශ්‍රී දළදා පෙරහැර මංගල්‍යය හා සබැඳි ව පවත්වනු ලබන හත්දා වලියකුම හෙවත් වලියක් මංගල්‍යයේ ආරම්භය හා පසුබිම සාකච්ඡා කරමින් එය පැවැත්වීමේ විශේෂ අරමුණු ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව වලියක් උපත, සත් දින පූජා පිළිවෙළ ආදිය පිළිබඳ අන්තර්ගත කිරීම. සමාජ විශ්වාස සාරධර්ම මෙන් ම චාරිත්‍ර විධි පිළිබඳ තොරතුරු හඳුන්වාදීම වැදගත් වේ. විශේෂයෙන් මෙම ශාන්තිකර්ම පැවැත්වීමේ දී සාම්ප්‍රදායික දායකත්වය සිදු වන අයුරු විස්තර කළ යුතු ය. ඒ අනුව පවත්වන ස්ථානය, කාලය, අන්තර්ගත නර්තන ගායන, වාදන, රංග වස්ත්‍රාභරණ හා සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. විශේෂයෙන් මෙම ශාන්තිකර්මය සංරක්ෂණය සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනා පිළිබඳ ව සාකච්ඡා කිරීමට යොමු වීම වැදගත් ය.

**වලියක් මංගල්‍යයේ ඓතිහාසික පසුබිම :**

මහනුවර දළදා පෙරහැර සම්පූර්ණයෙන් ම නිමා වීම සඳහා අවසාන රන්දෝලි පෙරහැරට පසු ව පුරා හත් දවසක් මහ දේවාලයයේ (විෂ්ණු දේවාලයයේ) දී වලියක් මංගල්‍යය පැවැත්වේ.

මෙම ශාන්ති කර්මය - වලියක් තෝත්‍රය, හද්දා වලියකුම, වලියකුම, වලියකුන් නැටීම වලියක් මංගල්‍යය යනුවෙන් ද හැඳින්වේ.

**වලියකුම පැවැත්වීමේ පරමාර්ථ :**

මහනුවර දළදා පෙරහැරේ දිය කැපීමේ පෙරහැර අවසන් කළ පසු දෙවියන්ට පින් අනුමෝදන් කරවීම සඳහාත්, පෙරහැර පැවැත්වීමට දායක වූ නිලමේවරුන්, දළදා මාලිගාවේ ඇතුළු කට්ටලේ සහ පිට කට්ටලේ නිලධාරීන්, පෙරහැර නැරඹූ හා ආධාර උපකාර කළ පිරිස හා පෙරහැරේ ගමන් ගත් අලි ඇතුන්ටත් මේ පෙරහැරට සහභාගි වීමෙන් ඇති වූ වස් දොස්, අපල උපද්‍රවයන් සියල්ල දුරු කිරීම පිණිස වලියකුන් ප්‍රධාන කොට දෙවියන් හා යකුන් විෂයයෙහි පූජා දොළ පිදේනි සහිත සත් දින වලියක් මංගල්‍යය පවත්වනු ලැබේ.

**වලියකුමේ වර්තමාන තත්ත්වය :**

මෙම ශාන්තිකර්මයේ පරිහානික ස්වභාවය ඉතා වේගයෙන් සිදුවන්නකි. එය මහනුවර දළදා පෙරහැර අවසන් වීමෙන් පසු විෂ්ණු දේවාලයයේ පමණක් වසරකට වරක් පැවැත්වෙන දුර්ලභ ගණයේ ශාන්ති කර්මයක් බවට පත්වීම ද එයට එක් හේතුවකි. එය සාම්ප්‍රදායික සිරිතක් වීම නොවැළැක්විය හැකි හේතුවකි. තව ද මෙම ශාන්තිකර්මය හා සම්බන්ධ පාරම්පරික පවුල් සංස්ථාව විසිර යෑම ද තවත් හේතුවකි. එසේම 'රාජකාරිය' නිල වශයෙන් අහෝසි වී යාම ද හේතුවකි.

එසේ ම මෙම ශාන්තිකර්මයට යොදාගන්නා අමුද්‍රව්‍ය සැපයීමට ප්‍රමාණවත් පරිසරයක් ශක්තිමත් ලෙස ගොඩනැඟී නොමැත. එසේ ම වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු වීම ද ප්‍රමාණවත් ව නොවේ. විශේෂයෙන් දළදා පෙරහැර මංගල්‍යය අවසන සිදු කෙරෙන වන මෙම ශාන්තිකර්මයට අදාළ ප්‍රභූන්ගේ සම්බන්ධ වීම ද සිදු වන බවක් නොපෙනේ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- වලියකුම ශාන්තිකර්මය පිළිබඳ ව සිසුන්ගේ දැනුම්වත් භාවය විමසන්න.
- එහි ආරම්භය හා විකාශය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ඒ හා සබැඳි විශ්වාස, සාරධර්ම හා චාරිත්‍ර විධි පිළිබඳ විස්තර කරන්න.
- ශාන්තිකර්මයේ අන්තර්ගත ගායනය, වාදනය, රංග වස්ත්‍රාභරණ හා සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
- වලියක් මංගල්‍යයේ අද්‍යතන තත්ත්වය හා එය සංරක්ෂණය පිළිබඳ අදහස් යෝජනා විමසන්න. ඊට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ ව සාකච්ඡා කරමින් එහි අවශ්‍යතාව අගයමින් අදහස් විමසන්න.

ඇගයීම :

- වලියකුම ශාන්තිකර්මයේ ආරම්භය පිළිබඳ ව විස්තර කරන්න.
- වලියකුම ශාන්තිකර්මය හා බැඳි ආගමික පසුබිම සමාජීය වශයෙන් වැදගත් වීමට හේතු වූ කරුණු විස්තර කරන්න.
- වලියකුම ශාන්තිකර්මයේ ගායනය, වාදනය, නර්තනය, රංග වස්ත්‍රාභරණ හා සැරසිලි පිළිබඳ ව විමසීමක් කරන්න.

මූලාශ්‍රය : මුදියන්සේ දිසානායක - වලියක් මංගල්‍ය විමසුම

**නිපුණතාව 06** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.4** : දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් නිර්දේශිත ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.4.2** : කිරිමඩුව ශාන්තිකර්මය විමසුමට ලක්කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- කිරිමඩුව ශාන්තිකර්මයෙහි ආරම්භය හා සබැඳි පසුබිම විස්තර කරයි.
- එම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු විචාරයට ලක් කරයි.
- කිරිමඩුව හා සබැඳි විශ්වාස, සාරධර්ම හා චාරිත්‍ර විධි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- කිරිමඩුවෙහි අන්තර්ගත නර්තන, ගායන, වාදන, රංග වස්ත්‍රාභරණ හා සැරසිලි පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි.
- සමාජ සහජීවනය වර්ධනය වීමෙහි ලා කිරිමඩුව ශාන්තිකර්මයෙන් ලැබෙන පිටුබලය අගය කරයි.
- දේශීය ශාන්තිකර්ම සංරක්ෂණය කිරීමේ වැඩසටහන්වලට සක්‍රිය ව දායක වෙයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර, රූප සටහන්, ආශ්‍රිත ග්‍රන්ථ

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය, ව්‍යාපෘති ක්‍රමය, ගවේෂණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, ක්ෂේත්‍ර චාරිකා ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

කිරිමඩුව ශාන්තිකර්මයට පසුබිම් වී ඇති මංගර දෙවියන් සම්බන්ධ කතා පුවත විස්තර කිරීම අවශ්‍ය වේ. මෙය පැවැත්වීමෙහි ලා මුල් වී ඇති සුවිශේෂ අරමුණු වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කළ යුතු ය. පුද ලබන දෙවිවරුන්, චාරිත්‍ර විධි, නර්තන, ගායන, වාදන අවස්ථා නම් කොට විස්තර කළ යුතු ය. මෙහි දී භාවිත රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ හා සැරසිලි හඳුනා ගැනීම මෙන් ම මෙම ශාන්තිකර්මය මඟින් විවරණය වන ගව සංරක්ෂණය පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීම සුදුසු ය.

**කිරිමඩුව** : මෙම යාගයේ දී මංගර දෙවියන් ප්‍රධාන වශයෙන් පූජා ලබන අතර පත්තිනි දේවිය, විෂ්ණු, සමන්, කතරගම, දැඩිමුණ්ඩ ආදි දෙවිවරු අවශේෂ වශයෙන් පූජා ලබති. ගව පට්ටි ආරක්ෂා කර ගැනීමත් බවබෝග සම්පත් හා සශ්‍රීකත්වය ළඟාකර ගැනීමත් මෙයින් අපේක්ෂා කෙරේ.

**උපත් කතාව** :

මායා රටෙහි රජුගේ වර්ණ නම් අග මෙහෙසිය දරුවන් නැති සොවින් පසු වූවා ය. දෙවියන්ට පුද සත්කාර කර දෙවියන් යැදීමට පුරුදු වී සිටි ඇය දිනක් සිහින තුනක් දැක ඒ බව රජුට පැවසුවා ය. බමුණන් ගෙන්වා සිහින විචාළ කල්හි තුන් ලොවට අධිපති රජ කුමාරයකු බිසවට පිළිසිඳී ඇති බව ඔවුහු පැවසූ හ. කුමරු උපත ලැබූ නැකතට අනුව වයස අවුරුදු දහඅටේ දී ගවයන්ට දක්වන ළැදියාව නිසා මීමෙකුගේ පහරින් මිය ගොස් දේව ආත්මයක් ලබන බව පලාපල බැලීමේදී හෙළි වෙයි. නමින් බුදසිරු නම් වූ කුමරු කුඩා කල පටන් වන සතුන් ඇල්ලීමටත් දඩයමටත් දක්‍ෂතා දැක්වී ය.

පෙර ආත්මයක සිට ඔහු හා වෛරයෙන් පසු වූ මධුර මායා රජුගේ පුත් කුමරු පළි ගැනීමේ අටියෙන් උපායක් යෙදී ය. බුදසිරු දඩයමට දක්‍ෂ නිසා

මධුර මායා රජුගේ පුත් කුමරු මීමෙකුගේ වෙස්ගෙන කඳිරගොඩ ප්‍රදේශය ලේ විලක් බවට පත් කරමින් ගවයන්ට ඇන මරා දැමීමටත් මිනිසුන් බිය වැද්දීමටත් පටන් ගනී.

මේ තොරතුරු දැනගත් බුදසිරු පිරිවර ද සමඟ නැව් නැගී උසන්ගොඩින් ගොඩබැස මීමා සොයමින් යන අතර වෙහෙස නිවා ගැනීමට නුග රුකක් සෙවණෙහි නතර විය. නුග රුකෙහි තිබූ අපූර්වත්වයෙන් යුත් මීය කැඩීමට උත්සාහ ගත්ත ද එය අසාර්ථක විය. ගසන ලද පොරෝ පහරවලින් පොරව කැඩිණි. මෙහි කිසියම් ගුප්ත බලවේගයක් ඇතැයි සිතූ බුදසිරු කුමරු අධිෂ්ඨානයෙන් රන් පොරව අතට ගෙන නුග ගස මුලින් ම කපා බිම හෙළී ය. ගසෙහි තිබූ මීය පිරිස අතරේ බෙදා දිනි. මෙහි දී මධුර මායා රජ කුමරු ගව රැළට හා බුදසිරු කුමරුට ද ඇන සියලුදෙනා මරා දැමූහ. බුදසිරු තුළ තිබූ සත්ත්ව කරුණාව හා දයාව හේතුවෙන් මීමා මැරීමට සිත් නොදුන් බව ගම්‍ය වේ.බුදසිරු සමඟ පැමිණි ගොපලු කුමරු (එඬේර කුමරු) දෙදෙනා මීමා සෙවීමට පෙර මඟ ගොස් නැවත ආපස්සට පැමිණ බැලූ කල සියලු දෙනා මරා ඇති ආකාරය දැක විමතියට පත්වූහ. කෝපයට හා වේදනාවට පත් එඬේර කුමාරවරු පසෙක සිටි මීමා දැක මීමා සමඟ සටන් කොට මීමා මරා දැමූහ. මරන ලද මීමාගේ කකුල් සතර කණුවලටත්,ඉළ දොළස මැස්සටත් ගෙන දණිස්වලින් ළිප්ගල් බැඳ සම උඩු වියනකට අදිමින් බඩවැල් වටතිරවලට ගෙන හිස් කබල කිරි හැළියට ගෙන කිරි උතුරවන ලදි. කන් දෙකින් පවන් ගසා ඇස් දෙකින් නිල්මිණි පහන් පත්තු කර වලිගයෙන් රන් ඊය තනා උගුරු දණ්ඩ බට ලීයට ගෙන පිඹින ලදි.

**කිරිමඩුවේ එන නාට්‍යමය අවස්ථා :**

ඇත් බන්ධනය, මී බන්ධනය , ආඬිගුරු නැටීම.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- කිරිමඩුව ශාන්තිකර්මය ආරම්භය හා සබැඳි පසුබිම විස්තර කරන්න.
- එය පැවැත්වීමේ අරමුණු විචාරයට ලක් කරමින් සාකච්ඡා කරන්න.
- විශ්වාස, සාරධර්ම, චාරිත්‍ර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
- එහි ගායනය, වාදනය, සැරසිලි, රංග වස්ත්‍රාභරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
- සමාජ සහජීවනය වර්ධනය වීමෙහි ලා කිරිමඩුව ශාන්තිකර්මයෙන් ලැබෙන පිටිවහල අගයන්න.
- එම ශාන්තිකර්ම සංරක්ෂණය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

ඇගයීම :

- කිරිමඩුව ශාන්තිකර්මයෙහි කතා පුවත කෙටියෙන් දක්වන්න.
- මෙම ශාන්තිකර්මයෙහි නර්තන, ගායන, වාදන අංග නම් කරන්න.
- කිරිමඩුවෙහි රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ හා සැරසිලි පිළිබඳ විමසීමක් කරන්න.
- සමාජ සහජීවනය වර්ධනයෙහි ලා කිරිමඩුව ශාන්තිකර්මය බලපාන ආකාරය ඇගයීමට ලක් කරන්න.

**පරිශීලනය සඳහා ග්‍රන්ථ :** කිරිමඩුව ශාන්තිකර්මය - ජයසේන කෝට්ටගොඩ

: සබරගමු නර්තන කලාව - ශ්‍රියානි රාජපක්ෂ

**නිපුණතාව 06** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.4** : දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් නිර්දේශිත ශාන්ති කර්ම පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.4.3** : රටයකුම ශාන්තිකර්මය පිළිබඳ තොරතුරු විමසමින් අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- රටයකුම ශාන්තිකර්මයෙහි ආරම්භය හා සබැඳි පසුබිම විස්තර කරයි.
- එම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු විචාරයට ලක් කරයි.
- රටයකුම හා සබැඳි විශ්වාස, සාරධර්ම හා චාරිත්‍ර විධි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- රටයකුමෙහි නාට්‍යමය අවස්ථා විමසුමට ලක් කරයි.
- සමාජ සහජීවනය වර්ධනය වීමෙහි ලා රටයකුම ශාන්තිකර්මයෙන් ලැබෙන පිටුබලය අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර, රූප සටහන්, ආශ්‍රිත ග්‍රන්ථ

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය , ගවේෂණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, ක්ෂේත්‍ර චාරිකා ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

## රිද්දියාගය (රටයකුම)

පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් ලංකාවේ පහතරට ප්‍රදේශවල (මාතර හා බෙන්තර යන ශෛලි දෙකෙහි ම) රටයකුම හෙවත් රිද්දියාගය පවත්වනු ලැබේ.

**පැවැත්වීමේ අරමුණු** :

- දරුවන් නොලැබූ ස්ත්‍රීන්ට දරුවන් ලබා ගැනීමට.
- ගැබ්ගත් කාන්තාවන්ගේ ගැබ ආරක්ෂා කර ගැනීමට.
- දරු උපත හොඳින් සිදු වීමට හා දරුවා ආරක්ෂා කිරීමට.
- දරුවන් ලැබූ මවුවරුන්ට වැලඳෙන වැදුම් ගෙයි දෝෂ, කිලිදෝෂ වැනි රෝගවලින් ආරක්ෂා කරගැනීමට.

**පුරාවෘත්තය** :

විල්ලෝඩි පුරවර රන්ගිරිකූටය පළාගෙන එහි හටගත් දුමාරයෙන් හා ගිනි පුපුරුවලින් රිද්දි බිසවු සත්දෙනා උපන්හ. මුදුන්මාල, ධර්මපාල, ගිරිමේකල, ඕන්කාර, රනකපාල, කොණ්ඩමාල හා එර්දි නම් වූ ඔවුහු දරුවන් නැති සොවින් පසු වූ නිසා වඳ බිසවුන් ලෙසින් හැඳින් වූහ. රිද්දි බිසවුන්ගේ වඳ භාවය ඇති කරනු ලැබුවේ කළු කුමරු විසිනි. නිමිති බලන්නන්ගේ උපදෙස් අනුව වඳ භාවයෙන් මිදීම සඳහා විල්ලෝඩි දේශයේ සිට නැව් නැඟී රුහුණු පුරයේ උසන්ගොඩට ගොඩ බැස, දිය නා පිරිසිදු වී හේනක් කොටා කපු වපුරා එම කපුවලින් නොඉඳුල් සළුවක් වියා, දීපංකර බුදුන්ට චීවරයක් ලෙසින් පූජා

කරන ලදි. ඉන් බිසවුන් සත් දෙනාට ම දරුගැබ් පහළ වූ බව පුරාවෘත්තයේ සඳහන් වෙයි.

දරු ගැබ් ඇති වීමේ ප්‍රීතිය නිසා දිය කෙළීමට ආභරණ ඇල්ලට ගිය බිසෝවරු රොඩියකුගේ ස්පර්ශය නිසා කලකිරී ඇල්ලෙන් පැන ජීවිතක්ෂයට පත් වූහ. ඔවුහු දරුවන්ට ආලයෙන් මිය ගොස් රිද්දි යක්ෂණීන් වී උපත ලැබූහ. ඇල්ලෙන් පැනීමේ දී එක් බිසවක් රොඩියකු විසින් කුල්ලකින් අල්ලා බේරා ගනු ලැබුවා ය. මෙම බිසව රොඩී බිසව ලෙස නම් ලැබුවා ය. මෙම පුවත රිද්දි යාගයේ දී අනුරූපණය කෙරේ.

**පුද ලබන අය** : රිද්දි බිසෝවරු, රිද්දි යක්ෂණීහු, කිරි අම්මාවරු, රොඩී බිසව, කළු කුමාරයා

**සැරසිලි** : මෙහි ප්‍රධාන වීදි මණ්ඩපය මල් මඩුව යි. නව මල් මඩුව, නව මල් පාය, රිද්දියාග මණ්ඩපය රටයකුන් වීදිය වැනි නම්වලින් ද එය හඳුන්වනු ලබයි. මෙහි තොරණ හතකි. දිගින් අට රියනක් වන මෙහි පළල සත් රියනකි.

හැන්දෑ පිදේනි තැබීම සඳහා පිදේනි මැස්සක් හා දෙවියන්ගේ කටයුතු සඳහා දේව යහනක් බෙන්තර දී සකස් කරන අතර මාතර දී කත්තිරික්ක හතරක් හා සූනියම් දේවතාවා වෙනුවන් සූනියම් වීදියක් සකස් කරනු ලැබේ. සන්නි යකා වෙනුවෙන් කපාළ කුඩුවක් හා දහඅටපාලි තොරණක් සකස් කරන අතර ආතුරයාගේ රෝග ලක්ෂණ අනුව විශේෂ සැරසිලි ද සකස් කෙරේ. දූරහැව, ප්‍රේත තටුව, ඉරමුදුන් පුරාලය, දියකෙළි පිදේනිය, ඉරමුදුන් පිදේනිය, වට කුමාර වීදිය, කුමාර පිදේනිය, රීරි හැලිය, රීරි පිදේනිය, සන්නි කළු කුමාර පිදේනිය, මල් බුලත් තටුව යනාදී සැරසිලි රිද්දි යාගයෙහි දැකිය හැකි වෙයි.

**නාට්‍යමය අවස්ථා** : නානුමුරය, කපුයක්කාරිය, දරු නැළවිල්ල.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- රටයකුම ශාන්තිකර්ම කතා පුවත පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශාන්තිකර්මය පැවැත්වීමේ සුවිශේෂ අරමුණු වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න.
- රටයකුම ශාන්තිකර්මයෙහි චාරිත්‍ර විධි, නර්තනය, ගායනය, වාදනය හා නාට්‍යමය අවස්ථා නම් කොට විස්තර කරන්න.
- ශාන්තිකර්මය සඳහා භාවිත කරන රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ හා සැරසිලි හඳුනා ගැනීමට යොමු කරන්න.
- රටයකුම මඟින් නිරූපණය වන සමාජමය වටිනාකම් සාකච්ඡා කරන්න.
- ශාන්තිකර්ම සංරක්ෂණය කිරීමට ගත යුතු පියවර පිළිබඳ අදහස් විමසන්න.

**ඇගයීම** :

- රටයකුම ශාන්තිකර්මයෙහි කතා පුවත කෙටියෙන් දක්වන්න.
- මෙම ශාන්තිකර්මයෙහි නර්තනය, ගායනය හා වාදනය අංග නම් කරන්න.
- රටයකුමෙහි රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ පිළිබඳ විමසීමක් කරන්න.
- සමාජ සහජීවනය වර්ධනයෙහි ලා රටයකුම ශාන්තිකර්මයෙන් ලැබෙන පිටිවහල අගයමින් අදහස් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 06** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.4** : දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් නිර්දේශිත ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.4.4** : බලි ශාන්තිකර්මය පිළිබඳ විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- බලි යන වචනයෙහි අර්ථ දක්වයි.
- බලි ශාන්තිකර්මයේ ආරම්භය පිළිබඳ ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කරයි.
- බලි ශාන්තිකර්මයේ විකාශය පිළිබඳ අදහස් දක්වයි.
- බලි ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණ හා සමාජ විශ්වාස විස්තර කරයි.
- මෙම ශාන්තිකර්මය හා සබැඳි චාරිත්‍ර, ගායනය හා වාදනය ආදියෙහි සුවිශේෂතා විචාරයට ලක් කරයි.
- බලි ශාන්තිකර්මයේ රංග උපකරණවල හා සැරසිලිවල සුවිශේෂතා අගයමින් අදහස් දක්වයි.
- බලි ශාන්තිකර්ම සංරක්ෂණය කිරීමට යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි, ගවේෂණ පත්‍රිකා, ඡායාරූප, දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, පැවරුම් ක්‍රමය, ක්ෂේත්‍ර චාරිකා ක්‍රමය, ගවේෂණ ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

බලි ශාන්තිකර්මයෙහි තොරතුරු මෙහි දී සිසුන්ට ලබා දීම වැදගත් ය. වෙනත් ශාන්ති කර්මවලට වඩා මෙහි ඇති සුවිශේෂ බව සාධක ඇසුරින් සිසුන්ට ලබා දී එහි ආරම්භය හා විකාශය පිළිබඳ තොරතුරු ලබාදීම මෙහිදී අපේක්ෂා කෙරේ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- බලි යන වචනයෙහි අර්ථ දක්වන්න.
- බලි ශාන්තිකර්මයේ ආරම්භය හා විකාශය පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීමට යොමු කරවන්න.
- පැවැත්වීමේ අරමුණු, ගායනය, වාදනය, රංග උපකරණ, රංග වස්ත්‍රාභරණ, ප්‍රදේශීය හා සාම්ප්‍රදායික අනන්‍යතා හා චාරිත්‍ර විධි පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- විශේෂයෙන් අනිකුත් ශාන්තිකර්මයන්හි දක්නට නොලැබෙන සැරසිලි අංග හා ක්‍රම ශිල්ප (සුවිශේෂ ව දක්නට ඇති) බලි වර්ණ ගැන්වීම යොදා ගන්නා අමුද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම වල සුවිශේෂතා පිළිබඳව විස්තර අගයමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මෙම දේශීය උරුමයන් සංරක්ෂණයේ අවශ්‍යතාව සාකච්ඡා කර සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න.

**ඇගයීම** :

- බලි යන වචනය පිළිබඳ ව දක්වා ඇති අර්ථ විග්‍රහ කරන්න.
- බලි ශාන්තිකර්ම පැවැත්වීමට අරමුණු දෙකක් විස්තර කරන්න.
- බලි ශාන්තිකර්මයේ ගායන හා නර්තනයේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- බලි ශාන්තිකර්ම හා බැඳි චාරිත්‍ර විධි නම් කරන්න.
- බලි ඇඹීමේ දී භාවිත අමුද්‍රව්‍ය හා සුවිශේෂ ශිල්ප ක්‍රම විස්තර කරන්න.

**නිපුණතාව 07** : රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 7.1** : නිර්දේශිත සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරයි.

**ක්‍රියාකාරකම 7.1** : ගැමි නැටුම් පිළිබඳ විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :

- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් නම් කරයි.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- සිංහල හා ද්‍රවිඩ ගැමි ජනතාවගේ ජීවන රටාව ගැමි නැටුම්වලින් පිළිබිඹු වන ආකාරය විස්තර කරයි.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල සමාන - අසමානතා හා සුවිශේෂතා විචාරයට ලක් කරයි.
- ගැමි නැටුම්වල අද්‍යතන තත්ත්වය විමසුමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි, තොරතුරු පත්‍රිකා, දෘශ්‍ය සංයුක්ත තැටි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, ගවේෂණ ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

ලී, කළ, ගොයම්, කුලු, මෝල්ගස්, පතුරු, තාලම්, කෝලාට්ටම්, චෙම්බු, අරිවිවෙට්ටු, සුලකු, කරහම් (කරගම්), කාවඩි, කොළඳු පරිතාල්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් නිරීක්ෂණයට ලක් කරමින් ඒ එක් එක් ගැමි නැටුම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල සමානතා - අසමානතා මෙන් ම සුවිශේෂතා පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න.
- එහි දී එම ගැමි නැටුම්වල දක්නට ලැබෙන චලන, රංග වස්ත්‍රාභරණ, ගායන, වාදන හා තාල රටා පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් ගැමි නැටුම්වල සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.
- සරල බව හා සාමූහික බව ගැමි නැටුම්හි සුවිශේෂ බවත් අද්‍යතනයේ ගැමි නැටුම්වල දක්නට ඇති තත්ත්වයන් පිළිබඳ වත් සාකච්ඡා කරමින් විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

**ඇගයීම** :

- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්හි පොදු ලක්ෂණ හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්හි ප්‍රභවය හා අද්‍යතන තත්ත්වය විග්‍රහ කරන්න.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් මඟින් විදහා දක්වෙන ජීවන රටාව විස්තර කරන්න.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

**නිපුණතාවය 07** : රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 7.2** : කොහොඹා කංකාරිය, රටයකුම සහ පහන්මඩුව ශාන්තිකර්මවල නාට්‍යමය අවස්ථා විචාරයට ලක් කරයි.

**ක්‍රියාකාරකම 7.2** : කොහොඹා කංකාරියේ ඌරා යක්කම, රට යකුමේ එන නානු මුරය, පහන් මඩුවේ පොත්කඩේ යක්කම විචාරය කර රස විඳිමු.

**කාලච්ඡේද** : 08

**ඉගෙනුම් පල** :

- මෙම නාට්‍යමය අවස්ථාවල භාවිත වේෂ නිරූපණය හා රංග උපකරණ පිළිබඳ අගයමින් අදහස් දක්වයි.
- චරිත නිරූපණ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා භාවිත කර ඇති විධික්‍රම විචාරයට ලක් කරයි.
- ඌරා යක්කම, නානු මුරය සහ පොත්කඩේ යක්කමෙහි සුවිශේෂ නාට්‍යමය ලක්‍ෂණ පිළිබඳ ව විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, ලිඛිත සටහන්, ඡායාරූප.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : කණ්ඩායම් ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, ක්ෂේත්‍ර චාරිකා ක්‍රමය, පැවරුම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

## ඌරා යක්කම

1 ගුරුන්නාන්සේ : අනේ බොලන්

2 ගුරුන්නාන්සේ : මොකදෑ බොල

1 ගුරුන්නාන්සේ : තුන් මස් තුන් පෝයක් වැදි හිරලයක්... ඒ කරෙන් මේ... කරෙන් දාගෙන මේ කරෙන් ඒ කරෙන් දාගෙන උදුල්ලෙ ම.... ඇවිද්දා.

2 ගුරුන්නාන්සේ : උදුල්ලේ? මොකක් ද බං ඒ තරම් ලොකු උදුල්ල.... උදුල්ල නොවෙයි නිදුල්ලෙ ඇවිද්දා කියනවා. ඉතින් මොන දෙයකට ද නිදුල්ලෙ ඇවිද්දෙ....?

1 ගුරුන්නාන්සේ : මලේ රාජෝත්තමයාණන්ගෙ උයන පාළු කරපු නැන්දම්මාගේ හූරා සොයන්න.

2 ගුරුන්නාන්සේ : එහෙම නොවෙයි බොලං... මලය රාජෝත්තමයාණන්ගෙ නන්දෝද්‍යාන නම් උයන සුනුවිසුනු කළ දුෂ්ට ඌරා සොයාගන්න.

1 ගුරුන්නාන්සේ : අනේ බොලන් මම ගියා නැකතක් අහගන්ට නැකත් ගුරුන්නාන්සේ ළඟට. මම යනකොට උන්දෑ හැතපි හැතපි සිටියා... නමුත් මා කිබිස්සුවා.. මා කීවා නැකතක් බලාගන්ට ආවයි කියලා.

2 ගුරුන්නාන්සේ : අනේ බොලං නැකත් ගුරුන්නාන්සේ හැතපි හිටියා නෙවෙයි සැතපි සිටියා.... කිබිස්සුවා නෙවෙයි කීද්දුවා...

1 ගුරුන්නාන්සේ : හිතන පතන යක්දෙහි ගුරුන්නාන්සේ නැකත් කියන්ට ඔබට හිත නැහැ කිව්වා.

2 ගුරුන්නාන්සේ : හිත නැතුවා නෙවෙයි... ලිත නැතිවා කීවා... බොහොම හොඳයි.... ඒ හැටියට ගියා ම තමයි. ඌරෝ හම්බු වෙන්නෙ නෑ. මට නන් පේන්නෙ උඹට හැම දේ ම නොපිටට වගෙයි කියලා.

1 ගුරුන්නාන්සේ : ඒ මොකද එහෙම කියන්නෙ? ඇයි එහෙම ගියා ම හම්බු වෙන්නෙ නැද්ද?

2 ගුරුන්නාන්සේ : හම්බු වේවි. හීල් බත් ටිකක් පොරවගෙන ඉන්න පුළුවනැයි යකෝ. හීල්බත් ටිකක් කාලා නියරක් ඔස්සෙ ගිනි පෙණෙල්ලක් අරන්, බල්ලන් බුරන වේලාවට මහා අමෘත යෝගයකින් යන්නයි කිව්වෙ.

1 ගුරුන්නාන්සේ : මන් හිතුවා අර විදියයි කියලා. පස්සෙ මට තව එකක් කිව්වා. ඕන් නැකත එතකොට රත් වෙයි කිව්වා.

2 ගුරුන්නාන්සේ : එහෙම තමයි නැකත එතකොට තැති ගන්නවා.

1 ගුරුන්නාන්සේ : ඉතින් මමත් ළිග්ගල් ළඟට වෙලා රත් වෙනකම් බලාගෙන හිටියා පොල්කටු දාලා. මම මුදුන් ළිග්ගල උඩට වෙලා හිටියා ටිකක් වෙලා යනකොට මෙන්න රත් වෙවී රත් වෙවී එනවා. ඊට පස්සෙ මෙන්න මම දොරට අඩිය තියන කොට ම ඌරා චිරිස් ගාලා පැගුණා.

2 ගුරුන්නාන්සේ : මදෑ... ඒ ඌරෙක් නෙවෙයි. ගේ ගෙම්බා.

1 ගුරුන්නාන්සේ : උඹ වගෙයි.

2 ගුරුන්නාන්සේ : මං වගේත් නෙවෙයි උඹ වගේත් නොවෙයි... ගේ ගෙම්බාය කියනවා නාම චාරිත්තරයට.

1 ගුරුන්නාන්සේ : ඊට එහා පැත්තෙ උඩහ වෙලේ ඉඳලා හෙණ පොල් බෑයකුත් කටින් ඩැහැගෙන මෙන්න ඉස්සරහට එනවා.

2 ගුරුන්නාන්සේ : ඒ ඌරා කියල ද හිතේ. ඒ ඌරා නොවෙයි හොර බළල්ලු. උඹලයි ගෙදර හොර බළල්ලු කියල මමත් දන්නවා.

1 ගුරුන්නාන්සේ : ඉතින් ඔන්න මම ආයිත් ඌරා හොයා ගන්න එපා දූයි කියල හිතාගෙන යනව වත්ත පහළට. ඒ හොර බළලා දුමේ ඉඳලා පොල් බෑයක් අරන් පැන්නා. යනකොට ආන්න පිච්ච මල් ඉහිච්ච රෙද්දක් පොරවාගෙන කිඩාරම් මලක් වගේ පාර හරහට දාලා තියෙනවා.

2 ගුරුන්නාන්සේ : ඒක නම් හොඳයි. ගියා නම් උඹට දෙයි ඌරෙක්.

1 ගුරුන්නාන්සේ : ඒකා ඌරා නෙවෙයි ද?

2 ගුරුන්නාන්සේ : ඒකා පොළඟා. ඌරා නෙවෙයි. විසඝෝර සර්පයා. නයා, පොළඟා කියල ඉන්නෙ... මේ විදිහට හෙට එළි වෙන කන් කිව්වත් ඌරා ගැන දැනගන්න පුළුවන් වෙන්නෙ නැහැ. උඹ කියන්නෙ ඌරගෙ හැටියැයි. වෙන වෙන ඒව නෙ.

1 ගුරුන්නාන්සේ : එහෙම නෙවෙයි. කහට කොළ දෙකක් සේ ම කන් සඟළක් ඇති ව කිල්ලෝටයක් සා ඇස් දෙකක් ඇති ව මැකරල් කරලක් සේ පුහු නගුටක් ඇතුව ඉස්සරහට නෙරල ගිය මුහුණක් ඇති ව නැන්දයි ලේලියි දබර කරනව වාගේ සද්දයක් දී වත්ත පහළ හබරල ගාලෙ පිට දීල හිටිය නොවැ බොලන්.

2 ගුරුන්නාන්සේ : ඒක නම් ඌරා තමයි බොලන්.

1 ගුරුන්නාන්සේ : මොකෙන් ද බොලන් දූන් ඌරා විදින්නේ.

2 ගුරුන්නාන්සේ : දුන්නෙන්. ඊ ගහෙන්... දූන් විදින්න තනියම ගිහිල්ලා බැහැ. අපේ ඉන්නව හොඳ සුබාදියෙක්. ඉන්නව හොඳ දඩමීමෙක්. ඌත් එක්ක පලයන්. (මෙහි දී අතෝරකාරයා මීමා ලෙස සරසා ඉදිරියට ගනු ලැබේ.) මේ මීමා හුරු කරල තියෙන්න නුහුරු විදියට.

1 ගුරුන්නාන්සේ : ඒ කිව්වෙ

2 ගුරුන්නාන්සේ : හෝ කිව්ව ම මූ අනිනවා. පුරු කිව්ව ම හිටිනවා... දූන් ඉතින් මේ දඩමීමා මුවකරගෙන ඌරා විදීම කරන්න. බොලං උඹ දන්නව ද ඌරා විදින්නෙ කොහොම ද කියා...?

1 ගුරුන්නාන්සේ : ඔව් ඊයෙන්. (උලකින් අනින අන්දම ඊයෙන් ඇන පෙන්වයි.)

2 ගුරුන්නාන්සේ : නැහැ බොලං... දුන්නෙන්..

1 ගුරුන්නාන්සේ : (දුන්නෙන් පමණක් විදින්නට උත්සාහ කරයි.

2 ගුරුන්නාන්සේ : බොලං.... දුන්නෙනුයි.... ඊයෙනුයි... දුන්නයි ඊයයි එකට තබා... දඩමීමා ගෙනිහිල්ලා ඌරා ළඟට ගිහින් උකුබේයෙ විදින්න ඕනෑ.

1 ගුරුන්නාන්සේ : උගෙ කාරිය ඌ පැළපොල් වනසනවා
මගෙ කාරිය මම පැළපොල් සිටුවනවා
සිතු කාරිය කළ කී දේ සරි යනවා
උඩුවේරිය දෙවි ඌරට හෙණ දෙනවා

2 ගුරුන්නාන්සේ : ඒයි කොහෙ ද ඔය යන්නෙ...?

1 ගුරුන්නාන්සේ : අපි යනවා ඌරෝ විදින්ඩ.

2 ගුරුන්නාන්සේ : ඔහොම නටාගෙන හූ කියාගෙන යනකොට ඌරොත් ඉන්නව ද?

1 ගුරුන්නාන්සේ : ඇයි එහෙම ඉන්නෙ නැත්තේ...? මෙච්චර හොඳට නටන කොට.

2 ගුරුන්නාන්සේ : එහෙම නෙවෙයි.... පරඬැල් පතක් වත් හෙල්ලෙන්නේ නැති ව හීන් සැරේ ගිහින් විදගන්න ඕන. බෙර ගහගෙන, නටාගෙන යන්නෙ නැති ව. උකිබේය ඇතුව යන්න ඕන.

(කෙසෙල් කොටයක් අඩියක් පමණ කොටට කපා එයට කෝටු කෑලි 4ක් කකුල් ලෙස සවි කර ගොක් කොළ කීපයකින් සරසා ඌරකු ලෙස සකසා තිබිණි.)

1 ගුරුන්නාන්සේ : (දඩමීමාට මුවා වී ඌරාට විදියි)

2 ගුරුන්නාන්සේ : දැන් ඉතින් ඌරා වැටිල ඉන්නව ගම් මැද්දෙ. ගමරාලට දෙන්න ඕන කොටහක්. නම කියල ම දෙන්න ඕන.

ඉසට ඉසලන්ට ජගලත්තු තොප්පියක්
කරට කරලන්න මුතු බැඳපු මාලයක්
ඉහට ඉහලන්ට සුදු කරපු සවඩියක්
කපාලා දෙමුව ගමමහගෙ බරට ගාතයක්

1 ගුරුන්නාන්සේ : මෙතනින් කපාගත් යක්දෙස්සො කිච්චහම මාත් කැපුව නෙ. බැලුවා ම ගාත් පහක් ම එකතුවෙලා ආවෙ නැතෑ.

2 ගුරුන්නාන්සේ : තනියම කන්න තේ උඹ ගෙ හිතේ තිබුණෙ... තව ඉන්නවා... ඔය දුන්න ඊතල දුන්නු වඩු උන්නැහැ, කම්මල් ගුරුන්නාන්සේ, මේ දේව තෝත්‍රයට පැණි ගෙනාපු කන්දෙ මාමා, රෙදි අපුල්ලලා හගල දීපු මාමා, හේනෙ මාමා, බිලි ගුරුන්නාන්සේ, දේවතෝත්‍රයට වළන් දුන්න බඩහැල ගුරුන්නාන්සෙට එහෙමත් දෙන්නත් ඕන.

තව ඇවිල්ලා තියෙනවා බෙර ගහන ගුරුන්නාන්සේ. එයාට දෙන්ඩ ම ඕනෑ. බෙරකාරයා නැතිනම් අපිත් කාලා ඉවර යි.

1 ගුරුන්නාන්සේ : ඇත්තට, එහෙනම් මොනව කරන්ඩ ද දෙමු.

බෙරේ කරලාන ආ සැටි දන ගන්න
වැරේ සැරේ ඇති වෙයි පුලුවා පන්න
උරේ නැතුව කරකුත් නැහැ ගන්න
බෙරේ වෙනිවරට බඩවැල ඇර ගන්න

තවත් කවුද?

2 ගුරුන්නාන්සේ : යක්දෙහි ගුරුන්නාන්සේ....

1 ගුරුන්නාන්සේ : ඒ කියන්නේ....?

2 ගුරුන්නාන්සේ : ඔබ දන්නවා ද යක්දෙස්සා කියන්නෙ කවුද කියා. කිලි ගමක් කිලි ගෙයක් කීවොත් අසලින් වත් නොයන කෙනෙක්. මාංස වැලඳීමෙන් වැළකී සිටින්නෙක්. දෙවියන්ට සහ යකුන්ට දෙස් දෙන්නෙක්. සිව්සැට ආභරණ පලඳා සිටින්නෙක්. ඔන්න තවත් අහපන්...

හැට හතරක් ආබරණෙන් සැරසී ගතේ
සියලු යක්දෝස හරිනට ඇතැයි සිතේ
ඌරා පිටින් දෙන්නට මගේ සිතේ
ගාත පෝල් අරිමු ද කවුරුවත් අතේ

1 හා 2 ගුරු : ලේ වැද්දන්ට ලේ දීපිය... පුලුටු වැද්දන්ට පුලුටු දීපිය. වැදි තුන් දොළසක් ද තොවිල් පහට ද ඌරෙක් බෙදා දෙනවැයි කියල කියපු ආඥාවෙන් ආනුභාවෙන් අපේ දෝසාන්දකාරවල් අද පටන් ඉදිරියේ සන්තානම් ගලින් එහා පැත්තට තුර්න වේවා. ආයුබෝ වේවා....!!!

ආශ්‍රිත ග්‍රන්ථ :

ගැමි නාටක ප්‍රවේශය - මුදියන්සේ දිසානායක

යක්කම් පහ - බී. පී. අහුගොඩ

සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර

## <u>නානුමුරය</u>

**කෙටි කවි** : දඹදිව් හිමය තුළ - රන්ගිරි කුට සිරිදුල

වෙසෙන බිසවුන් කල - නානුමුර මංගල්ලයක් අසලොල

**බෙර පදය** : ර්... රිං ගත ගත් දෑහිමි ගත ගත
ගති ගත ගත් දෑහිමි ගත ගත
ගුඳ ගුඳ ගත ගත ගුඳගත
ගත් දිරිකිට ගතකු දොං

රන්විල රිද්දි විල කෙළිනා බිසවුන්ට
මැණික් විලේ දිය නාලා ගොඩ එන්ට
අය වන පුද පඬුරු හෙප්පුව පුරවන්ට
රන්රුව සේ ම බිසවුනි යහනින් එන්ට

**බෙර පදය** : ගුංද දෙගත, ගතිග තගුඳ
ගුං ගුංදං ගත්ගත ගත් ගත් තං ගුග් ගුඳ

නෙළා කැකුළු මල් පලඳින්නේ කවුරු
ගල් පොතු පිට ඉඳ අමුණන මල් පොකුරු
ගනරන් විලේ බැස පීනන්නේ කවුරු
නොවැඩියෙ මන්ද වඳ පොකුණේ බිසෝවරු

**පෙළපාලිය - නානුගෑම**

: දෙසි ද සහ කොකුම් පිනිදිය සඳුන් ගෙනා
සලිත කර නානු තැටියක සදා ගෙනා
එහැම දෙන නුරා රන්තැටි ගෙන අතිනා
සත්දෙන බිසෝ හිස ගල්වති බෙදා ගෙනා

නානු සකස් කිරීම : බෙර පද ඇසුරින් අනුකරණය කර දක්වයි.

දොංත ගතං ගත්ගත ගුඳ.....

දෝං ගුංද ගත්ත ගත්ත ගුංද ගුංද ගත්ත ගතං
දෝං ගුංද ගත්ත ගත්ත රෙගත ගදිත ගති ගුඳගත්
ර්.... රිං දූහිං//
දොංත ගුංද ගත්ත ගතං
ගදිත ගත්ත ගත්ත ගතං
දොංත ගතං - ගදිත ගතං
ගති ගත ගුංදත් දෙගුදත් දූහිං

නානු හිස ගෑම, නළලට බේරෙන නානු ඉවත් කිරීම ආදි අවස්ථාවන් සඳහා ද ඉහත බෙර පද භාවිත වේ.

සෑම පෙළපාලියක් ම අවසන් කිරීම සඳහා විශේෂිත පද කොටසක් මාතර සම්ප්‍රදායයේ භාවිත වන අතර බෙන්තර දී ඒ සඳහා සංවාද යොදා ගැනේ.

රෙගත දෙගත ගති ගුඳගත්

ගුගුඳ ගුගුඳ ගති ගුඳගත්

දෝං රෙගත ගති ගුඳගත් දූහිං

**දිය නෑම** :

කන්ද මුදුන්නේ පොකුණක් මවාලා
එදිය කෙළින්නට තිසරෙක් මවාලා
එපිල මෙපිල මල් දෙපිලක් සැදීලා
බිසවු නාති රැළි උකුළේ එළාලා

**හිස පීරීම** :

උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා
බිමින් බිමින් බිම්තැන්නෙන් ගෙනාවා
කපා කොටා ලියවාලා ගෙනාවා
රිද්දි බිසවු හිස පීරන පනාවා

පනාවෙහි කුණු ඉවත් කිරීම, හිස පීරීම, අවුල් හැරීම හා කොණ්ඩය බැඳීම සඳහා ද ඉහත බෙරපද උචිත පරිදි භාවිත කළ හැකි ය.

**සළු පැළඳීම** :

නෙරිය තබා සුදු සේල අඳිනවා
දෙවුර වසා රන් සැට්ට අඳිනවා
රුව බැබළී සිය ළඟ හැඩ වෙනවා
සළු රැළි අල්ලා බිසවු අඳිනවා

**තෙල් ගෑම** :

සුද්ධ ලෙසට දවසර සිටිති සැමකල්
සුද්ධ ලෙසට පාදා තිබුණු තලතෙල්
සුද්ධ රන් කුප්පි පුරවා ගෙනා තෙල්
රිද්දි බිසෝ හිස ගල්වති ඒ තලතෙල්

**හවරිය පැළඳීම** :

ඇල් සවරිය ගෙන්නා රිසි ළඳුන්නේ
පිල් මොනරිය සේ කරවට දිලෙන්නේ
මල් සවරිය බැඳලා නිති සැරසෙන්නේ
මල්මද අනගි රුව නායක බිසවුන්නේ

**කුරු පැලඳීම** :

| | |
|---|---|
| අසව් අසව් තනවා ගනිමින් | මහරු |
| දෙසව් දෙසව් සිට බලමින්නේ | මාරු |
| බිසව් බිසව් සුබ ගුණ රුසිරෙන් | සීරු |
| සත්දෙන බිසව් හිස පළඳින රන් | කුරු |

**තෝඩු පැලඳීම** :

| | |
|---|---|
| එරන් තෝඩු ගෙන දකුණට | සැරසෙන්නේ |
| වරන් හැට හතරකුත් ඇති | බිසවුන්නේ |
| නරන් රැක දෙන්න තෙද බල | පාමින්නේ |
| එරන් මල් බිසෝ තෝඩුයි | කනලන්නේ |

**වළලු පැලඳීම** :

| | |
|---|---|
| රනේ රන් වළලු අතලා | ගෙනේයා |
| කනේ එරන් පුස්කොළ ලා | ගෙනේයා |
| ගනේ ගොඩැල්ලේ එනවා | පෙනේයා |
| අනේ ටිකිරි කුමාරි | සාමිනේයා |

**තැල්ල පැලඳීම** :

| | |
|---|---|
| උඩත් බැලිම් ගල් ගෝසා දිය | රැල්ලා |
| බිමත් බැලිම් ගල් ගෝසා දිය | රැල්ලා |
| බලා සිටි කලට ඔය මැද සුදු | වැල්ලා |
| නායක බිසෝ ගෙන පලඳිති මල් | තැල්ලා |

අඳුන් ගෑම, සඳුන් ගෑම, දළුමුර කෑම, මොට්ටැක්කිලි පැලඳීම, පුල්ලි මල් පැලඳීම සඳහා ද කවි යොදා ගැනෙන අතර කැඩපතින් බැලීම පෙළපාලියෙන් නානුමුරය අවසන් කරයි.

**කැඩපතින් බැලීම**:

| | |
|---|---|
| සුනිත් සිත වෙලා එළියට | වරෙන්නේ |
| අනිත් තැනට නොගොසින් වට | බලන්නේ |
| මැණික් කැඩපතක් අරගෙන | බලන්නේ |
| මැණික් නම් ලැබූ බිසවුනි | වඩින්නේ |

## පොත්කඩේ යක්කම (පොක්කඩේ යක්කම)

පොත්කඩේ යක්කමේ සංවාදය සිදු කෙරෙන්නේ ප්‍රධාන ඇදුරා සහ දවුල් වාදකයා අතරෙහි පමණ ය. පිරුවටයක් මත තැබූ බුලත් අතක් රැගත් අත් උදවු කරු හෙවත් කොට්ටෝරුවා බුලත් පිළිගැන්වීමට පමණක් සහභාගි වේ. එම බුලත් පිළිගැනීම කරණ කොට ගෙන යක්කම ආරම්භ කෙරේ.

(බුලත් අතක් රැගත් කොට්ටෝරුවා ඇදුරාට පිළිගැන්වීමට උත්සාහ දරයි.)

ඇදුරා : අනේ ගුරුන්නාසේ මේ මිනිහා උලක් උලක් කියා මා පස්සේ එළවනවා.

ගුරු : උලක් නොවෙයි බය වෙන්න කාරි නෑ. මේ බුලත් ටික බය නැති ව අතට අරන් බලනවා.

ඇදුරා : හැබෑට ගුරුන්නාන් සේ මේ සුදක් පිට බුලත් තියලා නොවැ.

ගුරු : ඕක අනිත් පැත්ත හරවලා බලන්න.

ඇදුරා : හැබෑට ගුරුන්නාන්සේ මේ සුදක් පිට බුලත් තියල නොවැ.

ගුරු : හැබෑට ම ඔය බුලත් තියලා ආරාධනා කරල තියෙන්නේ මොකක් හරි වැදගත් දෙයක් වෙන්න ඇති.

ඇදුරා : හැබෑට ගුරුන්නාන්සේ මම ඇහුවා බුලත් දීලා ආරාධනා කළේ හේන් හීයක් ද මන්ද කියලා. මිනිහා ඒ පාර කියනවා හේන්වල කොහේද මිනිහෝ හී හාන්නේ , හී ගාන්නේ කුඹුරුවල නොවැ කියලා. ඊට පස්සෙ මම ඇහුවා එහෙම නෙමෙයි..... කුඹුරු වල් කෙටිල්ලක් ද කියලා කුඹුරු කොහේ ද මිනිහෝ වල් කොටන්නේ , කුඹුරු කොටනවා.

මෙහෙම ඇහුව ම මිනිහ කියනවා මේක රහසින් තමයි කියන්න ඕනෙ කියලා.

ගුරු : හැබෑට ම මොකක් ද ඒ රහස අපිටත් දැන ගන්න කියමුකෝ බලන්න.

ඇදුරා : රහස් කියනව ද මිනිහෝ ඇහෙන්න.

ගුරු : එහෙම නෙමේ මට විතරක් වත් ඇහෙන්න කියමුකෝ බලන්න.

ඇදුරා : මම රහස කියන්නම් හැබැයි කන කට ළඟට කළොත් තමයි කියන්න පුළුවන්.

ගුරු : ඒක නම් ටිකක් අමාරුයි. එහෙම නෙමෙයි. ඔහේගේ කට ළඟට මගේ කන කිට්ටු කරන්නං.

(රහස කීමට සැරසෙන ආකාරය නිරූපණය කරන ඇදුරා දවුල් වාදකයා ළඟට ගොස් ඔහු දෑතින් බදාගෙන කනට කට තබා මහා හඬින් රහස කියයි.)

ඇදුරා : බුදු...............බාප්.............පේ...............

උඹටයි...............මටයි...............හවුලේ...............

කසාදයක්...............බඳින්න........

ගුරු : හෝව්........හෝව්........ ඇති ඇති

ඇදුරා : ඇයි ඇහුණේ නැද්ද?

ගුරු : ඇහුණා ඇහුණා හොඳට ඇහුණා යසයි රහස් කියන හැටි. මගේ කනත් බීරී වුණා.

ඇදුරා : අපි නම් ඔහොම කසාද බැඳිල්ලක් ගැන අහලා නෑ.

(පොත්කඩේ යක්කමේ දී ප්‍රධාන ඇදුරු බාප්පා ලෙසත් කොට්ටෝරු මහතා පුතා ලෙසත් සැලකීම හාස්‍ය රසයට පිටිවහලක් වේ.)

ගුරු : එහෙම නෙමෙයි........ මිනිහා කලින් කසාද බැඳලා එහෙම නැද්ද?

ඇදුරා : මොකද නැතුවා මිනිහා කසාද කිහිපයක් ම බැඳලා තියෙනවා. මිනිහා හොඳ වැහි කාලයක් බලලා ගෑනු ළමයෙක් ගෙනාවා. ඒකිට අලකොළ රෝගෙ හැදිලා මැරිල ගියා. ඊට පස්සේ පායන කාලේ බලලා තවත හිරයක් ගෙනාවා ඒ ගෑනිට පොල්කටු රෝගය හැදිලා මැරිල ගියා. ඉතින් ඊට පස්සේ තවත් ගෑනු ළමයෙක් කැන්දාගෙන ආවා. ඒකිට මලකඩ රෝගෙයි, කොත්තනාවයි හැදිලා මැරිල ගියා.

ගුරු : අනේ මිනිහට ගෑනු පල දෙන්නේ නෑ නේ ?

ඇදුරා : අනේ ඉතින් මේ ගැන කල්පනා කරලා වැහි කාලෙයි පායන කාලෙයි දෙක අතර කාලයක්

බලලා ගෑනු ළමයෙක් කැන්දගෙන ආවා.ඒ ගෑනි ගෙනැල්ලා ඉස්සරහ දොරෙන් ඇතුළු කළා. ඊට පස්සේ පස්ස දොරෙන් ගියා ගියා මයි අද වෙන තුරු අන්දෝ සංසාරයක් දන්නෑ වෙච්ච දේ.

ගුරු : ඒ ඉතින් ඇතුළු කරපු හොඳකම තමයි.

ඇදුරා : ඉතින් මේ මඟුල් තුලාවලින් පලක් නෑ. කියලා බාප්ප එක්ක හවුලේ කසාදයක් බැඳලා බලමුයි කියලා තමයි මේ බුලත් දීලා ආරාධනා කෙරුවේ. මඟුල් කීපයකට විය පැහැදම් කරල මිනිහ හෙම්බත් වෙලා ඉන්න හින්දා මාත් ඉතින් ඒකට කැමති වුණා.

ගුරු : ඒක හොඳයි මේ කාලේ හැටියට හවුලේ බඳින එක.

ඇදුරා : හැබැට ම ගුරුන්නාන්සේ මේක මේ හවුලේ කසාද බැඳිල්ලක් ද ?

ගුරු : මමත් ඒක තමයි මේ කල්පනා කළේ. ඔය ගෑනිට හැදිච්ච ලෙඩ දුක් ගැන කිවුවා නේ ද, අල කොළ රෝගෙ, පොල් කටු රෝගේ, මලකඩ රෝගේ, කොක්කනාව මේවා මේ කෙත්වතු ගොයමට වැලඳෙන රෝග.

ඇදුරා : ආං හරි ගුරුන්නාන්සේ මේක මේ මෙහෙම වෙච්ච මඟුලක් නෙමේ. ගොයමට වැලඳෙන කොක්කනාව මළකඩ රෝගය, ආදි මේ දෝෂාන්දකාරවල් මේ ගංවලත් අවට ගංවලත් ගොයමට වැලඳෙන රෝග දුරු කරලා පත්තිනි දේවතාවිය ප්‍රමුඛ සපිරිවාර දෙවි දේවතාවුන් වහන්සේලා ප්‍රමුඛ සතර දේවාල පෙරහැරක් හා සමාන පහන් මඩු මංගල්‍යයක් ඔප්පු සිද්ධ කරලා වඳුරු වසංගත දුරු කරන්න කියලා කරපු ආරාධනයක් තමයි මේ බුලත් දීල කළේ. මේක මේ ගුරුන්නාන්සේ තමයි පටලවලා මඟුලකට හැරෙව්වේ.

ගුරු : මේ ඕවට මාව එහෙම අල්ල ගන්න එපා. තමුන් තමයි මේවා පටලවල කළේ.

ඇදුරා : හා ඉතින් දූන් කාරි නෑ. අපි පත්තිනි දේවිය ප්‍රමුඛ පරිවාර දෙවි දේවතාවුන් වහන්සේලාට බුලත් පුදලා ආශීර්වාද කරමු.

දොංත-කිතක

සුද්ධ ලෙසට ලෙලවා දළු මුර සතකි
සුද්ධ පිරුවටක් මත තබලා නුසැකි
වැද්ද නොදී එන පිරිපත හරිනු සකී
සිද්ධ පතිනි දෙවියන්ගේ අනුහසකි

**මෙය දීර්ඝ යක්කමකි. (මෙහි ඇත්තේ සංෂිප්ත වශයෙනි.)**

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- උඟරා යක්කම, නානු මුරය, පොත්කඩේ යක්කම, (පොක්කඩේ යක්කම) දෘශ්‍ය සංයුක්ත තැටි, බාහිර සම්පත් පුද්ගල සම්බන්ධතා ප්‍රදර්ශනාත්මක වැඩ සටහන් ඉදිරිපත් කර හොඳින් නිරීක්ෂණය කරවන්න.
- සම්ප්‍රදාය ත්‍රිත්වයේ ම ශාන්තිකර්මවල නාට්‍යමය අවස්ථාවන්හි සුවිශේෂ වෙනස්කම් ඇති බව සාකච්ඡා කරන්න.
- සාම්ප්‍රදායික බෙරපද, තාල රූප හා කවි ගායනය අනුව නර්තන මාධ්‍යයෙන් ද චරිත නිරූපණය කෙරෙන බව සාකච්ඡා කරන්න.
- උඟරා යක්කම, පොත්කඩේ යක්කම ආදියේ වාචික අභිනය භාවිතයෙන් නාට්‍යමය ගුණය තීව්‍ර වන බව පැහැදිලි කරන්න.
- නානු මුරයට අදාළ බෙර පද හා කවි ගායන යොදා ගනිමින් චරිත නිරූපණය වන බව සාකච්ඡා කරන්න.

**ඇගයීම** :

- උඟරා යක්කම, නානු මුරය, පොත්කඩේ යක්කම යන නාට්‍යමය අවස්ථා තුනෙහි සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරන්න.
- චරිත නිරූපණ කාර්ය සාර්ථක කරගැනීම සඳහා භාවිත විධික්‍රම විමසුමට ලක් කරන්න.

**නිපුණතාව 07** : රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 7.3** : භාරතීය නර්තන සම්ප්‍රදායවල ආරම්භය හා විකාශය විස්තර කරයි.

**ක්‍රියාකාරකම 7.3** : භාරතීය සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන්ගේ තොරතුරු විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :

- භාරතීය සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන්ගේ ආරම්භය හා විකාශය හඳුන්වයි.
- මෙම සම්ප්‍රදායයන් ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.
- සංගීත සම්ප්‍රදායයන් හඳුන්වයි.
- සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ඡායාරූප, පින්තූර, පුවත්පත් ලිපි

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය :** සාකච්ඡා ක්‍රමය, ගවේෂණය ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

භාරතීය නර්තන සම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන්ගේ ආරම්භය හා විකාශයට බලපෑ කරුණු (ආගමික පසුබිම හා සංකල්ප) සංගීත සම්ප්‍රදායය හා සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව විමසීම.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- භාරතීය සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන්ගේ ආරම්භය හා විකාශය පිළිබඳ කරුණු දක්වන්න.
- එක් එක් නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි සංගීත සම්ප්‍රදායය නම් කරන්න.
- එක් එක් සම්ප්‍රදායයන්වල සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න.

ඇගයීම :

- භාරතීය සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන් ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.
- භාරතීය සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායයන්ගේ ආරම්භය හා විකාශය ට බලපෑ කරුණු විමසන්න.
- එක් එක් සම්ප්‍රදායයන්වල සංගීත සම්ප්‍රදායය හා සුවිශේෂ ලක්ෂණ හඳුන්වන්න.

**නිපුණතාව 07** : රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 7.4** : රූපවාහිනිය මඟින් ප්‍රචාරය කරන නර්තන වැඩ සටහන් පිළිබඳ විචාරය කරයි.

**ක්‍රියාකාරකම 7.4.** : රූපවාහිනී නර්තන වැඩ සටහන් විචාරයට ලක් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- රූපවාහිනිය මඟින් ප්‍රචාරය කරන නර්තන විෂය හා සබැඳි වැඩසටහන් නම් කරයි.
- රූපවාහිනිය මඟින් ප්‍රචාරය වන වැඩසටහන්වල නර්තන අංග නරඹා ඒ පිළිබඳ විචාරය කරයි.
- දේශීය නර්තන සම්ප්‍රදායවල අනන්‍යතා ලක්ෂණ සුරැකීමට මාධ්‍ය සතු වගකීම් පිළිබඳ ව විචාරය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, පැවරුම් පත්‍රිකා

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : කණ්ඩායම් ක්‍රමය, පැවරුම් ක්‍රමය. සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

විවිධ කාලවල දී රූපවාහිනියෙන් ප්‍රචාරය කරන වැඩසටහන්වල විවිධත්වය හඳුනාගෙන - විමර්ශනය කර ක්‍රියාකාරකම සැලසුම් කළ යුතු වේ. එහි ප්‍රචාරය වන නර්තන විෂය හා සබැඳි විවිධ වැඩසටහන් ඇසුරින් ක්‍රියාකාරකමෙහි අන්තර්ගත ඉගෙනුම් පල කරා ළඟාවිය යුතු ය. සිසුන්ගේ විචාරාත්මක හා තර්කානුකූල චින්තනය වර්ධනය සඳහා මෙම ක්‍රියාකාරකම සැලසුම් කිරීම කාලෝචිත අවශ්‍යතාවකි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- රූපවාහිනී මාධ්‍ය ඔස්සේ දක්නට ලැබෙන විවිධ නර්තන වැඩසටහන් නැරඹීමට යොමු කරවන්න.
- එම වැඩසටහන් ප්‍රේක්ෂක රසවින්දනය සඳහා නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- රූපවාහිනිය මඟින් ප්‍රචාරය වන නර්තන වැඩසටහන්වල අන්තර්ගත ගායන, වාදන, චලන, රංග වස්ත්‍රාභරණ හා රංග රචනය පිළිබඳ අධ්‍යයනය කිරීමට යොමු කර ඒ පිළිබඳ විචාරාත්මක ව සාකච්ඡා කරන්න.
- දේශීය නර්තන සම්ප්‍රදායවල අනන්‍යතා ලක්‍ෂණ මතු කරමින් ඒවා කෙබඳු ආකාරයෙන් සුරක්ෂිත කළ යුතු ද යන්න සාකච්ඡා කරන්න.
- මෙම වැඩසටහන්වල ගුණාත්මක භාවය ප්‍රදර්ශනය කිරීමට භාවිත කර ඇති තාක්ෂණික විධි ක්‍රමවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විමසීමට ලක් කරන්න.

**ඇගයීම** :

- රූපවාහිනී මාධ්‍යයෙන් විකාශනය වන නර්තන වැඩසටහන් නම් කරන්න.
- තෝරාගත් නර්තන අංග මාධ්‍යයට උචිත පරිදි සකස් වී ඇත්දැයි විමසීමට ලක් කරන්න.
- දේශීය නර්තන සම්ප්‍රදායයවල අනන්‍යතා ලක්ෂණ සුරැකීමට මාධ්‍ය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය යෝජනා ඉදිරිපත් කරන්න.
- රූපවාහිනියේ දක්නට ලැබෙන නර්තන වැඩසටහන්වල සංස්කෘතික අනන්‍යතා පිළිබඳ විචාරය කරන්න.

**නිපුණතාව 07** : රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 7.5** : බැරිසිල්/පටාචාරා කලා කෘතිය විචාරයට ලක් කරයි.

**ක්‍රියාකාරකම 7.5** : බැරිසිල්/පටාචාරා කලා කෘතිය විචාරයට ලක් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :

- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ තේමාව විමසුමට ලක් කරයි.
- බැරිසිල්/පටාචාරා කලා කෘතිය නිර්මාණයට බලපෑ ආභාසයන් පිළිබඳ කරුණු දක්වයි.
- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ සංගීත නිර්මාණය පිළිබඳ විචාරය කරයි.
- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ රංග වින්‍යාසය පිළිබඳ අගයමින් අදහස් ඉදිරිපත් කරයි.
- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ රංග වින්‍යාසය, රංග වස්ත්‍රාභරණ, පසුබිම් අලංකරණය හා ආලෝකකරණයේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විචාරය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, පින්තූර, පුවත්පත් ලිපි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, සම්මන්ත්‍රණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, පැවරුම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

බැරිසිල්/පටාචාරා කලා කෘති ප්‍රදර්ශනය කරන්න. එම නිර්මාණ විචාරාත්මකව නැරඹීමට සලස්වන්න. බැරිසිල්/පටාචාරා මුද්‍රා නාට්‍යයේ කතා පුවත ඉදිරිපත් කිරීම් හා බැරිසිල්/පටාචාරා කලා කෘතියේ තේමාවෙහි සුවිශේෂත්වය පිළිබඳ ව අවධාරණය කිරීම. එම තේමාව විකාශනයෙහි ලා ඔහු භාවිත කර ඇති ගායනය, වාදනය, රංගනය, රංගවස්ත්‍රාභරණ, පසුබිම් අලංකරණය, ආලෝකකරණය හා ශිල්පීය දායකත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමින් බැරිසිල්/පටාචාරා කලා කෘතියේ ගුණාත්මක බව සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරේ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- බැරිසිල්/පටාචාරා කලා කෘතිය නැරඹීමට සලස්වමින් ඒ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- බැරිසිල්/පටාචාරා තේමාව පිළිබඳ විමසන්න.
- නිර්මාණයට බලපා ඇති ආභාසයන් විමසුමට ලක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ සංගීතය හා රංග රචනය පිළිබඳ අගයමින් අදහස් දැක්වීමට සලස්වන්න.
- රංග වස්ත්‍රාභරණ, පසුබිම් අලංකරණ හා ආලෝකකරණයේ සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරමින් අදහස් දැක්වීමට අවස්ථාව සලස්වා සමාලෝචනය කරන්න.

**ඇගයීම** :

- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ කතා පුවත ඉදිරිපත් කරමින් එහි තේමාව අගයන්න.
- බැරිසිල්/පටාචාරා කලා කෘතිය පෝෂණයට බලපා ඇති ආභාසයන් මොනවා දැයි කෙටියෙන් සඳහන් කරන්න.
- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ ප්‍රාසංගිකත්වය වර්ධනයෙහි ලා සංගීතය බලපා ඇති ආකාරය විමසුමට ලක් කරන්න.
- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ රංග රචනය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
- බැරිසිල්/පටාචාරා කලා කෘතියේ චරිත නිරූපණ අවස්ථා තීව්‍ර කිරීම සඳහා රංග වස්ත්‍රාභරණ, පසුබිම් අලංකරණය හා ආලෝකකරණය කෙබඳු ආකාරයෙන් බලපා ඇත් දැයි විමසන්න.

**නිපුණතාව 08** : නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයන කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 8.1** : ශ්‍රී ලාංකේය නර්තනය හා සංගීතය අතර ඇති සහසම්බන්ධතාව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 8.1** : නර්තනය හා සංගීතය අතර සහසම්බන්ධතාව විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- ශාන්තිකර්මවල අන්තර්ගත දේශීය ජන ගායනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- දේශීය ජන ගායනය ශාන්තිකර්මයන්හි යෙදී ඇති ආකාරය විස්තර කරයි.
- නර්තනයේ ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහි ලා සංගීතයෙන් ලැබෙන පිටිවහල අගයමින් අදහස් දක්වයි.
- දේශීය සංගීත කලාවේ පෝෂණයට නර්තන සම්ප්‍රදායයවලින් ලැබී ඇති ආභාසය පිළිබඳ විමසයි.
- නව සංගීත නිර්මාණකරණයෙහි ලා ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ජන ගායනා හා වාදන පිටිවහලක් වී ඇති ආකාරය විචාරයට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටි, ලිපි ලේඛන.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය, පැවරුම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

දේශීය ශාන්තිකර්මවල ජන ගායනය යෙදී ඇති ආකාරය, නර්තනයේ ප්‍රාසංගික බව තීව්‍ර කිරීමට සංගීතය ඉවහල් වන ආකාරය (ගීත නාට්‍ය, බැලේ, නෘත්‍ය නාටක සඳහා)දේශීය සංගීත කලාවේ පෝෂණයට නර්තන සම්ප්‍රදායවලින් ලබා ඇති ආභාසය (නර්තන විෂය හා සබැඳි ගායන - වාදන, තාල, නාද මාලා)

සංගීත නව නිර්මාණකරණය සඳහා ශ්‍රී ලාංකේය ශාන්ති කර්ම හා සබැඳි ජන ගායනය හා වාදනය පිටුබල වී ඇති ආකාරය (සරල සංගීතය සඳහා දේශීය ශාන්තිකර්ම හා අනිකුත් නර්තන හා සබැඳි අංගවලින් ලබා ඇති ආභාසය) විමසීම අපේක්ෂා කෙරේ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- ශාන්තිකර්මවල අන්තර්ගත ජන ගායනා ශ්‍රවණයට සලස්වන්න.
- එම ජන ගායනවල ස්වභාවය විමසුමට ලක් කරන්න.
- නර්තනයේ ප්‍රාසංගික බව තීව්‍ර කිරීමට සංගීතය ඉවහල් වන ආකාරය සාකච්ඡා කරන්න.
- සංගීත කලාවේ පෝෂණයට නර්තන සම්ප්‍රදායවලින් ලබා ඇති ආභාසය විමසන්න.
- සංගීත නව නිර්මාණ සඳහා නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි ගායනය, වාදනය, තාල හා නාද රටා යෙදී ඇති ආකාරය උදාහරණ දක්වමින් විමසීමට ලක් කරන්න.

ඇගයීම :

- ශාන්තිකර්මවල අන්තර්ගත දේශීය ජන සංගීතය පිළිබඳ උදාහරණ දෙකක් දක්වන්න.
- නර්තනයෙහි ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහි ලා සංගීතයෙන් ලැබෙන පිටුබලය අගයන්න.
- සංගීත නව නිර්මාණකරණය සඳහා නර්තනය හා සබැඳි භාණ්ඩ, තාල හා නාද රටා යොදාගෙන ඇති ආකාරය උදාහරණ සපයමින් විස්තර කරන්න.

**නිපුණතාව 08** : නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 8.2** : නර්තනය හා නාට්‍ය ශෛලීන් අතර ඇති සහසම්බන්ධතාවේ සුවිශේෂතා විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 8.2** : විවිධ නාට්‍ය ශෛලිවල නර්තනය භාවිත කර ඇති ආකාරය විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලි හඳුන්වයි.
- ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍යවල භාවිත නර්තන පිළිබඳ විචාරයට ලක් කරයි.
- දේශීය ගැමි නාටකවල නර්තන භාවිත කර ඇති ආකාරය විමසුමට ලක් කරයි.
- ගීත නාට්‍යවල භාවිත නර්තන පිළිබඳ නිරීක්ෂණය කර තොරතුරු දක්වයි.
- මිශ්‍ර නාට්‍ය ශෛලිවල නර්තනය යොදා ගැනීම විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, ලිපි ලේඛන හා තොරතුරු

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, භූමිකා රංගන ක්‍රමය, පැවරුම් ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :

ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලීන් හඳුන්වා ඒවායේ භාවිත නර්තන තොරතුරු මෙන් ම මිශ්‍ර නාට්‍ය ශෛලිවල භාවිත නර්තන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම වැදගත් වේ. ගීත නාට්‍යවල භාවිත නර්තන පිළිබඳ ව ද තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. නෘත්‍ය නාටක මෙන් ම බැලේ නර්තන ශෛලිය ද විමසීම අත්‍යවශ්‍ය වේ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය අවස්ථා නැරඹීමට සලස්වන්න.
- ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය හඳුන්වන්න.
- එම නාට්‍යවල භාවිත නර්තන ශෛලිවල සුවිශේෂ ලක්ෂණ විමසීමට ලක් කරන්න.
- දේශිය ගැමි නාටකවල නර්තන භාවිත කර ඇති ආකාරය විමසුමට ලක් කරයි.
- ගීත නාට්‍ය නැරඹීමට යොමු කරවන්න.
- එම ගීත නාට්‍යවල නර්තනය යොදා ඇති ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- බටහිර බැලේ නාට්‍ය කතා හා නෘත්‍ය නාටකවල භාවිත කරන නර්තන පිළිබඳ එම කෘති නරඹමින් සාකච්ඡා කර විමසුමට ලක් කරන්න.
- විවිධ නාට්‍ය ශෛලිවල නර්තනය යෙදී ඇති ආකාරය විචාරාත්මක ව විමසා බලමින් අදහස් දැක්වීමට සලස්වා සමාලෝචනය කරන්න.

**ඇගයීම** :

- නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී නාට්‍ය හඳුන්වන්න.
- මෙම ශෛලි දෙකෙහි භාවිත කරන නර්තන පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
- දේශීය ගැමි නාටකවල නර්තන භාවිත කර ඇති ආකාරය විමසුමට ලක් කරන්න.
- බටහිර බැලේ සහ නෘත්‍ය නාටකවල නර්තනය යොදා ගෙන ඇති ආකාරයේ ඇති වෙනස්කම් විස්තර කරන්න.

**නිපුණතාව 08** : නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයන කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 8.3** : නර්තන කලාව හා චිත්‍ර කලාව අතර සහසම්බන්ධතාව විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 8.3** : නර්තන කලාව හා චිත්‍ර කලාව අතර සහසම්බන්ධතාව විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- චිත්‍ර කලාව හා නර්තන කලාව අතර ඇති සම්බන්ධතාව විස්තර කරයි.
- චිත්‍ර සංරචනය හා සබැඳි මූලධර්ම පිළිබඳ විමසයි.
- චිත්‍ර සංරචනය හා සබැඳි ශිල්ප ක්‍රම (විධික්‍රම) පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නර්තන රංග රචනය පිළිබඳ ව විමසමින් අදහස් ඉදිරිපත් කරයි.
- නර්තන රංග රචනය හා චිත්‍ර සංරචනය අතර ඇති සමාන රූපී ලක්ෂණ විමසුමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය සංයුක්ත තැටි, ඡායාරූප, අදාළ සටහන්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය** : ප්‍රදර්ශන ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, භූමිකා රංගන ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

චිත්‍ර කලාවෙහි මූලිකාංග, චිත්‍ර සංරචනය හා සබැඳි මූල ධර්ම, ශිල්ප ක්‍රම, නර්තන රංග රචන හා සබැඳි ශිල්ප ක්‍රම, මූල ධර්ම, මේ අතර සමාන රූප ලක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

- චිත්‍ර කලාවේ මූලිකාංග විස්තර කරන්න.
- නර්තන රංග රචනය හා චිත්‍ර සම්පිණ්ඩනය අතර ඇති සමානරූපී ලක්ෂණ සාකච්ඡා කරන්න.
- චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳෙන ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න.
- ඉහත කරුණු සාකච්ඡා කර සමාලෝචනයට භාජනය කරන්න.

**ඇගයීම** :

- චිත්‍ර කලාවේ මූලිකාංග නම් කරන්න.
- නර්තන රංග රචනය හා චිත්‍ර සම්පිණ්ඩනය අතර ඇති සමානරූපී ලක්ෂණ දෙකක් විස්තර කරන්න.

# විවිධ සහාය

| | |
|---|---|
| කංචුක නිර්මාණය | රවින්ද්‍ර තේනුවර<br>කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| පරිගණක වදන් සැකසුම | කේ.ඒ.ඒ.ජයරාණි ගුණතිලක<br>කොට්ටාව, පන්නිපිටිය. |
| | ඒ.එල්.කේ.චතුරාණි<br>වෙළඳ සහායක<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |
| විවිධ සහාය | දීපා ශිරෝමනී<br>කේ.පී.පෙරේරා |